# ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## 9 වන ශ්‍රේණිය



සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

## 9 වන ශ්‍රේණිය

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

(2010 සිට ක්‍රියාත්මක වේ)

**සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

9 වන ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

2009 මුද්‍රණය

සමාජ විද්‍යා දෙපාර්මේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල විෂය ඉගැන්වීම සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනය හඳුන්වා දී තිබෙන නව ප්‍රවේශය, 2010 වර්ෂයේ දී 9 වන ශ්‍රේණිය සඳහා ද හඳුන්වා දෙනු ලබන අතර මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය විෂය ඉගැන්වීම සම්බන්ධයෙන් ගුරුවරුන් විසින් අනුගමනය කළ යුතු ඉගැන්වීම් ප්‍රවේශය පිළිබඳ සතුටුදායක මඟපෙන්වීමක් කරනු ඇත. 2007 වර්ෂයේ දී 6 සහ 10 වන ශ්‍රේණිවල ද 2008 වර්ෂයේ දී 7 සහ 11 වන ශ්‍රේණිවල ද හඳුන්වා දෙනු ලැබූ මෙම නව ඉගැන්වීම් ප්‍රවේශය මගින් පන්ති කාමරය තුළ ඉගෙනුම් - ඉගැන්වීම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රශස්ත වෙනසක් සිදු කොට තිබේ.

ඔබ අතට පත්වන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ශිෂ්‍ය කේන්ද්‍රීය ලෙස පන්ති කාමරයේ කටයුතු සංවිධානය කළ යුතු ආකාරය පිළිබඳ මග පෙන්වීමකි. ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශයකින් පන්ති කාමරයේ ඉගෙනුම් - ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීම ශ්‍රී ලංකාවේ පන්ති කාමරයට, එසේ ම ගුරු භවතුන්හට අලුත් අත්දැකීමක් නො වේ. එසේ වුවත් මෙම නව ප්‍රවේශය මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයට අලුත් මුහුණුවරක් ගෙන දී තිබේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මගින් පාඩම් සැලසුම් කොට ශිෂ්‍ය සහභාගිත්වය ඇති ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන යොමු කිරීම කරන අතර ඒ සඳහා අවශ්‍ය පරිසරය මැනවින් ගොඩනගයි. සෑම පාඩමක දී ම ශිෂ්‍යයන් කණ්ඩායම්වලට බෙදී අලුතින් තොරතුරු ගවේෂණය කරමින් නව දැනුම උත්පාදනය කිරීමට යොමු කරන ආකාරයට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියාකාරකම් ගොනු කර තිබේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ අන්තර්ගත මගපෙන්වීම පදනම් වන්නේ ගුරුවරයා දැනුම් සම්ප්‍රේෂකයකු (Knowledge Transmitter) නොව දැනුම් උත්පාදකයකු (Knowledge Transformer) විය යුතුය යන දර්ශනය මත ය. එහෙයින් මෙහි අඩංගු ක්‍රියාකාරකම් මගින් ශිෂ්‍යයන් දැනුම සොයා යන, අලුත් දැනුම උත්පාදනය කරන ශාස්ත්‍රලාභියකු බවට පත් කෙරේ. අලුත් දැනුම ගවේෂණය තුළින් අනාවරණය කර ගැනීමට ශිෂ්‍යයන් යොමු කිරීම හා පෙළඹවීම ගුරු භවතුන්ගෙන් අපේක්ෂා කරන කාර්යය වෙයි.

සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමවලට හිර වී නොසිට නව ඉගැන්වීම් ප්‍රවේශ ගැන සිතන්නට ගුරුවරුන් යොමු කිරීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල අන්තර්ගත දර්ශනය හා ක්‍රියාකාරකම් බෙහෙවින් උදව් වනු ඇතැයි සිතමි. අපගේ ගුරුවරුන් අලුත් ප්‍රවේශ හා ඉගැන්වීම් ක්‍රම ගැන සිතන්නට යොමු විය යුතු ය. නව සහස්‍රය අලුත් දැනුම උත්පාදනය වන යුගයෙකි. එම නිසා සාම්ප්‍රදායික ක්‍රමවලින් බැහැර ව අලුතින් තම ක්‍රියාකාරකම් සැලසුම් කරන්නට යොමු විය යුතු ය.

මෙවැනි ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයක ඇතුළත් කරන තොරතුරුවලින් අපේක්ෂා කරනුයේ ගුරුවරුන් හට තම ඉගැන්වීමේ කාර්යයේ දී යොදා ගත හැකි මූලික උපදෙස් සම්පාදනය කරන අතරතුර ඔවුන් වඩාත් ඉහළ නිර්මාණාත්මක ප්‍රවේශ කරා යොමු කරවීම ය. එම අරමුණ ඇති ව ගුරුභවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනය කරනු ඇතැයි ද පන්ති කාමර කටයුතුවල දී භාවිත කරනු ඇතැයි ද බලාපොරොත්තු වෙමි. මෙවැනි පරිශ්‍රමයක් මගින් පන්ති කාමරයේ ඉගෙනුම් - ඉගැන්වීම් කටයුතුවල කාර්යක්ෂමතාව හා ගුණාත්මක බව තවදුරටත් ඉහළ නැංවීම ප්‍රධාන අපේක්ෂාව වෙයි.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සම්පාදනය කිරීම සඳහා සහභාගී වී දායකත්වය දැක්වූ ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයින්ටත් බාහිර සම්පත්දායකයින්ටත් මගේ ස්තූතිය පිරිනමමි.

**මහාචාර්ය ලාල් පෙරේරා**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# සංදේශය

ශ්‍රී ලංකාවේ විෂයමාලා ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසල් විෂය නිර්දේශ යාවත්කාලීන විය යුතු ය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ මෙම විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශවල යම් විෂයකට අදාළ විෂය මාතෘකා රාශියක් ද ඒ ඒ විෂය මාතෘකාවට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි. මෙම විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයා ගෙන් සිදු විය. මෙම ක්‍රියාවලිය නිසා බොහෝ විෂය කරුණු දන්නා සිසු පිරිසක් බිහිවූහ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ ඒ විෂය යටතේ සිසුන් අත්පත් කර ගත යුතු නිපුණතා හඳුනා ගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය තුළින් බොහෝ විෂය කරුණු දන්නා බවින් ඔබ්බට ගිය ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශය භාවිත කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ක්‍රියාකාරකම් සන්තතිය නම් කොටසේ දී හමුවන නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත පන්ති කාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාල භාවිතය හා පොත්පත් කියවීම්, පරිසරය නිරීක්ෂණය සම්පත් පුද්ගලයන්ගෙන් කරුණු රැස්කර ගැනීම, තම මිතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගෙනීම සහ තම යහළු යෙහෙළියන්ට තමා දන්නා දේ කියා දීම, හැකි අවස්ථාවන්හි දී අන්තර්ජාලයෙන් තොරතුරු රැස් කර ගැනීම ආදී ගවේෂණාත්මක ව ඉගෙන ගන්නා සංස්කෘතියක් දැකිය හැකි විය යුතු ය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති පෙළපොත ද සම්පත් පොතක් ලෙස භාවිතා කළ යුතු ය. මෙසේ සොයා ගන්නා කරුණු වඩාත් නිවැරදි ව සංවිධානාත්මක ව හා අංග සම්පූර්ණ ව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් වූවකු විය යුතු ය. එය සිසුන් සොයා ගන්නා සියලු කරුණු අභිබවා යන බහුශ්‍රැතභාවයක් ප්‍රදර්ශනය කරයි. මෙම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය, සිසුන්ට බෙහෙවින් ආකර්ශනය වනු ඇත.

මේ සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ආදර්ශ පාඩම් තවත් බොහෝ පාඩම් සකස් කර ගැනීමට මග පෙන්වීමක් බව සිතන්න. මේවා ඇසුරෙන් නිර්මාණශීලී ගුරුවරයකු ලෙස නව පාඩම් සකස් කර ගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැම විට ම සිසුන් ක්‍රියාකාරී ය, එබැවින් ඔවුන්ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට දක්නට ලැබේ. ඒ හැමවිට ම එම දුෂ්කරතා ඉවත් කර ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන්ට උදවු කිරීමට යොමු කරන්න. මේ අයුරින් පාඩමත් සමග කෙරෙන තක්සේරු ක්‍රියාවලිය වඩාත් ඵලදායී ඉගෙනුමකට හේතු වේ.

තව ද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ඉගෙනුම් දීර්ඝ කිරීමේ පැවරුම් හා අභ්‍යාස දරුවා උගත් දේ තව දුරටත් ශක්තිමත් කිරීමට සමත් වන ආකාරය ගැන අවධානය යොමු කරන්න. එම සිසුන් මෙසේ ඇගයීම් කළ හැකි හොඳ අවස්ථාවක් ලෙසට සලකන්න. මෙබඳු තවත් ඉගෙනුම් දීර්ඝ කිරීමේ බොහෝ අභ්‍යාසවල සිසුන් යොමු කිරීම පිළබඳ ව සැලකිලිමත් වන්න.

**විමල් සියඹලාගොඩ**

**සහකාර අධ්‍යක්ෂ ජනරාල්**

**(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)**

**ජාතික අධ්‍යාපන ආයතනය**

# අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් තුමාගේ පණිවිඩය

# හැඳින්වීම

9 වන ශ්‍රේණිය සඳහා 2010 දී ක්‍රියාත්මක කිරීමට යෝජිත ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශය කොටස් දෙකකින් සමන්විත ය. මෙහි පළමුවන කොටසට ජීවන නිපුණතා විෂය කොටස් අයත්වන අතර එම විෂය කොටස් නිපුණතා හයක් පදනම් කරගෙන අධ්‍යයනයට යොමු කිරීමට නියමිත ය.

ආත්මාවබෝධයෙන් කටයුතු කිරීම, තරගකාරී ලොව තුළ යහජීවනය ප්‍රගුණ කිරීම, ජීවන අවස්ථා හා අභියෝග හමුවේ ඵලදායී ව තීරණ ගැනීම, ආපදා කළමනාකරණය කිරීම, ගැටුම් සාමකාමී ව විසඳා ගැනීම, වැඩ ලෝකයට සූදානම් වීම, යන නිපුණතා ජීවන නිපුණතා විෂය කොටස් අධ්‍යයනය තුළින් සංවර්ධනය කිරීමට අපේක්ෂිත ය.  මීට අමතර ව ආරක්ෂක නිපුණතා විෂය නිර්දේශයේ ඇතුළත් ජීවන නිපුණතා කොටසට අදාළ ව විෂය අන්තර්ගතයන් හා ක්‍රියාකාරකම් ඉගෙනුම් ඉගැන්වීම් සඳහා යොදා ගන්න.

මෙම විෂය නිර්දේශයේ දෙවන කොටස පුරවැසි අධ්‍යාපනයට අදාළ ව ප්‍රධාන නිපුණතා හතරක් පදනම් කරගෙන ඉදිරිපත් කර ඇත.  සාමූහික ක්‍රියාකාරීත්වය තුළින් සමාජ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට ක්‍රියාකාරී ව දායක වීම, සමාජ යහපතට දායක වන තාක්ෂණික ආර්ථික හා සමාජ වෙනස්වීම්වලට අනුගත ව ක්‍රියා කිරීම, ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සාර්ථක ව පවත්වාගෙන යාමට සක්‍රීය ව දායක වීම, පොදු යහපතට හේතුවන පළාත් පාලන ආයතනවල කටයුතුවලට සහය දැක්වීම යන නිපුණතා සංවර්ධනය කිරීම මෙම විෂය සන්ධාරය අර්ථවත් ව අධ්‍යයනය කිරීමට සැලැස්වීම තුළින් අපේක්ෂා කෙරේ.

මෙම විෂය නිර්දේශයට අදාළ විෂය කරුණු අධ්‍යයනය කිරීම තුළින් යහපත් සමාජ ජීවිතයක් ගත කිරීමට හා අනාගත අභියෝගයන්ට මුහුණ දියහැකි පරපුරක් සමාජයට දායාද කිරීම ප්‍රධාන අපේක්ෂාව යි.  මෙම නිපුණතා සංවර්ධනය කිරීම සඳහා සිසුන් ඉගෙන ගන්නා විෂය කරුණු මෙන් ම, ඉගෙන ගන්නා ආකාරය ද (ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම් ක්‍රමවේද) ඉතා වැදගත්වන බැවින් ඒ සඳහා පන්ති කාමරයේ භාවිතයට සුදුසු ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම් ක්‍රමවේදයන් ද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයට ඇතුළත් කර ඇත.  ඒවා ආදර්ශ ක්‍රියාකාරකම් වන අතර පන්ති කාමරයට ගැළපෙන අයුරින් භාවිතයට ගැනීමටත් අදාළ නිපුණතා යෝග්‍ය ක්‍රියාකාරකම් නිර්මාණාත්මක ව සැලසුම් කර ක්‍රියාත්මක කිරීමටත් ඔබට නිදහස තිබේ.

පළමු ව සඳහන් කළ පරිදි මෙම විෂය නිර්දේශය කොටස් දෙකකින් යුක්ත වන බැවින් සතියක් තුළ එක් කාල පරිච්ඡේදයක් බැගින් ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය  සඳහා කාලච්ඡේද දෙක වෙන්කර ගැනීම සුදුසු ය.  ඒ අනුව එක්  සතියක් තුළ මෙම විෂය කොටස් දෙක ම ආවරණය විය යුතු ය.  මෙම විෂය නිර්දේශය පාසල්වාර තුන සඳහා ක්‍රියාත්මක කළ යුතු ආකාරය හඳුනා ගැනීමට පහත දැක්වෙන සටහන ඔබට උදව් කර ගත හැකි ය.

| විෂය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| I කොටස ජීවන නිපුණතා | I වාරය | 9.1.1, 91.2, 9.1.3, 9.1.4 | 08 |
| | II වාරය | 9.2.1, 9.2.2, 9.3.1, 9.3.2, 9.3.3, 9.4.1, 9.4.2 | 12 |
| | III වාරය | 9.5.1, 9.5.2, 9.5.3, 9.6.1, 9.6.2 | 10 |
| II කොටස පුරවැසි අධ්‍යාපනය | I වාරය | 9.1.1, 9.1.2, 9.1.3, 9.2.1, 9.2.2 | 08<br>04 |
| | II වාරය | 9.2.2, 9.2.3, 9.3.1, 9.3.2 | 04<br>04 |
| | III වාරය | 9.3.2, 9.3.3, 9.4.1, 9.4.2, 9.4.3 | 10 |

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ තෙවන කොටස ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම් උපකරණ සඳහා වෙන්කර ඇත. එක් වාරයක් සඳහා එවන් ඇගයීම් උපකරණ එක බැගින් මෙම මාර්ගෝපදේශ සංග්‍රහයට ඇතුළත් කර ඇත. අවශ්‍ය පරිදි අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා සංවර්ධනය කිරීමට හා මැන බැලීමට සුදුසු ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම් උපකරණ නිර්මාණය කර භාවිත කිරීමට ඔබට පිළිවන.

6,7,8,9 ශ්‍රේණිවල දී හැදෑරූ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය, 10, 11 ශ්‍රේණිවල දී පළමුවන විෂය කාණ්ඩය යටතේ තෝරා ගත හැකි විෂයක් ලෙස **පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය** විෂය නමින් අඛණ්ඩ ව ක්‍රියාත්මක වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සම්බන්ධ ව සංවර්ධනාත්මක යෝජනා තිබේ නම් අප වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණික ව ඉල්ලා සිටිමු. මෙම ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය සැකසීමේ දී නන් අයුරින් සහාය දුන් සැමට අපගේ ස්තුතිය හිමි වේ.

## ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

| | | | |
|---|---|---|---|
| **උපදේශනය** | : | මහාචාර්ය ලාල් පෙරේරා | (අධ්‍යක්ෂ ජනරාල්, ජා.අ.ආ) |
| **අධ්‍යක්ෂණය** | : | විමල් සියඹලාගොඩ මයා | (සහකාර අධ්‍යක්ෂ ජනරාල්, ජාඅ.ආ) |
| **සම්බන්ධීකරණය** | : | ඒ.එල්.එස්.අබේවික්‍රම මයා | (ව්‍යාපෘති නායක, ජා.අ.ආ) |
| | | එම්.කේ.කිංස්ලි ප්‍රියන්ත මයා | (ව්‍යාපෘති නිලධාරි, ජා.අ.ආ) |
| **ලේඛක මණ්ඩලය අභ්‍යන්තර** | : | ඒ.එල්.එස්.අබේවික්‍රම මයා | (ව්‍යාපෘති නිලධාරි, ජා.අ.ආ) |
| | | එම්.කේ.කිංස්ලි ප්‍රියන්ත මයා | (ව්‍යාපෘති නිලධාරි, ජා.අ.ආ) |
| | | එම්.පී. රංජනී ධනවර්ධන මිය | (ප්‍රධාන ව්‍යාපෘති නිලධාරිනි |
| | | ඩී.එම්.චන්දිමා නිෂානි ධර්මපාල මිය | (ව්‍යාපෘති නිලධාරි, ජා.අ.ආ) |
| | | ඩබ්.ඒ.කුමුදේන්ද්‍රි සුදර්ශනී මිය | (ව්‍යාපෘති නිලධාරි, ජා.අ.ආ) |
| | | යූ.ඒ. භද්‍රා ගුණතිලක මිය | (ව්‍යාපෘති නිලධාරි, ජා.අ.ආ) |
| | | එස්. කරුණාකරන් මයා | (සහකාර ව්‍යාපෘති නිලධාරි, ජා.අ.ආ) |
| **බාහිර** | : | | |
| | | ආචාර්ය එච්.ඩී.ඒ.බටුවිටගේ මිය | (විශ්‍රාමික අධ්‍යක්ෂ, ජා.අ.ආ) |
| | | සී.එස්. ජයසිංහ මයා | කළමනාකරු - ගුරු මධ්‍යස්ථානය, හොරණ |
| | | අයිරාංගනි රණසූරිය මෙනවිය | (උප පීඨාධිපති, ඌව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය) |
| | | එම්.එම්.ජී.සී. රත්නායක මිය | ගුරු සේවය 1, මහ/උසස් බාලිකා විද්‍යාලය, මහනුවර |
| | | ඒ. ඒ. කල්‍යාණවතී මෙවිය | (ගුරු උපදේශක, පිළියන්දල කලාපය) |
| | | ජේ. එම්.එම්. ජයසුන්දර මයා | (ගුරු උපදේශක, නිකවැරටිය කලාපය) |
| | | අතුල පී. මල්ලවආරච්චි මයා | (ගුරු උපදේශක, නිකවැරටිය කලාපය) |
| | | පී.පී.මාලිකා මිය | (ගුරු උපදේශක, හම්බන්තොට, කලාපය) |
| | | නන්දාවතී වන්නිආරච්චි මිය | (ගුරු උපදේශක, දික්වැල්ල, කලාපය) |
| | | නිලන්ත කුරුප්පු ආරච්චි මයා | (ගුරු සේවය, පොලේගොඩ මහ විදුහල, මහගම) |
| | | එස්.පී. පේමවතී මිය | (ගුරු සේවය 1, මාර/ ශාන්ත තෝමස් විදුහල, මාතර) |
| | | ලින්ටන් ධර්මදාස මයා | (ගුරු උපදේශක, හලාවත කලාපය) |

**භාෂා සංස්කරණය** : සුසිල් සිරිසේන මයා කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, හාපිටිගම

**පිටකවරය හා චිත්‍ර නිර්මාණය** : රවීන්ද්‍ර තේනුවර මයා (සහකාර ව්‍යාපෘති නිලධාරි, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය)

**පරිගණක අකුරු ඇමුණුම** : ශිරානි සමරක්කොඩි මිය (සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව)

**විවිධ සහාය** : ඒ.එල්.එස්.පී අතපත්තු මෙනවිය (සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව)
ආර්.එම්.රූපසිංහ මයා (සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව)
එම්.එන්.එෆ්. රිහානා මෙනවිය (සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව)

# පටුන


| | |
|---|---|
| සවිස්තර විෂය නිර්දේශය | 1 - 12 |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් | 13 - 14 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | 15 - 201 |
| තක්සේරුව හා ඇගයීම | 198 - 202 |
| ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම් උපකරණ | 203 - 210 |
| ඇමුණුම 1.1 | 211 - 213 |

## 2.0 විෂය අරමුණු ( 1 කොටස )

- තම හැකියා, දක්ෂතා, විභවතා හඳුනා ගනිමින් අනාගත ජීවන ඉලක්ක ගොඩ නගා ගැනීම
- එදිනෙදා කටයුතු මනා සැලසුමකින් හා සංවිධානාත්මක බවකින් ඉටු කිරීමට යොමුවීම
- චිත්තවේගී තත්ත්වයන්ට සාර්ථක ව මුහුණ දෙමින් ආතතිය අවම කර ගැනීම
- පෞරුෂ සංවර්ධනය සඳහා ක්‍රීඩාව, විනෝදාංශ හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරත වී විවේකය ඵලදායී ව ගත කිරීම
- යහපත් අන්තර් පුද්ගල සබඳතා පවත්වමින් සහානුභූතියෙන් යුතු ව කටයුතු කිරීම
- ඵලදායී සන්නිවේදන කුසලතා දියුණු කිරීම
- එදිනෙදා කටයුතුවල දී ධනාත්මක ආකල්පවලින් යුක්ත ව කටයුතු කිරීම
- විචාරශීලී චින්තනයෙන් හා නිර්මාණශීලී චින්තනයෙන් යුක්ත ව කටයුතු කිරීම
- නායකත්ව ගුණාංග ප්‍රගුණ කරමින් නායකත්වයට ගරු කිරීම
- ඵලදායී තීරණ ගැනීම මගින් ගැටලු විසඳීම
- ආපදා කළමනාකරණයට සක්‍රීය ව දායක වෙමින් ආපදා අවස්ථාවලින් වැළකීම හා අවම කර ගැනීම
- පුද්ගල මෙන් ම සමාජීය ගැටුම් අවම කර ගනිමින් කටයුතු කිරීම
- අනාගත වැඩ ලෝකයට සාර්ථක ව අනුගත වීම

## විෂය අරමුණු( II කොටස )

- බහුවිධ සමාජයක් තුළ එක්සත් බවින් යුක්ත ව ජීවත් වීමට අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම
- මානව ගුණාංග හා සමාජ සාරධර්ම රැක ගැනීම සඳහා යෝග්‍ය පුරවැසියන් බිහි කිරීම
- විනය ගරුක හා නීතිගරුක පුරවැසියකු සමාජයට දායාද කිරීම සඳහා යෝග්‍ය නිපුණතා වර්ධනය කිරීම
- පුද්ගල හා සමාජීය ක්‍රියාකාරකම්වල දී අන්‍යොන්‍ය සහයෝගයෙන් යුක්ත ව කටයුතු කිරීම
- ශ්‍රී ලංකාව හා ලෝකයේ පාලන රටා පිළිබඳ ව අවබෝධය ලබා දීම
- ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට හා මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තීන්ට අනුගත ව කටයුතු කරන සමාජයක් ගොඩ නැගීම
- නිරතුරු ව වෙනස් වන ලෝකයේ අනපේක්ෂිත හා ව්‍යාකූල අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම
- අන්‍යොන්‍ය වශයෙන් වගකීම් හා යුතුකම් අගයන සමාජයක් ගොඩ නැගීම
- සමාජයේ යහ පැවැත්ම සඳහා සමාජ සංස්ථා හා සංවිධාන යොදා ගැනීමට යොමු කිරීම

# 9 වන ශ්‍රේණිය - ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය - (1 කොටස)

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | යෝජිත කාලච්ඡේද |
|---|---|---|---|
| 9.1 ආත්මාවබෝධයෙන් කටයුතු කරයි. | 9.1.1 තමා තුළ ඇති බුද්ධිමය දක්ෂතා එළිදක්වයි. | විවිධ පුද්ගල හැකියා<br>• විවිධ පුද්ගල හැකියා දක්ෂතා හඳුනා ගැනීම<br>• සෑම පුද්ගලයෙක් සතුවම විවිධ වූ හැකියා දක්ෂතා ඇති බව<br>• හැකියා වැඩි දියුණු කර ගැනීම සඳහා භාවිත කළ හැකි අතිරේක ඉගෙනුම් ක්‍රම<br>උදා: * ජීවිත අත්දැකීම්<br>* පුහුණුව<br>* පොතපත<br>* විද්‍යුත් මාධ්‍ය<br>* සම්පත් පුද්ගලයන් හමුවීම<br>• තම සුවිශේෂී හැකියා පදනම් කර ගනිමින් අනාගත ජීවිත අරමුණු ගොඩ නැගීම<br>* පෞද්ගලික දියුණුව<br>* පෞරුෂය<br>* ජීවන වෘත්තිය | 03<br><br>01 |
| | 9.1.2 විවිධ ජීවිත අභියෝගවල දී සාර්ථක ව කටයුතු කරයි. | • ජීවත්වීමේ දී විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදු වීම හා එය ජීවිත ස්වභාවය බව<br>සෑම අභියෝගයක්ම ජීවිත සාර්ථකත්වයට තුඩු දෙන ශක්තියක් බවට පත් කර ගැනීම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | යෝජිත කාලච්ඡේද |
| --- | --- | --- | --- |
| | 9.1.3 දේශීයත්වය රැකගනිමින් විශ්ව ගම්මානයේ සාමාජිකයකු ලෙස සහජීවනයෙන් කටයුතු කරයි. | • ලෝකය පිළිබඳ පුළුල් දැක්ම<br>• ශ්‍රී ලංකාවේ දේශීය සංස්කෘතිය, නිෂ්පාදනය, දේශීයත්වය අර්ථාන්විත ව අගය කිරීම<br>• දේශීය රාමුවෙන් ඔබ්බට ගොස් අන්‍ය ශ්‍රේෂ්ඨ සංස්කෘතීන් හඳුනා ගැනීම හා ඒවායින් ඉගෙනීම<br><br>• සහජීවනය ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගැනීම<br><br>• අන්‍යොන්‍ය රැඳියාව<br>- කිසිම පුද්ගලයකුට, ජනවර්ගයකට, රටකට, ලෝකයේ තනි ව සිටිය නොහැකි බව | 02 |
| | 9.1.4 අවශ්‍ය තැන ස්ථිරසාරතාවයෙන් කටයුතු කරයි. | • ස්ථිරසාරතාව හඳුනාගැනීම<br>• තමා සමග ස්ථිරසාරතාව<br>• අනුන් සමග ස්ථිරසාරතාව<br>• තම හැඟීම් අවශ්‍ය තැන අවශ්‍ය පරිදි අවස්ථාවෝචිත ව සදාචාරාත්මක ව ප්‍රකාශ කිරීම<br><br>• සුභවාදී ආකල්පවලින් යුක්ත ව විචාරශීලී ව සෘජු ප්‍රතිපත්ති මත කටයුතු කිරීම | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | යෝජිත කාලච්ඡේද |
|---|---|---|---|
| 9.2 තරංගකාරී ලොව තුළ යහජීවනය ප්‍රගුණ කරයි. | 9.2.1 තරංගකාරී ලොව තුළ යහජීවන අවශ්‍යතාව විමර්ශනය කරයි. | • යහජීවනයක අවශ්‍යතාව<br>- පුද්ගල අභිරුචින්ගේ විවිධත්වය<br>- සංකීර්ණ ජීවන රටාව<br><br>• යහජීවන ගුණාංග<br>- සතුටින් සිටීම<br>- ලද දෙයින් සතුටු වීම<br>- සැහැල්ලු දිවි පැවැත්ම<br>- සුහද බව<br>- සමබර ව ජීවත්වීම | 02 |
| | 9.2.2 යහජීවනයට තුඩුදෙන ගුණාංග අනුගමනය කරයි. | • යහජීවන ගුණාංග අනුගමනය නොකිරීමෙන් මතුවන තත්ත්වයන්<br><br>• එළඹෙන තත්ත්වයන් හමුවේ යහජීවන ගුණාංග එදිනෙදා ජීවිතයට අදාළ කර ගැනීම | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | යෝජිත කාලච්ඡේද |
|---|---|---|---|
| 9.3 ජීවන අවස්ථා හා අභියෝග හමුවේ ඵලදායී ව තීරණ ගනියි. | 9.3.1 ජීවිතයේ විවිධ අභියෝග හා අවස්ථා විමර්ශනය කරයි. | • අභියෝගය හඳුනා ගනියි<br>- යම් අරමුණක් සාර්ථක ලෙස ඉටුකර ගැනීමේ දී එල්ලවන බාධක හෝ සීමා හමුවේ ඒවා ජය ගැනීමට ඇති වන අචල අධිෂ්ඨානය අභියෝගය බව<br>• අභියෝග අවස්ථා<br>- තමාට, තම පවුල, පාසල, සමාජය තුළ, වෙනත් අවස්ථා | 02 |
| | 9.3.2 විවිධ අභියෝගවල දී නායකත්ව ලක්ෂණ ප්‍රගුණ කරයි. | • බාධක ජය ගැනීමේ නිර්මාණශීලී ක්‍රම අත්හදා බැලීම<br>• විකල්ප විමසා බැලීම | 01 |
| | 9.3.3 ජීවිතයේ විවිධ ගැටලු, අවස්ථා හා අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙයි. | • අප මුහුණ දෙන විවිධ අනතුරු හඳුනා ගැනීම<br>• අනතුරු හා විපත් සිදුවිය හැකි ස්ථාන වර්ගීකරණය<br>- නිවස<br>- පාසල<br>- අවට පරිසරය<br>- වැඩබිම | 02 |
| 9.4 ආපදා කළමනාකරණය කරයි. | 9.4.1 විපත් හා අනතුරු කෙරෙහි සවිඥානක වෙයි. | • ස්ථානීය අනතුරු හැරුණු විට වෙනත් අනතුරු වන අවස්ථා<br>• ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් හේතු කොටගෙන සිදුවන විපත් හා අනතුරු<br>• ආහාර හා ඖෂධ සම්බන්ධ විපත්/ අනතුරු<br>• අහිතකර පුරුදු නිසා සිදුවන අනතුරු | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | යෝජිත කාලච්ඡේද |
|---|---|---|---|
| | 9.4.2 අනතුරු හා විපත්වල දී බුද්ධිමත් ව කටයුතු කරයි. | • අනතුරු වළක්වා ගැනීමට කළ යුතු ක්‍රියාමාර්ග<br>• අදාළ ආයතන පිළිබඳ දැනුවත් වීම<br>- රෝහල, පොලීසිය, ගිනිනිවන මධ්‍යස්ථානය<br>- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය<br>- වෙනත් ආයතන<br>• ඒ ඒ අනතුරු අවස්ථාවලට අදාළ ව උපක්‍රමශීලි ව මනා සිහියකින් යුක්තව කටයුතු කිරීම | 01 |
| 9.5 ගැටුම් සාමකාමී ව විසඳයි. | 9.5.1 ගැටුම්වල ස්වභාවය විග්‍රහ කරයි. | • ගැටුම් නිර්වචනය කිරීම<br>• ගැටුම්වල ස්වභාවය හඳුනා ගැනීම<br>• ගැටුම් විග්‍රහ කිරීම<br>- හේතු<br>- ලක්ෂණ | 02 |
| | 9.5.2 බාධක ජයගනිමින් ගැටුම් විසඳීමට පෙළඹෙයි. | • ගැටුම් නිරාකරණයෙහි බාධක<br>- දෘඩි ස්ථාවර බව<br>- එකම විසඳුමක රැඳී සිටීම<br>- අනෙක් පාර්ශවය පරදවා තමා ජය ගැනීමට සිතීම<br>• ගැටුම් නිරාකරණයක හොඳ ලක්ෂණ හඳුනා ගැනීම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | යෝජිත කාලච්ඡේද |
|---|---|---|---|
| | | • ගැටුම් නිරාකරණ කුසලතා<br>- සහමන්ත්‍රණය<br>- සහානුභූතික සවන් දීම<br>- ගැටුම් විග්‍රහය<br>- විකල්ප විසඳුම් හඳුනා ගැනීම<br>- ස්ථිරසාර ප්‍රතිචාරය | 02 |
| | 9.5.3 ගැටුම් සමථකරණය කරයි. | • සමථකරණය හැඳින්වීම<br>- ගැටුම් විසඳීමට තෙවන පාර්ශ්ව කරුවකුගේ සහය ලබා ගැනීම<br><br>• සමථකරණයේ පියවර<br>- අපක්ෂපාතී ව ගැටුම විසඳා ගැනීමට සහය දෙන්නකු හැටියට ඉදිරිපත් වීම<br>- ගැටුම අධ්‍යයනය කිරීම<br>- වෙන් වෙන් ව පාර්ශ්ව සමඟ සාකච්ඡා කිරීම<br>- විකල්ප විසඳුම් ඉදිරිපත් කිරීමට දෙපාර්ශ්වය පෙළඹවීම.<br>- දෙපර්ශ්වයට පිළිගත හැකි විසඳුම් සඳහා දෙපාර්ශ්වය ම පෙළඹ වීම<br>- එය ක්‍රියාත්මක කරන ආකාරය යෝජනා කිරීම | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | යෝජිත කාලච්ඡේද |
|---|---|---|---|
| 9.6 වැඩ ලෝකයට සුදානම් වෙයි. | 9.6.1 විවිධ වෘත්තීන් හඳුනාගෙන තම ලැදියා හා දක්ෂතා අනුව අභිලාෂ වෘත්තියක් තෝරා ගැනීමට පෙළඹෙයි. | ● ජීවන වෘත්තිය තෝරා ගැනීම<br>- තම බුද්ධිමය හැකියා, ලැදියා සහජ දක්ෂතා හඳුනාගෙන එයට යෝග්‍ය වූ වෘත්තියක් ඉලක්ක ගත කිරීම<br>- තෝරා ගන්නා වෘත්තිය ඇසුරින් පසුබිම් තොරතුරු ගවේෂණය කිරීම<br>- නැඹුරු වීමට අදාළ වෘත්තියකට අදාළ ව මූලික කුසලතා වර්ධනයට පෙළඹවීම<br>- මූලික පුහුණුවීම් ලබා ගැනීමට යොමු වීම<br>- ස්වයං රැකියා අවස්ථා කෙරෙහි යොමු වීම<br>- කාර්යක්ෂම ව හා ඵලදායී ව ස්වයං රැකියා නිෂ්පාදනවල ගුණාත්මකභාවය වර්ධනය කිරීමට පෙළඹවීම<br>- තම වෘත්තීය නැඹුරුවට අනුව අනාගතයේ රැකියාවක් තෝරා ගැනීමට යොමු කරවීම | 02 |
| | 9.6.2 වෘත්තීය සංවර්ධනයට අවශ්‍ය ආකල්ප වර්ධනය කරගනියි. | - කාර්යක්ෂමතාව<br>- ඵලදායිතාව<br>- ශ්‍රමාභිමානය<br>- භාණ්ඩ හා සේවාවල ගුණාත්මක භාවය<br>- තම සේවාවන් විශිෂ්ඨ ලෙස සැපයීමට පෙළඹවීම | 02 |

## 9.1 අප ජීවත් වන සමාජය (11 කොටස)

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | යෝජිත කාලච්ඡේද |
|---|---|---|---|
| 9.1 සාමූහික ක්‍රියාකාරිත්වය තුළින් සමාජ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට ක්‍රියාකාරී ව දායක වෙයි. | 9.1.1 සමාජ සුරක්ෂිතතාව කෙරෙහි පුද්ගල යුතුකම් හා වගකීම් ඉටු කරයි. | 9.1.1 සමාජ සුරක්ෂිතතාව<br>- සමාජය හා පුද්ගලයා අතර සම්බන්ධතාව<br>- සමාජ සුරක්ෂිතතාව හැඳින්වීම<br>- සමාජ සුරක්ෂිතතාව කෙරේ දායකත්වය<br>- පවුල, පාසල, ආගමික ආයතන, සමාජ ආයතන | 08 |
| | 9.1.2 සමාජ සුරක්ෂතතාවට දායකවන විවිධ ආයතන හඳුනා ගෙන අභිමානවත් පුරවැසියෙකු ලෙස සහයෝගයෙන් කටයුතු කරයි. | 9.1.2 සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා යොදා ඇති යාන්ත්‍රණ, නීතිරීති හා බැඳුණු පුද්ගල වගකීම්<br>• පොලීසිය<br>• ආරක්ෂක හමුදා | |
| | 9.1.3 සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ වී සහජීවනයෙන් යුතු පුරවැසියෙකු ලෙස කටයුතු කරයි. | 9.1.3 - සමුපකාර ව්‍යාපාරය හැඳින්වීම<br>- සමුපකාර ව්‍යාපාරයේ වර්තමාන කාර්යභාරය<br>- විවිධ සේවා සමුපකාර සමිති හා පාසල් සමුපකාර සමිති | |

## 9.2 කාලීන සමාජ වෙනස්වීම්

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | යෝජිත කාලච්ඡේද |
|---|---|---|---|
| 9.2 සමාජ යහපතට දායක වන තාක්ෂණික ආර්ථික හා සමාජ වෙනස්වීම්වලට අනුගත ව ක්‍රියා කරයි. | 9.2.1 කාලීන වෙනස්කම් ඇසුරින් පුද්ගල හා සමාජ සංවර්ධනයට බලපාන වෙනස්වීම් විමර්ශනය කරයි. | 9.2.1 තාක්ෂණික වෙනස්වීම් හා ඒවාට දක්වන ප්‍රතිචාරවල වැදගත්කම<br>- තාක්ෂණික වෙනස්වීම් හැඳින්වීම<br>- විවිධ ගවේෂණ, පර්යේෂණ මගින් ඇති වන නව සොයා ගැනීම්<br>- තාක්ෂණික වෙනස්වීම් සමඟ ඇතිවන සමාජ වෙනස්වීම්<br>- නිර්මාණශීලී පුරවැසියෙකු වශයෙන් තාක්ෂණික වෙනස්වීම් යොදා ගැනීමේ වැදගත්කම | 08 |
| | 9.2.2 ආර්ථිකයේ සිදුවන වෙනස්වීම් වලට අනුගත ව ක්‍රියා කරයි. | 9.2.2 ආර්ථිකයේ සිදුවන වෙනස්වීම්<br>- කෘෂි අංශය<br>- කාර්මික අංශ<br>- සේවා අංශ | |
| | 9.2.3 නව රැකියා වෙළෙඳපොළට ගැලපෙන පරිදි තම දක්ෂතා හා හැකියා හඳුනා ගෙන ඒවා වර්ධනය කර ගැනීමට කටයුතු කරයි. | 9.2.3 රැකියා වෙළෙඳපොළ හා බැඳුණු නව ප්‍රවණතා | |

## 9.3 පාලනය සඳහා ජනතා සහභාගිත්වය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | යෝජිත කාලච්ඡේද |
|---|---|---|---|
| 9.3 ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක ව පවත්වා ගෙන යාමට සක්‍රිය ව දායක වෙයි. | 9.3.1 ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මුලික අංග ලක්ෂණ විශ්ලේෂණය කරයි. | 9.3.1 ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මුලික ලක්ෂණ<br>- ප්‍රජාතන්ත්‍රවාදය හැඳින්වීම<br>- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මුලික ලක්ෂණ සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවත්නා රටවලට උදාහරණ<br>- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට අවශ්‍ය අංග | 08 |
| | 9.3.2 ජන සමාජයක එක්සත් බව ඇති කිරීමට දේශපාලන පක්ෂ මගින් ඉටු කළ යුතු කාර්යභාරය අගය කරයි. | 9.3.2 දේශපාලන පක්ෂ<br>- දේශපාලන පක්ෂ හැඳින්වීම<br>- ජන සමාජයක එක්සත්බව ඇති කිරීම සඳහා දේශපාලන පක්ෂ මගින් ඉටුකළ යුතු කාර්යභාරය | |
| | 9.3.2 ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක යහපත් පුරවැසියෙකු ලෙස තම වගකීම් හා යුතුකම් ඉටුකරයි. | 9.3.3 ඡන්ද බලය හා මැතිවරණ<br>- ජනතාව පාලනයට සහභාගී වන අවස්ථා<br>- සර්ව ජන ඡන්ද බලය සහ එහි වැදගත්කම<br>- මැතිවරණ, මැතිවරණ සම්බන්ධ ජනතා අයිතිවාසිකම් හා යුතුකම් | |

## 9.4 පළාත් පාලන ආයතන හා ජනතා සහභාගිත්වය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | යෝජිත කාලච්ඡේද |
|---|---|---|---|
| 9.4 පොදු යහපතට හේතුවන පළාත් පාලන ආයතන වල කටයුතුවලට සහය දක්වයි. | 9.4.1 තම ප්‍රදේශයට පළාත් පාලන ආයතනවලින් සිදුවන සේවා පිළිබඳ විමර්ශනය කරයි. | 9.4.1 පළාත් පාලනය හැඳින්වීම<br>පළාත් පාලන ආයතනවලට නියෝජිතයින් තෝරා පත් කර ගන්නා ආකාරය | 06 |
| | 9.4.2 පළාත් පාලන ආයතනවල සේවා හා සම්බන්ධ මහජන වගකීම් හා යුතුකම් ඉටු කරයි. | 9.4.2 පළාත් පාලන ආයතනවල ව්‍යුහය බලතල හා කාර්යයන් | |
| | 9.4.3 පළාත් පාලන ආයතනයක සේවා කාර්යක්ෂම ව ඉටු කිරීමට ජනතා සහභාගිත්වයේ ඇති වැදගත්කම අගය කරයි. | 9.4.3 පළාත් පාලන ආයතනවල සේවා හා සම්බන්ධ මහජන වගකීම් සහ යුතුකම් | |

# 3.0 පාසල් ප්‍රතිපත්ති හා පාසල් වැඩ සටහන්

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය පාසල තුළ ක්‍රියාත්මක කිරීමේ දී එය පන්ති කාමරයට සීමා නොවී අවශ්‍ය සැම අවස්ථාවක දී ම, සිසුන් ජීවිත අත්දැකීම් ලැබෙන ක්‍රියාකාරකම් සඳහා යොමු කිරීම වැදගත් වේ. විෂය සමගාමී ක්‍රියාකාරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම්වල දී දරු දැරියන් තුළ විවිධ ක්ෂේත්‍රවලට අයත් නිපුණතා සංවර්ධනය කිරීමට එය මහඟු පිටිවහලක් වනු ඇත. තීරණ ගැනීම, නායකත්වය, සහභාගිත්වය, සංවිධානය, සැලසුම්කරණය ආදී විවිධ කටයුතුවල දී හැකි ආකාරයෙන් සිසුන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. විශේෂයෙන් පාසල තුළ ක්‍රියාත්මක වන සැඟවුණ විෂයමාලා ව ක්‍රියාත්මක වීමේ දී විදුහල්පතිතුමා ඇතුළු පාසලේ පරිපාලනයට සම්බන්ධ සියලු දෙනා ම දරු දැරියන් තුළ ජීවන නිපුණතා සංවර්ධනය කිරීමට උචිත වැඩ කටයුතු සැලසුම් කිරීම වැදගත් වේ.

මීට අමතර ව විවිධ සමාජ සේවා හා සුභ සාධක කටයුතුවල සිසුන් නිරත කරවීම සඳහා පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් නවීකරණය වීම අවශ්‍ය ය. විශේෂයෙන් ගුරු, දෙමාපිය, ප්‍රජා වැඩ සටහන්වල දී සිසු දායකත්වය හා මඟ පෙන්වීම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු පාසල් ප්‍රතිපත්ති තුළ අන්තර්ගත විය යුතු වේ. එමෙන් ම පාසල තුළ **"මගේ හොඳ වැඩ පොත"** නමින් දින පොතක් සැම සිසුවකු ලවා ම පවත්වා ගෙන යාමට මඟ පෙන්වීම කළ හැකි ය. මෙය වරින් වර පරීක්ෂා කිරීම මගින් සිසුන් තුළ පෙළඹවීමක් ඇති කිරීම වැදගත් වේ.

විශේෂයෙන් ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපන සංකල්ප මෙම විෂය උගන්වන ගුරුවරයා මෙන් ම අනෙකුත් විෂයන් උගන්වන ගුරුවරුන් මගින් ද සංවර්ධනය කිරීම පාසල් ප්‍රතිපත්තිවලට ඇතුළත් කළ යුතු ය. ඔවුන්ගේ සහාය ද ඒ සඳහා ලබා ගැනීම සුදුසු ය. එසේ ම මෙම විෂය සම්බන්ධ ව සහාය ලබා දෙන බාහිර ආයතන හා පුද්ගලයින්ගේ උපකාරක දායකත්වය ලබා ගැනීමට යොමු කළ යුතු ය. පන්ති කාමරයේ දීත්, පන්ති කාමරයෙන් බැහැර ව විවිධ අවස්ථාවන්හි දීත් ක්‍රීඩාපිටිය, පුස්තකාලය, ආපනශාලාව, නේවාසිකාගාරය, පොදු ස්ථාන, උදේ රැස්වීම යන පාසල් විවිධ කාර්යස්ථානයන් හි දී ශිෂ්‍යයන්ගේ හැසිරීම් රටා තුළින් නිපුණතා ප්‍රදර්ශනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම විෂයයේ ඉගෙනුම් ඵල ලෙස පාසලේ විනය ගැටලු අඩු වීම මෙන් ම සිසුන් ප්‍රීතියෙන් ඉගෙනීමේ යෙදෙන ප්‍රියජනක පරිසරයක් නිර්මාණය වීම සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පාසල පවතින්නේ මානව වර්ගයාට සාමානාත්මතාවෙන් යුක්ත ව සේවය කිරීමට ය. ලෝක වාසීන් පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම මිනිස් ජීවිතයට හා මිනිස් වර්ගයාට ගෞරව කිරීම උගන්වන්නේ පාසලෙනි. එසේ ම යහපත් ආකල්පවලින් යුක්ත වූ ද යහපත් චර්යාවලින් හෙබි පුද්ගලයින් බිහි කිරීම ද පාසල සතු වගකීමක් වෙයි. මානව වර්ගයාට සංවර්ධනය විය.

හැක්කේ එකමුතුකම හා සාමූහික ප්‍රයත්න තුළින් පමණක් වන අතර ඒ සඳහා පදනම වැටෙන්නේ ද පාසල තුළිනි. එ බැවින් පුරවැසි අධ්‍යාපනය යන විෂය පාසල්වල අනිවාර්යයෙන් ඉගැන්විය යුතු විෂයයක් වන්නේ ය.

විෂය නිර්දේශයේ අන්තර්ගතය වඩා සාර්ථක ඉගෙනුම් අත්දැකීම් බවට පත් කිරීම සඳහා සෑම ශිෂ්‍යයකුට ම සහභාගි විය හැකි ප්‍රදේශයට ගැළපෙන වාර්ෂික වැඩ සටහනක් සම්පාදනය කිරීම පාසල් අධිකාරීන්ගේ වගකීමකි. වසර ආරම්භයේ දී ප්‍රායෝගික ව ක්‍රියාත්මක කළ හැකි වැඩ සටහනක් සකස් කිරීම ප්‍රයෝජනවත් වේ. එවැනි වැඩ සටහනකට ඇතුළත් කළ හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක් වේ.

- ක්ෂේත්‍ර වැඩ සටහන් හා අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම
- කුඩා පරිමාණයේ ව්‍යාපෘති ආරම්භ කිරීම
- දැනුම මිනුම වැඩ සටහන්, විවාද හා ප්‍රදර්ශන පැවැත්වීම
- බිත්ති පුවත්පත් හා වාර ප්‍රකාශන පළ කිරීම
- ප්‍රදේශයේ පිහිටුවා ගෙන ඇති වෙනත් සංවිධාන සමග එක් ව කටයුතු කිරීම
- ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමග කටයුතු කිරීම
- සම්පත් පුද්ගලයින්ගේ සහභාගිත්වයෙන් වැඩමුළු පැවැත්වීම

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

# හැඳින්වීම

මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කර ගෙන සිසු නිපුණතා ගොඩ නැගීමට හැකි වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව ( TRANSMISSION ROLE ) හා පසු කාලීන ව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (TRANS-ACTION ROLE ) වර්තමාන පන්ති කාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැර යන දරු දැරියන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතාවල අද දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන විට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත්, එය සිදුවිය යුතු ආකාරයත් හඳුනා ගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත් වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් ව දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමඟ ඇති කර ගන්නා දෙබස සංවාදාත්මක ගුරු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් සිසුන්ට හා සිසුන්ගෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතර ව සිසු - සිසු අන්තර් ක්‍රියා ද පසුව ඇති වීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළේ. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙනයාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයකුගේ (RESOURCE PERSON ) තත්ත්වයට පත් වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම් හා ඉගැන්වීම් දීර්ඝ කිරීම සඳහා ඇගයීම් උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටුවිය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොට ගත් ගුරු භූමිකාව පරිණාමන ගුරු භූමිකාව (TRANSFORMATION ROLE) ලෙස නම් කර තිබේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලබන විස්තරාත්මක විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. මේ සෑම ක්‍රියාකාරකමක් ම අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල පළමුවන පියවර මඟින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර (ENGAGEMENT STEP ) වශයෙන් නම් කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනු දෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය

කරමින් දෙබසකට මුල පුරයි. පසුව සංවාදයකට පරිවර්තනය වන මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතාව හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකමේ ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුන්ට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතු ව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම, පින්තූර පුවත්පත් දැන්වීම් හා සැණ පත් ( FLASH CARDS) වැනි උත්තේජක යොදා ගැනීම, ගැටලු ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයනය භාවිතය, දෙබස් භූමිකා රංගන, කවි, ගීත හා ආදර්ශන (DEMON-STRATIONS ) ශ්‍රව්‍ය දෘශ්‍ය පට යොදා ගැනීම මෙහි දී ගුරුවරයා සතු ව ඇති උපක්‍රම කිහිපයකි. සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීම මුල් කොට ක්‍රියාකාරකම්වල පළමු වන පියවර ක්‍රියාත්මක වේ.

- පන්තියේ අවධානය දිනා ගැනීම
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුන්ට හඳුන්වා දීම

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය (EXPLORATION )සඳහා සිසුන්ට අවස්ථාව ලබා දීමට ය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කරගෙන ය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුන්ට හැකි වන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදු වේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතු ව කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන් දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුන්ට උදව්වීම, කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමට ද සිසුන්ට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතු ය. සැඟවුණු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුන්ට හිමි වේ.

ක්‍රියාකාරකමේ තෙවන පියවරේ දී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් දිරිමත් කිරීමට ය. සෑම සාමාජිකයෙකුට ම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායක ය. සිසු අනාවරණ පැහැදිලි කිරීම ( EXPLANATION) හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ පන්ති කාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීම ය.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේ දී සොයා ගැනීම් පැහැදිලි කිරීමෙන් අනතුරු ව වැඩි දියුණු කිරීමට නැත්නම් විස්තාරණයට (ELABORATION ) සිසුන් යොමු කිරීමට අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායම්වල සිසුන්ට දෙවනුව ද මේ සඳහා අවස්ථාව ලැබේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය යොමු වන්නේ ගුරුවරයාට ය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේ මෙම සාමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් අපේක්ෂිත අරමුණු සාර්ථක ව ඉටු වන්නේ දැයි නිරතුරු ව සොයා බැලීම මෙම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම වේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුව හා ඇගයීම් යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ම ලබා ගැනීමට සැලසුම් කළ ක්‍රියාකාරකම් මගින් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ දෙවන පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් (ASSESSMENT ) ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරීම හා විස්තාරණයට යොමු වන විට ඇගයීමටත් (EVALUATION ) ගුරුවරයාට ඉඩ තිබේ. තක්සේරුව හා ඇගයීම් පිළිබඳ විස්තරාත්මක විමසුමක් මෙම ලේඛනය යටතේ මතු දැක්වේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමන භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහි දී කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමුවන විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ ඉදිරිපත් වන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතර ව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත් වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වය ලෙස සඳහන් කළ හැකි වේ.

## යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශය හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මෙහෙයවීමේ දී, ගුරුවරයා විසින් ඉගැන්වීමට වඩා සිසුන්ට ඉගෙනීමට අවස්ථාවන් සලසා දීම වැදගත් වේ. මෙම විෂය මගින් අපේක්ෂා කරන ආකාරයට පුද්ගල සංවර්ධනය මගින් සමාජ සංවර්ධනයට දායකත්වය ලබා දීමට දරු දැරියන් තුළ නිපුණතා සංවර්ධනය කළ යුතු බැවින් එකී හැකියා වර්ධනයට ඉගෙනුම් ඉගැන්වීම් පරිසරයක් නිර්මාණයවීම අතිශයින් වැදගත් වේ.

නව විෂය ක්ෂේත්‍රය තුළ ඉගෙනුම්-ඉගැන්වීම් උපාය මාර්ග වඩාත් නම්‍යශීලී විය යුතු අතර දේශන හා සාකච්ඡාවලට වඩා ව්‍යවහාරික සමාජයට වඩාත් උචිත සජීවී ජීවන අත්දැකීම් ලබා දීම යෝග්‍ය වේ.

විශේෂයෙන් සහයෝගී කණ්ඩායම් ක්‍රම මගින් ඉගෙනුම් අත්දැකීම් ලබා දීම මගින් දරු දැරියන් තුළ සමාජ කුසලතා වර්ධනය කිරීම අපේක්ෂිත යි. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පන්ති කාමරය, පාසල් සමාජය, පාසල් පරිසරය, අවට පරිසරය හා අවට සමාජ ආයතන, සජීවී ඉගෙනුම් අත්දැකීම් ලබා දීම සඳහා යොදා ගත හැකි ය.

මෙවැනි ඉගෙනුම් - ඉගැන්වීම් පරිසර තුළ දී නිරීක්ෂණය, සිද්ධි අධ්‍යයනය, ක්‍රීඩා, භූමිකා රංගන, සම්මුඛ සාකච්ඡා, සමීක්ෂණ, ගවේෂණ, ස්වයං අධ්‍යයන, අත්හදා බැලීම්, බුද්ධි කලම්බන සාකච්ඡා, ප්‍රදර්ශන, ව්‍යාපෘති, ක්ෂේත්‍ර අධ්‍යයන වැනි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම ගුරුවරයාට අභිමත පරිදි යොදා ගත හැකි ය.

දීර්ඝ කාලයක් තිස්සේ පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රමුඛ ස්ථානයක් ගත් දේශන ක්‍රමය තව දුරටත් වැදගත් ඉගැන්වීමේ උපාය මාර්ගයක් වශයෙන් පවත්වා ගෙන යාම මෙහි දී අවධාරණය නොකෙරේ. ශිෂ්‍යශිෂ්‍යාවන් තරගකාරී අධ්‍යාපනික පරිසරයක් කරා මෙහෙයවීම වෙනුවට සාමූහිකත්වය හා වැඩ ලෝකයට අදාළ නිපුණතා වර්ධනය කරන, ප්‍රීතිදායක ඉගෙනුම් පරිසරයක් ඇති කරන ස්වයං අධ්‍යයනයට පොළඹවන ඉගෙනුම් ක්‍රමවේද කෙරෙහි අපගේ අවධානය යොමු විය යුතු ය. පුරවැසි අධ්‍යාපනය විෂයයෙන් අවසන් වශයෙන් අපේක්ෂා කෙරෙන්නේ මිනිස් ගුණධර්මවලින් හෙබි සාමකාමී සහජීවනයෙන් යුත් අනාගත පරපුරක් බිහි කිරීම ය. මේ අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ශිෂ්‍යයාට පන්ති කාමරයේ උගත් කරුණු ජීවිත අත්දැකීම්වලට සම්බන්ධ කර ගැනීමට අවස්ථා ලබා දිය යුතු අතර ඒ සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය වෙයි. එබැවින් විෂය කරුණු ඉගැන්වීමට වඩා ප්‍රායෝගික අත්දැකීම් පෙරදැරි කර ගෙන ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම යන ස්වාධීන පන්ති කාමර ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ය. පාසලෙන් බාහිර ආයතන හා පුද්ගලයින් සමග සබඳතා පවත්වා ගැනීමෙන් සිසුන්ගේ සමාජමය කුසලතා වර්ධනය

වේ. ප්‍රජාතන්ත්‍රවාදී අගයන් හා සම්බන්ධ චර්යාමය රටා වර්ධනය වන ආකාරයේ ඉගෙනුම් සිද්ධි මගින් අත්දැකීම් වර්ධනය කිරීම පිණිස පන්ති කාමරයෙන් බැහැර ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කිරීම එම ක්‍රියාකාරකම් ශිෂ්‍යයාගේ වයස් මට්ටමට ගැළපෙන පරිදි සංවිධානය කිරීම සඳහා ගුරු භවතුන් විසින් මනා සැලැස්මක් සකස් කර ගැනීම කළ යුතු ය.

කරුණු ඉගැන්වීමට වඩා ස්වයං අධ්‍යයනයට, නිරීක්ෂණයට, තොරතුරු රැස් කිරීමට හා ඒවා විශ්ලේෂණය කිරීමට, කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීමට සහ ශිෂ්‍ය පෞරුෂ වර්ධනයට අදාළ වන නායකත්වයට ගරු කිරීම, නායකත්වය ඉසිලීම, අන්‍ය මත ඉවසීම, විනීත හා විනය ගරුක ව හැසිරීම පිළිබඳ ලක්ෂණ ශිෂ්‍යයන් තුළ වර්ධනය කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැදගත් වෙයි. ඒ සඳහා පන්ති කාමරය තුළ දී හා ඉන් පිටත ද ගුරු මග පෙන්වීම වැදගත් වේ. පහත දැක්වෙන ඉගෙනුම් ක්‍රමවේද පුරවැසි අධ්‍යාපනය විෂය ඉගැන්වීම සඳහා යෝජනා කරනු ලැබේ. ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ හා සේවාස්ථ පුහුණු කාර්ය සැසි ඇසුරෙන් ලබා ගැනීම මැනවි.

- නිරීක්ෂණය
- ගවේෂණය
- සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු රැස් කිරීම
- තොරතුරු විශ්ලේෂණය කිරීම
- ක්ෂේත්‍ර වැඩ
- ළමා පාර්ලිමේන්තුව, (එක් එක් අමාත්‍යාංශ හා විවිධ ජනවර්ග නියෝජනය වන පරිදි පාර්ලිමේන්තුවේ සංයුතිය සකස් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. එක් එක් පක්ෂ හෝ ජනවර්ග නියෝජනය වන පරිදි පාර්ලිමේන්තු සභාවාරයේ කටයුතු සකස් කර ගනිමින් වර්තමාන පාර්ලිමේන්තුවේ ආදර්ශයකට අනුව ළමා පාර්ලිමේන්තුව සකස්කර ගැනීමට කටයුතු කරන්න.)
- සුභ සාධක සමිති සමාගම්, ශ්‍රමදාන හා ශ්‍රමාභිමානී කඳවුරු, ශිෂ්‍ය බාල දක්ෂ කඳවුරු
- ගිලානෝපස්ථානය
- අපදා කළමනාකරණයට දායක වීම
- විවිධ සමිති සමාගම්, සමාජ සුභසාධනය, පරිසරය සුරැකීම, පෞරාණික සම්පත් සුරැකීම
- ව්‍යාපෘති
- ගැටලු විසඳීමේ ක්‍රමය
- විමසුම් ඉගැන්වීමේ ක්‍රමය
- ප්‍රශ්නෝත්තර ක්‍රමය
- බිත්ති පුවත්පත්
- ප්‍රදර්ශන

# ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය
# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
# I කොටස - ජීවන නිපුණතා

# 9.1 ආත්මාවබෝධයෙන් කටයුතු කරයි

## හැඳින්වීම

දරුවකු මෙලොව එළිය දකින්නේ උපතින් ම විවිධ බුද්ධිමය ශක්තීන් රැසක් සමගිනි. ක්‍රමයෙන් බිළිඳා වැඩෙත් ම එම ශක්තීන් තම කුසලතා හැකියා බවට පත්වන්නට පටන් ගනියි. පුද්ගල පෞරුෂ වර්ධනයේ දී ඔහු සතු කායික, බුද්ධිමය, සමාජමය, හා අධ්‍යාත්මික හැකියාවන් කුඩා කළ සිට හඳුනා ගනිමින් වර්ධනය කළ යුතු ව ඇත. " දැනුම " පමණක් වර්ධනය කිරීම ඉලක්ක කරගත් ක්‍රමයක් වෙනුවට සෑම ක්ෂේත්‍රයක ම වර්ධනයක් ඇති කිරීම අත්‍යවශ්‍ය වේ.

නූතන මනෝ විද්‍යාඥයින්ට අනුව එක ම පුද්ගලයෙකු තුළ බුද්ධිය විවිධාකාර වේ. සහජ පිහිටීම අනුව සෑම පුද්ගලයෙක් ම කිසියම් ක්ෂේත්‍රයකට සුවිශේෂී හැකියාවක් දක්වති. ඇතැම් අයෙක් ක්ෂේත්‍ර කීපයකට හැකියාවක් දක්වති. ඉතාම අල්ප පිරිසක් ක්ෂේත්‍ර සියල්ලේ ම කුසලතා ප්‍රදර්ශනය කරති. එහෙත් එම සියලු ම කුසලතා මතුවන්නේ සහජයෙන් ලද බුද්ධිමය හැකියාවන් පරිසර අවස්ථාවන් සමග ගළපමින් ඔප් නැංවීමෙන් පමණි. එබැවින් ගුරු භවතුන් විසින් එම බුද්ධිමය හැකියාවන් දරුවන් තුළින් හඳුනාගෙන වර්ධනය කළ යුතු ය.

**නිපුණතාව** :- ආත්මාවබෝධයෙන් කටයුතු කරයි.
**නිපුණතා මට්ටම** :- තමා තුළ ඇති බුද්ධිමය දක්ෂතා එළිදක්වයි.
**විෂය අන්තර්ගතය** :-

- විවිධ පුද්ගල හැකියා හා දක්ෂතා හඳුනා ගැනීම
- සෑම පුද්ගලයෙක් ම සතු ව ම විවිධ වූ හැකියා හා දක්ෂතා ඇති බව
- පුද්ගල හැකියා හා දක්ෂතා හඳුනා ගැනීමේ වැදගත්කම
- පුද්ගල හැකියා පිළිබඳ ව අප තුළ පවතින සාම්ප්‍රදායික නිර්ණායක ඇති බව
- වර්තමාන සංකීර්ණ සමාජ සංස්කෘතිය තුළ මතු වී ඇති විවිධ ක්ෂේත්‍රවලට ද අදාළ ව විවිධ බුද්ධිමය හැකියා හඳුනා ගැනීමේ වැදගත්කම
- ඇමුණුම 1.1 පිටු අංක 211-213 හි සඳහන් හොවාර්ඩ් ගාඩ්නර් ( Howard Gardner 1983 )විසින් දක්වන ලද බහුවිධ බුද්ධිමය මාන 8 සිසුන්ගේ බුද්ධිමය හැකියා මතු කර ගැනීමේ දී භාවිත කරන්න.

- මිනිසා සතු හැකියා වැඩි දියුණු කර ගැනීම සඳහා විවිධ ඉගෙනුම් ක්‍රම යොදාගත හැකි ය.

  * ජීවිත අත්දැකීම්වලින් ලබන ඉගෙනුම කිසි දිනක අමතක නොවන අතර එමගින් ජීවිත සාර්ථකත්වය ළඟා කර ගත හැකි ය.
  * ළදරු හා ළමා අවධිවල දී දෙමව්පියන්, සහෝදරයන්, ගුරුවරුන්, වැඩිහිටියන්ගේ රැකවරණය හා දැනුම මත අත්දැකීම් ලබාගත යුතු ය.
  * ඉන් අනතුරුව තනි ව කටයුතු කළ හැකි බුද්ධියෙන් පරිණත වූ පසු තමාව ස්වාධීන ව යම් යම් කටයුතු පිළිබඳ ව අත්දැකීම් ලබා ගත හැකි ය.
  * අන් අයගේ ජීවිත අත්දැකීම්වලින් වුව ද අපට විශාල පිටුබලයක් ලබාගත හැකි ය.

*	ජීවිත අත්දැකීම් අඩු වූ විට සමාජය තුළ කටයුතු කිරීමේ දී විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වේ.  එවිට ස්වාධීන ව කටයුතු කිරීමේ දී මහත් අපහසුතාවන්ට ලක්වේ.

*	තම හැකියා දක්ෂතා සමාජයෙන්, පවුල තුළින් නැතහොත් තමා නියෝජනය කරන සමාජ කණ්ඩායම මගින් ලැබිය හැකි ය.

	නිදසුන් :-  සෞන්දර්ය, තාක්ෂණික හැකියා

*	මෙම ක්ෂේත්‍ර බොහෝ දුරට ජීවිත අත්දැකීම් හා බද්ධ ව පවතී.

*	හැකියා වැඩි දියුණු කර ගැනීම සඳහා සමාජය තුළ විවිධ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක වේ. ඒවා හඳුනාගෙන ඒ කෙරෙහි යොමු වීම මගින් තම හැකියා තවදුරටත් පෝෂණය කරගත හැකි ය.  එමගින් අනාගත වෘත්තීය හැකියා කෙරෙහි ද යොමු විය හැකි ය.

*	යම් පුහුණුවක් ලබනවිට  මුදල් හෝ වෙනත් ප්‍රතිලාභ ගැන නොසිතන්න.  එමගින් තම හැකියා ඔපවත් කර ගැනීම ගැන සිතන්න.  ආධුනිකයකු වශයෙන් ඔබ ලබන පුහුණුව අනාගත ආයෝජනයක් ලෙස දකින්න.

- ඔබගේ හැකියා වැඩි දියුණු කරගත හැකි සුලබව යොදාගත හැකි මාධ්‍යයක් ලෙස පොතපත වැදගත් වේ.

*	තම හැකියා ක්ෂේත්‍රය අළලා ලියවුණු පොත්පත් කියවීම මගින් තම දැනුම් සම්භාරයන් පුළුල් කරගත හැකි ය.
*	එයට අමතර ව විවිධ පාඨමාලා හා ක්ෂේත්‍ර අළලා ලියවුණු පොත පත පරිශීලනය මගින් ඔබට නව ක්ෂේත්‍ර ඔස්සේ වුව ද හැකියා වර්ධනය කරගත හැකි ය.

*	විද්‍යුත් මාධ්‍ය භාවිතය මගින් ද තම හැකියා වැඩි දියුණු කර ගත හැකි ය.  වීඩියෝ දර්ශන, අන්තර්ජාලය, රූපවාහිනී වැඩසටහන්, ගුවන් විදුලි, පුවත්පත් ආදී මාධ්‍ය ඔස්සේ වුව ද ඔබගේ හැකියා වර්ධනයට අවකාශ ඇත.
*	එමගින් අන් අයගේ අත්දැකීම් දැක තමාට නිර්මාණශීලී ව හැකියා වැඩි දියුණු කර ගැනීමට හැකි ය.
*	විවිධ හැකියා ක්ෂේත්‍රවල ප්‍රවීණයන් හමු වී ඔවුන්ගේ අත්දැකීම් හා දැනුම තම හැකියා වර්ධනයට දායක කරගත හැකි ය.

- තම සුවිශේෂ වූ හැකියා පදනම් කරගෙන තම ජීවන අරමුණු ගොඩනගා ගත හැකි ය.

*	තමාට සත්‍ය වශයෙන් ම නැති දේවල් මොනවා ද ?
	තමාට අපහසු නැතහොත් අකමැති දේවල් මොනවා ද?
	මේවා තෝරා බේරා ගැනීම මගින් සත්‍ය වශයෙන් ම මාගේ හැකියා දක්ෂතා අනුව ජීවිත අරමුණු ගොඩනගා ගත හැකි ය.  එමගින් පෞද්ගලික දියුණුව, පෞරුෂ සංවර්ධනය හා ජීවන වෘත්තීය සකසා ගත හැකි ය

## 9.1.2 විවිධ ජීවිත අභියෝගවල දී සාර්ථක ව කටයුතු කරයි.

* ජීවත් වීම යනු විවිධ ගැටලුවලට මුහුණ දෙමින් ඒවා නිරාකරණය කරමින් හෝ අවම කර ගනිමින් යථාර්ථයට මුහුණ දීම වේ.
* ඒ සඳහා අපට විවිධ තීරණ, තෝරා ගැනීම් කෙරෙහි යොමු වීමට සිදු වේ.
* ජීවිතයේ විවිධ සිදුවීම්වල දී දුක, සතුට, අයස, නින්දා, ප්‍රසංශා, ලාභ අලාභ ආදියට අපි සැවොම මුහුණ දෙමු. ඒවා කෙරෙහි දැඩිව එළඹීමට වඩා උපේක්ෂාවෙන් කටයුතු කිරීම වැදගත් වේ.
* සෑම අභියෝගාත්මක අවස්ථාවක් ම අසුබවාදී ව නොදැක සුබවාදී ව දැක ක්‍රියාත්මක වීම මගින් ජීවිත සාර්ථකත්වය ළඟා කර ගත හැකි ය.
* ජීවිත අභියෝගවලට මුහුණ දීමේ දී එහි ප්‍රතිඵල ලෙස නව අදහස්, නව නිර්මාණ, බිහි වේ.
* ජීවිත අභියෝගවලට සාර්ථක ව මුහුණ දීමට නොහැකි ව ඉන් ඈත්වීම් හෝ පලා යාම, ප්‍රතික්ෂේප කිරීම මගින් ජීවිතය අසාර්ථක වීමට වුව ද හැකි ය.
* අප කුඩාකල සිට ම විවිධ අභියෝගවලට මුහුණ දෙමින් ඒවාට විවිධ ප්‍රතිචාර දක්වමින් විවිධ ජීවිත අත්දැකීම් ලබා ඇත.
* කුඩා අවධියේ විවිධ දුෂ්කර අභියෝගවලට මුහුණ දී ඒවාට සාර්ථක ව මුහුණ දී අතිශය සාර්ථකත්වයට පත්වූවන්ට නිදසුන් අප අවට සමාජයේ බෙහෙවින් ම දැකිය හැකි ය.

## 9.1.3 දේශීයත්වය රැකගනිමින් විශ්ව ගම්මානයේ සාමාජිකයෙකු ලෙස සහජීවනයෙන් කටයුතු කරයි.

- දේශීය ආර්ථික, සමාජීය, සංස්කෘතික අංග ගරු කරමින් කටයුතු කිරීමත් ජාතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමටත් දේශීයත්වය ලෙස සරල ව හැඳින්විය හැක.

- විශ්ව ගම්මානය
  - කාර්මීකරණය සමග සිදු වූ නිෂ්පාදන, ප්‍රවාහන, පණිවුඩ හුවමාරුව යන අංශවල දියුණුවත් සමග වත්මන් ලෝකය එක ම ගම්මානයක තත්ත්වයට පත් ව ඇත. මෙය විශ්ව ගම්මාන සංකල්පය ලෙස හඳුන්වනු ලැබේ.

  - දේශීයත්වය ආරක්ෂා කර ගනිමින් විශ්ව ගම්මානයේ සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමේ ශක්තිය පුරවැසියන් තුළ වර්ධනය කළ යුතු ය.

  - විශ්ව ගම්මානයේ පුරවැසියෙකු ලෙස කටයුතු කිරීමේ දී දේශීයත්වය අගය කරමින් හා ජාතික අනන්‍යතාව රැක ගනිමින් ලෝක සමාජයේ පුරවැසියෙකු වශයෙන් කටයුතු කිරීමට හැකි විය යුතු ය. මේ සඳහා ලෝකය පිළිබඳ පුළුල් දැක්මක් තිබිය යුතු ය.

  - විශ්ව සමාජයේ අප ලබා ගන්නා ආදර්ශයන් දේශීයත්වයට ගැළපෙන ලෙස යොදා ගැනීමට පුරුදු පුහුණු විය යුතු බව.

- විශ්ව සමාජයේ සාමාජිකයකු ලෙස ජීවත්වීමට අවශ්‍ය ගුණාංග හා හැකියාවන් පුරුදු පුහුණු කළ යුතු බව.
  උදා:- විශ්ව සංස්කෘතීන්ට ගරු කළ යුතු බව, ජාත්‍යන්තර භාෂා හැදෑරීම සහ අවශ්‍ය අවස්ථාවල දී ඒවා යොදා ගැනීම

- ලෝකය පිළිබඳ පුළුල් දැක්ම

  - වත්මන් ලෝකයේ ආර්ථික, සමාජ දේශපාලන ආදි ක්ෂේත්‍ර තුළ සිදුවන සංසිද්ධි පිළිබඳ දැනුමක් සහ අවබෝධයක් සහිත ව කටයුතු කිරීමේ හා තේරුම් ගැනීමේ හැකියාව. ලෝකය පිළිබඳ පුළුල් දැක්මයි.
  - මෙම ක්ෂේත්‍ර පිළිබඳ විචාරශීලී ව තේරුම් ගැනීමත් තම දෛනික කටයුතු තුලනාත්මක ව ගෙන යාමත් ලෝක පුරවැසියෙකු වශයෙන් වැදගත් වේ.

- ශ්‍රී ලංකාවේ දේශීය සංස්කෘතිය, නිෂ්පාදනය, දේශීයත්වය, අර්ථාන්විත ව අගය කිරීම

  - ශ්‍රී ලංකාව ඉපැරණි සංස්කෘතියකට හිමිකම් කියන බව.
  - ඒ හා බැඳුණු අංග
    * කෘෂිකාර්මික අංශය
    * කර්මාන්ත අංශය
    * වාරි කර්මාන්ත අංශය
    * ගෘහ නිර්මාණ හා කලා ශිල්ප

  - ශ්‍රී ලංකාවේ වර්තමාන නිෂ්පාදන හා දේශීයත්වය අර්ථාන්විත ව අගය කිරීම

- දේශීය රාමුවෙන් ඔබ්බට ගොස් අන්‍ය සංස්කෘතීන් හඳුනා ගැනීම හා ඒවා ගරු කිරීම

  - දේශීයත්වයට ගැළපෙන ලෙස එම සංස්කෘතීන්ගෙන් ගත හැකි ආදර්ශ ලබා ගැනීම

- සහජීවනය ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගැනීම

  - පුද්ගලයෙකුට, ජනවර්ගයකට, රටකට ලෝකයේ තනි ව සිටිය නොහැකි බව.

  - ඊට බලපාන හේතු
    උදා:- * සම්පත් විසංතුලනය
    * භූගෝලීය විවිධත්වය
    ආදිය නිසා ප්‍රදේශයකට, රටකට අවශ්‍ය සියලු දෑ නිපදවා ගත නොහැකි වීම

*	තාක්ෂණික දියුණුවත් සමග ලෝකයේ තොරතුරු තාක්ෂණය අද වන විට සියල්ල පරදා යෝධ පිම්මක් පැන ඇත. මේ නිසා සමස්ත ලෝකය ම විශ්ව ගම්මානයක් බවට පත් ව ඇත. කිසිදු පුද්ගලයෙකුට තනි ව ජීවත් විය නොහැකිවා මෙන් ම නව ගෝලීය සංස්කෘතියක් ගොඩ නැගීම වැළැක්වීම ද කළ නොහැකි ය. එහෙත් තම අනන්‍යතාව රැක ගනිමින් දේශීයත්වය ගරු කරමින් අන්‍යෝන්‍ය රැඳියාවෙන් යුතු ව ජීවත්විය යුතු බව හඳුනාගත යුතු ය.

සතර වටින් එන සුළඟට
-	සතර දෙසින් ඇතුළු වන්න
ඔබ වසනා නවාතැනේ
-	කවුළු නිබඳ හැර තබන්න
ඉහත දැක්වෙන්නේ මහත්මා ගාන්ධිතුමාගේ ප්‍රකාශනයකින් බිහි වූ කාව්‍ය සංකල්පනාවකි.

එමගින් විශ්ව ගම්මානයේ සාමාජිකයකු ක්‍රියා කළ යුතු ආකාරය මැනවින් තහවුරු වෙයි.

### 9.1.4 අවශ්‍ය තැන ස්ථිරසාරතාවයෙන් කටයුතු කරයි.

ස්ථිරසාරතාව යනු පුද්ගලයෙකු තුළ තිබිය යුතු සුවිශේෂ කුසලතාවකි. අන්‍යයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය නොකොට තමාගේ අයිතිවාසිකම් කියා පෑමට තමා වෙනුවෙන් නැගී සිටීමට හා තමාගේ හොඳම සිතැඟියාව අනුව කටයුතු කිරීමට පුද්ගලයන් පොළඹවන චර්යාවක් වශයෙන් ද ස්ථිරසාරතාව හැඳින්විය හැකි ය.

කිසියම් අභියෝගයක් හමුවේ පුද්ගලයන් ප්‍රතිචාර දක්වන අන්ත දෙකකි. යටහත්ශීලී බව එක අන්තයක් වන අතර ආක්‍රමණශීලී බව අනෙක් අන්තය යි. මෙම අන්ත දෙකින් එකකටවත් නතු නොවී අභියෝගයක් හමුවේ තමා වෙනුවෙන් ඍජු ව පෙනී සිටීමේ, කථා කිරීමේ ගුණය ස්ථිරසාරතාවය යි. මෙය යටහත්ශීලී බව හා ආක්‍රමණශීලී බව අතර පවතින මැදිහත් ප්‍රතිපදාවකි.

යටහත්ශීලී වීමෙන් ක්‍රමයෙන් තමාට තමා නැති වී යන තත්ත්වයක් උද්ගත විය හැකි ය. අන්මත අනුව ම කටයුතු කිරීමේ දී තමා හුදු අනුකාරකයෙකු බවට පත්වේ. එය පුද්ගලයෙකුගේ පෞරුෂයට ද හානියකි. එමෙන් ම ආක්‍රමණශීලී වීමෙන් ද තමා නොසන්සුන් කලබලකාරී වීමෙන් ද අන්තර් පුද්ගල සබඳතා බිඳ වැටීමටත් හේතු වේ. එම තත්ත්වය ද පුද්ගලයෙකුගේ පෞරුෂයට බාධාවකි. කෙනෙකුගේ සුවිශේෂ අනන්‍යතාවන් ගොඩ නැගෙන පරිදි පූර්ණ පෞරුෂයකින් යුක්ත වීමට නම් ස්ථිරසාරතාව ගොඩනගා ගැනීම ඉතා වැදගත් වේ. තමා සමග ස්ථිරසාරතාව ගොඩ නගා ගැනීමටත් අනුන් සමග ස්ථිරසාරතාව ගොඩනගා ගැනීමටත් පුද්ගලයෙකු සමත් විය යුතු ය.

*	ස්ථිරසාරතාව හඳුනා ගැනීම
*	තමා සමග ස්ථිරසාරතාව
*	අනුන් සමග ස්ථිරසාරතාව
*	තම හැඟීම් අවශ්‍ය තැන අවශ්‍ය පරිදි අවස්ථාවෝචිත ව සදාචාරාත්මක ව ප්‍රකාශ කිරීම
*	සුභවාදී ආකල්පවලින් යුක්ත ව විචාරශීලී ව ඍජු ප්‍රතිපත්ති මත කටයුතු කිරීම

## 9.1.1 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ආත්මාවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** :- තමා තුළ ඇති බුද්ධිමය දක්ෂතා එළිදක්වයි.

**ක්‍රියාකාරකම** :- " මතු කර ගනිමු හැකියා "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ලියන කඩදාසි
- ෆෙල්ට් පෑන්
- තමාගේ ඡායාරූපයක් / රූපයක්
- ගම්ටේප්
- ඇමුණුම 1.1.1.1 හා ඇමුණුම 1.1.1.2

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1.1.1.1**

- පන්තියේ ඇති විවිධ හැකියා ඇති සිසුන් අතුරින් ගීතයක් /නැටුමක් / අභිරූපණයක් / විකට ජවනිකාවක් යනා දී වශයෙන් එක් අංගයක් ඉදිරිපත් කරවන්න.
- ඇමුණුම 1.1.1.1 හා සඳහන් විවිධ වූ බුද්ධිමය හැකියා මොනවාද? යන්න විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක නිරතවන්න.

- මිනිසුන්ගේ හැකියා විවිධ වන බව
- මිනිසුන්ට තම හැකියා සහජයෙන් මෙන් ම පුහුණුව මගින් ද ළඟා කරගත හැකි බව
- කුඩාකල මතු වූ හෝ හඳුනාගත් දක්ෂතා තම ඉදිරි ගමනට යොදා ගත හැකි බව
- තම හැකියාවන් නිවැරදි ව හඳුනා ගැනීම වැදගත් අතර ඒවා වැඩි දියුණු කරගත යුතු බව

**(මිනිත්තු 10යි)**

**පියවර 1.1.1.2**

- ඇමුණුම 1.1.1.2 හි සඳහන් කාර්ය පත්‍රිකාව සෑම සිසුවකුට ම ලබා දෙන්න.
- කළ යුතු කාර්යන් පැහැදිලි කර දෙන්න.
- අවශ්‍ය අවස්ථාවල දී මඟ පෙන්වන්න.
- සිසුන් කාර්යයෙහි නිරත කරවන්න.

**(මිනිත්තු 10 යි)**

**පියවර 1.1.1.3**

- ඇමුණුම 1.1.1.3 හි සඳහන් කාර්ය පත්‍රිකාව සෑම සිසුවකුට ම ලබා දෙන්න.
- එහි සඳහන් කාර්යයන් හි නිරත කරවන්න.
- සිසුන්ගේ නිර්මාණ හා යෝජනා අන් අයගෙන් දැන ගැනීමට යොමු කරවන්න.
- සිසුන්ගේ හැකියා ප්‍රගුණ කිරීමට ප්‍රතිපෝෂණය ලබා දෙමින් පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- පුද්ගලයින්ගේ හැකියා විවිධ බව පන්තියේ සිසුන් මගින් නිරීක්ෂණය වන බව
- හැකියා උපතින් මෙන් ම පුහුණුව මගින් අත්පත් කර ගත හැකි බව
- එක් පුද්ගලයකුට හැකියා එකක් හෝ කිහිපයක් තිබිය හැකි බව.
- හැකියා නිවැරදි ව විනිශ්චය කර ගැනීම වැදගත් බව
- හැකියා විනිශ්චය කිරීමේ දී තම අදහස් මෙන් ම අන් අයගේ අදහස් ද වැදගත් බව
- තම හැකියා ගැන ආත්මාභිමානයක් ඇති කරගත යුතු බව
- අන් අයගේ හැකියා අගය කළ යුතු බව

**(මිනිත්තු 20යි)**

## තක්සේරුව හා ඇගයීම

- පුද්ගල හැකියා නම් කරයි.
- තම හැකියා පිළිබඳ ව ආත්මාභිමානයෙන් අදහස් දක්වයි.
- තමා සතු හැකියා ආවර්ජනය කර ලියා දක්වයි.
- තම හැකියා නිශ්චිත ව හඳුනා ගනිමින් සංවර්ධනය කර ගනියි.
- අන් අයගේ හැකියාවලට ගරු කරයි.

**පසු වැඩ :-**

සිසුන් විසින් හඳුනා ගනු ලැබූ ඔවුන්ගේ හැකියා දැක්වෙන වර්ණවත් පිංතූර ඇතුළත් සටහන පන්ති කාමරය තුළ ප්‍රදර්ශනය කර "අප පන්තියේ ඇති හපන්නු " යනුවෙන් නිර්මාණයක් ප්‍රදර්ශනය කරවන්න.

**ඇමුණුම 1.1.1.1**

මාපාකඩවැව
පුංචි වීරයාට
නාලන්ද විදුහලට වරමක්



ශ්‍රීමත් ආතර් සී ක්ලාක් මහතා



ජෙෆ්‍රිබාවා ගෘහ නිර්මාණ ශිල්පියාගේ නිර්මාණයක්

හිතාචි දුම්රියේ නුවරඑළිය
චාරිකාව ..... (උපුටා ගැනීම)

අලුයම 2.10 ට පමණ ලහි ලහියේ අවදි වූ අපි සියලු දෙනා ම අපේ හිතාචි දුම්රියේ චාරිකාව යාමේ අදිටනින් සූදානම් වීමු. මේ අතර කළුතර දුම්රිය ස්ථානය බලායන වෑන් රථයේ නැගුණු අපි කඩිමුඩියෙන් සහ කඩිසර බවකින් දුම්රිය ස්ථානයට කෙමෙන් ඇදුනෙමු. ටික වේලාවක් ගිමන් හැර සිට අප එකවර ම දුටුවේ රේල් පීලිමතින් කළුතර දුම්රිය ස්ථානයට පිය නැගුණු හිතාචි දුම්රිය යි. දුම්රිය නැවතුණු සැනින් අපි සියලු දෙනා ම එහි අධි සුඛෝපබෝගි ආසනවලට හිමිකම් කිව්වෙමු.

දුම්රිය නිසොල්මනේ ගමනේ යෙදෙනවිට අපි අපේ විඩාවට තිතක් ද තබමින් නින්දට වැටුණෙමු. කොළඹ කොටුව දුම්රිය ස්ථානයට පැමිණෙන විට මන්දාරම් අඳුර මතින් එළිය වැටුණේ ය. දුම්රිය තුළින් පිටත දුටු අපට වැටහුණේ මෙය වෙරළබඩින් ඈත් වී මධ්‍යම කඳුකරයට යන වගකි. මේ අතර වාරයේ දී අපට ළඳුකැලෑ වන රොද, නගර, ගම්බිම්, හමුවුණේ ය. ටිකින් ටික මුහුදු මට්ටමෙන් ඉහළට යන දුම්රිය ද අප ද සිතුවේ ඉනිමඟක් දිගේ ඉහළ ට යන්නාක් මෙනි.

දුම්රිය අඩියෙන් අඩියට පාද තබා ඊළඟ දුම්රිය නවාතැන් පොළ වුණු රඹුක්කන දුම්රිය ස්ථානයට අපි ළඟා වීමු. මේ අතර වාරයේ දී හමුවුණු බිම් ගෙවල් අනන්ත අප්‍රමාණ ය. මේ අතර වාරයේ දී අපට විශේෂ අවස්ථාවක් අහඹුවෙන් සේ ලැබිණි. එය මම ද මගේ මිතුරෝ ද ලත් මහඟු අවස්ථාවකි. එය වූයේ මම ද මා මිතුරන් ද හිතාචි දුම්රියේ ඇති ඉදිරි එන්ජින් මැදිරියේ යාමට ය. එයින් නැවත ගමන් ඇරඹූ අපි අලගල්ලේ කන්ද යටින් වැටි ඇති සින්නමලේ බිම් ගේ තුළින් ද අපට යාමට සිදුවිණි. මෙය ලංකාවේ දිගම බිම් ගේ විය. ටික දුරටක් යන විට සීගිරිය මෙන් මම දුටු බතලේගල කන්ද ද අතර මැද දී හමුවිණි. තවත් ඉදිරියට යත්ම දිස් වූයේ සුර සරදියෙල් විසූ උතුවන් කන්ද යි. මෙය කන්දකට ඉහළින් ඇති ගල් කුලක් බඳුය. උදෑසන ආහාරය ගැනීමට පෙර අන්තිම නවාතැන් පොළ වූයේ කඩුගන්නාව දුම්රිය ස්ථානය යි.

ඩබ්.එම්. විසල් යසෝධන කුමාරසිංහ
6 වන ශ්‍රේණිය,
ගා/පී. ද ඇස්. කුලරත්න විදුහල

## ඇමුණුම 1.1.1.2
### කාර්ය පත්‍රිකා සඳහා ගුරු උපදෙස්

- සිසුන්ගේ හැකියා හඳුනා ගැනීමේ දී කායික, මානසික, ආධ්‍යාත්මික, සමාජමය, තාක්ෂණමය, සෞන්දර්යාත්මක, වෘත්තීයමය ආදී අංශවල හැකියා සඳහා උදාහරණ පැහැදිලි කර දෙන්න.

- හැකියා හඳුනා ගැනීමේ දී පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සිතන්නට සිසුන් යොමු කරවන්න.

1. ඔබ සතු සහජ හැකියා මොනවා ද?
2. ඔබ දක්වා ඇති දක්ෂතා මොනවා ද?
3. ඔබට ජයග්‍රහණ හිමිවී ඇත්තේ කුමකට ද?
4. ඔබ කර ඇති නිර්මාණ මොනවා ද?
5. අන් අය ඔබ සතු යැයි සිතන හැකියා මොනවා ද?
6. අන් අය ඔබට ප්‍රශංසා කරන්නේ ඔබගේ කුමන හැකියාවට ද?

- දෙනෙත් පියාගන්න
  තෙවරක් හොඳින් ආශ්වාස ප්‍රශ්වාසයෙහි යෙදෙන්න.
  ඔබ සතු හැකියා පිළිබඳ ව සිහිපත් කරන්න.
  ඒවා පහත වගුව තුළ ඇතුළත් කරන්න.

| හැකියා ක්ෂේත්‍රය | හැකියා වර්ග |
|---|---|
| කායික | ................................................... |
| මානසික | ................................................... |
| අධ්‍යාත්මික | ................................................... |
| සමාජයමය | ................................................... |
| තාක්ෂණමය | ................................................... |
| සෞන්දර්යාත්මක | ................................................... |
| වෘත්තීයමය | ................................................... |
| වෙනත් | ................................................... |

- නැවත අලුත් පත්‍රිකාවක් ගන්න.
- එහි ඔබගේ ඡායාරූපයක් හෝ චිත්‍රයක් අලවන්න / අඳින්න.

- ඔබගේ රූපය වටා ඔබ සතු හැකියා වර්ණවත් ආකාරයෙන් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

- නැවත දෙනෙත් පියාගන්න.
- තෙවතාවක් හොඳින් ආශ්වාසයෙහි ප්‍රශ්වාසයෙහි යෙදෙන්න.
- දෙනෙත් හරින්න.
- දැන් ඔබගේ හැකියාවලින් පිරිපුන් වර්ණවත් චිත්‍රය දෙස එකින් එක අවධානය යොමු කරමින් සිතින් සතුටු වන්න. සිනාහවක් පාන්න.

ඇමුණුම 1.1.1.3

කාර්ය පත්‍රිකාව

- ඔබ හඳුනාගත් හැකියා ඔබ සතු වුයේ සහජයෙන් ද නැත්නම් ඉගෙනීමෙන් දැයි සිතන්න.
- ඒ අනුව තෝරාගත් හැකියා කිහිපයක් මෙම කොටස් දෙක යටතේ වර්ග කරන්න.

| සහජයෙන් සතු වූ හැකියා | ඉගෙනුමෙන් ලත් හැකියා |
|---|---|
| 1. ...................................... | 1. ...................................... |
| 2. ...................................... | 2. ...................................... |
| 3. ...................................... | 3. ...................................... |
| 4. ...................................... | 4. ...................................... |

- මින් ඔබ විසින් වැඩි දියුණු කරගත යුතු යැයි සිතන හැකියා කිහිපයක් තෝරා ගෙන එය ප්‍රමුඛතාව අනුව 1, 2, 3 ආදී වශයෙන් ලියා ගන්න.

- එම හැකියා වැඩි දියුණු කර ගැනීමට කළ යුතු දේවල් ලියන්න.

| හැකියාව | වැඩිදියුණු කිරීමට කළ යුතු දේවල් |
|---|---|
| 1. ......................... | ................................................................. |
| 2. ........................ | ................................................................. |
| 3. ........................ | ................................................................. |

- ඔබ විසින් ලියන ලද හැකියා හා සංවර්ධනය කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග තමා අසල සිටින හිතවතුන්ට ගුරුවරයාට ප්‍රකාශ කර ප්‍රතිපෝෂණ ලබා ගන්න.

## 9.1.2 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ආත්මාවබෝධයෙන් කටයුතු කරයි

**නිපුණතා මට්ටම** :- විවිධ ජීවිත අභියෝගවල දී සාර්ථක ව කටයුතු කරයි.

**ක්‍රියාකාරකම** :- " දැනගෙන අභියෝග - ජයගමු ජීවිතය "

**කාලය** :- මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :-
- ඇමුණුම 9.1.2.1
- ඇමුණුම 9.1.2.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා
- ඇමුණුම 9.1.2.3 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා
- ලියන කඩදාසි

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.1.2.1**

- ඇමුණුම 9.1.2.1 හි සඳහන් ක්‍රීඩාවේ සිසුන් යොදවන්න.
- එම ක්‍රීඩාවේ ජයග්‍රහණය ලැබූ අය පිළිබඳ ව විමසන්න.
- පරාජයට හේතු විමසන්න.
- තරගයේ දී තමා තුළ ඇති වූ හැඟීම් විස්තර කරමින් අනපේක්ෂිත ව තමා මුහුණ දුන් අභියෝගාත්මක තත්ත්වය පිළිබඳ ව සාකච්ඡාවක් යෙදෙන්න.
- එම සාකච්ඡාවේ දී පහත සඳහන් කරුණු මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ජීවිතයේ සෑම පුද්ගලයෙකුට ම අභියෝගවලට මුහුණ දීමට සිදුවන බව
- අභියෝග ජීවිතයේ සාමාන්‍ය ස්වභාවයක් බව
- අභියෝගයක් යනු ජීවිත අරමුණු ඉටුකර ගැනීමේ දී මතුවන ගැටලු හා බාධකවලට සාර්ථක ව මුහුණ දිය යුතු බව
- අභියෝග ඇතිවන අවස්ථා හා ස්වභාවයන් විවිධාකාරී බව

  * අවතැන්වීම් මගින් (යුද්ධ/සුනාමි/ගංවතුර/සුළිසුළං ආදිය මගින්)
  * රැකවරණය අහිමිවීමෙන් (මව/පියා / භාරකරු අහිමිවීමෙන්)
  * සමවයස් කණ්ඩායම්වලින් එල්ලවන අහිතකර බලපෑම්

* ජනමාධ්‍ය හා අන්තර් ජාලය
* කායික දුබලතා / ආබාධ
* යුද වාතාවරණය හා ගැටුම්
* ආර්ථික දුෂ්කරතා
* කාලීන සමාජ වෙනස්වීම් තුළින් ඇතිවන තත්ත්වය
* පුද්ගල සාධක හා වෙනත්

- තමා මුහුණ දී ඇති හා මුහුණ දෙන අභියෝග පැහැදිලි ව හඳුනා ගැනීමෙන් ජීවිත ජය ගැනීමේ මාවත් ගොඩනැගිය හැකි බව.

**(මිනිත්තු 20යි)**

**පියවර 9.1.2.2**

- සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන්කරන්න.
- කුඩා කණ්ඩායම් සඳහා 9.1.2.2 හා 9.1.2.3 ඇමුණුම් ලබා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- අවශ්‍ය තැන්හි සහාය වෙමින් මඟ පෙන්වන්න.

**(මිනිත්තු 20යි)**

**පියවර 9.1.2.3**

- සිසුන් ගවේෂණයෙන් ලද නිමැවුම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම් හි අදහස් විමසන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වනසේ සමාලෝචනයක යෙදෙන්න.

- සෑම අභියෝගයක් ම ජීවිත සාර්ථකත්වයට තුඩුදෙන ශක්තියක් බවට පත්කරගත හැකි බව
- අභියෝග ජයගත් පුද්ගලයන් ලෝකයේ සාර්ථක ම පුද්ගලයන් බවට පත් ව ඇති බව
- අභියෝග හමුවේ සාර්ථක ව මුහුණ දීම ජීවිතයට පන්නරයක් බව
- සෑම අභියෝගයක ට ම මුහුණ දියහැකි විවිධ මාර්ග පවතින බව හා තමා විසින් ඒවා අනුගමනය කළ යුතු බව
- කටුක අභියෝග පවා පසු කලෙක ජය ගැනීමෙන් සුන්දරාත්මක /රසවත් අත්දැකීමක් ලෙස ප්‍රකාශ කළ හැකි බව

**(මිනිත්තු 40 යි)**

## තක්සේරුව හා ඇගයීම

- අභියෝගයක් යන්න අර්ථ දක්වයි.
- අභියෝගයක් තුළින් ජීවිත සාර්ථක කර ගැනීමේ මාර්ග ඇති බව පිළිගනියි.
- විවිධ අභියෝග හඳුනා ගනිමින් ජය ගැනීමේ ක්‍රම හා විධි ඉදිරිපත් කරයි.
- තම කණ්ඩායමේ සාමාජිකයන් හා එක් ව අභියෝග සඳහා විසඳුම් යෝජනා කරයි.
- තමා මුහුණ දුන් අභියෝගවලට සාර්ථක විසඳුම් ඉදිරිපත් කර අනුගමනය කරයි.

**පසු වැඩ**

- විවිධ අභියෝග හමුවේ නොසැලී මුහුණ දී ජීවිතය ජයගත් ලොව ප්‍රකට පුද්ගලයන් පිළිබඳ පුවත් පත් වාර්තා හා තොරතුරු ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරන්න.

**ඇමුණුම 9.1.2.1**

විනෝද ක්‍රීඩාවකි. මේ සඳහා (පාවහන් ගලවා ක්‍රීඩාවට සිසුන් සූදානම් කරවන්න).

* පන්තියේ සිසුන් සංඛ්‍යාවට බැලුම් බෝල ගන්න.
* අඩියක ප්‍රමාණ නූල් කැල්ලක් (ටුවයින් නූල්) බැගින් සිසුන් සංඛ්‍යාවට ප්‍රමාණවත් ව සූදානම් කර ගන්න.
* සිසුන් එක් අයෙකුට බැලුම් බෝලයක් හා නූල් කැල්ල බැගින් ලබා දී බැලුම් බෝලය පුම්බා ගැට ගැසීමට උපදෙස් දෙන්න.
* බැලුම් බෝලය නූල් කැල්ලෙන් ගැටගසා සිසුන්ගේ කකුලක නොගැලවෙන සේ බැඳ ගැනීමට උපදෙස් දෙන්න.
* විනාඩි 05 ක කාලයක් තුළ තමාගේ බැලුනය බේරා ගනිමින් සෙසු අයගේ බැලුන පිපිරවීමට උපදෙස් දෙන්න.
* ආරම්භය හා අවසානය දැනුම් දෙන්න.
* මේ සඳහා පංති කාමරයේ ඉදිරිපස හෝ සිසුන්ගේ සංඛ්‍යාවට ප්‍රමාණවත් පරිදි සුදුසු ස්ථානයක් තෝරා ගන්න. එම ස්ථානයේ රවුමක් ඇඳ සීමාව දක්වා රවුමෙන් පිටතට පනින අය තරගයෙන් / ක්‍රීඩාවෙන් ඉවත් වන බව දැනුම් දෙන්න.
* විනෝදාත්මක ලෙස මෙම ක්‍රීඩාවට සිසුන් යොමු කරන්න.

**ඇමුණුම 9.1.2.2**

* පහත සඳහන් තොරතුරු හා සංවාදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අසංක රඹපොකුණ කනිෂ්ඨ විද්‍යාලයේ ඉගෙන ගන්නා දීප්තිමත් ශිෂ්‍යයෙකි. ඔහුගේ මව මිය ගොසිනි. පියා මීට වසර 7කට පෙර විදෙස්ගත වී ඇති අතර ඔහු ගැන මේ වන විට කිසිදු තොරතුරුක් දැන ගැනීමට නොහැක. අසංකත් මල්ලීත් නංගීත් සිටින්නේ සීයා සහ ආච්චී සමග ය. ඔවුහු ආර්ථික අතින් ඉතා දුෂ්කර ජීවිතයක් ගෙවති.

මේ අතර මෙම දරුවන් තිදෙනාගෙන් එක් අයෙකුට ශිෂ්‍යත්වයක් පිරිනැමීමට එන ස්වේච්ඡා සංවිධානයක නියෝජිතයකු හා අසංක අතර සිදු වූ සංවාදයක් පහත දැක්වේ.

නියෝජිතයා :- ඔබේ මව පියා දෙදෙනා ම මේ වන විට ඔබලා සමග නැහැ. ඔබලා රැකබලා ගන්නා අය ගැන කියන්න.

අසංක :- ඔව්. දැන් අපි ගැන බලා ගන්නේ ආච්චියි සීයයි.

නියෝජිතයා :- ආච්චිටයි සීයටයි දැන් ගොඩක් වයසයි නේ ද? ඒ වගේ ම අබල දුබලයි.

අසංක :- අපි ඒ දෙන්නට උදව් කරනවා. මට තමයි ගොඩක් වැඩ පැවරිලා තියෙන්නේ. වත්තේ පිටියේ වැඩත් මට තියෙනවා.

නියෝජිතයා :- ඔබලා ඉගෙන ගන්නා පන්ති කියන්න.

අසංක :- මම 9 ශ්‍රේණියේ. මල්ලී 4 ශ්‍රේණියේ. නංගි 2 ශ්‍රේණියේ.

නියෝජිතයා :- අපි මාසයකට රුපියල් දෙදාහක් අධ්‍යාපන වියදම් ශිෂ්‍යත්වයක් දෙන්න සූදානම්. ඒක කාට ද දෙන්න ඕන?

අසංක :- අපි තුන්දෙනාට ම දෙන්න.

නියෝජිතයා :- එහෙම බැහැ. මෙය දෙන්නෙ එක් අයෙකුට පමණයි.

අසංක :- එහෙනම් මට දෙන්න.

නියෝජිතයා :- ඔබට වඩා කුඩා නංගියි මල්ලියි ඉද්දි ඇයි ඔයා එය ඔයාගෙ නමට ඉල්ලන්නේ.

අසංක :- නංගිටයි මල්ලියි දෙන්නට ම තව ම බැංකු කටයුතු කිරීම අපහසුයි කියලා මට හිතෙනවා. අනික මම ශිෂ්‍යත්වය ගත්තම ඒ අය ගැනත් බලනවා. ඔක්කොට ම වඩා මම හොඳට ම සා. පෙළ විභාගය පාස් වෙලා ඉහළට ඉගෙන ගන්න ඕනෑ. හොඳට ඉගෙන ගත්තොත් තමයි මගේ නංගිටයි මල්ලිටයි හොඳට උගන්වන්න මට පුළුවන් වෙන්නේ.

නියෝජිතයා :- හොඳයි. අපි ඔයාට මේ ශිෂ්‍යත්වය පිරිනමන්නම්.

**ප්‍රශ්න**

1. අසංක ඔබ නම් මෙම මුදල මාසික ව වියදම් කරන ආකාරය සඳහන් කරන්න.
2. අසංක ඉදිරියේ පවතින අභියෝග මොනවා ද ?

**ඇමුණුම 9.1.2.3**

පහත සඳහන් ප්‍රශ්නවලට ඔබේ ජීවිත අත්දැකීම් ඇසුරින් පිළිතුරු සපයන්න.

1. ඔබ මුහුණ දී ඇති ජීවිත අභියෝගයක් සඳහන් කරන්න.
2. එම අභියෝගයේ ස්වභාවය කෙටියෙන් විස්තර කරන්න.
3. එම අභියෝගය නිසා ඔබට අත් වී ඇති ජයග්‍රහණ, පරාජයන්, කලකිරීම් හෝ අලාභයක් ඇත්නම් සඳහන් කරන්න.
4. එම අභියෝගය ජය ගැනීමට ඔබ අදහස් කරන්නේ කෙසේ ද?

## 9.1.3 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ආත්මාවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** :- දේශීයත්වය රැක ගනිමින් විශ්ව ගම්මානයේ සාමාජිකයකු ලෙස සහජීවනයෙන් කටයුතු කරයි.

**ක්‍රියාකාරකම** :- " දේශීයත්වය අගයමින් විශ්ව සමාජයට පිවිසෙමු "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.1.3.1 හා 9.1.3.2
- ඩිමයි කොළ
- ෆෙල්ට් පෑන්

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.1.3.1**

- ඇමුණුම 9.1.3.1 හි සඳහන් ඡේදය පන්තියට ඉදිරිපත් කරන්න.
- එහි සඳහන් තොරතුරු පිළිබඳ අදහස් දැක්වීමට සිසුනට අවස්ථාව සලසා දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ඈත අතීතයේ ශ්‍රී ලංකාවේ දේශීය තාක්ෂණය උසස් මට්ටමක පැවති බව
- වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ විවිධ නිෂ්පාදන ලෝක වෙළෙඳ පොළට ඉදිරිපත් කරන බව
- එම නිෂ්පාදන අතුරින් ඇතැම් ඒවා ලෝකයේ ඉහළ පිළිගැනීමකට ලක් ව තිබෙන බව
- අතීතයේ මෙන් ම වර්තමානයේ ද දේශීය වශයෙන් අගය කළ හැකි සාරධර්ම හා නිපැයුම් අප සතු ව පවතින බැවින් දේශීයත්වය අගය කරමින් ඉදිරියට යැමට අප උත්සාහ ගත යුතු බව

**(මිනිත්තු 10යි)**

**පියවර 9.1.3.2**

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 9.1.3.2 හි ඇතුළත් කාර්ය පත්‍රිකා කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- අදාළ කාර්ය නිම කිරීම සඳහා ප්‍රමාණවත් කාලය ලබා දෙන්න.
- අවශ්‍ය අවස්ථාවල උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දෙන්න.
- වාර්තාව සැකසීමට ප්‍රමාණවත් කාලය ලබා දෙන්න.

**(මිනිත්තු 10යි)**

**පියවර 9.1.3.3**

- කණ්ඩායම් වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම් ඉදිරිපත් කළ තොරතුරු පිළිබඳ අදහස් දැක්වීමට සෙසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතුවන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- දේශීය සිරිත් විරිත් හා සම්ප්‍රදාය ගරු කළ යුතු බව
- අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා විවිධ නිෂ්පාදන ප්‍රයෝජනයට ගැනීමට සිදුවන බව
- සැම විට ම තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා දේශීය නිෂ්පාදන භාවිත කිරීමට යොමු විය යුතු බව
- එසේ කිරීමෙන් පිටරට ඇදී යන ධනය ඉතිරි කර ගැනීමට හැකිවන අතර දේශීය නිෂ්පාදන වැඩි දියුණු වීමට ද එය බලපාන බව
- සම්පත්වල අසම ව්‍යාප්තිය, අවශ්‍ය සැම දෙයක් ම තම රට තුළ නිපදවා ගත නොහැකි වීම ආදී කරුණු නිසා අවශ්‍ය සැම දෙයක් ම තම රට තුළ නිපදවා ගැනීමට නොහැකි වන බව
- මේ සඳහා ලෝකයේ විවිධ රටවල් සමග සබඳතා ගොඩනගා ගැනීමට අපට සිදුවන බව
- සමාජ සබඳතා ගොඩනගා ගැනීමටත්, සබඳතා පවත්වා ගැනීමටත්, විශ්ව සමාජයේ පුරවැසියකු ලෙස ජීවත් වීමටත් අවශ්‍ය හැකියා අප තුළ වර්ධනය කර ගත යුතු බව

**(මිනිත්තු 20යි )**

## තක්සේරුව හා ඇගයීම

- දේශීය නිෂ්පාදන මිල දී ගැනීම ජාතික අභිවෘද්ධියට හේතු වන අයුරු පැහැදිලි කරයි.
- දේශීය සිරිත් විරිත් හා සාම්ප්‍රදායන් අගය කරමින් කරුණු ඉදිරිපත් කරයි.
- ලෝක සමාජයේ පුරුවැසියකු ලෙස ජීවත්වීමට අවශ්‍ය ගුණාංග ප්‍රගුණ කිරීමට කැමැත්තක් දක්වයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් නිම කිරීම සඳහා සහයෝගයෙන් යුතු ව කටයුතු කරයි.
- තම හැකියා ප්‍රදර්ශනය කරමින් යම් නිර්මාණයක් බිහි කිරීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

**ඇමුණුම 9.1.3.1**

පහත සඳහන් ප්‍රකාශ පන්තියට ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කර ගන්න.

**ශ්‍රී ලංකාවේ තේවලට ඉහළ ම මිලක්**

**ශ්‍රී ලංකාවේ ඇඟලුම් වලට ලෝක වෙළෙඳ පොළේ ඉහළ ඉල්ලුමක්**

**ශ්‍රී ලංකාවේ අතීත තාක්ෂණය**

- වාරි තාක්ෂණය
  ධාතුසේන රජතුමා විසින් කරවන ලද යෝධ ඇළ හෙවත් ජය ගඟ කිලෝමීටර 86 ක් පමණ දිග වන අතර, ඇළ මාර්ගයේ බෑස්ම කිලෝමීටර 1ට මිලිමීටර 95 ක් පමණ වන සේ බැවුම් කර ඇත.

- වෛද්‍ය තාක්ෂණය
  පොළොන්නරු යුගයට අයත් ආලාහන පිරිවෙන් සංකීර්ණය අසල කරන ලද කැනීම්වලින් ශෛල්‍ය වෛද්‍ය උපකරණ කිහිපයක් සොයා ගෙන ඇත.

- කලාත්මක නිර්මාණ
  ක්‍රි.ව. 5 වන සියවසේ දී නිර්මාණය කරන ලද සීගිරි චිත්‍ර අදත් නොවෙනස් ව පැවතීමෙන් පෙනී යන්නේ එම නිර්මාණ කිරීම සඳහා භාවිත කළ තාක්ෂණික ක්‍රමවල විශේෂත්වය යි.

**ඇමුණුම 9.1.3.2**

**කාර්ය පත්‍රිකා අංක 01**

ඔබ විසින් අගය කරනු ලබන දේශීය සිරිත් විරිත් හා සාම්ප්‍රදායන් ලැයිස්තු ගත කර, ඒවා අගය කිරීමට හේතු පන්තියට පැහැදිලි කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 02**

ලෝක සමාජයේ පුරවැසියකු ලෙස ජීවත්වීම සඳහා ඔබ තුළ වර්ධනය කළ යුතු ගුණාංග ලැයිස්තුවක් පිළියෙළ කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 03**

- පහත සඳහන් වගු සටහන සම්පූර්ණ කරන්න
- ඔබ කණ්ඩායම සටහන් කළ කරුණු විස්තරාත්මක ව පන්තියට ඉදිරිපත් කරන්න.

| ඔබේ එදිනෙදා අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා භාවිත කිරීමට සිදුවන භාණ්ඩ | එම භාණ්ඩ අතුරින් මිල දී ගත හැකි ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ ඉදිරියේ √ ලකුණ යොදන්න. විදේශ භාණ්ඩ මිල දී ගැනීමට සිදුවේ නම් එම භාණ්ඩ ඉදිරියේ + ලකුණ යොදන්න. | ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ මිල දී ගැනීමෙන් අත්වන වාසි |
|---|---|---|
| | | |

**කාර්ය පත්‍රිකා අංක 4**

වර්තමානයේ ලෝකයේ කිසිම රටකට තනි ව තම අවශ්‍යතා ඉටුකර ගැනීම අපහසුවීමට හේතු ඉදිරිපත් කරන්න.

# 9.1.4 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ආත්මවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** :- අවශ්‍ය තැන ස්ථිරසාරතාවයෙන් කටයුතු කරයි.

**ක්‍රියාකාරකම** :- " නිසිතැන නිසි ලෙස "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-
- ඇමුණුම් 9.1.4.1 හි සඳහන් ජන කතාව
- ඇමුණුම 9.14.2.ට අදාළ කාර්ය පත්‍රිකාව
- ලියන කඩදාසි
- පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.1.4.1**

- ඇමුණුම 9.1.4.1 හි සඳහන් ජන කතාව ඉදිරිපත් කරන්න.
- කතාව ඇසීමෙන් සිසුන්ට ඇති වූ අදහස් විමසන්න.
- පහත කරුණු මතු කරමින් බුද්ධි කලම්භන සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • තමන් කරන කාර්ය පිළිබඳ තමාට මනා අවබෝධයක් තිබිය යුතු බව<br>• අන් අයගේ අදහස් අවිචාරවත් ව නොපිළිගත යුතු බව<br>• තමන්ට සුදුසුනම් අන් අයගේ අදහස් විචාරශීලී ව පිළිගත යුතු බව<br>• ස්ථිරසාර අදහස් ඇති ව කටයුතු කිරීමෙන් තම අනන්‍යතාව / ගෞරවය සුරැකෙන බව |

**(මිනිත්තු 10 යි)**

**පියවර 9.1.4.2**

- ඇමුණුම 9.1.4.2 කාර්ය පත්‍රිකාව සිසුන් අතර බෙදා හරින්න.
- සිසුන් අදාළ කාර්යයෙහි නිරත කරවන්න.

**(මිනිත්තු 15 යි)**

**පියවර 9.1.4.3**

- සිසුන්ගේ අදහස් පන්තියට ඉදිරිපත් කරන්න.
- අන් සිසුන්ගේ සංවර්ධනාත්මක යෝජනා විමසන්න.
  පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- කිසියම් අභියෝගයක් හමුවේ පුද්ගලයන් ප්‍රතිචාර දක්වන අන්ත දෙකක් ඇති බව
- එය යටහත්ශීලී බව හා ආක්‍රමණශීලී බව වශයෙන් හඳුනාගත හැකි බව
- මෙම අන්ත දෙකින් එකකටවත් ඇදී නොයා ස්ථිරසාර ව කටයුතු කළ යුතු බව
- ස්ථිරසාරතාව තමන් සමග මෙන් ම අන් අය සමඟ ද පවත්වා ගත යුතු බව
- තම හැඟීම් අවශ්‍ය තැන අවශ්‍ය පරිදි සදාචාරාත්මක ව ප්‍රකාශ කළ යුතු බව

**(මිනිත්තු 15 යි)**

## තක්සේරුව හා ඇගයීම

- ස්ථිරසාරතාව හඳුනා ගනියි.
- ස්ථිරසාරතාවයෙන් කටයුතු කිරීමට පෙළඹෙයි.
- තම අදහස් අවශ්‍ය තැන අවශ්‍ය පරිදි ප්‍රකාශ කරයි.
- සුභවාදී ආකල්පවලින් යුක්ත ව දිවිමඟ හැඩ ගස්වා ගැනීමට කටයුතු කරයි.
- ස්ථිරසාරතාවයෙන් යුතු ව සමාජ සබඳතා පවත්වයි.

**ඇමුණුම 9.1.4.1**

අතීතයේ එක්තරා පියෙක් හා පුතෙක් තමන්ට අයිති බූරුවකු විකිණීම සඳහා වෙළෙඳ පොළට යමින් සිටිය හ. ඔවුන් මෙසේ යන අතර ඔවුන් ව දකින මිනිසුන් බූරුවාගේ පිටේ නොගොස් පිය පුතු දෙදෙනා පයින් යාම පිළිබඳ සමච්චල් කළහ. "මෙහෙමත් මෝඩ මිනිස්සු බූරුවා ඉද්දි පයින් යනවා" යැයි කීහ. ඉන්පසු පියා තම පුතා බූරුවා පිට තබා තමා පයින් ගමන් කරන්නට විය. එය දුටු තවත් පිරිසක් "වැඩිහිටියා බිම යන විට පුතා උඩ යනවා" යැයි දොස් නැගුහ. ඉන්පසු පුතා බිමට බැස පියා බූරුවා පිට යන්නට විය. මෙසේ මද දුරක් යන විට "අනේ අර අහිංසක කොලුපැටිය බිම යනවා මහ මිනිහා අපූරුවට බූරුවා පිට යනවා" යැයි තවත් පිරිසක් දොස් කීහ. අනතුරුව පිය පුතු දෙදෙනා ම බූරුවා පිට නැගී ගමන් කරන්නට වුහ. එය දකින මිනිස්සු අහිංසක සතෙකුට දෙන වදයක් ඔහොමත් සතුන්ට හිංසා කරනව ද දෙන්නම බිමට බැහැල අමාරුවෙන් යන සතාව උස්සන් යන එක නේද හොඳ යැයි කීහ.

පසු ව දෙදෙනා බූරුවාගේ පා සතර එක්කොට බැඳ ඒ අතරින් ලීයක් දමා ඔසවා ගෙන යන්නට වුහ. අතර මග දී ඒ දණ්ඩක් උඩින් යෑමට සිදු වී බූරුවා දැඟලීම නිසා තිදෙනා ම ගඟට ඇද වැටිණි.

**ඇමුණුම 9.1.4.2**

පහත සඳහන් සිද්ධිය කියවන්න.

අකිල පන්තියේ සිටින කටකාර දරුවෙකි. එමෙන් ම අන් සිසුන්ගේ අවශ්‍යතා ඉටුකර දීමට ද ඔහු නිතර ඉදිරිපත් වේ. වෙනත් පන්තියක ළමුන්ගෙන් තම පන්තියේ ළමයකු හට තර්ජනයක් එල්ල වූ විට ද ඉදිරියට එන්නේ අකිල ය. එහෙත් අකිල තමන්ට පන්තියේ ළමුන්ගෙන් ඇති පිළිගැනීම නිසා ම ඔහුගේ සෑම අදහසක් ම පන්තියේ සෑම ළමයකු ම පිළිගත යුතු ම ය යන වැරදි මතයේ පිහිටා සිටියි.

අකිල :- පසිඳු අද සවසට ඉස්කෝලේ ඇරිල මාත් එක්ක වැවට නාන්න යන්න එන්න ඕන හරිද , බෑ කියන්න බෑ

පසිඳු :- හා මම එන්නම් අකිල

අකිල :- සුදේශ් ඔයාටත් ඇහුණනේ කාපු ගමන් ම වැවට එන්න

සුදේශ් :- හරි වැඩක්නේ, ඔයාට ඕන නම් ඔයා යන්න. ඔයවගේ ගමන් ගිහිල්ල ගිලිල මැරුණොත්

අකිල :- හා එහෙනම් ඒකත් බලා ගමුකෝ. නිශාම් ඔයා මොකද කියන්නේ

නිශාම් :- මට හරියට ම කියන්න බෑ අකිල. මම එන්නම් කියල ගිහින් ගෙදරින් එන්න එපා කීවොත් මම බොරු කාරයෙක් වෙනවා, අනික මේ දවස්වල වැවේ වතුර එච්චර හොඳ නෑ. ඔයා වුනත් ලෙඩ වෙන්න ඉඩ තියෙනවා. ප්‍රවේශම් වෙන්න.

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයා පන්තියට ඉදිරිපත් කරන්න.

1. පසිඳු අකිල සමග වැවට යාමට කැමති වන්නේ කුමන හේතුවක් නිසා යැයි ඔබ සිතන්නේ ද?

2. සුදේශ් අකිලගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ ආකාරය පිළිබඳ ඔබට කුමක් සිතේ ද?

3. නිශාම් අකිලට දුන් පිළිතුර පිළිබඳ ඔබේ අදහස් ලියන්න.

4. අකිල ඔබගෙන් මෙම ඉල්ලීම කළේ නම් ඔබ දක්වන ප්‍රතිචාරය කෙබඳු ද?

## 9.2 තරගකාරී ලොව තුළ යහජීවනය ප්‍රගුණ කරයි

### හැඳින්වීම

යහජීවනයට ඇති හැකියාව නිසා ම මිනිසා තමාටත් තමා අයත් මිනිස් වර්ගයාටත් යහපත් අර්ථයක් සැපයීමට සමත් වූ සත්වයෙකි. එහෙත් මිනිසා විසින් ම නිර්මාණය කරගනු ලැබූ විවිධ මතවාද හා බොහෝ මෙවලම් හේතුවෙන් වර්තමාන මානව සමාජයට වඩාත් ලෞකිකවාදී හා පාරිභෝගිකවාදී සමාජ වාතාවරණයක් තුළ සැරිසරන්නට සිදු වී ඇත. එමගින් ගොඩනැගෙන තරගකාරි ලෝකය, මනුෂ්‍යයාට අවශ්‍ය තරගය හා අනවශ්‍ය තරගය තෝරා බේරා වෙන් කර ගැනීමට නොහැකි තරම් ව්‍යාකූල කෙරෙන අවස්ථා බහුල ය.

උපතින් ම හෘදසාක්ෂිය නැතහොත් හදවතේ හඬ සමග කටයුතු කරන මිනිසාට මෙම තත්වය අභියෝගයකි. දෙගිඩියාවකි. ඒ මිනිසත් බව ඔවුන් සතු ව ඇති බැවිනි. ඇතැම් විටෙක තරගකාරිත්වය විසින් මිනිස්කම නිවට නියාලු බියගුලු තත්ත්වයක් ලෙස හඳුන්වනු දක්නට ලැබේ. එවැනි තන්හි මිනිස්සු මිනිස්කම් හකුළා ගනිති. නොමිනිස්කම් විදහා දක්වති. අරුත් සුන් තරගයන්හි ජය ලැබීමට හඹා යති. යහජීවනය බිඳෙනුයේ එලෙසිනි. එය මිනිසාට තනි තනිවත් සමූහයක් ලෙසත් රිදුම් දෙයි. පාඩු සිදු කරයි.

පුද්ගලයන් සියල්ල ම සමාන නැත. විවිධතා බොහෝ ය. අභිරුචීන් වෙනස් ය. එය ස්වාභාවික යි. ඒ නිසා ම එකිනෙකාගේ ජීවන රටා විවිධ යි. පටු අරමුණු මත සිතා මතා ම ඇති කෙරෙන තරගකාරිත්වය නිසා ස්වභාවයෙන් ම පවත්නා විවිධත්වය දැරිය නොහැකි තරම් සංකීර්ණ වේගයක් බවට පත් කෙරෙන අවස්ථා එමට ය. එය මිනිසා තුළ සාමයට හා මිනිසුන් අතර සාමයට බාධා පමුණුවයි. එනම් තමා සමග සහ සෙස්සන් සමග යහපත් ලෙස ජීවත් වීම නම් වූ යහජීවනයට හානි පමුණුවයි. එය වහා මැඩිහත් විය යුතු සමාජය තත්වයකි. වහා ඉවුකළ යුතු සමාජ මෙහෙවරකි. ගුරු භූමිකාවේ අනිවාර්ය වගකීමකි. එහෙත් එකවර එක රැයින් එක ප්‍රයත්නයකින් සිදු කළ නොහැක්කකි. එබැවින් අද ම පටන් ගත යුතු ය. අප සිටින තැනින් අප අවට අයගෙන් තමාගෙන් ආරම්භ කළ යුතු ය. මිනිසත් බව සිඳී ගිය තැන් හිස් ව ගිය තැන් වහා පිරවීමට සහාය විය යුතු ය.

යහජීවනය ගොඩනැගෙන්නේ පුද්ගල ජීවිතය හා සමාජ ජීවිතය පදනම් කරගෙන බැවින් ළමාවියේ සිට ම යහජීවන ගුණාංග රෝපණය ගැන සැලකිලිමත් විය යුතු ය. පුද්ගලයාගේ ශාරීරික, මානසික, සාමාජික හා ආධ්‍යාත්මික සංවර්ධනයට ඉවහල් වන යහජීවන ගුණාංග පසු කලෙක පුරුද්දක් බවට හා අභ්‍යන්තර පෙළඹවීමත් සහිත නිපුණතාවක් බවට පත්වෙන්නේ එවිට ය. යහපත් මිනිසෙක්, යහපත් පවුලක්, යහපත් සමාජයක් සඳහා බලාපොරොත්තු සහගත විය හැක්කේ එමගින්, දිගුකාලීන හා පුළුල් ලෙස ජාතික සංවර්ධනයට එය මනා අත්තිවාරමක් සපයයි. තමා කෙරෙහි තම පවුල කෙරෙහි තමා අයත් ආයතනය කෙරෙහි අන්‍ය පුරවැසියන් කෙරෙහි තම රට කෙරෙහි තම මිනිස් වර්ගයා කෙරෙහි වගකීමක් ඇති මිනිසුන් බිහිකර ගැනීමට හා රැක ගැනීමට එම ක්‍රියාවලිය හේතු වන බැවිනි.

හුදෙක් කියවීමෙන් හෝ ඇසීමෙන් පමණක් යහජීවන ගුණාංග ප්‍රතිෂ්ඨාපනය හෝ සංරක්ෂණය කිරීම කළ නොහැකි ය. ඒ සමග ම ඒවා ප්‍රගුණ කිරීම කළ හැකි ය. ඒ සමග ම ඒවා ප්‍රගුණ කිරීමේ ප්‍රායෝගික අවස්ථා සම්පාදනය කළ යුතු ය. ගුරුවරයා සතු ව පවත්නා සීමිත කාලය හා අවකාශය

තුළ හැකි උපරිමයෙන් ඒ සඳහා නිර්මාණශීලී වීම මහත් සේ වටින්නේ ය. හර සුන් අනුකරණවාදී චර්යාවන්ගෙන් දරුවා මුදවාගෙන බහුශ්‍රැත භාවය හා ගුණ නැණ බලය පදනම් කර ගත් යහජීවනය පිළිබඳ උදාර හැඟීම් ඇති කිරීමට ගුරුවරයා පෙරමුණ ගත යුතු වේ. යහජීවනයේ අගය දකිමින් යහජීවන ගුණාංග සහිත ව තම ජීවිතය ගොඩනැඟීම පිළිබඳ ආත්ම විශ්වාසය ඔවුන් තුළ ස්ථාපිත කළ යුතු වේ. නිවැරදි දේ නිවැරදි ලෙස සිදු කරන, තමා පිළිබඳ ව ආත්ම අභිමානය ඔවුන් තුළ ජනිත වන්නේ එමගිනි.

එපමණක් ද නොවේ. යහපත් ජීවන දර්ශනයක් සහිත පුරවැසියන් රටකට හිමි කර දීමට ද එවැනි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සමත් වේ. එමගින් දරුවෝ තම හෘද සාක්ෂියේ ප්‍රතිජනනාත්මක පක්ෂය දියුණු කර ගනිමින් ස්වාත්ම පරමාදර්ශය කරා ගමන් කරන්නෝ වෙති. නැතහොත් මිනිසකු වශයෙන් තමා ළඟා විය යුතු උසස් ම තත්ත්වය කරා සකස් වෙමින් අළුත් වෙමින් අභීත ව ඉදිරියට යන්නෝ වෙති. ඔවුහු සෑම දෙයක් දෙස ම නිරවුල් වුත් විවෘත වූත් ගැඹුරු වුත් නිර්මාණාත්මක වුත් ලෙසින් බලති. එසේ ම තර්කානුකූල ලෙස හා හේතුඵලවාදී ලෙස දකිති. හුදෙක් තෝරා ගත් එක් දෙයක් හෝ කිහිපයක් වෙත රැඳී නොසිටිති. අගතින්ට ලක් නොවී සමබර ව හා සමස්ත වශයෙන් විමසති.

ශාන්ත ඉන්ද්‍රියයන් හා සරුසාර මනසක් හිමි ඔවුහු තම සමාජ වගකීම් කෙරෙහි ද සර්වඥානක වෙමින් ඒ සඳහා ස්වශක්තිය මෙහෙය වන්නෝ වෙති. එවැන්නෝ ජීවගුණයෙන් (quality of life ) උසස් වෙති. යහජීවන ගුණාංගයන්ගෙන් පෝෂිත වූ ජීවගුණයෙන් අනූන එවැනි පුරවැසියෝ පෞද්ගලික ව තමන්ට ආශීර්වාදයක් වෙති. රටට ද ආශීර්වාදයක් වෙති.

**නිපුණතාව** : තරගකාරී ලොව තුළ යහජීවනය ප්‍රගුණ කරයි.

**නිපුණතා මට්ටම** :
- 9.2.1 තරගකාරී ලොව තුළ යහජීවන අවශ්‍යතාව විමර්ශනය කරයි.
- 9.2.2 යහජීවනයට තුඩුදෙන ගුණාංග අනුගමනය කරයි.

**විෂය අන්තර්ගතය :**

තරගකාරී ලොව තුළ අවශ්‍යතාව විමර්ශනය කරයි.
- යහජීවනයක අවශ්‍යතාව
- යහජීවන ගුණාංග හඳුනා ගැනීම

යහජීවනයට තුඩුදෙන ගුණාංග අනුගමනය කරයි.

- යහජීවන ගුණාංග අනුගමනය නොකිරීමෙන් මතුවන විවිධ තත්ත්ව
- යහජීවන ගුණාංග ජීවිතයට අදාළ කර ගැනීම

## 9.2.1 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- තරගකාරී ලොව තුළ යහජීවනය ප්‍රගුණ කරයි.

**නිපුණතා මට්ටම** :- තරගකාරී ලොව තුළ යහජීවන අවශ්‍යතාව විමර්ශනය කරයි..

**ක්‍රියාකාරකම** :- " ප්‍රගුණ කරමු යහගුණ "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.2.1.1. සඳහන් කතාන්දරය
- ඇමුණුම 9.2.1.2 සඳහන් කාර්ය පත්‍රිකාව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.2.1.1**

- ඇමුණුම 9.2.1.1. හි දැක්වෙන "අවංක දර කපන්නා සහ නැති වූ පොරව " පිළිබඳ කතාන්දරය කෙටියෙන් ඉදිරිපත් කරන්න.
- ඉන් ලැබෙන පණිවුඩය පිළිබඳ සිසු අදහස් විමසන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි කෙටි සාකච්ඡාවක යෙදෙන්න.

- තම අවශ්‍යතාවට සරිලන දේ පමණක් ලබා ගැනීමෙන් සෑහීමට පත්වීම යහජීවනයේ එක් ගුණාංගයක් බව
- තමාට අත්‍යවශ්‍ය නොවන දේ සඳහා යොමුවීමෙන් අයහපත් තත්ත්වයක් උදාවන බව
- අවංකත්වය දිගුකාලීන ව යහපත් ප්‍රතිඵල උදා කරන බව

**(මිනිත්තු 10 යි)**

**පියවර 9.2.1.2**

- ඇමුණුම 9.2.1.2 සිසුන්ට ලබා දී එහි දැක්වෙන උපදෙස් අනුව කටයුතු කිරීමට පවරන්න.
- මඟපෙන්වීම් සිදුකරමින් අවශ්‍ය පහසුකම් සපයන්න.

**(මිනිත්තු 15යි)**

**පියවර 9.2.1.3**

- සිසුන්ට ඉදිරිපත් කිරීම්වලට අවස්ථාව දෙන්න.
- සියලු අදහස් සැලකිල්ලට ගනිමින් පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- මහත්මා ගාන්ධි තුමාගෙන් අපට ආදර්ශ රැසක් ගත හැකි බව
- සංකීර්ණ සමාජය තුළ දී පුද්ගල අවශ්‍යතා විවිධ වී ඇති බව
- පුද්ගල අවශ්‍යතා විවිධත්වයට පත්වුව ද ඒ කෙරෙහි දැඩි ලොල් නොවී අත්‍යවශ්‍ය දේ පමණක් තෝරා බේරා ගත යුතු බව
- එදිනෙදා ජීවිතය අසීමිත උවමනාවන්ගෙන් පුරවා ගැනීම මානසික සහනය තුරන් කරන බව
- පුද්ගල අවශ්‍යතා හා ලැදියා ප්‍රමුඛත්වය අනුව පෙළ ගස්වා ගැනීම ජීවිතයට පහසුවක් වන බව
- ලැදියා අර්ථවත් ව හසුරුවා ගනිමින් තමන්ටත් අන්‍යයන්ටත්, බරක් නොවන ලෙස ජීවත්වීම "යහජීවනය" ලෙස හැඳින්විය හැකි බව

**(මිනිත්තු 15 යි)**

## තක්සේරුව හා ඇගයීම

- "යහජීවනය" අර්ථ දක්වයි.
- යහජීවනයෙහි අවශ්‍යතාව කරුණු දෙකකින් සනාථ කරයි.
- යහජීවනය දිරිගැන්වීම සඳහා ආදර්ශ පාඨයක් සකස් කරයි.
- යහජීවනය ආරම්භ විය යුත්තේ තම තමා වෙතින් බව දැන ඒ සඳහා අධිෂ්ඨානශීලී වෙයි.
- සෙස්සන් සමග යහජීවනය පිළිබඳ ව සාකච්ඡා කරයි.

**ඇමුණුම 9.2.1.1.**

**අවංක දර කපන්නා සහ නැති වූ පොරව**

එක්තරා දරා කපන්නෙක් යකඩයෙන් තැනූ තම පොරව රැගෙන කැලයට ගොස් දර කපද්දී කිසියම් හේතුවකින් පොරව තලය ගැල වී විසි වී ගඟට වැටී නොපෙනී ගියේ ය. දර කපන්නා පොරව සෙවූ මුත් සොයා ගත නොහැකි ව බෙහෙවින් අසරණ ව වැලපෙන්නට විය. දර කැපීම ඔහුගේ ජීවිකාව වු බැවිනි.

ඒ මොහොතේ එක්තරා රුක් දෙවියෙක් ඔහුගේ පිහිටට පැමිණ විස්තර අසා රන් පොරවක් ඔහුට පෙන්වා නැති වූ පොරව එය දැයි විචාරී ය. ලැබුණේ " නැත " යන පිළිතුරයි. දෙවනු රිදී පොරවක් පෙන්වා විමසී ය. ඊට ද පිළිතුරු " නැත " යන්නයි. තෙවනු ව ඔහුගේ නියම යකඩ පොරව පෙන්වී ය. ඔහු බොහෝ සතුටට පත් ව එය තමාගේ දැන්වී ය. ප්‍රසාදයට පත් වූ රුක් දෙවියා දර කපන්නාගේ අවංකකමට ත්‍යාගයක් වශයෙන් පොරොව තුන ම ඔහුට දුන්නේ ය.

දර කපන්නාගෙන් මේ පුවත අසා දැන ගත් තවත් පුද්ගලයෙක් ඒ පරිදිදෙන් ම තම යකඩ පොරව ගඟට දමා වැලපෙමින් සිටියේ ය. රුක් දෙවියා පැමිණ රන් පොරව ඉදිරිපත් කොට පෙර පරිදි විමසී ය. එය තමාගේ බව කී විට රුක් දෙවියා ඔහු මුසාවක් කී බව පවසා එක ද, පොරවක්වත් හිමි නොවන බව දන්වා යන්නට ගියේ ය.

**ඇමුණුම 9.2.1.2**

**කාර්ය පත්‍රිකාව**

* මහත්මා ගාන්ධි තුමා පිළිබඳ ව විස්තර ඇතුළත් පත්‍රිකාවක් / ලිපියක් සපයන්න.
* මහත්මා ගාන්ධි තුමා තුළ තිබූ යහජීවන ගුණාංග ලැයිස්තු ගත කරන්න.
* මහත්මා ගාන්ධි තුමා තුළ මෙන් ම ඔබ තුළ ද ඇති යහජීවන ගුණාංග ලියන්න.
* ඔබ හඳුනාගත් ප්‍රගුණ කළ යුතු යහජීවන ගුණාංග සටහන් කර එය ප්‍රදර්ශනය කරන්න.

# 9.2.2 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- තරගකාරී ලොව තුළ යහජීවනය ප්‍රගුණ කරයි.

**නිපුණතා මට්ටම** :- තරගකාරී ලොව තුළ යහජීවන අවශ්‍යතාව විමර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** :- " අමිල ගුණ දම් "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :- • ඇමුණුම 9.2.2.1

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.2.2.1**

- සිසුන් දන්නා ලෝහ වර්ග කිපයක නම් අසා ඒවා කළුලෑල්ලේ ලියන්න.
- යහජීවනය සඳහා වැදගත් වන පුද්ගල ගුණාංග කීපයක් විමසා ඒවා ද කළුලෑල්ලේ ලියන්න.
- ලෝහ අතුරින් වඩා වටිනා ලෝහයන් යහජීවන ගුණාංග අතුරින් වඩා වටිනා ගුණාංගයන් විමසන්න.

  මෙහි දී මතුවන අදහස් අසුරින් පහත කරුණු අවධාරණය කරන්න.

- භෞතික වශයෙන් පවත්නා දේ සඳහා වටිනාකමක් නියම කළ හැකි වුවත් පුද්ගල ගුණාංග සඳහා එසේ කළ නොහැකි බව
- වටිනාකමින් ඉහළ ම ද්‍රව්‍යවලටත් වඩා සෑම පුද්ගල ගුණාංගයක් ම උසස් බව
- අවංකත්වය දිගුකාලීන ව යහපත් ප්‍රතිඵල උදා කරන බව

**(මිනිත්තු 05 යි )**

**පියවර 9.2.2.2**

- සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න.
- ඇමුණුම 9.2.2.1 හි දැක්වෙන ප්‍රකාශන අතුරින් ප්‍රකාශන පහ බැගින් සිසුන්ට ලබා දී එම කාර්ය පත්‍රිකාවේ සඳහන් ආකාරයට සිසුන් වැඩෙහි යොදවන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් සූදානම් කරවන්න.

**(මිනිත්තු 15 යි)**

**පියවර 9.2.2.3**

- ඒ ඒ කණ්ඩායම් විසින් ගොනු කළ යහජීවන ගුණාංග ලැයිස්තු ඉදිරිපත් කරමින් අදහස් දැක්වීමට අවස්ථාව දෙන්න.
- පහත දැක්වෙන කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- යහජීවන ගුණාංග යනු යහපත් මිනිස් ලක්ෂණ බව

උදා:-

- අවංක වීම
- සතුටින් සිටීම
- ලදදෙයින් සතුටුවීම
- සැහැල්ලු දිවිපැවැත්ම
- සුහද බව
- සමබරව ජීවත්වීම
- ඉවසීම
- අන්අයගේ හොඳ දැකීම
- කාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම
- මැනවින් සවන් දීම
- ස්තුති කිරීම
- කරුණාවන්ත වීම
- වරද පිළිගැනීම
- උදව් කිරීම
- මැදහත් වීම
- ශුභවාදී වීම
- පරිත්‍යාග කිරීම
- කඩිසර වීම
- අන් අයගේ සිත් නොරිදු වීම
- සුහද වීම
- ධෛර්යවන්ත වීම
- අර පරෙස්සම් සහිත වීම
- ඉතිරි කිරීම
- සොබා දහමට ආදරය කිරීම

(ඉහත සඳහන් ගුණාංග හැකි පමණින් අපගේ ජීවිතවලට ළංකර ගත යුතු ය.)

**(මිනිත්තු 20 යි)**

## තක්සේරුව හා ඇගයීම

- යහජීවන ගුණාංග නම් කරයි.
- යහජීවන ගුණාංග ප්‍රගුණ කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- යහජීවන ගුණාංග ගැන කියැවෙන විවිධ ප්‍රකාශන රැස් කරයි.
- යහජීවන ගුණාංග තම ශක්ති පමණින් ප්‍රගුණ කිරීමට උත්සාහ දරයි.
- යහජීවන ගුණාංග කරා සමීපතමයන් මෙහෙයවයි.

**ඇමුණුම 9.2.2.1**

- පහත දැක්වෙන ප්‍රකාශන හොඳින් කියවන්න.
- ඒවා ඇසුරින් පුද්ගලයකු විසින් ප්‍රගුණ කර ගත යුතු යහජීවන ගුණාංග පහක් ලියන්න.
  ඉන් දෙකක වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

1. සැමට ම ඕනෑ කරන වාතය කිසිදාක ගණන් උස්සා නැත.
2. අප සමග පොර බදන්නෝ අපට ඉවසීම ද ශක්තිය ද දෙති.
3. හැම දෙයක ම වැරදි පමණක් සොයන්නකු නොවන්න.
4. කාලයෙන් වැඩ ගැනීමේ විශේෂඥයකු වන්න.
5. කතාබස් කරන විට නිහඬ විය යුතු අවස්ථාව තේරුම් ගන්න.
6. ස්තුතියි කීමට පුරුදු වන්න.
7. කාරුණික, දයාවන්ත අයකු ම වන්න.
8. තම වරද බිය නැති ව පිළිගන්න.
9. අහංකාරකම උඩ යන විට පුද්ගලයා පහතට යයි.
10. දුක පළවා හැරීම සඳහා නිතර සිනාමුසු මුහුණින් ඉන්න.
11. අන් අයට ඕනෑ කරන අයකු වන්න.
12. විවේචනය කරන අයට පිළිතුරු දීමට කාලය නාස්ති නොකරන්න.
13. සැම කරදරයක් තුළ ම වටිනා පාඩමක් ඇත.
14. අලසයාට කිට්ටුවන්නේ එවැනි අලසයන් හෝ මහා අලසයන් ය.
15. ලබන්නන්ට වඩා සතුට ලබන්නේ දෙන්නෝ ය.
16. ඇනුම් පද කියන්නාට ඇනුම් පද ඇසීමට ද සිදුවේ.
17. ඕනෑවට වඩා සැප පහසුවට කෑදරයකු නොවන්න.
18. ඉතිරි කරන්නට පුරුදු වූ අයකු මෙතෙක් බංකොලොත් වී නැත.
19. නිකම් හිටියොත් හිතේ හැටියට නිකම් ඉන්න ලැබේ.
20 සොබාදහම තරම් මැජික් කාරයකු ලොවේ නැත. එහි අසිරිය නරඹන්න අසන්න, භුක්ති විඳින්න.

**සැ.යු.** මීට සමාන වෙනත් ප්‍රකාශන ද ඔබට එකතු කර ගත හැකි ය. එක් කණ්ඩායමකට ඉන් පහක් පමණ ලබා දීම ප්‍රමාණවත් ය.

## 9.2.3 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- තරගකාරී ලොව තුළ යහජීවනය ප්‍රගුණ කරයි.
**නිපුණතා මට්ටම** :- යහජීවනයට තුඩු දෙන ගුණාංග අනුගමනය කරයි.

**ක්‍රියාකාරකම** :- " යහ ගුණ දම් සුරකින්නෝ රට ජාතිය නංවන්නෝ "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-
- ඇමුණුම 9.2.3.1 හි සඳහන් නිරීක්ෂණ පත්‍රිකාව
- ඇමුණුම 9.2.3.2 හි සඳහන් පුවත්පත් වාර්තා

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.2.3.1**

- පළමු ව පංතියේ සිසුන් පස් දෙනෙකු පමණ නිරීක්ෂණ කණ්ඩායම ලෙස වෙන් කරන්න.
- නිරීක්ෂණ කණ්ඩායමට ඇමුණුම 9.2.3.1 හි සඳහන් නිරීක්ෂණ පත්‍රිකාව ලබා දී සෙසු සිසුන් කණ්ඩායම් වන ආකාරය පිළිබඳ ව සටහන් තබා ගැනීමට පවරන්න.
- පංතියේ සෙසු සිසුන්ට විනාඩි තුනකින් ඩෙස්ක්, පුටු, සකස් කර ගනිමින් කුඩා කණ්ඩායම් පහකට වෙන් වීමට පවරන්න.
- විනාඩි තුනකින් පසු සිසු අවධානය ලබා ගනිමින් නිරීක්ෂක සිසුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
  කෙටි සාකච්ඡාවකින් පහත සඳහන් කරුණු ඉස්මතු කරන්න.

- එදිනෙදා ජීවිත අවස්ථාවන් හි දී යහජීවන ගුණාංග මග හැරී යාම නොදැනුවත්ව ම සිදු විය හැකි බව
- සිතා මතා කල්පනාකාරී ව කටයුතු නොකිරීමෙන් යහජීවන පුරුදු කඩ විය හැකි බව
- විවිධ ජීවිත අවස්ථාවන් හි දී යහජීවන ගුණාංග අනුගමනය නොකිරීමෙන් බොහෝ අවාසිදායක තත්ත්වයක් ඇති වන බව
  උදා:-පවුල තුළ දී, පාසල තුළ දී මග තොට දී, සුන්දර ස්වභාවික ස්ථානවල දී, සමාජයේ විවිධ ආයතනවල දී

**(මිනිත්තු 10 යි)**

**පියවර 9.2.3.2**

- පළමු වන පියවරේ දී සකස් වීමට පැවරූ සිසු කණ්ඩායම්වලට නිරීක්ෂණ කණ්ඩායම ද ඇතුළත් කර කණ්ඩායම් පහක් වෙන් කරන්න.
- ඇමුණුම 9.2.3.2 හි සඳහන් පුවත්පත් වාර්තා එක බැගින් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- එහි දැක්වෙන වගුව සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් පැහැදිලි කරන්න.
- මග පෙන්වීම් සිදු කරමින් ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් සූදානම් කරන්න.

**(මිනිත්තු 15යි)**

**පියවර 9.2.3.3**

- කණ්ඩායම් ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම්වල අදහස් ද ඇසුරු කර ගනිමින් විවෘත සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඇමුණුම 9.2.2.1.3 ද ප්‍රයෝජනයට ගනිමින් පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- කුඩා කාලයේ සිට ම එදිනෙදා ජීවිත අවස්ථාවල දී යහජීවන ගුණාංග පුරුදු පුහුණු නොකිරීම පසුකාලීන වැඩිහිටි ජීවිතයේ දී ඉතා බරපතල සිදුවීම්වලට හේතුවන බව
- යහජීවන ගුණාංග ප්‍රගුණ නොකිරීමෙන් වටිනා මිනිස් ජීවිත, සත්ව ජීවිත, පොදු දේපළ හා ස්වභාවික පරිසරය ආදී සියල්ල කෙරෙහි අහිතකර බලපෑම් එල්ල වන බව

  උදා:-- මිනිසාගේ ජීවිත කාලය අවාසනාවන්ත ලෙස ගෙවී යාම
  - අන්තර් පුද්ගල සබඳතා බිඳ ගැනීමෙන් පුද්ගලයා හුදකලා තත්ත්වයට පත්වීම
  - ස්වභාවික සම්පත් විනාශ වී යාම
  - වියදම් වැඩි වීම නිසා ඉතිරි කිරීම් අඩුවීම
  - පවුලක ආදායමේ සිට ජාතික ආදායම දක්වා විවිධ මට්ටමේ නාස්ති සිදු වීම
- යහජීවන ගුණාංග අනුගමනය නොකිරීම පුද්ගල සංවර්ධනයේ සිට ජාතික සංවර්ධනය දක්වා විවිධ මට්ටමේ සංවර්ධනයන් අඩාල කරන බව

**(මිනිත්තු 15යි)**

## තක්සේරුව හා ඇගයීම

- යහජීවන ගුණාංග පවත්වා නොගැනීමෙන් මතු වන ගැටලුකාරී තත්වයන් ලැයිස්තුගත කරයි.
- යහජීවන ගුණාංග ප්‍රදර්ශනය නොකිරීම පුද්ගල සංවර්ධනයට අහිතකර ලෙස බලපාන ආකාරය පිළිබඳ ව අදහස් දක්වයි.
- පුරවැසියන් තුළ යහජීවන ගුණාංග තහවුරු නොවීම ජාතික සංවර්ධනය අඩාල කරන ආකාරය සංක්ෂිප්ත සටහනකින් දක්වයි.
- යහජීවන ගුණාංග අනුගමනයට අධිෂ්ඨානශීලී වෙයි.
- යහජීවන ගුණාංග නොසලකා හැරීමේ ආදීනව පැහැදිලි කරමින් අන් අයට නිවැරදි මඟ පෙන්වයි.

**ඇමුණුම 9.2.3.1**

* ඔබගේ මිතුරු මිතුරියන්ගේ හැසිරීම් දෙස හොඳින් බලන්න.
* පහත සඳහන් හැසිරීම්, එක් අයකු වෙත හෝ පවතී නම් අදාළ තීරුවේ ✓ ලකුණ යොදා පෙන්වන්න.

| අනු අංකය | හැසිරීම | ඔව් | නැත |
|---|---|---|---|
| 1. | දැඩි ඝෝෂාකාරී ලෙසින් හැසිරෙයි | | |
| 2. | භාණ්ඩවල ආරක්ෂාව ගැන සැලකිලිමත් නොවෙයි | | |
| 3. | තමාගේ අසුන ගැන පමණක් වැඩිපුර උනන්දු වෙයි | | |
| 4. | පවරන ලද කාර්යය මග හැර අලස ව බලා සිටියි | | |
| 5. | අන් අයට දොස් පවරමින් කෑකෝ ගසයි | | |
| 6. | ඉවසීමෙන් කටයුතු නොකරයි | | |
| 7. | තමාගේ වෙනත් වැඩක යෙදී සිටියි. | | |

මීට අමතර ව ඔබ කණ්ඩායමේ අදහස් ඇතොත් ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 9.2.3.2**

- * පහත සඳහන් පුවත්පත් වාර්තා එක බැගින් සාකච්ඡාවට භාජනය කරන්න.
- * ඔබ කණ්ඩායමේ අදහස් ද ඇතුළත් කරමින් දී ඇති වගුව පුරවන්න.

1. පවුලේ වත්කම් බෙදා ගැනීමේ සාකච්ඡාව දෙදෙනෙකුට මරු කැඳවයි.

   සහෝදර සහෝදරියන් අතර ඉඩකඩම් බෙදා වෙන් කිරීම පිළිබඳ ව පැවති මත භේදය උග්‍ර වී බාල සහෝදරයා විසින් එල්ල කරන ලද පොලු පහර වැඩිමහල් සහෝදරයාගේ ජීවිතය අහිමි කළේ ය. දෙපාර්ශ්වය අතර සමගිය සඳහා පවුලේ සෙසු අය දැරූ සියලු උත්සාහයන් නිශ්ඵල වී බාල සහෝදරයාගේ ජීවිතය ද ඥාතී සහෝදරයා අතින් මරුමුවට පත්විණි. එම පවුලේ දරුවන් අතර පැවති අසමගිය නිසා කලකට පෙර මව්පිය දෙපළ වැඩිහිටි නිවාසයකට ඇතුළත් වූ බව ද ප්‍රදේශවාසීහු කියති.

2. බීමත් ව රිය පදවන්නන්ගේ රියදුරු බලපත්‍රය අහෝසි කළ යුතු ය.

   ශ්‍රී ලංකාව තුළ කාලයක සිට සැමතැන ම පාහේ වාහන අනතුරුවලින් මිය යන සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. මාර්ග නීතිරීති තුට්ටුවකටවත් ගණන් නොගන්නා ඇතැම් රියදුරන් බීමත් ව හිතුවක්කාරී ලෙස ක්‍රියා කිරීම මීට ප්‍රධාන හේතුවකි. පෞද්ගලික දේපල හා රජයේ දේපල විනාශ කරමින් වාහනය අතට ගෙන ඔවුන් ඉගිලෙන්නේ ඉතාම අපරීක්ෂාකාරී ලෙස ය. ඊට අමතර ව මගීන් සම්බන්ධයෙන් ඔවුන්ගේ පැවැත්ම හා කතාබහ ද අමිහිරි ය. අනවශ්‍ය තරගයක් මවමින් මහා මාර්ග විනය කඩ කරන එවැනි අය අතර යහපත් ප්‍රවාහන සේවයකට දායකත්වය සැපයීමේ උවමනාව සහිත රියදුරු මහත්වරුන් ද සිටින බව මෙහි දී සිහිපත් කළ යුතු වේ.

3. අරපරෙස්සම අඩු වීම පාසල්වල භෞතික සම්පත් විනාශය කෙරෙහි බලපායි.

   පාසල් සතු භෞතික සම්පත්වල අඩුපාඩු පවත්නා බව සත්‍යයකි. එහෙත් තිබෙන සම්පත් උපරිම ලෙස ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය හැඟීම් හා සිතුවිලි දරුවන් තුළ ප්‍රමාණවත් ව වර්ධනය නොවීම මෙම අඩුපාඩුව තවත් උග්‍ර කරයි. පාසල් උපකරණ භාවිතයේ දී අපරීක්ෂාකාරී ලෙස කටයුතු කිරීම නිසා පාසල් තුළ අබලි ද්‍රව්‍ය ගොඩ ගැසෙමින් පවතී. ඒවා නැවත පිළිසකර කොට පාවිච්චියට ගත හැකි දැයි සොයා බැලීමේ පියවර කඩිනම් කිරීමට මේ හොඳ ම කාලය යි.

4. ඇතැම් නරඹන්නන් නිසා ජාතික වටිනාකමක් ඇති අපේ ස්වාභාවික සුන්දර ස්ථාන සංරක්ෂණය කිරීම අසීරු වෙයි.

ලෝකාන්තය, බෝපත් ඇල්ල, හුම්මානය ආදී සුන්දර ස්ථාන දිගුකාලීන ස්වභාවික තත්ත්වයන් යටතේ අපට ලැබුණු දායාද ය. ඒවා නැරඹීමට යන ඇතැම් දේශීය හා විදේශීය සංචාරකයන් එම ස්ථාන කෙරෙහි දක්වන අඩු සෙනෙහස හා ආරක්ෂාකාරී බව නිසා අනාගත පරපුරට ඒවායේ සැබෑ සුන්දරත්වය අත්විඳ ගැනීමේ හැකියාවට තර්ජන එල්ල වෙමින් පවතී. තමන් ගෙන යන පොලිතින් මලු, කෘත්‍රිම දවටන, ප්ලාස්ටික් බෝතල් ආදිය තැන තැන දමා එන ඔවුන් සැබැවින් ම එම ස්ථාන නරඹා සතුටු වන්නට ගිය අයදැයි තමන් ගෙන් ම ප්‍රශ්න කරනු ඇත.

5. තම අවශ්‍යතාව ඉටු කර ගැනීම සඳහා අදාළ නිලධාරීන් හමු වූ සේවාලාභියකුට අප්‍රසන්න වාග් ප්‍රහාරයක් එල්ල වෙයි.

තම රාජකාරිය මැනවින් ඉටු කරන යහපත් නිලධාරීන් බහුතරයක් සිටියත් තවමත් තම සේවාව ගැන කිසි අවබෝධයක් නොමැතිකමින් මහජනතාව පීඩාවට පත් කරන මහජන සේවකයන් සිටීම කණගාටුවට කරුණකි. කාර්යාලයෙන් ඉටු විය යුතු සේවාව කල් දැමීම නිසා තමන්ට සිදු වූ අවාසිය ගැන දුක් ගැනවිල්ලක් ඉදිරිපත් කළ පුද්ගලයකුට තවදුරටත් ඉවසන ලෙස අදාළ බලධරයන් දන්වා ඇත්තේ නොරුස්සන වචන ද භාවිත කරමිනි. අඩු වශයෙන් තම සේවාලාභීන්ට සවන් දෙන සේවා දායකයන් හා හාම්පුතුන් ඇති කර ගැනීම පුද්ගල හා සමාජ ජීවිත පහසු කරනු ඇත.

| යහජීවන ගුණාංග අනුගමනය නොකිරීම | |
|---|---|
| පුද්ගලයාට බලපාන ආකාරය | සමාජයට බලපාන ආකාරය |
| 1. ....................................... | 1. ....................................... |
| 2. ....................................... | 2. ....................................... |
| 3. ....................................... | 3. ....................................... |

## 9.2.4 ක්‍රියාකාරකම

**නිපුණතාව** : තරගකාරී ලොව තුළ යහජීවනය ප්‍රගුණ කරයි.

**නිපුණතා මට්ටම** : යහජීවනයට තුඩුදෙන ගුණාංග අනුගමනය කරයි.

**ක්‍රියාකාරකම** : " යහජීවනයෙන් දිවිමග සරුවෙයි "

**කාලය** : මිනිත්තු 40 යි

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 9.2.4.1 හි සඳහන් ගුරු උපදෙස් පත්‍රිකාව
- ඇමුණුම 9.2.4.2 හි දැක්වෙන ක්‍රියාකාරකම් ලැයිස්තුව
- ඇමුණුම 9.2.4.3 හි දැක්වෙන රූපික සටහන් ආකෘතිය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 9.2.4..1**

- සිසුන් පහසු ලෙස අසුන් ගන්වන්න.
- ඇමුණුම 9.2.4.1 හි සඳහන් ගුරු උපදෙස් පත්‍රිකාව අනුව සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- ක්‍රියාකාරකම නිමවීමෙන් පසු සිසුන්ට දැනුණු හැඟීම් විමසන්න.
- පහත කරුණු ඉස්මතු කරමින් මනසේ සන්සුන් බව තහවුරු කරන්න

| |
|---|
| • තමා තුළ යහජීවන ගුණාංග දියුණු කර ගත යුත්තේ තමා විසින් ම බව<br>• තමා තුළ යහජීවන ගුණාංග දියුණු කර ගැනීමට අවශ්‍ය තරම් ශක්තිය තමා සතු ව ඇති බව<br>• ඕනෑකම ඇත්නම් තමාට ක්‍රමයෙන් ඉතා උසස් යහජීවන ගුණාංග ඇති අයකු බවට පත් විය හැකි බව<br>• යහජීවන ගුණාංග සහිත වීම තම ජීවිතයට පහසුවක් වන බව |

**(මිනිත්තු 08 යි)**

**පියවර 9.2.4.2**

- සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න.
- දැන උගත් යහගුණාංග පදනම් කර ගනිමින් ඇමුණුම 9.2.4.2 මගින් සපයා ඇති එක් අවස්ථාවක් නිරූපණය වන පරිදි විනාඩි දෙකකින් ඉදිරිපත් කළ හැකි භූමිකා රංගනයක් නිර්මාණය කිරීමට මඟ පෙන්වන්න.
- ඇමුණුම 9.2.4.3 හි දැක්වෙන රූපික සටහන සිසුන්ට ලබා දී ඒ ඒ භූමිකා රංගන නිරීක්ෂණය කරමින් එම ආකෘතිය සම්පූර්ණ කළ හැකි ආකාරය පිළිබඳ ව තනි තනි ව සිතා බැලීමට උපදෙස් දෙන්න.

**(මිනිත්තු 12 යි)**

**පියවර 9.2.4..3**

- ඒ ඒ භූමිකා රංගනය ඇසුරින් හා තමාට හැඟෙන අයුරින් රූපික සටහනට ඇතුළත් කළ හැකි කරුණු තනි තනි ව සටහන් කර ගත යුතු බව සිහිපත් කරන්න.
- එකකට විනාඩි දෙක බැගින් ලබා දෙමින් භූමිකා රංගන ඉදිරිපත් කරන්න.
- භූමිකා රංගන ඉදිරිපත් කොට නිම වූ පසු සටහන සඳහා තනි තනි ව ගොනු කර ගත් දේ ඉදිරිපත් කිරීමට ඒ ඒ කණ්ඩායමට අවස්ථාව දෙන්න.
- පහත දැක්වෙන කරුණු තහවුරු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- පුද්ගලයාගේ ශාරීරික, මානසික, සාමාජික හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා යහජීවන ගුණාංග හේතු වන බව
- ශාරීරික සංවර්ධනය සඳහා
  - උදෑසන පිබිදීම
  - තම පෞද්ගලික පවිත්‍රතා කටයුතු නිසි ලෙස සිදු කිරීම.
  - අවම වියදමකින් හිතකර ආහාරපාන පමණක් ලබා ගැනීම.
  - අවශ්‍ය ව්‍යායාම ලබා ගැනීම අරමුණු කොට නිවසේ කටයුතුවල යෙදීම.
  - නින්ද සහ විවේකය ක්‍රමානුකූල සැලසුමකට අනුව ලබා ගැනීම
  - ශරීරයේ බාහිර ප්‍රියමනාප බව පිළිබඳ ව සැලකිලිමත් වීම.
- මානසික සංවර්ධනය සඳහා
  - අන් මතවලට සවන් දීම
  - තම අදහස් සන්සුන් ව හා නිරවුල් ව ඉදිරිපත් කිරීම
  - මැදහත් ලෙසින් අන් අයට කරුණු පැහැදිලි කර දීම
  - දුර දිග බලා තීරණ ගැනීම
  - නිරතුරු පොතපත හෝ යෝග්‍ය මාධ්‍ය ඇසුරු කරමින් විචාරශීලී වීම
  - ගැටලු දෙස පුළුල් ලෙස බැලීම

- සාමාජික සංවර්ධනය සඳහා
    - අවශ්‍ය තැන්හි සමාව ගැනීම හා ස්තුති කිරීම
    - හැකි හැම කල්හි ම අන් අයට උදව් කිරීම
    - සුහද අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීම
    - පොදු දේපල සාධාරණ ලෙස පරිහරණය කිරීම
    - ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම
    - සම්මත නීතිරීති හා සාම්ප්‍රදායයන්ට ගරු කිරීම සහ වෙනත් යහපත් දේ
- ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා
    - සතුටින් සිටීම
    - ලද දෙයින් සතුටු වීම
    - කාරුණික වීම
    - නිහතමානී වීම
    - ශුභවාදී වීම
    - සැහැල්ලු දිවි පැවැත්මක් සහිත වීම
- තමා සතු ව අඩුවෙන් පවත්නා යහජීවන ගුණාංග පුරුදු පුහුණු කර ගැනීමේ ආරම්භක අවස්ථාව උදා වනුයේ හෙට නොව අද ම මේ මොහොතේ ම බව
- ජීවිත කාලය තුළ මුහුණ දීමට සිදු වන ගැටලු හෝ දුක්ඛ දෝමනස්සයන් පාලනය කළ නොහැකි වුවත් ඒවාට මුහුණ දීමේ යහජීවන ගුණාංග ඉස්මතු කර ගැනීමෙන් එම තත්ත්වයන්ගේ කටුක හෝ අයෝග්‍ය සම්පන්න බව අවම කර ගත හැකි බව
- සතුටින් හා අර්ථ සම්පන්න බලය තනි ව ජීවත් වීම සඳහාත් සමූහයක් ලෙස ජීවත් වීම සඳහාත් යහජීවන ගුණාංග අත්‍යවශ්‍ය සාධකයක් වන බව

  තමා සමග තරග කරමින් තම දියුණුව කරා යාම වඩා වැදගත් වන බව

**(මිනිත්තු 20 යි)**

## තක්සේරුව හා ඇගයීම

1. තමා තුළ යහජීවන ගුණාංග සංවර්ධනය කර ගත යුත්තේ තමා ම බවට අදහස් දක්වයි.
2. තමා තුළ යහජීවන ගුණාංග වර්ධනය කර ගැනීමට අවශ්‍ය තරම් ශක්තිය ඇති බව පිළිගනියි.
3. යහජීවන ගුණාංග ප්‍රගුණ කිරීම තම ජීවිතයේ ශාරීරික, මානසික හා ආධ්‍යාත්මික සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය රූපික සටහනක් ඇසුරින් ඉදිරිපත් කරයි.
4. අවංක ව ම යහජීවන ගුණාංග ප්‍රදර්ශනය කරමින් පෞද්ගලික ව පහසුවටත් තෘප්තියටත් පත් වෙයි.
5. යහජීවන ගුණාංග සම්බන්ධයෙන් අන් අයට ආදර්ශවත් අයෙක් වෙයි.

**පසු පැවරුම**

යහජීවන ගුණාංග ප්‍රගුණ කිරීම මගේ ජීවිතයට බලපාන ආකාරය යන මැයෙන් ශාරීරික, මානසික හා ආධ්‍යාත්මික සංවර්ධන ක්ෂේත්‍ර ඇතුළත් සංකල්ප සිතියමක් පිළියෙල කරවන්න.

**ඇමුණුම 9.2.4.1**

ගුරු උපදෙස් පත්‍රිකාව

- මෙම ක්‍රියාකාරකම සඳහා කාලය විනාඩි හතරක් පමණ යොදා ගන්න.
- ඔබගේ කටහඬ මෘදු හා ලෙන්ගතු ලෙස හසුරුවමින් ඉතා සන්සුන් ව පියවරින් පියවර පහත දැක්වෙන පරිදි සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
  * පහසු ලෙස තම අසුනෙහි හිඳගන්න
  * දෑත් දෙපා තමන්ට පහසු ආකාරයෙන් තබා ගන්න.
  * දෑස පියාගන්න.
  * හොඳින් හුස්ම ගෙන සන්සුන් වන්න.
  * පසුගිය දිනවල දී දැන උගත් යහජීවන ගුණාංග සිහිපත් කරන්න.
  * ඒ අතර යහජීවන ගුණාංග දියුණු කර ගැනීමට බාධා පමුණුවන යම් අවාසිදායක ලක්ෂණ ඔබ තුළ තිබේ දැයි සිතින් විමසා බලන්න.
  * ඉතිරි වී ඇති එවැනි සුළු හෝ අවාසිදායක ලක්ෂණ වේ නම් ඒවා හඳුනා ගන්න.
  * දැන් ඔබේ සිතින් සුදු කඩදාසියක් හා පෑනක් මවාගන්න.
  * සිතින් ගෙන සුදු කඩදාසිය මත ඔබ තුළ ඇතැයි සිතෙන අයහපත් දෑ හා අවාසිදායක ලක්ෂණ ලොකු අකුරින් ලියන්න.
  * කාටවත් නොපෙනෙන බැවින් ඔබ වෙත තිබෙන එවැනි නොගැළපෙන ලක්ෂණ බිඳුවක්වත් ඉතිරි නොකොට සියල්ල ම ලියන්න.
  * දැන් ලියූ දේ නැවත බලමින් සිහිපත් කරන්න
  * දැන් එම පෑනෙන් ම කඩදාසියේ ලියූ සියල්ල මත කුරුටු ගාන්න
  * හොඳට ම කුරුටු ගාන්න.
  * දැන් කඩදාසිය සිතින් ගෙන ගුලි කරන්න.
  * කුඩා බෝලයක් වන සේ හොඳට ම ගුලි කරන්න.
  * කුඩා බෝලයක් වන සේ හොඳට ම ගුලි කරන්න.
  * එම කඩදාසි බෝලය සිතින් හැකිතාක් වෙර ගෙන අහසට විසි කරන්න.
  * එය ඈතට ඈතට ඉහළට ඇදී යන අයුරු සිතින් දකින්න.
  * එය කුඩා තිතක් වී නොපෙනී ගොස් තමාගෙන් සම්පූර්ණයෙන් ම ඉවත් වූ බව සිතන්න.
  * තමා සතු ව දැන් ඇත්තේ ඉතා වටිනා යහජීවන ගුණාංග පමණක් බව සිතන්න.
  * තමා ගැන සතුටු වන්න.
  * තමා ගැන සෙසු අය සතුටින් කතා කරන සැටි සිතින් දකින්න.
  * සෙමින් දැස් හැර නිහඬ ව සිටින්න.
- මෙම ක්‍රියාකාරකම තමන්ට විවේක අවස්ථාවල දි තනි ව කළ හැකි බව සිහිපත් කරන්න.
- මෙහි දී තමන්ට දැනුණු හැඟීම් පැවසීමට සූදානම් වන ලෙස දන්වන්න.

**ඇමුණුම 9.2.4.2**

- ඔබ දැන උගත් යහජීවන ගුණාංග ප්‍රදර්ශනය වන පරිදි පහත දැක්වෙන එක් අවස්ථාවක් ආශ්‍රිත ව භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- සපයන ලද රූපික සටහන කෙරෙහි ද අවධානය යොමු කරන්න.
- ඒ ඒ ඉදිරිපත් කිරීම මගින් ඔබගේ ජීවිතයේ කුමන අංශ සංවර්ධනය සඳහා අවශ්‍ය වන යහජීවන ගුණාංග ප්‍රකාශ වන්නේ දැයි සුපරීක්ෂාකාරී ව සිටින්න.
- ඔබ හඳුනා ගත් යහජීවන ගුණාංග රූපික සටහනෙහි සඳහන් අංශවලට අදාළ ව ඉතා කෙටියෙන් තම තමන් වෙන ම සටහන් කර ගන්න.
- අවසානයේ රූපික සටහන පදනම් කරගෙන කණ්ඩායම් අදහස් ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

භූමිකා රංගන සඳහා මාතෘකා

- උදෑසන පිබිදීමේ සිට ආහාර ගැනීම, ව්‍යායාම, විවේකය, නින්ද හා පවිත්‍රතා ව ආදිය සහිත ව තම කායික සුවතාව පවත්වා ගැනීමේ වැඩ පිළිවෙළ පිළිබඳ ව සොයුරු සොයුරියන් සමග කතාබහක්.
- නිවසේ විදුලිය හා ජලය භාවිතය, කැලිකසළ බැහැර කිරීම හා පවුලේ සමගිය පවත්වා ගැනීම පිළිබඳ ව නිවසට පැමිණි ඥාතීන් සමග අදහස් හුවමාරුවක්.
- විවිධ විලාසිතා, නූතන විවිධ තාක්ෂණික උපකරණ, විනෝදය හා ජනමාධ්‍ය ඇසුරු කිරීම පිළිබඳ ව මිතුරු මිතුරියන් සමග අදහස් හුවමාරුවක්.
- අසල්වැසි නිවසක අගහිඟකම් ඇති ව පාසල් යන අහිංසක දරුවකුට උදව් කිරීමේ අදහසින් සොයුරු සොයුරියන් අතර සාකච්ඡාවක්.
- ලැබෙන ආදායම අනුව නව වසරේ දී පවුලේ අයට හා නිවසට අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සම්බන්ධයෙන් දූ දරුවන් හා දෙමාපියන් අතර සාකච්ඡාවක්.

**ඇමුණුම 9.2.4.3**

**රූපික සටහන**



(කාලච්ඡේද 08යි)

# 9.3 ජීවන අවස්ථා හා අභියෝග හමුවේ ඵලදායී ව තීරණ ගනියි

## හැඳින්වීම

ජීවත් වීමේ දී අප විසින් විවිධ අවස්ථාවල විවිධ තීරණ ගත යුතු වේ. ජීවිතය යනු එකිනෙක අවස්ථා සිද්ධි හා බැඳුණු තීරණ පෙළක් ලෙස හැඳින්විය හැකි ය. සමහර අවස්ථාවල ඉතා සුළු කාලයක් තුළ විශාල තීරණ සංඛ්‍යාවක් ගැනීමට ද අපට සිදු වේ. තීරණ ගැනීම සරල ක්‍රියාවක් ලෙස පෙනුණ ද එය සංකීර්ණ බුද්ධිමය ක්‍රියාවලියකි. තීරණ ගැනීමේ දී අප අපගේත්, අන්‍යයන්ගේත් චිත්තවේග හොඳින් දැන සිටිය යුතු ය. එනිසා ඵලදායී තීරණ ගැනීම සඳහා අත්දැකීම් සමුදායක්, පුළුල් දැක්මක්, ඉහළ බුද්ධි මට්ටමක් අවශ්‍ය වේ. අප ගන්නා තීරණයක ප්‍රතිඵල අපට පමණක් නොව අපේ පවුලට, පාසලට පොදුවේ සමාජයට ද බලපායි. නිවැරදි තීරණ ගැනීමට ඒ සඳහා මඟ පෙන්වීමට එතුළින් ජීවිත සාර්ථකත්වය කරා ළඟාවීමට ද හැකියාව ලබා ගැනීමට මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් හැකිවනු ඇත.

**නිපුණතාව** : ජීවන අවස්ථා හා අභියෝග හමුවේ ඵලදායී ව තීරණ ගනියි.

**නිපුණතා මට්ටම්**

- 9.3.1 ජීවිතයේ විවිධ අභියෝග හා අවස්ථා විමර්ශනය කරයි.
- 9.3.2 ජීවිතයේ විවිධ ගැටලු, අවස්ථා හා අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙයි.

**විෂය අන්තර්ගය** :

**9.3.1** ජීවිතයේ විවිධ අභියෝග හා අවස්ථා විමර්ශනය කරයි.

- අභියෝගය හඳුනා ගැනීම (අරමුණක් සාර්ථක ලෙස ඉටු කර ගැනීමේ දී එල්ල වන බාධක හෝ සීමා)
- අභියෝග අවස්ථා - තමාට, තම පවුලට, පාසලට, සමාජය තුළ මුහුණ දෙන වෙනත් අවස්ථා
- අභියෝග අවස්ථා තුළ මතුවන නිර්මාණශීලී බව
- අභියෝගය ඵලදායී ජීවිත අත්දැකීමක් බවට පත් කර ගත යුතු බව

9.3.2 විවිධ අභියෝගවල දී නායකත්ව ලක්ෂණ ප්‍රගුණ කරයි.

- අභියෝගවලට මුහුණ දීමට සිදුවන අවස්ථා ( පෞද්ගලික ව - සාමූහික ව)
- අභියෝගවල දී අවස්ථානුකූල ව නායකත්වය ගැනීම
- නායකත්ව ලක්ෂණ ප්‍රගුණ කරමින් අභියෝගවලට මුහුණ දීම

9.3.3 ජීවිතයේ විවිධ ගැටලු, අවස්ථා හා අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙයි

- ගැටලු, අභියෝග ජය ගැනීමේ විකල්ප ක්‍රම
- නිර්මාණශීලී ක්‍රම අත්හදා බලමින් හොඳ ම විකල්පය තෝරා ගැනීම
- ගැටලු, අවස්ථා, අභියෝගවලට සාර්ථක ව මුහුණ දීම

## 9.3.1 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ජීවන අවස්ථා හා අභියෝග හමුවේ ඵලදායී ව තීරණ ගනියි.

**නිපුණතා මට්ටම** :- ජීවිතයේ විවිධ අභියෝග හා අවස්ථා විමර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** :- " අභියෝග ජය ගනිමු නුවණින් "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.3.1.1 සඳහන් ගීතය
- ඇමුණුම 9.3.1.2 සඳහන් සිද්ධි අධ්‍යයන
- ලියන කඩදාසි, පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.3.1.1**

- ඇමුණුම 9.3.1.1 සඳහන් ගීතය පංතියේ ගායනා කරන්න.
  (සිසුවකු ලවා / කැසට් පටයක ආධාරයෙන්)
- එයින් මතුවන අදහස් පිළිබඳ සිසුන්ගෙන් විමසන්න
- පහත කරුණු මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ජීවන ගමනේ විවිධ අවස්ථාවල විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදුවන බව
- එබඳු ජීවිත අභියෝගවලට අප විසින් මුහුණ දිය යුතු බව
- අභියෝග අවස්ථා මග හැරිය නොහැකි බව
- අභියෝගයන්ට සාර්ථක ව මුහුණ දීම සඳහා නිවැරදි තීරණ ගත යුතු බව
- නිවැරදි තීරණ ජීවිත සාර්ථකත්වයට හේතු වන බව

**(මිනිත්තු 07 යි)**

**පියවර 9.3.1.2**

- ඇමුණුම 9.3.1.2 හි සඳහන් සිද්ධි/ අවස්ථා අඩංගු පත්‍රිකා පංතියේ සිසුන් අතර බෙදා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**(මිනිත්තු 20 යි)**

**පියවර 9.3.1.3**

- සිසු අදහස් පංතියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න
- සිසු සහභාගිත්වය ඇති ව පහත කරුණු මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ජීවත්වීමේ දී නිරන්තරයෙන් ම අභියෝග අවස්ථාවන්ට මුහුණ දීමට සිදු වන බව
- අභියෝග අවස්ථාවන් හි දී නිර්මාණශීලී ව නිවැරදි තීරණ ගත යුතු බව
- ජීවිත අභියෝග අවස්ථා ඵලදායී ජීවිත අත්දැකීම් බවට පත් කර ගත යුතු බව
- එතුළින් ජීවිත සාර්ථකත්වයට ළඟා විය හැකි බව

**(මිනිත්තු 13 යි)**

## තක්සේරුව හා ඇගයීම

- ජීවිත අභියෝග නම් කරයි.
- ජීවිත අභියෝගවලට මුහුණ දිය යුතු බව පිළිගනියි.
- අභියෝගවලට නිර්මාණශීලී ව මුහුණ දෙයි.
- නිර්මාණශීලී ව තීරණ ගනිමින් ජීවිත සාර්ථකත්වයට ළඟා වෙයි.
- නිවැරදි තීරණ තුළින් සමාජ සංවර්ධනයට දායක වෙයි.

**ඇමුණුම 9.3.1.1**

කැරකෙන රෝදේ පුංචි කරත්තේ ඉද ගෙන මම ඉන්නේ
පදික වේදිකා පසු කර යන්නට තල්ලු කරන් පුතුනේ ...........
තල්ලු කරන් පුතුනේ...........
කැඩුණු පාවහන් කුඩ නිමවාලා දවසේ වියදම සරිකරවාලා
අඳුරු වැටෙන්නට කලියෙන් ගෙදරට තල්ලු කරන් පුතුනේ .....
තල්ලු කරන් පුතුනේ
කිරිකැටි දෙ අතේ සවිබල දියවී පමා වුණොත් අප මහ මග තනිවේ
අම්මා මඟ ඇති නෙත් දල්වා ගෙන තල්ලු කරන් පුතුනේ .......
තල්ලු කරන් පුතුනේ
ගායනය : විශාරද එඩ්වඩ් ජයකොඩි මහතා

**ඇමුණුම 9.3.1.2 : සිද්ධි අධ්‍යයනය**

පහත සඳහන් සිදුවීම්වලට ඔබ මුහුණ දෙන ආකාරය විස්තර කරන්න

1. මහවැහි ඇද හැලෙන වැසි කාලයක රාත්‍රි නින්දෙන් ඔබ අවදි වන්නේ කවුරු හෝ මහ හඬින් කෑ ගසන ශබ්දයකිනි. අවදි වී බලන විට ඔබේ නිවස තුළ අඩි දෙකක පමණ ජල මට්ටමක් පවතී. නිවසින් පිටත ද අසල්වැසි නිවසේ ද එසේ ම ය. ජල මට්ටම ද වේගයෙන් ඉහළ නගින බව ද පෙනේ. ඔබ මෙම අවස්ථාවේ දී ක්‍රියා කරන ආකාරය විස්තර කරන්න.

2. තිවංක 9 වන ශ්‍රේණියේ ඉගෙන ගන්නා සිසුවෙක්. පසුගිය දිනක තිවංක ඔහුගේ දෙමාපියන් හා මල්ලී සමග අනුරාධපුරයේ චාරිකාවක් ගියා. අතරමග දී ඔවුන් ගමන්ගත් වෑන් රිය අනතුරකට ලක් වු අතර තිවංකගේ මල්ලී හා තාත්තා අනතුරින් බරපතළ තුවාල ලැබුවා. කම්පනයට පත් මවට ද ප්‍රකෘති සිහිය තිබුනේ නැහැ. සුළු තුවාල ලබා බේරුනේ තිවංක පමණයි. ඔබ තිවංක නම් ඔබ මෙම අවස්ථාවට මුහුණ දෙන ආකාරය විස්තර කරන්න.

## 9.3.2 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ජීවිත අවස්ථා හා අභියෝග හමුවේ ඵලදායී ව තීරණ ගනියි.

**නිපුණතා මට්ටම** :- විවිධ අභියෝගවල දී නායකත්ව ලක්ෂණ ප්‍රගුණ කරයි.

**ක්‍රියාකාරකම** :- " නායකත්වය කරා "

**කාලය** :- මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.3.2.1 හි සඳහන් සිද්ධිය
- ඇමුණුම 9.3.2.2 ට අදාළ ගවේෂණ පත්‍රිකාව - I
- ඇමුණුම 9.3.2.3 ට අදාළ ගවේෂණ පත්‍රිකාව - II
- පාට පහක පබලු, ඉදිකටු, නූල්, බ්‍රිස්ල් බෝඩ්, කතුරු වාර්නිෂ් කඩදාසි, ගම්බෝතලයක්

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.3.2.1**

- ඇමුණුම 9.3.2.1 හි සඳහන් පුවත් උපුටන පංතියේ ප්‍රදර්ශනය කරන්න.
- එයින් මතුවන අදහස් පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- පහත කරුණු මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - ජීවිත අභියෝගවලට පෞද්ගලික ව මෙන් ම සාමූහික ව ද මුහුණ දීමට සිදුවන බව
> - එබඳු අවස්ථාවල අභියෝග තත්වය හොඳින් හඳුනා ගත යුතු බව
> - ආත්ම ශක්තියෙන් යුතු ව අභියෝගවලට මුහුණ දිය යුතු බව

**(මිනිත්තු 10යි)**

**පියවර 9.3.2.2**

- සිසුන් 5-7 ක් වන සේ කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න.
- එක් එක් කණ්ඩායමට පබලු, පාට තුන බැගින් (කුඩා පැකට් 3ක්), නූලක්, ඉදිකටුවක්, බ්‍රිස්ල් බෝඩ් 01 ක්, කතුරක් බැගින් බෙදා දෙන්න.
- ඇමුණුම 9.3.2.2 හි සඳහන් ගවේෂණ පත්‍රිකාව පංතියේ ශිෂ්‍ය කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- සිසුන් අදාළ ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- ඇමුණුම 9.3.2.3 ලබා දෙන්න.
- ක්‍රියාකාරකමේ යොදවන්න

**(මිනිත්තු 25 යි)**

**පියවර 9.3.2.3**

- කණ්ඩායම් නිර්මාණ පංතියට ඉදිරිපත් කරන්න.
- සිසු අදහස් පංතියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- සිසු සහභාගිත්වය ඇති ව පහත කරුණු මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • ඇමුණුම 9.3.2.3 ට අදාළ ව ඉදිරිපත් කළ ශිෂ්‍ය නිමැවුම් ඇගයීමට ලක් කරන්න. |
| • පෞද්ගලික ව මෙන් ම සාමූහික ව ද ජීවිත අභියෝගවලට මුහුණ දීමට සිදුවන බව |
| • අභියෝග අවස්ථාවල දී කවුරු හෝ වගකීම් භාර ගතයුතු බව |
| • වගකීම් දරමින් නායකයෙක් ලෙස අභියෝගවලට මුහුණ දිය යුතු බව |
| • අභියෝග ජය ගනිමින් ජීවිත සාර්ථකත්වයට පත් විය යුතු බව |

**(මිනිත්තු 45 යි**

## තක්සේරුව හා ඇගයීම

- ජීවිත අභියෝගවලට මුහුණ දීමට සිදු වන අවස්ථා නම් කරයි.
- අභියෝග අවස්ථා විවිධ බව පිළිගනියි.
- අභියෝග අවස්ථාවල දී නායකයෙක් ලෙස කටයුතු කරයි.
- නායකත්ව ලක්ෂණ ප්‍රකට කරයි.
- අභියෝග ජයගනිමින් සාර්ථක නායකයෙක් ලෙස සමාජ දියුණුවට දායක වෙයි.

**ඇමුණුම 9.3.1.2**

පහත සිද්ධිය හොඳින් කියවන්න

ඇය අවුරුදු 15ක් වයසැති දැරියක්. ඇගේ පියා ඇය කුඩා කාලයේ දී ම මිය ගිය බැවින් ආච්චි අම්මා හා අම්මාගේ රැකවරණය යටතේ ඇය, නංගී හා මල්ලී සමග ජීවත් වූහ. පියා අහිමි පවුලේ ලොකු ම ශක්තිය ඇයගේ අම්මා යි. ඇය කම්හල්වලින් ඉවත් කරන රෙදි කැබලිවලින් පාපිසි, සුරතල් සතුන් මසා විකුණී ය. පාසල අවසන් වී පැමිණි සමහර අවස්ථාවල ඇයත් මවගේ කටයුතුවලට උදව් කළා ය. හදිසියේ ම රිය අනතුරකින් ඇයගේ මව ද මිය ගියා ය. මවගේ හදිසි අභාවයත් සමග පවුලට එල්ල වූ අභියෝග හමුවේ පවුලේ වගකීම් හා නායකත්වය භාර ගැනීමට සිදු වුයේ ඇයට ය. ඇය නොසැලී, නොබිය ව මෙම අභියෝගවලට මුහුණ දීමට සූදානම් ය.

- * මෙහි සඳහන් දැරිය මුහුණ දී ඇති අභියෝගය කුමක් ද?
- * එම අභියෝගය හමුවේ ඇයට ඇති වගකීම් මොනවා ද?
- * ඇය ඔබ නම් මෙම අභියෝගය ජයගන්නා ආකාරය විස්තර කරන්න.

**ඇමුණුම 9.3.2.2**

ගවේෂණ පත්‍රිකාව - I

- * ඔබ කණ්ඩායමට ලැබුණ පබලු, ඉදිකටුව, නූල් මගින් එක් නිර්මාණයක් ද වාර්නිෂ් කඩදාසිය, කතුර, බ්‍රිස්ල් බෝඩ් යොදා ගෙන තවත් නිර්මාණයක් ද කරන්න.
(මිනිත්තු 10 කින් කාර්යය නවත්වන්න)

- * ගවේෂණ පත්‍රිකාව I සඳහා මිනිත්තු 10ක් ලබා දී එම නිර්මාණ ක්‍රියාකාරකම නවත්වා ගවේෂණ පියවර II ලබාදෙන්න.

**ඇමුණුම 9.3.2.3**

ගවේෂණ පත්‍රිකාව - II

ඔබ කණ්ඩායම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඔබ කණ්ඩායම මුහුණ දුන් අභියෝග / බාධක මොනවා ද?
2. ඔබ තනි තනි ව මුහුණ දුන් ගැටලු /බාධක / අභියෝග මොනවා ද?
3. ඔබ මුහුණ දුන් ගැටලු/ අභියෝග දිනා ගැනීමට යොදාගත් උපක්‍රම / ක්‍රියාමාර්ග මොනවා ද?
4. ඔබගේ කණ්ඩායම මෙහෙය වූ මූලිකයෙක් /නායකයෙක් සිටියේ ද? ඔහු / ඇය කවුද?
5. නායකයා පත් වූ ආකාරය කුමක් ද?
6. නායකයා මගින් ඉටු වූ කාර්යයන් ලැයිස්තුගත කරන්න.
7. මෙම ක්‍රියාකාරකමේ දී ඔබ ලැබූ අත්දැකීම් මොනවා ද?

## 9.3.3 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ජීවිත අවස්ථා හා අභියෝග හමුවේ ඵලදායී ව තීරණ ගනියි

**නිපුණතා මට්ටම** :- ජීවිතයේ විවිධ ගැටලු අවස්ථා හා අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙයි

**ක්‍රියාකාරකම** :- " අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙමු "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.3.3.1
- ලියන කඩදාසි
- නළපාන ජාතක කථාව හෝ පණ්ඩුකාභය කුමාරයාගේ ළමා කාලය පිළිබඳ කථාන්තරය (සපයා ගන්න.)

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.3.3.1**

- නළපාන ජාතක කථාව හෝ පණ්ඩුකාභය කුමාරයාගේ ළමා කාලයට අදාළ සිද්ධියක් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එම කථාව ඇසුරින් මුහුණ දුන් අභියෝග අවස්ථාවල දී නිර්මාණශීලී ව ක්‍රියාකළ ආකාරය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- සෑම කෙනෙකුට ම විවිධ ගැටලු අවස්ථා හා අභියෝගවලට මුහුණ දීමට සිදුවන බව
- අභියෝග හමුවේ නොසැලී ක්‍රියා කිරීම මගින් සාර්ථක ප්‍රතිඵල ලබාගත් බොහෝ පුද්ගලයන් අප අතර සිටින බව
- ඔවුන් අභියෝග හා ගැටලුවලට මුහුණ දී සාර්ථක ප්‍රතිඵල ලබාගැනීම ට (ජයගැනීමට) නිර්මාණශීලී ව ක්‍රියා කොට ඇති බව
- අප ද සෑම විට ම අභියෝගවලට, අභියෝගයක් වී ජය ගැනීමට ක්‍රියා කළ යුතු බව

**(මිනිත්තු 10 යි)**

**පියවර 9.3.3.2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.

- ඇමුණුම 9.3.1.1 සිසුන්ට ලබා දී එහි ඇති සිද්ධි කියවා පිළිතුරු සැපයීමට උපදෙස් දෙන්න.
  මඟ පෙන්වමින් අවශ්‍ය පහසුකම් සපයන්න.

**(මිනිත්තු 15 යි)**

**පියවර 9.3.3.3**

- සිසුන් පිළිතුරු සපයන ලද කණ්ඩායම් ක්‍රියාකාරකම්වල තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- සියලු කණ්ඩායම්වල අදහස් සැලකිල්ලට ගනිමින් පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • ජීවිතය අභියෝග බාධක හා ගැටලුවලින් පිරී පවතින බව<br>• ඕනෑම අවස්ථාවක මෙවැනි තත්වයන්ට මුහුණ දීමට සිදු විය හැකි බව (ගැටලු, බාධක අභියෝග) එය ජීවිත යථාර්ථය බව<br>• ජීවිතයේ දී ඇතිවිය හැකි මෙවැනි අවදානම් ගැටලු සහිත අවස්ථාවල දී නොසැලී බුද්ධිමත් ව, විචාරශීලී ව ස්ථානෝචිත ප්‍රඥාව මෙහෙයවා ක්‍රියාකළ යුතු බව<br>• තීරණ ගැනීමට පෙර හොඳින් ගැටලු ව අධ්‍යයනය කොට තීරණ ගැනීමෙන් තමාට පවුලට මෙන් ම සමාජයට ද යහපතක් වන බව<br>• හොඳ බුද්ධිමත් තීරණ ගැනීමෙන් තමාට සතුටු විය හැකි බවත් එසේ නොවුණු විට පසුතැවීමට සිදු වන බව<br>• සියලු තැන දී සිහි කල්පනාවෙන් බුද්ධිමත් ව හැසිරීමෙන් හා සන්සුන් ව අභියෝගවල ට මුහුණ දීමෙන් යහපතක් වන බව<br>• තීරණ ගැනීමේ දී විකල්ප ක්‍රියාමාර්ග අතුරින් වඩාත් වාසි සහගත තීරණ ගැනීමට ක්‍රියා කළ යුතු බව |

**(මිනිත්තු 15 යි)**

## තක්සේරුව හා ඇගයීම

- ගැටලු බාධක හා අභියෝග හමුවේ ක්‍රියා කළයුතු ආකාරය පැහැදිලි කරයි.
- අභියෝග, ගැටලු හා බාධක අවස්ථාවල දී නොසැලී බුද්ධිමත් ව විකල්ප තෝරා ගතයුතු බව පිළිගනියි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් ක්‍රියා කරයි.
- විචාරශීලී හා නිර්මාණශීලී උපක්‍රම අත්හදා බලයි.
- බුද්ධිමත් තීරණ ගැනීමට අන්‍යයන්ට ද සහය වෙයි.

**ඇමුණුම 9.3.1.1**

* ඔබ යහළුවා සමග පාසල ඇරී ගෙදර එනවිට යහළුවා ක්ලාන්ත වෙයි. අහල පහළ ගෙයක් ද නැත. අසනීප ව ඇති මිත්තණිය බැලීම සඳහා යාමට මව ඔබ එනතුරු බලා සිටින නිසා ඉක්මනින් ගෙදර යා යුතු ව ඇත.

  - මෙහි දී ඔබ මුහුණ දෙන ගැටලු හෝ අභියෝග මොනවා ද?
  - මෙහි දී ඔබට ගත හැකි ක්‍රියාමාර්ග තීරණ කවරේ ද?
  - එම එක් එක් (තීරණ )ක්‍රියාමාර්ගයේ වාසි අවාසි දක්වන්න.
  - ඒ අනුව ඔබ ගන්නා හොඳ ම ක්‍රියාමාර්ගය (තීරණය) කුමක් ද? එයට හේතු දක්වන්න.

* නිමල්, 9 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. නංගී සහ මල්ලී කුඩා දරුවන් ය. අවසාන වාර විභාගයට ඇත්තේ සතියකි. නිමල් ගේ පියා හදිසියේ අසනීප ව රෝහල් ගත කරනු ලබන්නේ මේ අතරතුර දී ය. මව දවල්ට පියා ළඟ නතර වී සිටින අතර, රාත්‍රියට පියා ළඟ නතර වීමට සිදුවන්නේ නිමල්ට ය.

  - ඉහත සිද්ධිය අනුව නිමල්ට මුහුණ දීමට සිදු වී ඇති බාධක ගැටලු හෝ අභියෝග මොනවා ද?
  - මෙම අවස්ථාවේ දී නිමල් ට ගතහැකි ක්‍රියාමාර්ග (තීරණ) මොනවා ද?
  - එම ක්‍රියා මාර්ගවල (තීරණ) වාසි අවාසි දක්වන්න.
  - ඒ අනුව ඔහු ගත යුතු හොඳ ම ක්‍රියාමාර්ගය දක්වා එය සනාථ කිරීමට හේතු ඉදිරිපත් කරන්න.

* ඔබ පාසල ඇරී ගෙදර යනවිට කවදාවත් නොදුටු කෙනෙක් ඇවිත් ආ.... කොහොම ද නංගී / මල්ලී
තාත්තල අම්මල ගෙදර ද? මම මේ ඔයාලගේ ගෙදර යන ගමන්
ඔයාලට නං මාව මතක නැහැ?
මොකක් ද තාත්තගේ නම ..... මෙන්න මම ටොපි වගයක් ගත්ත ...........ආ ගන්නකෝ කියමින් ඔබ වෙත දිගු කරයි.

  - මෙවන් අවස්ථාවක දී ඔබට මුහුණ දීමට සිදු වන ගැටලු මොනවා ද?
  - මෙවන් අවස්ථාවක දී ඔබට ගතහැකි ක්‍රියාමාර්ග (තීරණ) මොනවා ද?
  - ඔබ ගන්නා එක් එක් තීරණයේ වාසි අවාසි දක්වන්න.
  - එහි දී ගතයුතු හොඳ ම ක්‍රියාමාර්ගය කුමක් ද? එය තහවුරු කිරීමට හේතු දක්වන්න.

(කාලච්ඡේද 03 යි)

# 9.4 ආපදා කළමනාකරණය

## හැඳින්වීම

ලොව වෙසෙන සෑම පුද්ගලයෙකුට ම විවිධාකාර අනතුරු හා ආපදාවලට මුහුණ දීමට සිදු වේ. ස්වාභාවික ව සිදු වන විපත් හා මිනිසාගේ බලපෑම් නිසා සිදුවන විපත් ලෙස ඒවා වර්ග කළ හැකි ය. නිවස, පාසල, පරිසරය, වැඩබිම ආදී ඕනෑ ම ස්ථානයක දී අනතුරු හා විපත් සිදු විය හැකි ය.

විවිධ ආහාර වර්ග හා ඖෂධ භාවිතයේ දී ද සංකූලතා හේතු කොටගෙන අනතුරු සිදු විය හැකි ය. එමෙන් ම පුද්ගලයන් තුළ තිබෙන අයහපත් පුරුදු හා නොසැලකිලිමත් බව නිසා ද අනතුරු සිදු වන අවස්ථා දැකිය හැකි ය.

අනතුරු හා විපත්වල දී බුද්ධිමත් ව කටයුතු කරමින් අනතුරු වළක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් විපත් හා අනතුරු සිදු විය හැකි ස්ථාන, අනතුරු හා ඍජු ව සම්බන්ධ වන ස්ථාන පිළිබඳවත් දැනුවත් වීම මෙම ඒකකය අධ්‍යයනය කිරීම තුළින් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : ආපදා කළමනාකරණය කරයි.

**නිපුණතා මට්ටම්** :
- 9.4.1 විපත් හා අනතුරු කෙරෙහි සවිඥානික වෙයි.
- 9.4.2 අනතුරු හා විපත්වල දී බුද්ධිමත් ව කටයුතු කරයි.

**විෂය අන්තර්ගය 9.4.1** :

- අප එදිනෙදා මුහුණ දෙන අනතුරු ප්‍රධාන වශයෙන් තුන් ආකාරයකට සිදු වේ.

    1. ස්වාභාවික ව
    2. මානව ක්‍රියාකාරකම් නිසා
    3. වෙනත්

- ස්වාභාවික ව සිදු වන අනතුරු

    * ගංවතුර
    * අකුණු
    * නායයාම්
    * සුළි සුළං
    * සුනාමි
    * භූමිකම්පා
    * ටොනාඩෝ
    * ලැව්ගිනි
    * ගිනිකඳු

- **මානව ක්‍රියාකාරකම්**
  - * **අනාරක්ෂිත ක්‍රියා**

    උදාඃ- මාර්ග සංඥා හා නීති අනුගමනය නොකිරීම, අනාරක්ෂිත ස්ථානවල ගොඩනැගිලි ඉදිකිරීම.(කඳු බෑවුම්, වෙරළාසන්න ව, ගංගා ආශ්‍රිත ව)
  - * **නොසැලකිලිමත් ක්‍රියා**

    උදාඃ- නොසැලකිලිමත් ලෙස විදුලිය භාවිතය, අවි ආයුධ නොසැලිකිලිමත් ලෙස පරිහරණය, අවදානම් ස්ථානවල ස්නානය කිරීම. බිම්බෝම්බ වළදමා ඇති ස්ථානවල කටයුතු කිරීම
  - * **අවිධිමත් පරිහරණය**

    උදාඃ-
    - අවිධිමත් ලෙස වනහරණය (නායයාම්, ගංවතුර, ගංපත්ල ගොඩවීම් වලට කඳු ආශ්‍රිත වනාන්තර එළි කිරීම හේතු වේ).
    - වගුරුබිම් ගොඩ කිරීම (ජල ගැලීම්වලට හේතු වේ).
    - වාහන භාවිතයේ දී අනතුරුදායක තත්ත්වයන් නොසැලකීම (පා පුවරුවේ යාම, අයෝග්‍යතා තත්ත්වයෙන් තිබිය දී වාහන භාවිතය)
    - ප්‍රමිතියෙන් තොර භාණ්ඩ භාවිතය.
- **ආහාර හා ඖෂධ සම්බන්ධ විපත්**

  - * විෂ සහිත ආහාර අපවිත්‍ර ආහාර හා කල්පසු වූ ආහාර ශරීරගත වීම
  - * වෛද්‍ය උපදෙස් මත ඖෂධ ලබා නොගැනීම හා වැරදි ඖෂධ භාවිතය / නිවැරදි ලෙස රෝග හඳුනා නොගෙන ඖෂධ හා එන්නත් නොසැලිකිලිමත් ලෙස ලබා දීම

- **අහිතකර පුරුදු නිසා සිදුවන අනතුරු**
  - * විවිධ පුරුදු හා ඇබ්බැහිකම් නිසා සිදු වන අනතුරු මේ යටතට ගත හැකි ය. මෙම අබ්බැහිතාවන් හා පුරුදු නිසා සිදු වන විපත් තීව්‍ර වීම හා ජීවිත හානි සිදුවීම පවා සිදු වේ. මෙකී පුරුදු නිසා පුද්ගලයින් දීර්ඝ කාලීන විපත්වලට ද මුහුණදීමට සිදු වේ.
    - මත්ද්‍රව්‍ය,මත්කුඩු , සිගරට්, ලිංගික අපයෝජන, ශාරීරික හෝ මානසික වෙනත් ඇබ්බැහි වීම්
- **ආවේගාත්මක හැසිරීම**

  උදාඃ- සියදිවි හානි කර ගැනීම, පහර දීම හා ඝාතනය කිරීම, අපරාධ සිදු කිරීම

- **වෙනත්**
  - * සතුන්ගෙන් වන අනතුරු
  - * පිළිස්සීම, වැටීම ආදිය
  - * ක්ලාන්ත වීම ආදී

  ස්වභාවික අනතුරු වළක්වා ගැනීම සඳහා (ව්‍යුහාත්මක) ගොඩනැගිලි ඉදිකිරීමේ දී පූර්ව සුදානම් වීම තුළින් අනතුරු අවම කළ හැකි ය. භූමි කම්පාවලින් සිදුවන අනතුරු අවම කර ගැනිම සඳහා (ව්‍යුහාත්මක නොවන ගෘහ භාණ්ඩ නිසි පරිදි ස්ථානගත කිරීම (අල්මාරි, විදුලි පංකා ආදිය).

- **අනතුරක් සිදු වීමේ දී අනුගමනය කළ යුතු කරුණු කිහිපයක්**

    * නිවැරදි ව අනතුරේ සවභාවය හඳුනා ගැනීම
    * අන් අය ඉවත් කිරීම හා නිවැරදි සන්නිවේදනය.
    * සන්සුන්වීම
    * විපතට පත් වූවන් බේරා ගැනීමට යොමු වීම
    * නිවැරදි ප්‍රථමාධාර දීමට යොමු කිරීම
    * විපතට පත්වූවන්ගේ දේපළ ආරක්ෂා කිරීම
    * අවස්ථාවෝචිත ව තමා ද ආරක්ෂා වීම

ආපදා කළමනාකරණ චක්‍රය

* අනතුරු හා විපත් වළක්වා ගැනීමට සූදානම් වීමේ දී, වළක්වා ගැනීමේ දී ආපදා කළමනාකරණය පිළිබඳ හොඳින් දැනුවත් විය යුතු ය. එහි පියවර ආපදා කළමනාකරණ චක්‍රය අධ්‍යයනය කිරීමෙන් හඳුනා ගත හැකි ය.



| | | | |
|---|---|---|---|
| A | පූර්ව සූදානම් අවස්ථාව | - | පෙර සූදානම, ආපදාව අවම කිරීම |
| B | ආපදා අවස්ථාව | - | අනතුරු අවස්ථාව, මිනිසුන් ඉවත් කිරීම, ආරක්ෂිත ස්ථාන කරා ගෙන යාම, වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම |
| C | පසු ආපදා අවස්ථා | - | ගොදුරු වීමට හැකියාව ඇති නොවන පරිදි ඉක්මන් කල්පවත්නා විසඳුම් ගැනීම |

- **ආපදා කළමනාකරණයට අදාළ ආයතන**

    * ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - DMC
    බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව - කොළඹ 07
    දු.ක. 011 2670071 / 2670051 /2670077
    WWW.dmc.gov.lk

    * ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය -NBRO
    99/1 ජාවත්ත පාර, කොළඹ 05
    දු.ක. 0112588946 / 2503431
    WWW.nbro@ gov.lk /nbro @ sltnet.lk

    * කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව -Department of Meteorology
    383, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
    දු.ක. 011 2665088
    WWW.meteo slt. lk

    * ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය -NDMC
    146, ගාලුපාර, කොළඹ 07
    දු.ක 011 2395105
    WWW.ndmc.gov.lk
    මීට අමතර ව
    - ප්‍රාදේශීය ගිනි නිවන මධ්‍යස්ථානය
    - රෝහල
    - පොලීසිය, සමාජ සේවා ආයතන පිළිබඳ තොරතුරු ද වැදගත් ය.

- **අනතුරු අවස්ථාවලට අදාළ ව උපක්‍රමශීලී ව මනා සිහියකින් යුක්ත ව කටයුතු කිරීම**

    * අනතුරක් සිදු වීමට පෙර අනතුර සිදු වන අවස්ථාවේ හා අනතුරක් සිදු වූ පසු ත්‍රිවිධ අවස්ථාවල දී ම පුද්ගලයෙකු මනා සිහිබුද්ධියකින් කටයුතු කිරීම ඉතා ම වැදගත් ය. මක්නිසා ද තමාගේ ජීවිතය මෙන් ම අන් අයගේ ජීවිතය ද ගලවා ගැනීමට අවශ්‍ය නිසා ය.

    * අන් අයගේ ජීවිත ගලවා ගැනීමට අධි සංවේදී වීම තුළින් තමාගේ ජීවිතය ද නැතිවන ආකාරයට කටයුතු නොකිරීම

    * තමා ආරක්ෂා වෙමින් අන් අය ගලවා ගැනීමට හැකි මානසික තත්ත්වයක් හා කායික ශක්තියක් තමාට තිබේදැයි දැන ගැනීමෙන් පසු ඒ සඳහා යොමු වීම නිදසුන් ලෙසඃ- දියට වැටුණු කෙනෙකු බේරා ගැනීමට පීනන්නට බැරි අයෙකු දියට පැනීමේ දී දෙදෙනා ම විපතට පත්වීම

    * හැඬීම, කෑගැසීම් හෝ නිශ්ශබ්ද ව සිටීම නිසා ද අනතුරු සිදුවීම හෝ සිදුවන අනතුරු උග්‍ර වන අවස්ථා ද ඇත.

    * අනතුරක් වූ අවස්ථාවක රෝහලට ගෙනයන තුරු දියයුතු ප්‍රථමාධාර පිළිබඳ දැනුවත් වී තිබීම

    * අනතුරක් වූ විට දැනුම් දිය යුතු ආයතන හා පුද්ගලයින් පිළිබඳ දැනුවත් වීම

## 9.4.1 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ආපදා කළමනාකරණය කරයි.

**නිපුණතා මට්ටම** :- විපත් හා අනතුරු කෙරෙහි සවිඥානක වෙයි.

**ක්‍රියාකාරකම** :- " අප අවට අනතුරු හඳුනා ගනිමු "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ගෙදර දී, පාසලේ දී පරිසරයේ දී, වැඩ බිම තුළ දී සිදුවන අනතුරු දැක්වෙන පිංතූරයක්, චිත්‍රයක්, වාර්තාවක්.
- ඇමුණුම 9.4.1.1 කණ්ඩයම් සඳහා කාර්ය පත්‍රිකා
- ඩිමයි කොළ
- ෆෙල්ට් පෑන්
- පෙළ පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.1.1.1**

- විවිධ ස්ථානවල දී සිදු විය හැකි අනතුරු දැක්වෙන පිංතූරයක්, චිත්‍රයක්, වාර්තාවක් ඉදිරිපත් කරන්න.
- එම අනතුරු කුමන ස්ථානවල සිදු විය හැකි දැයි සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පහත කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක යෙදෙන්න.

- ඕනෑ ම වේලාවක දී අප විපත් හා අනතුරුවලට ලක්විය හැකි බව.
- ඕනෑම ස්ථානයක දී විපත් හා අනතුරු සිදු විය හැකි බව.
- තස්ත්‍රවාදී කටයුතු පැවති ප්‍රදේශවල බිම්බෝම්බ වැනි අනතුරු හා අවදානම් තත්ත්ව ඇති බව.
- අනතුරු ස්වාභාවිකවත් මිනිස් ක්‍රියාකාරකම් නිසාත් සිදු වන බව.
- අප විපත් හා අනතුරු කෙරේ සවිඥානික වුවහොත් බොහෝ අනතුරු වළක්වා ගතහැකි බව.

**(විනාඩි 10 යි)**

**පියවර 9.4.1.2**

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 9.4.1.2 කාර්ය පත්‍රිකාව, ඩිමයි කොළය හා ෆෙල්ට් පෑන් එක බැගින් ලබා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකම කරන අතර ඔවුන් මෙහෙයවමින් ක්‍රියාකාරකම නිම කිරීමට සහාය වන්න.

**(මිනිත්තු 15 යි)**

**පියවර 9.4.1.3**

- කණ්ඩායම්වලට ගවේෂණ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම ඉදිරිපත් කරන තොරතුරු පිළිබඳ අදහස් දැක්වීමට සෙසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • ඕනෑ ම වේලාවක ඕනෑ ම ස්ථානයක දී අනතුරු සිදු විය හැකි බව<br>• නිවසේ දී පාසලේ දී අවට පරිසරයේ දී ක්‍රීඩා පිටියේ දී වැඩ බිම්වල දී ගමන් බිමන්වල දී අනතුරු සිදු විය හැකි බව<br>• ස්වාභාවික ව ද මිනිස් ක්‍රියාකාරකම්වලින් ද විපත් හා අනතුරු සිදු වන බව<br>• අපට මුහුණ දීමට සිදු විය හැකි විපත් හා අනතුරු පිළිබඳ ව සවිඥානික ව එදිනෙදා කටයුතු කළ යුතු බව<br>• විපත් හා අනතුරු පිළිබඳ සවිඥානික වීමෙන් ඒවා අවම කරගත හැකි බව |

**(මිනිත්තු 15 යි)**

## තක්සේරුව හා ඇගයීම

- විපත් හා අනතුරු සිදු වන ස්ථාන නම් කරයි.
- ස්වභාවික ලෙසත් මිනිස් ක්‍රියාකාරකම් නිසාත් සිදුවන අනතුරු වර්ග කර දක්වයි.
- විපත් හා අනතුරු ගැන සවිඥානික වීමෙන් අනතුරු වළක්වා ගත හැකි බව පිළිගනියි.
- තමා ආශ්‍රිත පරිසරය ගැන සවිඥානක විය යුතු බව ප්‍රකාශ කරයි.
- සාමුහික ව ක්‍රියා කිරීමෙන් කණ්ඩායම් හැඟීම් වර්ධනය කර ගනියි.

**ඇමුණුම 9.4.1.1**

**කාර්ය පත්‍රිකාව (පළමු කණ්ඩායම)**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ නිවසේ දී අනතුරක් සිදු විය හැකි අවස්ථාවක් පිළිබඳ කෙටි නාට්‍යයක් ඉදිරිපත් කිරීම

**කාර්ය පත්‍රිකාව (දෙවන කණ්ඩායම)**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ පාසලේ දී අනතුරක් සිදුවීමට හේතු වන ආකාරයේ සිද්ධියක් භූමිකා රංගනයක් මගින් ඉදිරිපත් කිරීම

**කාර්ය පත්‍රිකාව (තුන්වන කණ්ඩායම )**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ ස්වභාවික ව සිදුවන විපත් හා අනතුරු චිත්‍රයක් මගින් ඉදිරිපත් කිරීම යි.

**කාර්ය පත්‍රිකාව (හතරවන කණ්ඩායම)**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ මානව ක්‍රියාකාරකම් නිසා සිදු වන විපත් හා අනතුරු පිළිබඳ ව චිත්‍රයක් ඉදිරිපත් කිරීම යි.

**කාර්ය පත්‍රිකාව (පස්වන කණ්ඩායම)**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ අප මුහුණ දෙන විපත් හා අනතුරු අවම කර ගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව ලේඛනයක් ඉදිරිපත් කිරීම යි.

## 9.4.2 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ආපදා කළමනාකරණය කරයි.

**නිපුණතා මට්ටම** :- අනතුරු හා විපත්වල දී බුද්ධිමත් ව කටයුතු කරයි.
**ක්‍රියාකාරකම** :- " ආපදා අවදානම කළමනාකරණය කරමු "

**කාලය** :- මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :-
- ඇමුණුම 9.4.2.1 හි ඇතුළත් රූප සටහන
- ඇමුණුම 9.4.2.2 හි ඇතුළත් කාර්ය පත්‍රිකා
- ඩිමයි කොළ
- ෆෙල්ට් පෑන් 6ක් වර්ණ කිහිපයකින්
- වාර්නිස් කොළ වර්ණ 4 කින්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.4.2.1**

- ඇමුණුම 9.4.2.1 රූප සටහන් "අ " පින්තූරය පන්තියේ සිසුන්ට හොඳින් නිරීක්ෂණය කිරීමට දෙන්න. එහි ඇති විශේෂත්වයන් පැවසීමට අවස්ථාව දෙන්න. කළුලෑල්ලේ සටහන් කරන්න.
- "ආ" පින්තූරය පන්තියේ සිසුන්ට හොඳින් නිරීක්ෂණය කිරීමට දෙන්න. එහි ඇති විශේෂත්වයන් පිළිබඳ ව විමසා කළුලෑල්ලේ සටහන් කරන්න.
- "ඉ" පින්තූරය පන්තියේ සිසුන්ට හොඳින් නිරීක්ෂණ කිරීමට දෙන්න. එහි ඇති විශේෂත්වයත් කළුලෑල්ලේ සටහන් කරන්න. ඒ ඇසුරින් පහත දැක්වෙන කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක යෙදෙන්න.

- අප අවට පරිසරය තුළ උපද්‍රව තිබෙන බව
- එම උපද්‍රව පැහැදිලි ව හඳුනාගත යුතු බව
- ඒ අනුව ආපදාවට ගොදුරු වන ප්‍රදේශ හඳුනා ගත හැකි බව
- ගොදුරු වන ප්‍රදේශය ආපදාවට ලක්වන බව
- ආපදාව හසුරුවා ගැනීමෙන් එය වළක්වා ගත හැකි බව

**(විනාඩි 10 යි)**

**පියවර 9.4.2.2**

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න. දී ඇති කාර්ය පත්‍රිකා 4 එක බැගින් කණ්ඩායම්වලට බෙදන්න.
- කාර්ය පත්‍රිකාවට අනුව අදාළ කාර්යයෙහි නිරත කරවන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම්වලට අවස්ථාව දෙන්න.
- ඒ ඒ කණ්ඩායම් ඉදිරිපත් කිරීම් සංවර්ධනය කිරීම සඳහා අනෙක් කණ්ඩායම්වල සිසුන්ට අවස්ථාව දෙන්න.

**(මිනිත්තු 50 යි)**

**පියවර 9.4.2.**

- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සමාලෝචනය කරන්න.

|  |
|---|
| • උපද්‍රවය, ගොදුරු වන ප්‍රදේශය හා ආපදාව, ආපදා කළමනාකරණයේ දී වැඩි අවධානයක් යෙදිය යුතු සංකල්ප බව<br>• ආපදාවක දී බුද්ධිමත් ව කටයුතු කළ යුතු බව<br>• ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග ගත හැකි බව<br>• ආපදා කළමනාකරණ චක්‍රය අනුව ක්‍රියාත්මක වීමෙන් ආපදා වළක්වා ගත හැකි බව හා කළමනාකරණය කළ හැකි බව<br>• සෑම පුරවැසියෙක් ම අනතුරු හා ආපදා පිළිබඳ ව අවදියෙන් සිටිය යුතු බව |

**(මිනිත්තු 20යි)**

## තක්සේරුව හා ඇගයීම

- ආපදා කළමනාකරණ සංකල්ප පැහැදිලි කරයි.
- අවට පරිසරය තුළ උපද්‍රව ඇතිබව පිළිගනියි.
- අනතුරු හා උපද්‍රව වළක්වා ගැනීමට බුද්ධිමත් ව කටයුතු කළ හැකි ආකාර ඉදිරිපත් කරයි.
- සෑම පුරවැසියෙක් ම අනතුරු හා ආපදා වළක්වා ගැනීමට කටයුතු කළ යුතු බවට අදහස දක්වයි.
- ආපදා කළමනාකරණය සඳහා අවස්ථානුකූල ව ඉදිරිපත් වීමට සූදානම් වෙයි.

**ඇමුණුම 9.4.2.1**

ප්‍රවේශය සඳහා රූප සටහන මෙම රූප සටහන් පංතියේ ප්‍රදර්ශනයට සුදුසු ආකාරයට විශාල කර සකස් කරගන්න.









**ඇමුණුම 9.4.2.2**

**1 කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ ආපදා අවදානම් කළමනාකරණ සංකල්ප පැහැදිලි කිරීමට යි. ඒ සඳහා සුදුසු නිර්මාණයක් ඉදිරිපත් කරන්න.

**2 කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ අනතුරු වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම. එම ක්‍රියාමාර්ග පැහැදිලි ව ලියා ඉදිරිපත් කරන්න.

**3 කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ ස්වභාවික අනතුරු අවම කිරීමට කටයුතු කරන ආකාරය පැහැදිලි කිරීමට ඔබ කැමති ආකාරයකට නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

**4 කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ ආපදා කළමනාකරණ චක්‍රය පිළිබඳ පැහැදිලි කිරීමට ය. සුදුසු ක්‍රමවේදයක් යොදා ගෙන ආපදා කළමනාකරණ චක්‍රය පැහැදිලි කරන්න.

(කාලච්ඡේද 06යි)

# 9.5 ගැටුම් නිරාකරණය

## හැඳින්වීම

පුද්ගල විවිධත්වය නිසා බොහෝ අවස්ථාවල පුද්ගලයන් සිතන පතන ආකාරය ද වෙනස් වේ. මෙම වෙනස්කම් තුළ විවිධාකාර මතවාද මතු වීම, අදහස්වල එකඟත්වයක් නොමැති වීම වැනි කරුණු නිසා ගැටුම්කාරී තත්ත්වයන් උදා වේ. ජීවිත ගමනේ විවිධ අවස්ථාවල මෙබඳු ගැටුම් සහගත තත්ත්වයන් අතීතයේ දී ද මිනිසුන් මුහුණ දී ඇත. වර්තමානයේ ද ගැටුම් අවස්ථා එසේ ම පවතින අතර අනාගතයේ දී ද පවතිනු ඇත. ගැටුමක් විසඳා ගැනීම යනු බුද්ධිමය ක්‍රියාවලියකි. එමෙන් ම ගැටුමක් නිර්මාණශීලී ව විසඳා ගැනීම සමාජ ප්‍රගමනයට ද හේතු වේ. මිනිසුන් කණ්ඩායම් වශයෙන් සමාජගත වීමේ දී අනිවාර්යයෙන් ම ගැටුම් නිරාකරණ කුසලතා ලබාගත යුතු ය.

ගැටුම් විසඳා ගැනීමේ දී ඊට බලපාන සාධක හඳුනා ගනිමින් විශ්ලේෂණය කොට විසඳුම් සෙවිය යුතු ය. නම්‍යශීලීබවින් හා මැදහත්කරණයෙන් යුතු තෙවන පාර්ශ්වකරුවකුගේ අවශ්‍යතා ව පවතී. එම සමථකරුවා විසින් සෑම විට ම දෙපාර්ශවයට ම ජය ලැබිය යුතු ය. ගැටුම් සමථකරණයේ දී අත් විය හැකි තත්ත්ව හතරකි.

| A පාර්ශ්වය | B පාර්ශ්වය |
|---|---|
| ජය | පරාජය |
| පරාජය | ජය |
| පරාජය | පරාජය |
| ජය | ජය |

හැම විට ම දෙපාර්ශ්වයට ම ජය ලැබිය හැකි විසඳුමක් යෝජනා කළ යුතු ය.

ගැටුම් නිරාකරණය කුසලතා පිළිබඳ සිසුන් තුළ අවබෝධයක් ඇති කරලීමට මෙහි දී බලාපොරොත්තු වේ. මේ අනුව සහානුභූතික සවන් දීම, ගැටුම් විග්‍රහය, විකල්ප විසඳුම් හඳුනා ගැනිම ස්ථිරසාර ප්‍රතිචාර දැක්වීමේ වැදගත්කමක් සිසුන් හට පෙන්වා දිය යුතු ය.

අතීතයේ සිට ම පැවත එන ගැටුම් සමථකරණය කිරීම තුළින් විසඳුම් ලබා ගැනීමට ද මෙහි දී අවධානය යොමු කරනු ලැබේ. මෙහි දී සමථකරුවකු ලෙස ක්‍රියා කළ යුතු ආකාරයත් සමථකරණය තුළින් දෙපාර්ශ්වයට ම පිළිගත හැකි විසඳුමක් කරා එළඹිය හැකි ආකාරයන් පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට හැකිවන පරිදි ක්‍රියාකාරකම් සැලසුම් කර තිබේ.

මේ අනුව ගැටුම් නිරාකරණයේ දී තෙවන පාර්ශ්වකරුවකුගේ සහාය ලබා ගනිමින් දෙපාර්ශ්වයට ම තම තමන්ගේ ශක්තිය තුළින් ම ජය ජය - විසඳුම් කරා ළඟා වීමට හැකිවන ආකාරය පිළිබඳ ව සිසුන්ට අවබෝධ කරවීම අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : ගැටුම් සාමකාමී ව විසඳයි.

**නිපුණතා මට්ටම්** :

- ගැටුම්වල ස්වභාවය විග්‍රහ කරයි.
- බාධක ජයගනිමින් ගැටුම් විසඳීමට පෙළෙඹෙයි.
- ගැටුම් සමථකරණය කරයි.

**විෂය අන්තර්ගතය** :

**ගැටුම් නිර්වචනය කිරීම**

- අදහස්වල විවිධත්වය නිසා හෝ සමාජ විසමතාව නිසා පුද්ගලයන් දෙදෙනෙකු හෝ දෙපාර්ශ්වයක් අතර ඇතිවන මතභේදාත්මක තත්ත්වයන් තුළ ගැටුම් හට ගන්නා බව.

**ගැටුම් ස්වභාවය හඳුනා ගැනීම**

- අදහස්, ආකල්පමය වශයෙන් ඇතිවිය හැකි ගැටුම්වල ස්වභාවය හා සමාජ විසමතාව හේතුවෙන් ඇතිවිය හැකි ගැටුම්වල ස්වභාවය හඳුනා ගැනීම

**ගැටුම් විග්‍ර කිරීම**

- හේතු
  පුද්ගල අදහස්වල විවිධත්වය නිසා හෝ සමාජ විසමතාව නිසා ඇතිවන ගැටුම් වශයෙන් පුළුල් ලෙස ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන හේතු ලෙස විග්‍රහ කළ හැකි බව.
- ලක්ෂණ
  මානසික ගැටුම් හේතුවෙන් ඇති වන ආතතිය කළකිරීම මෙන් ම හදිසි කෝපය, නොරුස්සන බව, ප්‍රචණ්ඩ වචන භාවිතය, අනෙකුත් පුද්ගලයින්ට කායික බලය පාවිච්චි කිරීම

**ගැටුම් නිරාකරණය බාධක**

- දැඩි ස්ථාවර බව - එක් පාර්ශ්වයක දැඩි ස්ථාවර බව නිසා අනෙක් පාර්ශ්වය නොසලකා හැරීම.
  එකම විසඳුමක රැඳිසිටීම - එක ම විසඳුමක් මත රැඳී සිටිමින් අනෙක් පාර්ශ්වයේ අවශ්‍යතා නොසලකා හැරීම

අනෙක් පාර්ශ්වය පරදවා තමා ජය ගැනීමට සිතීම

- අනෙක් පාර්ශ්වයේ අදහස්, අවශ්‍යතා නොසලකා හරිමින් එක පාර්ශ්වයන් පමණක් ජයග්‍රහණය කිරීමට යාම නිසා ගැටුම්කාරී තත්ත්වයන් වර්ධනය වීමට ඉඩ හැරීම

- ගැටුම් නිරාකරණයක හොඳ ලක්ෂණ හඳුනා ගැනීම

| | | |
|---|---|---|
| - සන්නිවේදනය | - | ඵලදායි සන්නිවේදනය තුළින් දෙපිරිස තම අදහස් මතවාද පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීම |
| - විකල්ප විසඳුම් සෙවීම | - | එක ම විසඳුමක රැඳී සිටීනම් ඒ වෙනුවට හැකිතාක් විකල්ප විසඳුම් සෙවීම |
| - සහයෝගය | - | ගැටුමට සම්බන්ධ දෙපිරිසේ ම අදහස් හා අවශ්‍යතාවල සාධාරණ බව හා අදාළත්වය හඳුනා ගනිමන් විකල්ප විසඳුම් ලබා ගැනීම සඳහා අනොන්‍ය සහයෝගය දැක්වීම |
| - දෙපාර්ශ්වයම එකඟ විය හැකි විසඳුමක් කරා යෑම | - | ජය - ජය විසඳුමක් කරා දෙපිලට ම එළඹීමට හැකියාව ගැටුම් නිරාකරණයේ සාර්ථකත්වයට හේතු වන බැවින් දෙපිල ම සෑහීමකට පත්වීම |
| - ගැටුම් නිරාකරණ කුසලතා | - | සහානුභූතික සවන් දීම, ගැටුම් විග්‍රහය, විකල්ප විසඳුම් හඳුනා ගැනීම සහ ස්ථිරසාර ප්‍රතිචාරය තුළින් දෙපාර්ශ්වය ම ජය - ජය විසඳුමක් කරා එළඹීමට හැකි වීම |

- සමථකරණය හැඳින්වීම

- ගැටුම් විසඳීම සඳහා තෙවන පාර්ශ්වකරුවෙකුගේ සහාය ලබා ගැනීම යි. මෙහි දී අණ දීමක්, බලපෑම් කිරීමක්, දඬුවම් දීමක් සිදු නොවේ. ගැටුමට සම්බන්ධ දෙපාර්ශ්වයට ම තම ගැටුම් නිරාකරණය කර ගැනීම සඳහා නිවැරදි විසඳුම් තම තමන් තුළින් ම ලබා ගැනීමට අවස්ථාව ලබා දීම, සමථකරු දෙපාර්ශ්වය ම පිළිගන්නා, අපක්ෂපාති පුද්ගලයෙකු වීම
- ගැටුම් අධ්‍යයනය කිරීම ද මෙහි දී සිදු වේ. සමථකරු දෙපාර්ශ්වය සමග ම වෙන් වෙන් ව සාකච්ඡා කිරීමෙන් සිදු වේ.
- විකල්ප විසඳුම් යෝජනා කිරීමට දෙපාර්ශ්වය පෙළඹවීමක්, දෙපාර්ශ්වයට ම පිළිගත හැකි විසඳුම් යෝජනා කිරීමට ද අවස්ථාව මතු කර දෙනු ලැබේ.
- සාමකාමී ඇසුරින් ආරවුල් නිරාකරණය සඳහා මෙතුළින් මඟ පෙන්වනු ලැබේ.

## 9.5.1 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ගැටුම් සාමකාමී ව විසඳයි.

**නිපුණතා මට්ටම** :- ගැටුම්වල ස්වභාවය විග්‍රහ කරයි.

**ක්‍රියාකාරකම** :- " ජය ජය විසඳුම් "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.5.1.1 හි ඇතුළත් ගැටුම් සිතුවම් ආකෘතිය
- ඇමුණුම 9.5.1.2 හි ඇතුළත් කණ්ඩායම් ක්‍රියාකාරකම්
- ඩිමයි කඩදාසි, බ්‍රිස්ල් බෝඩ්
- ෆෙල්ට් පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.5.1.1.**

- " ගැටුම " යන වචනය හුණු පුවරුවේ සටහන් කර ඒ පිළිබඳ ව බුද්ධිකලම්භන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ළමයින්ගේ අදහස් ඇසුරින් ම පහත දැක්වෙන කරුණු ද ඉස්මතු වන සේ කෙටි සාකච්ඡාවක් කරන්න.

- ගැටුමක් යනු
  - පුද්ගලයකු තුළ
  - පුද්ගලයන් දෙදෙනකු අතර හෝ
  - වැඩි දෙනෙකු අතර
  - කණ්ඩායම් දෙකක් අතර හෝ
  - කණ්ඩායම් ගණනාවක් අතර

  යම් අවස්ථාවක්/යම් සිද්ධියක් පිළිබඳ ව එකඟතාවක් නොවීම නිසා ඇති වන චර්යාමය වෙනසක් බව
- මෙවැනි ගැටුම් අවස්ථාවන් අවශ්‍යතා ඉටුකර ගැනීමට යාම නිසාත්, තමාට සිදුවිය හැකි බිය/සැකය/ චකිතයන් / අවාසි නැතිකර ගැනීමට යොමු වීම නිසාත් සිදු වන බව

- එම නිසා සෑම ගැටුම් අවස්ථාවක් ම අවශ්‍යතා හා භීතිය හේතු කොට ගෙන ඇති වන බව

- ගැටුමට භාජනය වන්නන් " පාර්ශ්වකරුවන් "ලෙස හඳුන්වන බව
- ගැටුමක් විසඳීමට නම් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා හා භීතිය මැනවින් හඳුනාගත යුතු බව
- ගැටුම් අවස්ථාවන්ට සම්බන්ධ වූ පාර්ශ්වකරුන්ගේ අවශ්‍යතා හා භීතිය ඔබ විසින් සිසුන්ට මඟ පෙන්වීමක් ලෙසට ඇමුණුම අංක 9.5.1.1 හි දැක්වෙන ආකෘතිය භාවිත කරමින් කළුලෑල්ලෙහි ගොඩනගන්න.

**(මිනිත්තු 10 යි)**

**පියවර 9.5.1.2**

- පන්තියේ ළමයින්ගේ සංඛ්‍යාව අනුව කුඩා කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම අංක 9.5.1.2 දක්වා ඇති ක්‍රියාකාරකම් කණ්ඩායම්වලට යොමු කරන්න.
- කණ්ඩායමට යොමු වූ ගැටුම් අවස්ථාව කණ්ඩායම් සාකච්ඡාව ඇසුරින් පැහැදිලි කර ගැනීමට කණ්ඩායම්වලට උපදෙස් දෙන්න. පහත දැක්වෙන කරුණු ඔස්සේ කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවන්න.
  1. ගැටුම ඇති වී ඇත්තේ කුමන හේතු නිසා ද?
  2. ගැටුම සුදුසු නමකින් හඳුන්වන්න.
  3. ගැටුමට අදාළ පාර්ශ්වකරුවන් කවරහු ද?
  4. පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා කවරේ ද?
  5. පාර්ශ්වකරුවන්ගේ භීතිය කවරේ ද?
  6. සුදුසු ආකාරයකින් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා හා භීති ඉදිරිපත් කරන්න.

**(මිනිත්තු 20 යි)**

**පියවර 9.5.1.3**

- එක් එක් කණ්ඩායමේ පිළිතුරු ඉදිරිපත් කරවන්න.
- සෑම කණ්ඩායමකට තම පිළිතුරු ඉදිරිපත් කිරීමෙන් පසු ව ඒ පිළිබඳ ව සෙසු කණ්ඩායම්වලට අදහස් ද සමගින් ප්‍රතිපෝෂණයට අවස්ථාව දෙන්න.
- සියලු ම කණ්ඩායම් පිළිතුරු ඉදිරිපත් කිරීම හා අදාළ ප්‍රතිපෝෂණ අවස්ථාවන්ගෙන් පසු ව පහත දැක්වෙන කරුණු ද ඉදිරිපත් කරමින් සමස්ත ක්‍රියාකාරකම පිළිබඳ ව සමාලෝචනයක් කරන්න.

- එය ගැටුම් සිතුවම් කිරීම / ගැටුම් සිතුවම ලෙස හඳුන්වන බව
- මෙසේ ගැටුම් විශ්ලේෂණය කර පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා / භීතිය හඳුනා ගැනීම ගැටුමට සම්බන්ධ වූවන්ට කළ හැකි බව
- එසේ වුව ද ගැටුමට සම්බන්ධ වූවන්ට වඩා වෙනස් කෙනෙකු හෝ වෙනස් කණ්ඩායමක් විසින් විශ්ලේෂණය කරන්නේ නම් එය වඩාත් ඵලදායී හා අර්ථවත් වන බව
- ගැටුම් විශ්ලේෂණය සඳහා විවිධ ආකෘතීන් භාවිතයට ගතහැකි බව
- සියලු ම පාර්ශ්වකරුවන් අවශ්‍යතා හැකිතරම් ඉටුකර දීමටත්, සෑම පාර්ශ්වකරුවන්ගේ ම භීති හැකිතාක් අවම කර දීමට මෙවැනි විශ්ලේෂණ තුළින් හැකිවන බව
- එම ක්‍රියාවලිය ජය- ජය විසඳුම් කරා යොමු වීමට උපකාරී වන බව

**(මිනිත්තු 10 යි)**

## තක්සේරුව හා ඇගයීම

- ගැටුම යනු කුමක්දැයි අර්ථ දක්වයි.
- ගැටුම් විශ්ලේෂණය ජය ජය විසඳුම් කරා යොමු වීමට හේතුවන බව පිළිගනියි.
- ගැටුම් අවස්ථා නිවැරදි ව විශ්ලේෂණය කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් හි ක්‍රියාකාරී ව නිරත වෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි.

**පසු වැඩ**

ඔබ තුළ ඇති වූ ගැටුම් අවස්ථාවක් සිහියට නගාගන්න. එම ගැටුම උද්ගත වුයේ ඔබේ කුමන අවශ්‍යතා හා භීති නිසා දැයි විශ්ලේෂණය කරන්න. (ගැටුම් සිතියම් කරණයෙහි නිරත වන්න.)

**ඇමුණුම 9.5.1.1**
**කාර්ය පත්‍රිකාව**



**ඇමුණුම 9.5.1.2**

1 වන කණ්ඩායම

සමන් තම මිතුරු කපිලගේ විද්‍යා විෂයයේ පැවරුමකට දුන් පිළිතුරු කොපිකර ගැනීම සඳහා ඉල්ලයි. කපිල එය දිය නොහැකි බව ප්‍රකාශ කරයි. සමන් හා කපිල අතර උණුසුම් වචන හුවමාරුවකි.

2 වන කණ්ඩායම්

වාර අවසානයේ පැවැත්වෙන විභාගයට පාඩම් කරමින් සිටින යහළුවන් කණ්ඩායම වෙත පැමිණෙන සිරිමල් හා නාලිනි පුංචි සිටුවරු චිත්‍රපටය නැරඹීමට යාම සඳහා බලකරති. යහළුවෝ එය ප්‍රතික්ෂේප කරති. සිරිමල් හා නාලිනි නැවත නැවතත් ඇවිටිලි කරති.

3 වන කණ්ඩායම

සීගිරිය බැලීමට යාම සඳහා මිතුරියන් සංවිධානය කළ චාරිකාව සඳහා දෙමව්පියන් ගෙන් අවසර ඉල්ලූ චතුරිකාට, ඒ සඳහා දෙමව්පියන්ගේ අවසර නොලැබුණි. මිතුරියන් අනිවාර්යෙන් ම ඇයට සහභාගී වීමට ඇවටිලි කරයි.

4 වන කණ්ඩායම

ගණිත අභ්‍යාසයක් කරමින් අක්කා "රේඩියෝවේ ශබ්දය අඩුකරන්න" යැයි මල්ලීට ඇවිටිලි කරයි. මල්ලී සාලයේ සිටිමින් ගුවන් විදුලියෙන් ප්‍රචාරය වන සංගීත වැඩ සටහනට සවන් දෙයි. රේඩියෝවේ හඬ අඩු කළ නොහැකි බවත් එම වැඩ සටහනට සවන් දිය යුතු බවත් මල්ලී කියයි.

# 9.5.2 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ගැටුම් සාමකාමී ව විසඳයි.

**නිපුණතා මට්ටම** :- බාධක ජයගනිමින් ගැටුම් විසඳීමට පෙළඹෙයි.

**ක්‍රියාකාරකම** :- " වෙසෙමු සමගියෙන් - විසඳා ගැටුම් නුවණින් "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.5.2.1 භූමිකා රංගන දෙකකට අදාළ උපදෙස්
- ඇමුණුම 9.5.2.2 - කණ්ඩායම් පැවරුම

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.5.2.1**

- ඇමුණුම 9.5.2.1 හි දැක්වෙන භූමිකා රංගන ඉදිරිපත් කරන්න.
- පළමු වන හා දෙවෙනි වශයෙන් එක් එක් භූමිකා රංගනයෙන් කියවෙන අවස්ථාවන් හි හැසිරීම් ස්වරූපය පිළිබඳ ව ළමයින් ගෙන් ප්‍රශ්න කරමින් ඔවුන්ගේ අදහස් විමසන්න.
- ළමයින්ගේ ප්‍රතිචාර විචාරශීලී ව විමසමින් පහත දැක්වෙන කරුණු ද යොදා ගනිමින් කෙටි සාකච්ඡාවක යෙදෙන්න.

- පළමුවන භූමිකා රංගනයේ ආක්‍රමණශීලී හැසිරීම් ස්වරූපයක් හා යටහත්ශීලී හැසිරීම් ස්වරූපයක් පෙන්වන බව
- දෙවැනි භූමිකා රංගනයේ දෙදෙනෙක් ඔවුනොවුන්ට සවන්දෙන ස්වරූපය, ගෞරව කරමින් කථා කරන ස්වරූපයක් පෙන්වන බව
  එවැනි හැසිරීම් නිසි ලෙස හැසිරීම හෙවත් ස්ථිරසාර හැසිරීම ලෙස හඳුන්වන බව
- ආක්‍රමණශීලී හැසිරීම හා යටහත්ශීලී හැසිරීම ගැටුම්වලට හේතු වන බවත්, නිසිලෙස හැසිරීම හෙවත් ස්ථිරසාර හැසිරීමෙන් ගැටුම්
  වළකින බව හා සිදු වූ ගැටුමක් සමකාමී ව විසඳා ගැනීමටත් හේතු වන බව
- සාමකාමී පුද්ගලයන් වීමට, සාමකාමී සමාජයක් නිර්මාණයට සාමකාමී ව ගැටුම් විසඳා ගැනීමට, ගැටුම් ඇතිවීම වළක්වා ගැනීමට ස්ථිරසාර හැසිරීම් හෙවත් නිසිලෙස හැසිරීමට පුරුදු පුහුණු විය යුතු බව

**(මිනිත්තු 10 යි)**

**පියවර 9.5.1.2**

- පන්තියේ ළමයින්ගේ සංඛ්‍යාව අනුව ඔවුන් ව කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 9.5.2.2 දක්වා ඇති ක්‍රියාකාරකම් කණ්ඩායම්වලට යොමු කරන්න.
- කෙනෙකුට සවන් දිය යුත්තේ කෙසේ ද?
  කෙනෙකුට කථා කළ යුත්තේ කෙසේ ද?
  යන අංශ දෙකට අදාළ ව උපදෙස් මාලාව සකස් කිරීමට ළමයින්ට උපදෙස් දෙන්න.

**(මිනිත්තු 20 යි)**

**පියවර 9.5.2.3**

- කණ්ඩායම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- එක් කණ්ඩායමකින් ඉදිරිපත් වූ කරුණු ප්‍රමුඛත්වය පිළිබඳ ව අදහස් දැක්වීමට සෙසු කණ්ඩායම්වලට අවස්ථා ලබා දෙන්න. (කාලය මැනවින් යොදා ගැනීම සඳහා).
- කණ්ඩායම් පිළිතුරු පිළිබඳ ව සෙසු කණ්ඩායම්වල අදහස් ද විමසමින් ප්‍රතිපෝෂණයට අවස්ථාව සලසමින් පහත දැක්වෙන කරුණු ද සාකච්ඡා කරමින් සමාලෝචනය කරන්න.

- ආක්‍රමණශීලී නොවීමත් යටහත්ශීලී නොවීමත් යහපත් චර්යාවක් සඳහා පුරුදු පුහුණු කරගත යුතු බව
- යහපත් චර්යාව, ස්ථිරසාර චර්යාව/නිසි චර්යාව ලෙස හැඳින්වෙන බව
- ස්ථිරසාර කථනය, ස්ථිරසාර ශ්‍රවණය නිසිලෙස කථනය, නිසිලෙස ශ්‍රවණය ලෙස මෙම යහපත් චර්යාව ලෙස හැඳින්වෙන බව
- නිසි ලෙස සංනිවේදනය යනුවෙන් ද මෙම අවස්ථාව හැඳින්වෙන බව
- ගැටුම් ඇතිවීම වැළැක්වීමට හෝ ඇති වූ ගැටුම් අවස්ථාවක් සාමකාමී ව විසඳීමට ස්ථිරසාරතාව හෙවත් නිසිලෙස හැසිරීම හේතුවන බව
- එවැනි විසඳුම් ජය ජය විසඳුම් යනුවෙන් හැඳින්වෙන බව
- නිසිලෙස කථනය නිසිලෙස ශ්‍රවණය පුරුදු පුහුණු වී ඇත්නම් ඒ සඳහා යොමු කරවන්නේ නම් ගැටුම් අවස්ථා අවම කරගත හැකි බව - ගැටුම් අවස්ථා වළක්වා ගත හැකි බව - ඇති වූ ගැටුමක් සමකාමී ව විසඳා ගත හැකි බව
- මේ පිළිබඳ ව දැනුවත් වූ සිසුන් සියලු ම දෙනා සාමකාමී පුද්ගලයන් වීමට ස්ථිරසාර චර්යා ලක්ෂණ චරිතායනය කරගත යුතු බව

**(මිනිත්තු 10 යි)**

## තක්සේරුව හා ඇගයීම

- යටහත්ශීලී, ආක්‍රමණශීලී, ස්ථිරසාර හැසිරීම් රටාවන් හි ගති ලක්ෂණ විස්තර කරයි.
- ස්ථිරසාර චර්යා ලක්ෂණ සමකාමී පුද්ගලයකුගේ ගුණාංගයක් බව පිළිගනියි.
- විවිධ චර්යා ලක්ෂණ වෙන් වෙන් ව ලියා දක්වයි (ප්‍රකාශ කරයි).
- ස්ථිරසාර බවින් කටයුතු කරයි.
- ස්ථිරසාර චර්යා ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් අන්‍යයන් සමග කටයුතු කරයි.

## පසු වැඩ

"අපි ස්ථිරසාර වෙමු" - යන මාතෘකාවෙන් බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.

**ඇමුණුම 9.5.2.1**

- එක් ශිෂ්‍යයෙකු තුළ ආක්‍රමණශීලී හැසිරීම් රටාත්, තවත් ශිෂ්‍යයකු තුළ යටහත්ශීලී හැසිරීම් රටාත් ප්‍රදර්ශනය වන සේ සිසුන් දෙදෙනෙකු භූමිකා රංගනයක යොදවන්න.

- අනතුරු ව තවත් සිසුන් දෙදෙනෙකු යොදවා ඔවුනොවුන්ට සවන් දෙන ගෞරව කරන කතා හා හැසිරීම් සහිත භූමිකා රංගනයක් කරවන්න.

**ඇමුණුම 9.5.2.2**

**කාර්ය පත්‍රිකාව - 01**

නොරිස්සුමක් /අමනාපයක් /ගැටුමක් ඇති නොවන ලෙස හැසිරීම සඳහා සුදුසු උපදෙස් මාලාවක් සකස් කරන්න.

කෙනෙකුට සවන් දිය යුත්තේ කෙසේ ද? කෙනෙකුට කථා කළ යුත්තේ කෙසේ ද? යන අංශ දෙකට ම අදාළ ව උපදෙස් මාලාව ඇතුළත් කරන්න.

## 9.5.3 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ගැටුම් සාමකාමී ව විසඳයි.
**නිපුණතා මට්ටම** :- ගැටුම් සමථකරණය කරයි.

**ක්‍රියාකාරකම** :- " විසඳා ගැටුම් නුවණින් - වෙසෙමු නිරතුරු සතුටින්"

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :- • ඇමුණුම 9.5.3.1 සිද්ධි අධ්‍යයනය ඇතුළත් පත්‍රිකා

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.5.3.1**

- සිසුන් අමතමින් ඔවුන් කුඩා කාලයේ දී ආසා ඇති ගුවන් විදුලි ළමා ගීතයක් වන "සුරතල් නංගියේ අපේ අම්මා" යන ගීතය ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(1) සිසුන් හා සංවාදයට පිවිසෙමින් එම ගීතයට සම්බන්ධ චරිත විමසන්න.
(2) ගීතයෙන් මතුවන ගැටුම පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
(3) ඔවුන් ගැටුම විසදාගත් ආකාරය විමසන්න.
(4) මෙහි දී සිරි අයියා කටයුතු කළ අයුරු ද සිසුන්ගෙන් විමසන්න.

පහත සඳහන් කරුණු මතුවන සේ සාකච්ඡා කරන්න.

- සමථකරණයේ දී තෙවන පාර්ශ්වකරුවකුගේ සහාය ලබා ගැනීම සිදුවන බව
- සමථකරණයේ කණ්ඩායමක් ලෙසින් හෝ එක් අයෙකු ලෙසින් සමථකරණයේ යෙදිය හැකි බව
- සමථකරු දෙපාර්ශ්වය ම පිළිගන්නා පුද්ගලයකු විය යුතු බව
- සමථකරණයේ දී ගැටුමට විසඳුම ආරවුල් කරුවන්ගෙන් ම ලබාගත යුතු බව
- බල කිරීමක් හෝ තීන්දු දීමක් සිදු නොවේ.
- දෙපිල ම ජය- ජය විසඳුමක් කරා ගෙන ආ යුතු බව

**(මිනිත්තු 05 යි)**

**පියවර 9.5.3.2**

- පන්තිය කණ්ඩායම් 03කට බෙදන්න
- ඇමුණුම අංක 9.5.3.1 හි ඇතුළත් සිද්ධි අධ්‍යයනය පත්‍රිකා කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- සිද්ධි අධ්‍යයනය කරමින් විසඳුම් ගෙන ඒමට අවස්ථාව ලබා දෙන්න.

**(මිනිත්තු 15 යි)**

**පියවර 9.5.3.3**

- සිසුන්ගේ සිද්ධි අධ්‍යයන ඇසුරින් ලබාගත් පිළිතුරු පංතියට ඉදිරිපත් කරන්නට අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම්වල යෝජනා ද විමසන්න.
- නිවැරදි විසඳුම්, යෝජනා අගයන්න.

පහත කරුණු මතු වන සේ සමාලෝචනය කරන්න.

- සමථකරු විසින් තම ගැටුම විසඳා ගැනීම සඳහා ආරවුල්කරුවන්ට තම ශක්තිය හඳුනා ගැනීමට ඉඩදිය යුතු බව
- සමථකරණය තුළින් බල කිරීමක් හෝ තීන්දු වීමක් සිදු නොවී නිවැරදි විසඳුමක් කරා ඒමට සහාය දිය යුතු බව
- සමථකරු වෙන් වෙන් ව පාර්ශව සමඟ සාකච්ඡා කළ යුතු බව
- විකල්ප විසඳුම් සොයා ගනීමන් දෙපාර්ශවයට ම ජය ජය විසඳුමකට ළඟා වන අවස්ථාව උදාකළ යුතු බව

**(මිනිත්තු 20 යි)**

# තක්සේරුව හා ඇගයීම

- ගැටුම් සමථකරණය යන්න අර්ථ දක්වයි
- ගැටුම් නිරාකරණයේ දී, සමථකරණය තුළින් නිවැරදි ව විසඳුම් කරා බොහෝ විට එළඹිය හැකි බව පිළිගනිමින් අදහස් දක්වයි.
- සමථකරුවෙකු ලෙස යෝජනා සහ අදහස් ඉදිරිපත් කරයි. ලියා දක්වයි.
- තම පෞරුෂය තුළින් ගැටුම් නිරාකරණයේ දී තිබිය යුතු වටිනා ගුණාංග එළිදක්වයි.
- ගැටුම් නිරාකරණය කුසලතා ප්‍රදර්ශනය කරයි (විකල්ප විසඳුම් කරා එළඹීම, ස්ථිරසාරබව, සහනුභූතික සවන් දීම, ගැටුම් විග්‍රහ කිරීම)

**ඇමුණුම 9.5.3.1**

පහත සඳහන් සිද්ධි ඇතුළත් පත්‍රිකා සිසු කණ්ඩායම් අතර බෙදා දෙන්න.

**කාර්ය පත්‍රිකාව අංක 01**

සුමනසේන සහ දියසේන එක ම පවුලේ සහෝදරයන් දෙදෙනෙකි. තම නිවෙස් දෙක වෙන් වන තැන පිහිටි විශාල කොස් ගසකි. උරුමයට දෙදෙනා ම බහින් බස්වීම නිසා එය දෙදෙනා අතර ගැටුමකට මුල පිරී ඇත. දැන් දැන් සොහොයුරන් දෙදෙනා එකිනෙකා කථා නොකරන තත්ත්වයට පත් වී ඇත.

මෙහි දී සමථකරුවෙකු ලෙස මේ සඳහා විසඳුම් යෝජනා කළ හැකි ආකාරය සාකච්ඡා කර ලියා දක්වන්න.

**කාර්ය පත්‍රිකාව අංක 02**

මේනකා සහ දමයන්ති එක ම පංතියේ සිටින ඉතා ම කුළුපග මිතුරියන් දෙදෙනෙකි. මේ සිසුවියන් දෙදෙනා මෙවර අ.පො.ස සා.පෙළ විභාගයට පෙනී සිටීමට නියමිත ය.

මේනකා තමා විසින් මිල දී ගෙන තිබූ ගණිතය ක්‍රියාකාරකම් අභ්‍යාස පොතක් නැති වී ඇති බවත්, දමයන්ති ළඟ තිබෙන්නේ තමන්ගේ ගණිතය පොත බවත් පවසයි. දමයන්ති පවසන්නේ එය තමාගේ පොත බවත් ඇය මේනකාගේ පොත නුදුටු බවත් ය. මෙම ආරවුල දුර දිග යෑම නිසා දෙදෙනා බහින්බස් වී ඇත. මෙහි දී සමථකරු ලෙස මේ සඳහා ඔබ කණ්ඩායමට විසඳුම් ලබා ගැනීම සඳහා සහාය විය හැකි අයුරු සාකච්ඡා කරන්න.

(කාලච්ජේද 04යි )

# 9.6 වැඩ ලෝකයට සූදානම් වෙයි

## හැඳින්වීම

රටක ජීවනාලිය වන තරුණ පරපුර රටක සංවර්ධනයේ නියමුවෝ වෙති. ද්විතීයික ශ්‍රේණිවල ඉගෙන ගන්නා සිසුන් කෙටි කාලයක් තුළ දී පාසලින් ඉවත් ව සමාජයට පා තබනු ඇත. වැඩ ලෝකයට පිවිසීමට පියමං කරන මෙම සිසුන් වැඩ ලෝකය පිළිබඳ දැනුවත් ව සිටීමත් ඒ සඳහා කිසියම් පූර්ව සිතා බැලීමක් කිරීමට හා ඔවුන්ගේ සිතුවිලි හසුරුවා ගත යුතු ආකාරය කෙරෙහි හුරුවක් ලබා ගැනීමට පන්ති කාමරයේ දී යම් යම් අර්ථවත් අභ්‍යාස කළ හැකි ය. මේ සඳහා විවිධ ගුණාංග වර්ධනය කරගත යුතු බව හා රැකියාවකට යොමුවීමට අවධානය යොමු කිරීම සඳහා සිසුන් තුළ ආකල්ප වර්ධනය කිරීමත් අපේක්ෂිත ය.

එමෙන් ම සිසුන්ට තම දක්ෂතා, හැකියා, ලැදියා අනුව ගැළපෙන වෘත්තියක් තෝරා ගෙන ඒවාට යෝග්‍ය වූ වෘත්තියක් ඉලක්ක ගත කිරීමටත්, එම වෘත්තීය පිළිබඳ පසුබිම් තොරතුරු ගවේෂණය කිරීමටත්, අවශ්‍ය මඟ පෙන්වීමත් එමඟින් සිසුන් මූලික කුසලතා වර්ධනයට යොමු කිරීම අපේක්ෂිත ය. එමඟින් ඵලදායී සේවයක් රට වෙනුවෙන් කිරීමට ඔවුනට හැකියාව ලැබෙනු ඇත.

සිසුන්ට ඔවුන්ගේ හැකියා, ලැදියා, රුචි අරුචිකම් හා සහජ දක්ෂතා හඳුනා ගැනීමට සැලැස්වීමත්, තම හැකියා හා රුචිකම් පදනම් කරගෙන වඩාත් ගැළපෙන රැකියා මාවත කවරේදැයි ගළපා ගැනීමට උනන්දුව වර්ධනය කරලීමත් අරමුණ වේ.

**නිපුණතාව** : වැඩ ලෝකයට සූදානම් වෙයි

**නිපුණතා මට්ටම්** :

- විවිධ වෘත්තීන් හඳුනාගෙන තම ලැදියා හා දක්ෂතා අනුව අභිලාෂ වෘත්තියක් තෝරා ගැනීමට පෙළඹෙයි.
- වෘත්තිය සංවර්ධනයට අවශ්‍ය ආකල්ප වර්ධනය කරගනියි.

**විෂය අන්තර්ගතය** :

- **වැඩ ලෝකය**

සමාජය ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විවිධ කාර්යයන්, රැකියා හා වෘත්තීන්ගෙන් පිරී ඇත. පාසලෙන් අධ්‍යාපනය ලබා පිටවන සෑම දරුවෙක් ම වැඩ ලෝකයට පිවිසේ. තම ජීවිකාව ඉදිරියට ගෙනයාම සඳහා සෑම පුද්ගලයෙකු විසින් ම ජීවන වෘත්තියක හෝ කාර්යයක නියැලිය යුතු ය.

ජීවන වෘත්තිය තෝරා ගැනීමේ දී සෑම පුද්ගලයෙකු ම තම බුද්ධිමය හැකියා, ලැදියා හා සහජ දක්ෂතා හඳුනාගෙන එයට යෝග්‍ය වූ වෘත්තියක් ඉලක්ක ගතකිරීම මගින් ඵලදායී පුද්ගලයෙකු වන අතර, ඵලදායි සේවයක් සමාජයට ද ඉටුකළ හැකි ය.

තමා තෝරා ගන්නා රැකියාවට, වෘත්තියට අදාළ සුදුසුකම් හා පුහුණුවීම් ලබාගැනීම තුළින් තෘප්තිමත් වෘත්තිකයකු වීමට අවස්ථාව ලැබේ. එබැවින් වෘත්තීය පුහුණු ආයතන ගැන සැලකිලිමත් වීම ද අවශ්‍ය ය.

තමාගේ රැකියාව හෝ වෘත්තිය රජයේ, පෞද්ගලික හෝ ස්වයං රැකියාවක් විය හැකිය. එය කාර්යක්ෂම ව ඵලදායී ව කැපවීමෙන් ඉටුකිරීම අවශ්‍ය ය. එසේ ම භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී මෙන් ම සැපයීමේ දී ද ගුණාත්මකභාවය රැකෙන ලෙස ක්‍රියා කිරීම හා තම සේවය විශිෂ්ට ලෙස සමාජයට සැපයීමට උනන්දු වීම වෘත්තිකයකුගේ යුතුකමක් වේ.

## 9.6.1 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- වැඩ ලෝකයට සූදානම් වෙයි.

**නිපුණතා මට්ටම** :- විවිධ වෘත්තීන් හඳුනාගෙන තම ලැදියා හා දක්ෂතා අනුව අභිලාෂ වෘත්තියක් තෝරා ගැනීමට පෙළඹෙයි.

**ක්‍රියාකාරකම** :- " ලැදියාවෙන් රැකියාවට "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-
- ඇමුණුම 9.6.1.1.
- ඇමුණුම 9.6.1.2

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.6.1.1**

- ඇමුණුම 9.6.1.1 පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එහි දැක්වෙන පින්තූරය හොඳින් නිරීක්ෂණය කිරීමට උපදෙස් දෙන්න.
- පහත කරුණු මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • වැඩලෝකය පුළුල් බව හා එහි රැකියා රාශියක් ඇති බව<br>• අධ්‍යාපනය ලැබීමෙන් පසු වැඩලොවට පිවිසිය යුතු බව<br>• තම හැකියා ලැදියා හා සහජ දක්ෂතා හඳුනාගෙන ඒවාට යෝග්‍ය වෘත්තියක් ඉලක්ක ගත කිරීම අවශ්‍ය බව<br>• තෝරා ගන්නා රැකියාවට අවශ්‍ය සුදුසුකම් හා පුහුණුව ලබාගත යුතු බව |

**(මිනිත්තු 10 යි)**

**පියවර 9.6.1.2**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 9.6.1.2 සිසු කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- එය හොඳින් කියවා උපදෙස් අනුව ක්‍රියාකාරීවීමට උපදෙස් දෙන්න.

**(මිනිත්තු 20 යි)**

**පියවර 9.6.1.3**

- සිසු කණ්ඩායම් සකස් කරන ලද වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- සියලු ම කණ්ඩායම්වලට අදහස් දැක්වීමට උපදෙස් දෙන්න.
- පහත දැක්වෙන කරුණු මතුවන සේ සමාලෝචනයක යෙදෙන්න.

- එක් එක් පුද්ගලයා තුළ විවිධ ලැදියාවන් ඇති බව
- තම ලැදියා අනුව සුදුසු රැකියාවක් තෝරා ගත යුතු බව
- අවශ්‍ය සුදුසුකම් හා පුහුණුව ලබාගැනීමෙන් පහසුවෙන් වැඩ ලෝකයට පිවිසිය හැකි බව
- එමගින් විරැකියාවෙන් ගත කරන කාලය අවම කර ගෙන තෘප්තිමත් ව රැකියාවේ යෙදිය හැකි බව
- රටේ සංවර්ධනයට මෙන් ම තම පෞද්ගලික ජීවිතයට ද හොඳ අඩිතාලමක් දැමිය හැකි බව

**(මිනිත්තු 10 යි**

## තක්සේරුව හා ඇගයීම

- වැඩ ලෝකයට පිවිසීමට පෙර අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙළ පැහැදිලි කරයි.
- තම හැකියාවලට අනුව රැකියාවක් තෝරා ගෙන එහි නියුක්ත වීමෙන් තමාටත් රටටත් ඵලදායක සේවයක් කළ හැකි බව අනුමත කරයි.
- ලැදියාවලට අනුව රැකියා ක්ෂේත්‍ර පෙළ ගස්වයි.
- වැඩ ලෝකයේ රැකියා හා වෘත්තීන් පිළිබඳ විචාරශීලී වෙයි.
- අවශ්‍ය සුදුසුකම් හා පුහුණුව ලැබීමෙන් පසු වෘත්තියකට පිවිසීමට සූදානම් වෙයි.

**ඇමුණුම 9.6.1.1**

පහත සඳහන් විවිධ රැකියා අවස්ථා පෙන්වන වැඩ බිමක්, කර්මාන්ත ශාලාවක වැඩ කරන මිනිසුන්, පොළක්, ඇඟලුම් කම්හලක සේවිකාවන්, කඩයක්, ගොවියෙක්, පරිගණක ශිල්පීන්, සත්ව ගොවිපළක්, ගුරුවරයෙක්, කාර්යාල සේවකයෙක්, ගුවන් නියමුවෙක්, ධීවරයෙක් දැක්වෙන චිත්‍ර හෝ පිංතූර පන්තිය තුළ ප්‍රදර්ශනය කරන්න.

## ඇමුණුම 9.6.1.2 කාර්ය පත්‍රිකාව

* නිපුණතා සංවර්ධන වෘත්තීය සහ කාර්මික අධ්‍යාපන අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය ( උපුටා ගැනීමකි).

**රැකියා ලැදියා / ප්‍රිය කරන කාණ්ඩ ලේඛනය**

| ලැදියාව | රැකියා ක්ෂේත්‍ර |
|---|---|
| එළිමහනේ | මෙහි තේරුම ඔබ එහා මෙහා යමින් එළිමහනේ වැඩ කිරීමේ කැමැත්ත ය. සතුන් බලා ගැනීම හෝ වගා කිරීම මෙම කාණ්ඩයට අයත් ය. ගොවිතැන, වන වගාව උද්‍යාන සැකසුම, මිනින්දෝරුවන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන් මේ ගණයට අයත් රැකියා සමහරකි. |
| ප්‍රයෝගික | යන්ත්‍ර අලුත්වැඩියා / ක්‍රියාත්මක කිරීම වැනි මෙවලම් හා ආම්පන්න භාවිතයෙන් කරන කටයුතු මේ ගණයට අයත් ය. ගුවන් නියමුවන් කර්මාන්ත සේවකයින්, කාර්මිකයින් සහ ඉංජිනේරුවන් මේ යටතට ගැනෙන රැකියාවන් ය. |
| විද්‍යාත්මක | අලුත් අදහස් සෙවීම, නිරීක්ෂණය, ගවේෂණය, අත්හදා බැලීම් විද්‍යාත්මක ක්‍රියා වේ. වෛද්‍ය හා සෞඛ්‍ය රැකියා වෛද්‍යවරුන්, ඖෂධවේදීන්, සත්ව විද්‍යාඥයින්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් රසායන විද්‍යාඥයින් හා භෞතික විද්‍යාඥයින්ගේ කටයුතු මීට අයත් ය. |
| නිර්මාණාත්මක | තමාගේ නිර්මාණ එළිදැක්වීම මෙහි අදහස යි. චිත්‍ර ශිල්පය, සංගීතය සහ සාහිත්‍ය සම්බන්ධ රැකියා මීට අයත් ය. චිත්‍ර ශිල්පයට ඇති කැමැත්ත ඔබ තුළ ඇති යම් දේවල් සැලසුම් කර නිපදවීම, සුන්දර දේවල් රසවිඳීම, ඔබ අවට ඇති දේවල් අලංකාර කිරීම තුළින් ප්‍රදර්ශනය වේ. චිත්‍ර ශිල්පීන්, ඡායාරූප ශිල්පීය ගණයට වැටේ. සංගීත නිර්මාණය, නර්තනය, ගායනය, වාදනය, සංගීත ගණයට අයත් ය. සාහිත්‍ය අංශයට ගැනෙන්නේ ලේඛන කලාව, පොත් ලිවීම, වාර්තාකරුවන්, ප්‍රචාරකයින් වැනි රැකියා ය. |
| ව්‍යාපාරික | මිනිසුන් හමුවී ඔවුන් සාකච්ඡා කිරීමට ඇති කැමැත්ත, නීතිඥ, දේශපාලන, වෙළෙඳාම යන කටයුතු මේ ගණයට වැටේ. සංචාරක ව්‍යාපාරිකයින්, වෙළෙඳසලේ අයිතිකරුවන් ව්‍යාපාර විධායක නිලධාරීන් හා කළමනාකරුවන් මීට උදාහරණ කිහිපයකි. |
| කාර්යාලයීය | මීට අයත් වන්නේ කාර්යාලයක් තුළ ලිපි කටයුතු හා සංවිධාන කටයුතු නිවැරදි ව කිරීමේ කැමැත්ත, සැලසුම් කිරීම හා පාලනය, ලේකම්වරුන්, කාර්යාල සේවකයින්, පිළිගැනීමේ නිලධාරීන්, බැංකු ලිපිකරුවන්, පරිගණක ක්‍රියාකරුවන් මීට අයත් ය. කාර්යාල කටයුතුවලට ඇති කැමැත්ත ගණන් හිලව් තැබීම, මුදල් පරිපාලනය, දත්ත සැකසීම වැනි කටයුතු අඩංගු පරිගණක ශිල්පීන් නීතිඥයින්, ආර්ථික විද්‍යාඥයින් වැනි රැකියාවන් සඳහා ද මෙය විහි දී යා හැකි ය. |
| මහජන සම්බන්ධතා | මෙහි අර්ථය සහ වැඩ කිරීමට හා මිනිසුන්ගේ සුභ සාධනය කෙරෙහි ඇති උනන්දුව යි. ගුරුවරුන්, හෙදියන්, පොලිස් නිලධාරීන් සහ සුබ සාධක නිලධාරීන් මිනිසුන් සමග දැඩි සම්බන්ධතා පවත්වයි. විකුණුම්කරුවන්, අයකැමියන්, භෝජනශාලා සේවකයින් සහ ලේඛිකාවන් වැනි වෘත්තින් ද මීට සම්බන්ධ ය. |

ඇමුණුම 9.6.1.2 ට අදාළ කාර්ය පත්‍රිකාව කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. මෙහි සඳහන් ලැදියා ක්ෂේත්‍ර නම් කරන්න.

2. එක් එක් ලැදියා ක්ෂේත්‍රයට ගැළපෙන රැකියා 3ක් ලියන්න.

3. ඔබ වඩාත් කැමති ලැදියා ක්ෂේත්‍රයෙන් එක් රැකියාවක් තෝරා ගන්න.

4. එම රැකියාව තෝරා ගැනීමට වෙනත් හේතු කෙටියෙන් ලියන්න.

## 9.6.2.1 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- වැඩ ලෝකයට සූදානම් වෙයි.

**නිපුණතා මට්ටම** :- වෘත්තීය සංවර්ධනයට අවශ්‍ය ආකල්ප වර්ධනය කරගනියි.
**ක්‍රියාකාරකම** :- " හොඳ වෘත්තිකයෙකු වීමට ඔවදනක් "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-
- ඇමුණුම 9.6.2.1
- ලියන කඩදාසි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.6.2.1**

- ඇමුණුම 9.6.2.1 හි සඳහන් චරිත, පන්තිය ඉදිරියේ රඟපෑමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම චරිතවලින් කියවෙන දේ ඇසුරින් පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

- හොඳ වෘත්තිකයෙකු සතු ගුණාංග රාශියක් ඇති බව
  උදා:- කාර්යක්ෂමතාව, ඵලදායීතාව, ශ්‍රමාභිමානය, කැපවීම, යුතුකම් ඉටුකිරීම
- කාර්යක්ෂම ව තම රැකියාවේ යෙදීම අවශ්‍ය බව හා එයින් ඇතිවන ඵලදායීතාව ඉතා ඉහළ බව
- තම රැකියාවේ යුතුකම් නිසි ලෙස ඉටු කිරීමෙන් පුද්ගලයන් තුළ ශ්‍රමාභිමානය ඇති වන බව හා ඵලදායිතාව ඉහළ නැංවීමට උනන්දු විය යුතු බව

**(මිනිත්තු 10 යි)**

**පියවර 9.6.2.2**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- කණ්ඩායමේ සිසුන්ගේ කැමැත්ත අනුව සුදුසු රැකියාවක් තෝරා ගැනීමට උපදෙස් දෙන්න.
- 1. එම රැකියාව තෝරා ගැනීමට හේතු
  2. කාර්යක්ෂම ව හා ඵලදායීතාවයෙන් යුතු ව තම රැකියාවේ නියැලෙන ආකාරය
  3. වෘත්තීය යුතුකම් ඉටුකරන ආකාරය ආදිය පැහැදිලි කරමින් පන්තිය ඉදිරියේ කථාවක් පැවැත්වීමට සූදානම් වීමට උපදෙස් දෙන්න.

**(මිනිත්තු 15 යි)**

**පියවර 9.6.2.3**

- කණ්ඩායම් විසින් සූදානම් කරනු ලැබූ කථාව පන්තියට ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම්වල අදහස් විමසන්න.
- ප්‍රබලතා අගයමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • සෑම වෘත්තිකයකු ම තමන්ට පැවරෙන කාර්ය නිසි ලෙස ඉටු කළ යුතු බව |
| • සෑම වෘත්තිකයෙක් ම ගුණාත්මක භාණ්ඩ හා සේවාවන් සැපයීම කළ යුතු බව |
| • ආයතනයේ හා රටේ දියුණුව ඇතිවන සේ කැපවීමෙන් කටයුතු කළ යුතු බව |
| • එමගින් තමාට තෘප්තිමත් ව සේවය සැපයීම කළ හැකි බව |
| • එනිසා වෘත්තීය සංවර්ධනය ද ඇති වන බව |

**(මිනිත්තු 15යි)**

## තක්සේරුව හා ඇගයීම

- වෘත්තීය සංවර්ධනයට අවශ්‍ය ගුණාංග පැහැදිලි කරයි.
- භාණ්ඩ හා සේවා ගුණාත්මකබවින් යුක්ත විය යුතු බව අවධාරණය කරයි.
- කාර්යක්ෂමතාව හා ඵලදායිතාව රැකියාවක අත්‍යවශ්‍ය ගුණාංගයක් බව සනාථ කරයි.
- වෘත්තීය ලෝකයේ දී සමාජයට විශිෂ්ට සේවයක් කිරීමට යෝජනා කරයි.
- වෘත්තීය ලෝකයේ දී අන් අයට ආදර්ශවත් ලෙස කටයුතු කිරීමට පෙළඹෙයි.

## ඇමුණුම 9.6.2.1

| | |
|---|---|
| වෛද්‍යවරයෙක් | මම වෛද්‍යවරයෙක්. මම රැකියාවේ නියැලෙන්නේ ඉතා ම සතුටින්. මගේ ළඟට එන රෝගීන්ට මම හොඳින්, කරුණාවෙන් කථා කරනවා. ඔවුන් මට හුඟක් ආදරෙයි. ඔවුන් සතුටින් මට ස්තුති කරමින් තමයි පිටවෙලා යන්නෙ. ලෙඩුන් ඉක්මනින් සුවපත් වෙනවා දැකීම මට සතුටක්, මෙන් ම මගේ සේවය පිළිබඳ අභිමානයක් |
| ගුරුවරයෙක් | මම ගුරුවයෙක්. මම මට පැවරී තිබෙන ඉගැන්වීමේ කටයුතු කලට වේලාවට ඉටුකරනවා. මම ළමුන් හැමදෙනාට ම එක වගේ ආදරෙයි. ඒ නිසා මට ඉගැන්වීම සතුටුදායක දෙයක්. මගෙන් ඉගෙන ගන්නා සිසුන් සියලු දෙනා ම ඉහළ සමාර්ථ ලබා ගන්නවා. මම ඒ වෙනුවෙන් විශාල කැපවීමක් කරනවා. ඒ වගේ ම ඔවුන් ගුණයහපත්කම් අතින් ඉහළ යි. ඒ නිසා ම මට ඉහළ ප්‍රතිඵල ලැබෙනවා. මම හරි සතුටුයි. |
| කම්කරුවෙක් | මම වෘත්තියෙන් වඩු කාර්මිකයෙක්. මම වැඩ ආරම්භ කරන්නෙ උදේ 8.00ට. සවස 5.00 වන තෙක් නොකඩවා වැඩ කරනවා. ඒනිසා මගේ වැඩ කලට වෙලාවට නිම කරන්න මට පුලුවන්. ඒ විතරක් නෙවෙයි. හොඳ ගුණාත්මක භාණ්ඩ මම පාරිභෝගිකයින්ට ලබා දෙනවා. ඔවුන් මගේ භාණ්ඩ අගය කරනවා. මට එතකොට දැනෙන්නේ ලොකු ආඩම්බරයක්. මම රැකියාවට පුහුණුව ලබා ගන්නෙ වඩු කාර්මික පුහුණු ආයතනයකින්. මගේ ආදායම ගැනත් මට සතුටු වෙන්න පුලුවන්. |

| | | |
|---|---|---|
| ස්වයං රැකියාවක නියුතු වුවෙකු | : | මම ආදායම් ලබන්නෙ ස්වයං රැකියාවක් කරල. මගේ උපරිම කාලය යොදවල මගේ ස්වයං රැකියාව කරනවා. මම සුළු මුදලක් එකතු කරගෙන තමයි, මගේ රැකියාව පටන් ගන්නෙ. ටික කාලයකින් මට වැය කරපු මුදල් ලබා ගන්න පුලුවන් වුණා. මගේ කැපවීම නිසාත් උනන්දුව නිසාත් (හොඳ භාණ්ඩ) ගුණාත්මක භාණ්ඩ වෙළෙඳ පොළට ඉදිරිපත් කරන නිසා මගේ භාණ්ඩ ඉක්මනින් අලෙවි වෙනවා. අතමිටත් සරුයි. මගේ වෙළෙදාම සරුවගේ ම මගෙන් භාණ්ඩ මිල දී ගන්නා පාරිභෝගිකයනුත් සතුටු වෙනවා. ඒ අය මගේ භාණ්ඩ වෙනත් භාණ්ඩ නිෂ්පදකයන්ගේ භාණ්ඩ ගැන සසඳමින් අගය කරනවා. |

# ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය
# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
# II කොටස - පුරවැසි අධ්‍යාපනය

# 9.1 අප ජීවත් වන සමාජය

**(කාලච්ඡේද 08යි)**

## හැඳින්වීම

පවුල් ඒකක රාශියක එකතුවකින් සමාජයක් නිර්මාණය වේ. සමාජයේ සාමාජිකයන් ලෙස ජීවත් වන විට එම සාමාජිකයන්ගේ අපේක්ෂා ඉටුකර ගැනීමට සමාජයේ කිසියම් විධිමත් පාලනයක් තිබීම අවශ්‍ය වේ. එමඟින් සමාජයේ බිඳ වැටීම වැළකී සමාජ සුරක්ෂිතතාව ගොඩ නැගේ. පුද්ගල යහපත හා සංවර්ධනයට දායක වන පරිදි සමාජයේ පාලනයට විවිධ නීතිරීති, චාරිත්‍රවාරිත්‍ර ආගම වැනි අංශයන්ගෙන් විශාල මෙහෙයක් ඉටු වේ. සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා පාසල , ආගමික ආයතන හා වෙනත් සමිති සමාගම් ආදී විශේෂ ආයතන ද දායක වේ. පොලීසිය, ත්‍රිවිධ හමුදාව යන ආයතන සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා විශාල මෙහෙයක් ඉටුකරයි. පුද්ගලයකුට සමාජයෙන් ලැබෙන රැකවරණය හා ආරක්ෂාව සමාජ සුරක්ෂිතතාව ලෙස සරල ව හැඳින්විය හැකි ය. සමාජ සුරක්ෂිතතාව හා බැඳුණු පුද්ගලයන්ගේ සහ ආයතනවල කාර්ය භාරය හඳුනා ගනිමින් ඒ පිළිබඳ ව අධ්‍යයනය සඳහා සිසුන් යොමු කිරීම මෙම ඒකකය මගින් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : සාමූහික ක්‍රියාකාරිත්වය තුළින් සමාජ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට ක්‍රියාකාරී ව දායක වේ.

**නිපුණතා මට්ටම්** :

- සමාජ සුරක්ෂිතතාව කෙරෙහි පුද්ගල යුතුකම් හා වගකීම් ඉටුකරයි.
- සමාජ සුරක්ෂිතතාවට දායකවන විවිධ ආයතන හඳුනා ගෙන අභිමානවත් පුරවැසියෙකු ලෙස සහයෝගයෙන් කටයුතු කරයි.
- සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ වී සහජීවනයෙන් යුතු පුරවැසියෙකු ලෙස කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය** :

**9.1.1 සමාජ සුරක්ෂිතතාව**

- යම් පුද්ගලයෙකුට බියෙන් හා සැකයෙන් තොර ව ජීවිතය පවත්වා ගෙන යාමට සමාජයෙන් ලැබෙන රැකවරණය හා ආරක්ෂාව සමාජ සුරක්ෂිතාවය යි.

**සමාජය හා පුද්ගලයා අතර සම්බන්ධතාව**

- සමාජය යන්නෙන් අදහස් කරන්නේ යම් භූමි ප්‍රදේශයක් තුළ වාසය කරන එක් වාර්ගික ජන කොටසක් හෝ විවිධ වාර්ගික ජන කොටස් විසින් තම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ගොඩනගා ඇති ආයතන, සමිති සමාගම් හා සංවිධාන ජාලයේ සමස්ත එකතුව වේ.

- සමාජය පුද්ගල සමූහයක එකතුවක් බව
- පුද්ගලයා හා සමාජය අතර ඍජු සම්බන්ධතා පැවතීම
- යහපත් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා පුද්ගලයන් අතර අන්තර් සබඳතා අවශ්‍ය වේ.

සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායකවන ආයතන

| | | | |
|---|---|---|---|
| * | පවුල | * | ආගමික ආයතන |
| * | පාසල | * | සමාජ සංවිධාන |

| **සමාජ සුරක්ෂිතතාව සඳහා දායකත්වය සපයන ආයතන** | **සමාජ සුරක්ෂිතතාව සඳහා සැපයෙන දායකත්වය** |
|---|---|
| පවුල | * මූලික අවශ්‍යතා සැපයීම<br>* මානසික අවශ්‍යතා ඉටුකිරීම<br>* සමාජානුයෝජනය කිරීම<br>* ආරක්ෂාව හා රැකවරණය සැපයීම<br>* යහපත් සිරිත් විරිත් හා සාම්ප්‍රදායයන් අනාගත පරපුරට පවරා දීම |
| පාසල | * දැනුම, කුසලතා, ආකල්පවලින් පරිපූර්ණ යහපත් පුරවැසියන් බිහි කිරීම<br>* අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි පුරවැසියන් බිහි කිරීම<br>* යහපත්, සමාජශීලි, ගුණගරුක, පුරවැසියකු බිහි කිරීම<br>* සමාජානුයෝජනය කිරීම.<br>* අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ අත්දැකීම් ලබා දීම |
| ආගමික ආයතන | * අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීම<br>* විනය හා ශික්ෂණය ඇති කිරීම<br>* යහපත් ආකල්ප ඇති කිරීම |
| සමාජ සංවිධාන | * සාමාජිකයන් අතර සාමූහිකත්වය වර්ධනය කිරීම<br>* නීති ගරුක ව කටයුතු කිරීමට හුරු වීම<br>* පුද්ගල ගරුත්වය ඇති කිරීම<br>* අයිතිවාසිකම් හා යුතුකම් ඉටුකිරීමට හුරු කිරීම<br>* ගැටුම් අවම කිරීම |

9.1.2 සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා යොදා ඇති යාන්ත්‍රණ, නීතිරීති හා බැඳුණු පුද්ගල වගකීම්

* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
* අධිකරණය
* පොලීසිය
* ආරක්ෂක හමුදා
* සමථ මණ්ඩල
* ඔම්බුඩ්ස්මන්
* රජය විසින් පනවන නීතිරීති

| සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා දායකවන යාන්ත්‍රණ හා ආයතන | සමාජ සුරක්ෂිතතාවට දායකවන අයුරු |
|---|---|
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | * මූලික අයිතිවාසිකම් ව්‍යවස්ථාව මගින් සහතික කර තිබීම<br>* මූලික අයිතිවාසිකම් කඩ වුවහොත් ගත හැකි ක්‍රියාමාර්ග දක්වා තිබීම |
| අධිකරණය | * යුක්තිය පසිඳලීම<br>* නීති විවරණය කිරීම හා අර්ථ නිරූපණ සැපයීම |
| සමථ මණ්ඩල | * සුළු ආරවුල් සමථ කිරීම |
| පොලීසිය | * මහජන ආරක්ෂාව හා සාමය පවත්වා ගෙන යාම<br>* අපරාධකරුවන් නීතිය ඉදිරියට යොමු කිරීම. |
| ආරක්ෂක හමුදා | * ජාතික ආරක්ෂාව තහවුරු කොට පවත්වා ගෙන යාම<br>* රාජ්‍ය විරෝධී ක්‍රියා මර්ධනය කිරීම (ත්‍රස්ත ක්‍රියා/සිවිල් අරගල). |
| ඔම්බුඩ්ස්මන් | * රාජ්‍ය සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම |
| රජය විසින් පනවන නීතිරීති | * පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සිවිල් නීති හා අපරාධ නීති සංග්‍රහ ක්‍රියාවේ යෙදවීම |

(සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා ක්‍රියා කරන ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක බලකාය පිළිබඳ තොරතුරු රැස් කිරීමට සිසුන් යොමු කරන්න.)

### 9.1.3 සමුපකාර ව්‍යාපාරය හැඳින්වීම

- පුද්ගල සමූහයක් විසින් සහජීවන පදනම මත සමාජ සුභසාධනය ඇති කර ගැනීම සඳහා සමානාත්මතාව පදනම් කොට ගෙන සිය කැමැත්තෙන් ගොඩනගා ගන්නා සංවිධානය සමුපකාරය ලෙස හැඳින්විය හැකි ය.

- සමුපකාරයේ අරමුණු

    * සාමාජිකයන්ගේ අවශ්‍යතා පිරිමසාලීම
    * පුද්ගලයන්ට වඩා හොඳින් ජීවත් වීමේ මාර්ගයක් ඇති කිරීම
    * සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහාය වීම

- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමුපකාර සමිති වර්ග

    * විවිධ සේවා සමුපකාර සමිති
    * ණය දෙන සමුපකාර සමිති
    * කෘෂිකාර්මික නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති
    * පාසල් සමුපකාර සමිති

- පාසල් සමුපකාරයකින් පාසල් සිසුන්ට සලසා ගත හැකි සේවා

    * පාසල් ලිපි ද්‍රව්‍ය පහසු මිලට ලබා ගැනීම
    * ආහාර ද්‍රව්‍ය පහසු මිලට ලබා ගත හැකි වීම
    * ක්‍රීඩා උපකරණ පහසු මිලට ලබා ගත හැකි වීම
    * වෙනත් සිසු අවශ්‍යතා සපුරාලීම
    * නායකත්ව පුහුණුව
    * සමුපකාරික ජීවන රටාවකට හුරු වීම

- විවිධ සේවා සමුපකාර සමිති මගින් සැපයෙන සේවා

    * ග්‍රාමීය මට්ටමින් ජනතාවට සේවා සැපයීම සඳහා "සමුපකාර ප්‍රාදේශික" පවත්වා ගෙන යාම
    * ණය දෙන සමිති පවත්වා ගෙන යාම
    * ආරෝග්‍යශාලා පිහිටුවා සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම
    * අවමංගල්‍ය සේවා සැපයීම සඳහා දායක වීම
    * ප්‍රවාහන සේවා සැපයීම සඳහා දායක වීම

# 9.1.1 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- සාමූහික ක්‍රියාකාරිත්වය තුළින් සමාජ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට ක්‍රියාකාරී ව දායක වෙයි.

**නිපුණතා මට්ටම** :- සමාජ සුරක්ෂිතතාව කෙරෙහි පුද්ගල යුතුකම් හා වගකීම් ඉටු කරයි.

**ක්‍රියාකාරකම** :- " සමාජ සුරක්ෂිතතාව ගොඩ නගමු "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-
- ඇමුණුම 9.1.1.1
- ඇමුණුම 9.1.1.2 ට අදාළ කාර්ය පත්‍රිකාව
- $A_4$ කඩදාසි
- මාකර් පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

### පියවර 9.1.1.1

- ඇමුණුම 9.1.1.1 හි සඳහන් කරුණු පදනම් කරගෙන බුද්ධිකලම්බන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පහත කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක යෙදෙන්න.

> - දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ව වැඩිහිටියන් සැලකිලිමත් විය යුතු බව
> - ආරක්ෂාව සෑම කෙනෙකුගේ ම ප්‍රධාන අවශ්‍යතාවක් බව
> - පුද්ගලයෙකුට සමාජයෙන් ලැබෙන රැකවරණය හා ආරක්ෂාව සමාජ සුරක්ෂිතතාව වන බව

**(මිනිත්තු 05 යි)**

**පියවර 9.1.1.2**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 9.1.1.2 ට අදාළ කාර්ය පත්‍රිකා ලබා දෙන්න.
- කණ්ඩායම්වලට කඩදාසි, මාකර් පෑන් ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- කණ්ඩායම් අතර හැසිරෙමින් සිසුන්ට අවශ්‍ය මඟ පෙන්වීම් කරන්න.

**(මිනිත්තු 20 යි)**

**පියවර 9.1.1.3**

- කණ්ඩායම්වලට ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- සෑම පුද්ගලයෙකුට ම සමාජ සුරක්ෂිතතාව අවශ්‍ය බව
- සමාජ සුරක්ෂිතතාව කෙරෙහි පවුල, පාසල, ආගමික ආයතන හා සමාජ සංවිධාන දායක වන බව
- මූලික අවශ්‍යතා ලබා දෙමින් යහපත් පුද්ගලයෙකු සමාජයට දායක කිරීම පවුලෙන් සමාජ සුරක්ෂිතතාවට කෙරෙන කාර්යයක් බව
- පාසල, සමාජ සුරක්ෂිතතාවයට දායක වන්නේ මනා දැනුමකින්, ශික්ෂණයකින් පිරිපුන් දරුවකු සමාජයට දායාද කිරීම තුළින් බව
- සදාචාරාත්මක ගුණධර්මයන්ගෙන් පිරිපුන් දරුවන් සමාජයට දායාද කිරීම තුළින් ආගමික ස්ථාන සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වන බව
- යුක්තිය පසිඳලීම හා නීති කඩ කරන අයට දඬුවම් පැමිණ වීම තුළින් අධිකරණය ද මානව හිමිකම් සුරැකීමට දායක වන අතර එය සමාජ සුරක්ෂිතතාවට හේතු වන බව

**(මිනිත්තු 15 යි)**

## තක්සේරුව හා ඇගයීම

- සමාජ සුරක්ෂිතතාව සඳහා විවිධ ආයතන දායක වන බව ප්‍රකාශ කරයි.
- සමාජ සුරක්ෂිතතාව ගොඩ නැගීම සඳහා මෙම ආයතනවලින් සිදු වන මෙහෙය අගය කරයි.
- පුරවැසියකු වශයෙන් සමාජ සුරක්ෂිතාව ඇති කිරීමට තම යුතුකම් ඉටු කරයි.
- කණ්ඩායම තුළ සක්‍රීය ව කටයුතු කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි.

**ඇමුණුම 9.1.1.1**

- පුද්ගල ආරක්ෂාව සම්බන්ධ ව පහත සඳහන් අවස්ථා හා ක්‍රියාවන් අදාළ කර ගනිමින් බුද්ධිකලම්බන සාකච්ජාවක් මෙහෙයවීම

- නිවස තුළ දී කුඩා දරුවන්ට අනතුරු සිදුවිය හැකි, අවස්ථා, ක්‍රියාවන් උපකරණ සහ ස්ථාන.

- නිවසින් පිටත අවට පරිසරය තුළ දී කුඩා දරුවන්ට මෙන් ම වැඩිහිටියන්ට අනතුරු සිදු විය හැකි ක්‍රියා, අවස්ථා, ස්ථාන.

**ඇමුණුම 9.1.1.2 කාර්ය පත්‍රිකාව**

**1 කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමාජ සුරක්ෂිතතාව කෙරෙහි පවුල දායක වන ආකාරය පිළිබඳ කරුණු ගොනු කිරීම යි.

**2 කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමාජ සුරක්ෂිතතාව කෙරෙහි පාසල දායක වන ආකාරය පිළිබඳ කරුණු ගොනු කිරීම යි.

**3 කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමාජ සුරක්ෂිතතාව කෙරෙහි ආගමික ස්ථාන දායක වන ආකාරය පිළිබඳ කරුණු ගොනු කිරීම යි.

**4 කණ්ඩායම්**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමාජ සුරක්ෂිතතාව කෙරෙහි අධිකරණය දායක වන ආකාරය පිළිබඳ කරුණු ගොනු කිරීමයි.

**5 කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමාජ සුරක්ෂිතතාව කෙරෙහි පොලීසිය හා ත්‍රිවිධ හමුදාව දායක වන ආකාරය පිළිබඳ කරුණු ගොනු කිරීම යි.

## 9.1.2 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- සාමුහික ක්‍රියාකාරිත්වය තුළින් සමාජ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට ක්‍රියාකාරී ව දායක වෙයි.

**නිපුණතා මට්ටම** :- සමාජ සුරක්ෂිතතාව කෙරෙහි පුද්ගල යුතුකම් හා වගකීම් ඉටු කරයි.

**ක්‍රියාකාරකම** :- " සමාජ සුරක්ෂිතතාවට දායක වන ආයතන හඳුනා ගනිමු "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.1.2.1 ට අදාළ කාර්ය පත්‍රිකා
- ඇමුණුම 9.1.2.2 ට අදාළ කාර්ය පත්‍රිකාව

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.1.2.1**

- ඇමුණුම 9.1.2.1 ට අදාළ කාර්ය පත්‍රිකාව පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.

- පහත දැක්වෙන ප්‍රශ්න සිසුන් වෙත යොමු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.

- සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා දායක වන ආයතන මොනවා ද ?
- එම ආයතන මගින් ඉටු කරන කාර්යයන් මොනවා ද?
- එමගින් සමාජ සුරක්ෂිතතාව සඳහා ඉටුවන මෙහෙය කුමක් ද?
- සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා විවිධ ආයතන දායක වන බව
- එම ආයතන මගින් සමාජ සුරක්ෂිතතාව කෙරෙහි විශාල මෙහෙයක් සලසන බව
- සමාජ සුරක්ෂිතතාව ගිලිහීයාම සමාජ යහපැවැත්මට තර්ජනයක් වන බව
- අන්‍යොන්‍ය සම්බන්ධතා වැඩි දියුණු කර ගනිමින් ආරක්ෂාකාරී ජීවන ක්‍රමයක් සලසා ගැනීම කෙරෙහි සමාජ සුරක්ෂිතතාව මහඟු පිටිවහලක් වන බව

**(මිනිත්තු 10යි)**



**පියවර 9.1.2.2**

- සුදුසු පරිදි පන්තියේ සිසුන් කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට ඇමුණුම 9.1.2.2 ට අදාළ කාර්ය පත්‍රිකා බෙදා දෙන්න.
- තම කණ්ඩායමට ලැබුණු කාර්ය පත්‍රිකාවට අදාළ මාතෘකාව අනුව කෙටි භූමිකා රංගනයක් සූදානම් කරන්න. (විනාඩි 03ක පමණ)
- අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දෙමින් භූමිකා රංගනය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**(මිනිත්තු 20යි)**

- පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.
- සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා පවුල තුළින් පෝෂණය, ආරක්ෂාව, ආදරය, කරුණාව, දයාව, සෙනෙහස අධ්‍යාපනය ආදිය ලැබෙන බව
- පවුල තුළින් සමාජ සුරක්ෂිතතාවට අදාළ මූලික පදනම ලැබෙන බව
- ආගමික ආයතන, පොලීසිය හා ආරක්ෂක හමුදා, පාසල, අධිකරණය වැනි ආයතන සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා විශාල මෙහෙයක් ඉටු කරන බව
- මෙම ආයතන මගින් ඉටුකරන මෙහෙය සමාජ සුරක්ෂිතතාව තහවුරු කොට පවත්වා ගෙන යාම කෙරෙහි විශාල දායකත්වයක් සලසන බව
- සමාජ සුරක්ෂිතතාව නොමැති වූ විට සමාජ යහපැවැත්මට හානි සිදුවන බව
- සමාජ සුරක්ෂිතතාව සඳහා පුද්ගලයා වෙතින් ද ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කළ යුතු බව

**(මිනිත්තු 10යි)**

## තක්සේරුව හා ඇගයීම

- සමාජ සුරක්ෂිතතාව සඳහා දායක වන ආයතන නම් කරයි.
- එම ආයතනවලින් ඉටු වන සේවා පිළිබඳ අගය කරමින් කථා කරයි.
- පාසල් සමාජයේ සාමාජිකයෙක් වශයෙන් සමාජ සුරක්ෂිතතාවයට දායක වෙයි.
- සාමූහික ව ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- සමාජ සුරක්ෂිතතාව ඇති කිරීමට දායක වෙයි.

**ඇමුණුම 9.1.2.1**

සමාජ සුරක්ෂිතතාවට දායක වන ආයතන

* පවුල
* පාසල
* ආගමික ආයතන
* පොලීසිය හා ආරක්ෂක හමුදාව
* අධිකරණය

**ඇමුණුම 9.1.2.2**

**කණ්ඩායම 01**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ පවුල සමාජ සුරක්ෂිතතාවට දායක වන ආකාරය පිළිබඳ භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීමට යි

**කණ්ඩායම 02**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ පාසල සමාජ සුරක්ෂිතතාවට දායක වන ආකාරය පිළිබඳ භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීමට යි

**කණ්ඩායම් 03**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ ආගමික ආයතන සමාජ සුරක්ෂිතතාවට දායක වන ආකාරය පිළිබඳ භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීමට යි

**කණ්ඩායම 04**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ පොලීසිය හා ආරක්ෂක හමුදාව සමාජ සුරක්ෂිතතාවට දායක වන ආකාරය පිළිබඳ භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීමට යි

**කණ්ඩායම 05**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ අධිකරණය සමාජ සුරක්ෂිතතාවට දායක වන ආකාරය පිළිබඳ භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීමට යි

## 9.1.3 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- සාමුහික ක්‍රියාකාරිත්වය තුළින් සමාජ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට ක්‍රියාකාරී ව දායක වෙයි.

**නිපුණතා මට්ටම** :- සමාජ සුරක්ෂිතතාවට දායක වන විවිධ ආයතන හඳුනාගෙන අභිමානවත් පුරවැසියකු ලෙස සහයෝගයෙන් කටයුතු කරයි.

**ක්‍රියාකාරකම** :- " සමාජ සුරක්ෂිතතාව ඇති කිරීමට පිහිටුවා ඇති යාන්ත්‍රණ"

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-
- ඇමුණුම 9.1.3.1 ට අදාළ පින්තූරය, හෝ චිත්‍රය
- ඇමුණුම 9.1.3.2 ට අදාළ කාර්ය පත්‍රිකාව

  $A_4$ කඩදාසි

  මාකර් පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.1.3.1**

- ඇමුණුම 9.1.3.1 ට අදාළ චිත්‍රය/ පින්තූරය පන්තියට ඉදිරිපත් කරන්න.
- චිත්‍රය/පින්තූරය නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- චිත්‍රය /පින්තූරයෙන් දැක්වෙන දේ පිළිබඳ ව විග්‍රහයක් කිරීමට සිසුන් කිහිප දෙනෙකුට අවස්ථාව ලබා දෙන්න.

පහත කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ක්‍රියා කිරීම ත්‍රිවිධ හමුදාවේ කාර්යය වන බව
- ත්‍රිවිධ හමුදාව විසින් රටක ආරක්ෂාව තහවුරු කිරීම පිණිස විවිධ ක්‍රියාමාර්ග ගන්නා බව
- රටක නීතිය හා සාමය ආරක්ෂා කොට පවත්වා ගෙන යාම පොලීසියෙන් ඉටු වන කාර්යයක් බව
- සිවිල් ආරක්ෂක බලකාය සමාජ සුරක්ෂිතතාව සඳහා දායකවන බව
- පොලීසිය හා ත්‍රිවිධ හමුදාව විසින් මාර්ග බාධක වැනි දේ යොදා ගනිමින් වාහන, පුද්ගලයන් ආදිය පරීක්ෂා කරනු ලබන්නේ මහජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් ම බව
- එවැනි අවස්ථාවන්වල දී පුරවැසියෙකු වශයෙන් අප විසින් ආරක්ෂක අංශවලට සහයෝගය දැක්විය යුතු බව

**(මිනිත්තු 10යි)**

**පියවර 9.1.3.2**

- සුදුසු පරිදි පන්තියේ සිසුන් කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 9.1.3.2 ට අදාළ කාර්යය පත්‍රිකා ලබා දෙන්න.
- කණ්ඩායම් සඳහා A4 කඩදාසි, මාකර් පෑන් ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
  කණ්ඩායම් අතර හැසිරෙමින් සිසුන්ට අවශ්‍ය මඟ පෙන්වීම් කරන්න.

**(මිනිත්තු 15යි )**

## පියවර 9.1.3.3

- කණ්ඩායම්වලට ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- යුධ, නාවික, ගුවන් යන ත්‍රිවිධ හමුදාව විසින් රටේ ආරක්ෂාව වෙනුවෙන් විවිධ පියවර ගන්නා බව
- එකී සේවා ඉටු කිරීම සඳහා ත්‍රිවිධ හමුදාව විසින් විශාල කැප කිරීමක් කරන බව
- එම කැප කිරීම වෙනුවෙන් ජනතාව ඔවුන්ට සහය පළ කළ යුතු බව.
- මහජනතාව වෙනුවෙන් නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ දී පොලීසියෙන් විශාල මෙහෙයක් ඉටු වන බව
- ත්‍රිවිධ හමුදාව ඇතුළු ආරක්ෂක අංශවල ක්‍රියාමාර්ග සඳහා ජනතාව සහයෝගය දැක්විය යුතු බව

**(මිනිත්තු 15)**

## තක්සේරුව හා ඇගයීම

- සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක බලකාය වැනි ආයතන දායක වන බව ප්‍රකාශ කරයි.
- සමාජ සුරක්ෂිතතාව ගොඩ නැගීම සඳහා මෙම ආයතනවල කාර්යයන් නිසි පරිදි සිදුවිය යුතු බව පිළිගනි යි.
- පුරවැසියෙකු වශයෙන් එම ආයතන මහජනතාවගේ සුරක්ෂිතතාව ඇති කිරීමට දායක වන බව පිළිගනි යි.
- එකී ආයතන විසින් සමාජ සුරක්ෂිතතාව සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවලට සහයෝගය දක්ව යි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් නිර්මාණශීලී ව සකස් කොට ඉදිරිපත් කරයි.

**ඇමුණුම 9.1.3.1**

පොලීසිය / ත්‍රිවිධ හමුදාව විසින් මාර්ග බාධකයක දී වාහනයක් /මගීන් පරීක්ෂා කරන අයුරු දැක්වෙන චිත්‍රයක් /ඡායාරූපයක් ඔබ විසින් සපයා ගන්න.

**ඇමුණුම 9.1.3.2**
**කාර්ය පත්‍රිකා**

**කණ්ඩායම 01**

| |
|---|
| ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම කෙරෙහි යුධ හමුදාව දායක වන ආකාරය පිළිබඳ කරුණු රැස් කිරීම යි. |

**කණ්ඩායම 02**

| |
|---|
| ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස ගුවන් හමුදාව දායක වන ආකාරය පිළිබඳ කරුණු රැස් කිරීම යි. |

**කණ්ඩායම් 03**

| |
|---|
| ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස නාවික හමුදාව දායක වන ආකාරය පිළිබඳ කරුණු රැස් කිරීම යි. |

**කණ්ඩායම 04**

| |
|---|
| ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස පොලීසිය දායක වන ආකාරය පිළිබඳ කරුණු රැස් කිරීම යි. |

**කණ්ඩායම 05**

| |
|---|
| ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස සිවිල් ආරක්ෂක බලකාය දායක වන ආකාරය පිළිබඳ කරුණු රැස් කිරීම යි. |

## 9.1.4 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- සාමුහික ක්‍රියාකාරිත්වය තුළින් සමාජ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට ක්‍රියාකාරී ව දායක වේ.

**නිපුණතා මට්ටම** :- සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ වී සහජීවනයෙන් යුතු පුරවැසියෙකු ලෙස කටයුතු කරයි.

**ක්‍රියාකාරකම** :- " සමුපකාරයෙන් ඉටුවන සේවා හඳුනා ගනිමු. "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.1.4.1 ට අදාළ සමුපකාර ලාංඡනය සපයා ගන්න.
- ඇමුණුම 9.1.4.2 ට අදාළ කාර්ය පත්‍රිකාව
  $A_4$ කඩදාසි
  මාකර් පෑන්
  බ්‍රිස්ටල් බෝඩ්

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.1.4.1**

- ඇමුණුම 9.1.4.1 හි සඳහන් සමුපකාර ලාංඡනය පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉහත රූපයෙන් හැඟවෙන දේ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- මෙය කුමක් පිළිබිඹු කරන ලාංඡනයක් ද යන්න සිසුන්ගෙන් විමසන්න. පහත කරුණු ඉස්මතු වන පරිදි සාකච්ජාවක් මෙහෙයවන්න.

> - පුද්ගලයන්ට තම අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී නොයෙකුත් ගැටලු පවතින බව
> - ඒවා විසඳා ගැනීමට අතීතයේ සිට මිනිසා කණ්ඩායම් වශයෙන් සාමුහික ව ක්‍රියා කළ බව
> - වර්තමානයේ මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී ගැටලුවලට මුහුණපාන බව
> - මෙවන් බොහෝ ගැටලු විසඳා ගැනීමට සමුපකාරය තුළින් හැකියාව ලැබෙන බව

**(මිනිත්තු 10යි)**

**පියවර 9.1.4.2**

- ඇමුණුම 9.1.4.1 හි සඳහන් කාර්යය පත්‍රිකා ඒ ඒ කණ්ඩායම්වලට ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් කාලය ලබා දෙන්න.
- අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම් ලබා දෙන්න.

**(මිනිත්තු 15යි)**

**පියවර 9.1.4.3**

- කණ්ඩායම් විසින් රැස් කළ තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කරන තොරතුරු පිළිබඳ අදහස් දැක්වීමට කණ්ඩායමේ සෙසු සිසුනට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම ඉදිරිපත් කරන තොරතුරු පිළිබඳ අදහස් දැක්වීමට සෙසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ද ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

- පාසල් සමුපකාර සමිති පිහිටුවා ගැනීමෙන් පාසල් සිසුනට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ආදිය පහසු මිළට ලබා ගත හැකි වන බව
- සමුපකාර සාමාජිකයකු වශයෙන් ජීවන අත්දැකීම් ලබා ගැනීමට පාසල් සමුපකාරය දායක වන බව
- එය වැඩි දියුණු කර ගැනීමෙන් පාසල් සමුපකාරය මගින් තවත් සුබසාධන සේවා ආරම්භ කළ හැකි බව
- තම ප්‍රදේශයේ " විවිධ සේවා සමුපකාර සමිතිය " සමාජ සුබසාධනයට අදාළ ව විවිධ සේවා පවත්වා ගෙන යන බව
- ඔබ ප්‍රදේශයේ පවතින සමුපකාර ප්‍රාදේශිකය පවත්වා ගෙන යාම ඉන් එක් සේවාවක් වන බව
- ණය දෙන සමිති මගින් ක්ෂණික මුදල් අවශ්‍යතා සඳහා ඉතා අඩු පොලියට ණය මුදල් ලබා ගත හැකි බව
- සමුපකාර ග්‍රාමීය බැංකු මගින් ඉතුරුම් පවත්වා ගෙන යාම, ණය ලබා ගැනීම, විදුලි බිල්පත්, ජල බිල්පත්, ආදිය ගෙවීමට පහසුකම් සලසා ඇති බව
- එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා ඉටුකර ගැනීමට සමුපකාරය විශාල මෙහෙවරක් ඉටු කරන බව

**(මිනිත්තු 15යි)**

## තක්සේරුව හා ඇගයීම

- සමුපකාරය මගින් ඉටු කරනු ලබන සේවා විස්තර කරයි.
- සමුපකාරය සමාජ සංවර්ධනයට දායක වන ආයතනයක් ලෙස අගයමින් අදහස් දක්ව යි.
- තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සමුපකාරයෙන් සිදුවන සේවාවන් වගු ගත කරයි.
- සහයෝගයෙන් යුතුව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- සමුපකාරයේ අගය පිළිබඳ සෙසු අය දැනුවත් කරයි.

**ඇමුණුම 9.1.4.1**

**කාර්ය පත්‍රිකාව**

ඔබ ප්‍රදේශයේ ආසන්න ම සමුපකාරය වෙත ගොස් එහි නාම පුවරුවේ සඳහන් සමුපකාර ලාංඡනය ඇඳගෙන ඒමට යොමු කරවන්න.

**සැ.යු.** මෙය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම ආරම්භ කිරීමට දින කිහිපයකට පෙර මෙම ලාංඡනය ඇඳගෙන ඒමට සිසුන්ට උපදෙස් දෙන්න.

**ඇමුණුම 9.1.4.2**
**කාර්ය පත්‍රිකා**

**කණ්ඩායම 01**

| |
|---|
| ඔබ ප්‍රදේශයේ විවිධ සේවා සමුපකාර සමිතිය මගින් ඉටුවන සේවා පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරන්න. |

**කණ්ඩායම 02**

| |
|---|
| ඔබ ප්‍රදේශයේ සමුපකාර ප්‍රාදේශිකය මගින් ඉටුවන සේවා කෙටියෙන් පැහැදිළි කරන්න. |

**කණ්ඩායම් 03**

| |
|---|
| ඔබ ප්‍රදේශයේ සමුපකාර ග්‍රාමීය බැංකුව මගින් ඉටුවන සේවා කෙටියෙන් පැහැදිලි කරන්න. |

**කණ්ඩායම 04**

| |
|---|
| ඔබ ප්‍රදේශයේ කෘෂි නිෂ්පාදනයන්ට අදාළ ව පිහිටුවා ඇති සමුපකාර සමිතිය මගින් ඉටුවන සේවා පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන්න. |

**කණ්ඩායම 05**

| |
|---|
| ඔබ පාසලේ / ආශ්‍රිත පාසලක පාසල් සමුපකාරය මගින් ඉටුවන සේවා පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන්න. |

# 9.1.5 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- සාමූහික ක්‍රියාකාරිත්වය තුළින් සමාජ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට ක්‍රියාකාරී ව දායක වේ.

**නිපුණතා මට්ටම** :- සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ වී සහජීවනයෙන් යුතු පුරවැසියෙකු ලෙස කටයුතු කරයි.

**ක්‍රියාකාරකම** :- " එකා සැමටත් - සැම එකාටත්. "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-
- ඇමුණුම 9.1.5.1 ට අදාළ සමුපකාර ගීතය
- ඇමුණුම 9.1.5.2 ට අදාළ කාර්ය පත්‍රිකාව

  $A_4$ කඩදාසි

  මාකර් පෑන්

  බ්‍රිස්ල් බෝඩ්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

### පියවර 9.1.5.1

- ඇමුණුම 9.1.5.1 ට අදාළ සමුපකාර ගීතය පන්තියේ සියලු දෙනා එකතු වී ගායනා කරන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතුවන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

- සමුපකාරය"එකා සැමටත් - සැම එකාටත් " යන ආදර්ශ පාඨය පදනම් කර ගෙන කටයුතු කරන බව
- පුද්ගලයන් තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සහයෝගයෙන් වැඩ කිරීමේ අගය වටහා ගත් බව
- සහයෝගයෙන් වැඩ කිරීම තුළින් සමුපකාරය යන සංකල්පය බිහි වීමට අවශ්‍ය අත්තිවාරම ගොඩනැගුණු බව
- සමානාත්මතා සංකල්පය ආරක්ෂා කිරීම තුළින් සමුපකාරය ඉදිරියට මෙහෙයවන බව

**(මිනිත්තු 10යි)**

**පියවර 9.1.5.2**

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 9.1.5.2 ට අදාළ කාර්ය පත්‍රිකා කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කණ්ඩායමේ සිසුන්ට අවශ්‍ය උපදෙස් දෙමින් ක්‍රියාකාරකමට අවශ්‍ය කරුණු එක්රැස් කර ගැනීමට මඟ පෙන්වන්න.
- කණ්ඩායම් තුළින් ස්ව කැමැත්තෙන් නායකයකුට ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දී ඔහු / ඇය ලවා මිනිත්තු 03 ක පමණ කාලයක් ලබා දී කණ්ඩායම විසින් මතුකරගත් තොරතුරු කථික තරගයක ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**(මිනිත්තු 15යි)**

**පියවර 9.1.5.3**

පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- සමුපකාරය තම එදිනෙදා අවශ්‍යතා සපුරාලීමේ ප්‍රධානතම මාධ්‍යයක් බව
- සමුපකාරය මිනිස් ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් වී ඇති බව
- එදිනෙදා අවශ්‍යතා සපුරාලීමේ දී ලාභ ලැබීමේ අරමුණෙන් තොර ව සමුපකාරය කටයුතු කරන නිසා එය වඩාත් ජනතා හිතකාමී සංවිධානයක් බව
- වඩ වඩාත් සමුපකාරය හා බද්ධ වී අපේ ජන ජීවිතය සාර්ථක කරගත යුතු බව

**(මිනිත්තු 15යි)**

## තක්සේරුව හා ඇගයීම

- සමුපකාරයේ ආරම්භය හා අරමුණු පැහැදිලි කරයි.
- පුද්ගල අවශ්‍යතා ඉටු කිරීම පිණිස සමුපකාර ව්‍යාපාරයෙන් විශාල දායකත්වයක් සපයන බව ප්‍රකාශ කරයි.
- සමුපකාරයේ වටිනාකම පැහැදිලි කරමින් ඉන් ඉටුවන සේවය අගය කරයි.
- සාමූහික හැඟීමෙන් යුතු ව නිසි ලෙස කාලය කළමනාකරණය කර ගැනීමට උත්සුක වෙයි.
- තම ජීවිතය සමුපකාරය හා බද්ධ කර ගැනීමට උත්සුක වෙයි.

**ඇමුණුම 9.1.5.1**

## සමුපකාර ගීතය

මහජන දියුණුව සදමින්නේ - පදනම සහයෝගය දෙමිනේ
සමගි බලේ යොදවමිනේ - සිරිලක නිදහස රැක දෙන්නේ

ජයදේවා සිරිදේවා //
සමුපකාරය පැතිරේවා

උස් මිටිකම් අමතක කරදා - දුර හැර ආගම් කුළ බේදා
අලස නොවී දිරිය යොදා - ලක්මව සුරකිමු අප සැමදා

තම තමනට දෙන ආධාරේ - විලස සැදේ සම උපකාරේ
දිළිඳු දනා පෙළ අතරේ - සේවය වේ සිරිලක් අඹරේ

ජයදේවා සිරිදේවා //
සමුපකාරය පැතිරේවා

සිය රට ගොඩ මඩ ගොවිතැනෙහි වෙළහෙළඳාමෙහි අත්කමෙහි
දියුණුවටා මතු දිනෙහි - පිහිටය සමුපකාරයෙහි

ජයදේවා සිරිදේවා //
සමුපකාරය පැතිරේවා

ජාතික ධනයට සුදුසු ලෙසේ - පොදු ජන යහපත සදන ලෙසේ
සම වාසි ලැබෙන ලෙසේ - සමුපකාරෙන් ඉඩ සැලසේ

සමුපකාරයෙ බලය යොදා - රට තොට උවදුරු නැති කර දා
අසරණයා දුකින් මුදා - සැමට ම සුවසෙත කරමු උදා

ජයදේවා සිරිදේවා //
සමුපකාරය පැතිරේවා

පද රචනය : සරණගුප්ත අමරසිංහ මහතා
ගීතයේ තනු නිර්මාණය : ජේ. කේ. සෙබස්තියන් පෙරේරා මහතා

**ඇමුණුම 9.1.5.2**

**කාර්ය පත්‍රිකා**

**කණ්ඩායම 01**

| |
|---|
| ඔබ කණ්ඩායමට පැවරෙන්නේ " සමුපකාර ව්‍යාපාරයේ ආරම්භය හා එහි අරමුණු " පිළිබඳ කථාවක් ඉදිරිපත් කිරීමට යි. |

**කණ්ඩායම 02**

| |
|---|
| ඔබ කණ්ඩායමට පැවරෙන්නේ "සමුපකාර සමිති වර්ග හා ඒවා පිහිටුවා ගන්නා ආකාරය" පිළිබඳ කථාවක් ඉදිරිපත් කිරීමට යි. |

**කණ්ඩායම් 03**

| |
|---|
| ඔබ කණ්ඩායමට පැවරෙන්නේ "පාසල් සමුපකාරයකින් ලැබෙන සේවා" පිළිබඳ තොරතුරු ඇතුළත් කථාවක් ඉදිරිපත් කිරීමට යි. |

**කණ්ඩායම 04**

| |
|---|
| ඔබ කණ්ඩායමට පැවරෙන්නේ "සමුපකාර සමිති මගින් සැපයෙන සේවා " පිළිබඳ කථාවක් ඉදිරිපත් කිරීමට යි. |

# 9.2 කාලීන සමාජ වෙනස් වීම්

**(කාලච්ඡේද 08යි)**

## හැඳින්වීම

වර්තමානයේ නවීන තාක්ෂණය ආර්ථිකය තුළ නිෂ්පාදනය, බෙදාහැරීම, වෙළෙඳාම යන අංශ කෙරෙහි ප්‍රබල බලපෑමක් එල්ල කර ඇත. තාක්ෂණයේ බලපෑම මත ආර්ථිකයේ සිදු වූ මෙම වෙනස්කම් රැකියා ක්ෂේත්‍ර කෙරෙහි ද විවිධ ආකාරයට බලපා ඇත.

තාක්ෂණයේ ඇති වූ වේගවත් දියුණුව සමාජය වෙනස් වීම කෙරෙහි ද දැඩි බලපෑම් එල්ල කර ඇත. මෙම වේගවත් තාක්ෂණික දියුණුව සමාජ යහපතට මෙන් ම අයහපතට ද හේතුවන අවස්ථා උදා වී ඇත. සමාජයේ යහ පැවැත්මට බාධාකාරී වන දෑ පවා ආකර්ශනීයත්වයෙන් යුතු ව සමාජයට දායාද කිරීමට නවීන තාක්ෂණය සමත් වී ඇත.

තාක්ෂණික දියුණුව ප්‍රබල සමාජ වෙනස්වීම්වලට හේතු වේ. නිර්මාණශීලී පුරවැසියකු වශයෙන් තාක්ෂණය සමාජ ආර්ථික දියුණුවට දායක කර ගැනීමටත්, තාක්ෂණය මගින් සමාජ ප්‍රගමනයට බාධා කරන අයහපත් බලපෑම් අවම කර ගැනීමටත් අවශ්‍ය දැනුම ආකල්ප, කුසලතා සංවර්ධනයට අවස්ථාව සැලසීම මෙම ඒකකය අධ්‍යයනය කිරීම තුළින් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : සමාජ යහපතට දායක වන තාක්ෂණික ආර්ථික හා සමාජ වෙනස්වීම්වලට අනුගත ව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම්** :

- කාලීන වෙනස්කම් ඇසුරින් පුද්ගල හා සමාජ සංවර්ධනයට බලපාන වෙනස්වීම් විමර්ශනය කරයි.
- ආර්ථිකයේ සිදුවන වෙනස්වීම්වලට අනුගත ව ක්‍රියා කරයි.
- නව රැකියා වෙළෙඳපොළට ගැළපෙන පරිදි තම දක්ෂතා හා හැකියා හඳුනාගෙන ඒවා වර්ධනය කර ගැනීමට කටයුතු කරයි.

## විෂය අන්තර්ගතය :

### 9.2.1 තාක්ෂණික වෙනස් වීම් හා ඒවාට දක්වන ප්‍රතිචාරවල වැදගත්කම

**තාක්ෂණය හැඳින්වීම**

- මිනිසා තම කටයුතු පහසුකර ගැනීම සඳහා අනුගමනය කරන ක්‍රමවේදය යි
- මෙම ක්‍රමවේද කාලීන ව වෙනස්වීම්වලට ලක්වී ඇති අතර තවදුරටත් වෙනස්වීම් සිදු වේ.

  උදා - දඩයම් යුගයේ දී ගල් ආයුධ භාවිත කළ මිනිසුන් පසු කාලයේ දී දියුණු නවීන උපකරණ භාවිත කිරීම

  - අතීතයේ දී කෘෂිකාර්මික කටයුතු සඳහා ඉතා සාම්ප්‍රදායික උපකරණ භාවිත කළ ගොවීන් වර්තමානයේ අති නවීන යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීම

**තාක්ෂණික වෙනස්වීම්**

- නවීන විද්‍යාවේ දියුණුව හා මිනිසා කරනු ලබන නව සොයා ගැනීම් ද පදනම් කරගෙන තාක්ෂණය පෝෂණය වේ.

  උදාඃ- - අභ්‍යවකාශතරණය, පරිගණක භාවිතය, අන්තර්ජාල පහසුකම් භාවිතය

- ජනගහනය වැඩිවීම සමග වැඩි වූ අවශ්‍යතා සපුරාලීමට සීමිත සම්පත් භාවිත කිරීමේ දී තාක්ෂණය නව මුහුණුවරක් ගැනීම. මෙය කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන සියලු අංශ කෙරෙහි බලපා ඇත.

  උදාඃ- - කෘෂිකාර්මික - මිනිස් ශ්‍රමය හා සතුන් යොදා ගැනීම වෙනුවට යන්ත්‍රෝපකරණ භාවිතය.

  - කාර්මික - මිනිස් ශ්‍රමය භාවිතය වෙනුවට යන්ත්‍ර සූත්‍ර මගින් නිෂ්පාදන කටයුතු සිදු කිරීම
  - සේවා - පණිවුඩ සඳහා විද්‍යුත් තැපැල භාවිතය

**ගවේෂණ හා පර්යේෂණ අර්ථ දැක්වීම**

- ගවේෂණය යනු පවතින ක්‍රියාවලියක් හෝ සිද්ධාන්තයක් සොයා ගැනීමකි.
- පර්යේෂණයක් යනු විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් සිදු කරන අත්හදා බැලීම් වේ.

  උදාඃ- - ශ්‍රී ලංකාවේ පාසල් සිසුවෙක් රෙදි වේලීම සඳහා නව යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම. සෝදාගත් රෙදි හිරුඑළිය ඇති වේලාවේ වේලා ගැනීමටත්, වැසිබර තත්ත්වයක් ඇතිවන විට ආවරණ ස්ථානයකට ස්වයංක්‍රීය ව ගමන් කිරීමට සැලැස්වීමත් පර්යේෂණයක ප්‍රතිඵලයකි.

  - බෙහෙත් ඔරුව භාවිතය මගින් කළ ප්‍රතිකාරක විධි වර්තමානයට ගැළපෙන පරිදි නවීකරණය කර ප්‍රයෝජනයට ගැනීම ගවේෂණයක ප්‍රතිඵලයකි.
  - ගවේෂණ මගින් සොයාගත් තොරතුරු වර්තමානයට ගැළපෙන සේ යොදා ගැනීම

    උදාඃ- රෝග සුවකිරීම සඳහා යොදා ගත් වෛද්‍ය ක්‍රම වර්තමානයට ගැළපෙන සේ සකසා ගැනීම

**තාක්ෂණික වෙනස්වීම් සමග ඇතිවන සමාජ වෙනස් වීම්**

- විවිධ ක්ෂේත්‍රවල සිදු වූ වෙනස් වීම් සමාජයේ ද විවිධ වෙනස්කම්වලට බලපා ඇත.
  - ජීවන ක්‍රමය වෙනස් වීම
  - පාරිභෝජන රටාව මත ජීවන තත්ත්වය වෙනස් වීම
  - නව රැකියා ක්ෂේත්‍ර බිහි වීම
  - ප්‍රවාහන විධි
  - සන්නිවේදනය
  - ඇඳුම් පැළඳුම්
  - සිතුම් පැතුම්
  - ආහාර පාන සැකසීමේ ක්‍රම
  - වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම
  - විවේකය විනෝදය ගත කරන ආකාරය
  - සමාජ සම්බන්ධතා පැවැත්වීම

  උදා :- ක්ෂණික ආහාර වර්ග
  ආහාර සැකසීමේ ක්‍රම හා
  ආහාර සැකසීමේ විවිධ තාක්ෂණික උපකරණ භාවිතය.
- පැරණි සාම්ප්‍රදායික ක්‍රම ශිල්ප අභාවයට යාම

  උදා:- බටහිර වෛද්‍ය ක්‍රමය පැමිණීමත් සමග ම ඒ කෙරෙහි වැඩි නැඹුරුවක් ඇති වීම
- විවේකය සඳහා නව තාක්ෂණය යොදා ගැනීම

  උදා :- ගුවන් විදුලිය, රූපවාහිනිය, අන්තර්ජාල පහසුකම් භාවිතය
- සමාජ සබඳතා වේගවත් වීම හා පුළුල් වීම

  උදා:- ගමනාගමනය සඳහා විවිධ මාධ්‍ය භාවිතය
  සෙලියුලර් දුරකථන භාවිතය

**නිර්මාණශීලී පුරවැසියකු වශයෙන් තාක්ෂණික වෙනස් වීම් යොදා ගැනීමේ වැදගත්කම**

- එදිනෙදා කටයුතු පහසුකර ගැනීමට තාක්ෂණය යෝග්‍ය පරිදි යොදා ගත හැකි වීම

  උදා:- ගෘහ කටයුතු
  ප්‍රවාහනය
  සන්නිවේදනය
  දැනුම ලබා ගැනීම

- නව නිපැයුම් බිහි කිරීමට තාක්ෂණය යොදා ගැනීම
- සමාජ යහපත සඳහා අවශ්‍ය නිපැයුම් බිහි කිරීමට තාක්ෂණය යොදා ගැනීම
- විවේකය ඵලදායීව ගත කිරීම සඳහා තාක්ෂණය භාවිත කිරීම
- නිෂ්පාදන ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණය යොදා ගත හැකි වීම
- සමාජ සම්බන්ධතා පහසුවෙන් හා ඉක්මනින් ගොඩනගා ගැනීමට තාක්ෂණය භාවිත කිරීම
- තාක්ෂණය භාවිත කිරීමේ දී විචාරශීලී ව එය භාවිත කිරීමෙන් තමාටත් අන්‍යයන්ටත් එයින් සෙතක් සැලසේ.

**තාක්ෂණය ජන ජීවිතය කෙරෙහි හිතකර හා අහිතකර ලෙස බලපා ඇති ආකාරය**

තාක්ෂණය දිනෙන් දින දියුණුවෙමින් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ඉදිරියට යාමත් සමග ජන ජීවිතයට ද විවිධ ආකාරයේ බලපෑම් කර ඇති බව පෙනේ. ඒ ඔස්සේ ජන සමාජයට ද හිතකර මෙන් ම අහිතකර ප්‍රතිඵල අත් ව තිබේ. තාක්ෂණික වෙනස්වීම් නිසි ලෙස හඳුනාගෙන තම ජීවිත සාර්ථක කර ගැනීමට කටයුතු කිරීම යහපත් පුරවැසියෙකුගේ වගකීම වේ.

**තාක්ෂණික වෙනස්වීම් හිතකර ලෙස බලපා ඇති අවස්ථා**

- එදිනෙදා කාර්යයන් පහසුවෙන් ඉටු කර ගැනීමට හැකි වීම
- පුද්ගලයන් අතර හා අන්තර් ජාතික වශයෙන් සබඳතා වර්ධනය වීම
- කාලය ඉතිරි කර ගත හැකි වීම
- විවිධ රැකියා අවස්ථා උදා වීම
- දිනෙන් දින එකතුවන නව දැනුම ලබා ගැනීමේ මාර්ග විවර වීම
- නිෂ්පාදනය හා බෙදාහැරීම පහසු වීම
- ලොව ම විශ්ව ගම්මානයක් බවට පත් වීම

**අහිතකර ලෙස බලපා ඇති අවස්ථා**

- ජීවන රටාව වෙනස් වීම නිසා සෞඛ්‍ය සම්පන්න බවට තර්ජන එල්ල වීම
- ත්‍රස්තවාදය, අවි ආයුධ නිෂ්පාදනය, අපරාධ සැලසුම්, අපචාර ආදිය දිනෙන් දින වැඩි වීම
- තාක්ෂණික උපකරණ සමග විවේකය ගත කිරීමට පෙළඹීම නිසා අන්තර් පුද්ගල සබඳතා, පවුල තුළ ළබැඳියාව අඩු වීම
- පරිසර දූෂණය අධික වීම හා තිරසාර සංවර්ධනයට බාධා පැමිණීම
- විවේකය විනෝදය සඳහා තාක්ෂණය අනිසි ලෙස භාවිත කිරීම නිසා සමාජ ප්‍රශ්න ඇති වීම

## 9.2.2 ආර්ථිකයේ සිදුවන වෙනස් වීම්

මිනිස් අවශ්‍යතා ඉටු කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරයි. මෙසේ විවිධ සම්පත් යොදා ගෙන තාක්ෂණය භාවිත කරමින් නිපදවන දෑ කාර්යක්ෂම ව පාරිභෝගිකයා වෙත බෙදා හැරිය යුතු වේ. බෙදා හැරීමෙන් පසු වෙළෙඳපොළ මගින් අළෙවි කරන අතර එය වෙළෙඳාම යි. ඒ අනුව ආර්ථිකයේ නිෂ්පාදනය, බෙදා හැරීම, වෙළෙඳාම යන සියලු අංශවල වෙනස්කම් සිදු වී ඇති අතර තව දුරටත් වෙනස් වෙමින් පවතී.

**නිෂ්පාදනය**

නිෂ්පාදනය කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශවලින් සිදු වේ.
වර්තමානයේ එම එක් එක් අංශවලින් සිදු වූ වෙනස්කම් පහත විස්තර කෙරේ.

**කෘෂි අංශයේ සිදු වු වෙනස්කම්**

උදා:-

* අභිජනනය කළ නව බීජ වර්ග හඳුන්වා දීම
* ජාන තාක්ෂණය භාවිත කිරීම
* නව වගා ක්‍රම භාවිතය
* රසායනික පොහොර භාවිතය
* පාරිභෝජනය සඳහා සකස් කළ ආහාර වර්ග නිෂ්පාදනය
* ක්ෂණික ආහාර නිපදවීම
* නිෂ්පාදනවල විවිධාංගීකරණය
  උදා:- තේ නිෂ්පාදනයේ දී ක්ෂණික තේ, රස ගැන්වූ තේ, හරිත තේ
* ධීවර කර්මාන්තයේ දී විශාල හා පහසුකම් සහිත යාත්‍රා භාවිතය, මසුන් ඇල්ලීමේ ක්‍රම හා උපකරණ, කල් තබා ගැනීමේ ක්‍රම ආදියේ වෙනස්කම්.
* අතීතයේ සිට ඇති කරන සත්ව වර්ග වෙනස් නොවු ව ද තාක්ෂණය භාවිතයෙන් සතුන්ගෙන් ගන්නා ප්‍රයෝජන වෙනස් වීම, නිදසුන් ලෙස මස් පිණිස "බ්‍රොයිලර් "කුකුළන් ඇති කිරීම, වැඩි කිරි ප්‍රමාණයක් ලබා ගත හැකි දෙමුහුන් කිරිහරක්.
* බිංදු ජල තාක්ෂණය යොදා ගැනීම

*

**කාර්මික අංශයේ සිදු වු වෙනස්කම්**

- මිනිසාගේ දෑතින් නිපද වු දෑ නිපදවීමට යන්ත්‍ර හා රොබෝ තාක්ෂණය යොදා ගැනීම

  උදා:- රෙදි නිෂ්පාදනය, වාහන නිෂ්පාදනය

- ශ්‍රම විභජනය හා විශේෂීකරණය

  උදා:- ප්‍රාදේශීය විශේෂීකරණය, ජාත්‍යන්තර විශේෂීකරණය

- එකලස් කිරීමේ කර්මාන්ත බිහි වීම

- කාර්මික නිෂ්පාදන නව උපාංග සහිත ව නිපදවීම
  උදා:- ප්‍රමාණය, හැඩය, පහසුකම් ආදිය අනුව වෙනස්කම් සහිත යන්ත්‍ර, යාන වාහන, ඉලෙක්ට්‍රොනික් උපකරණ ආදිය.
- විවිධ ගවේෂණ පර්යේෂණ සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපාංග නිපදවීම
  උදා:- චන්ද්‍රිකා, අභ්‍යවකාශ යානා, සබ්මැරීන යාත්‍රා ආදිය
- කෘෂි හා සේවා අංශයේ දියුණුවට බලපා ඇති යන්ත්‍රෝපකරණ, උපකරණ නිපදවීම
  උදා:- අස්වනු නෙළන යන්ත්‍ර, පරිගණක, වෛද්‍ය උපකරණ

**සේවා අංශයේ සිදු වූ වෙනස්කම්**

- අධ්‍යාපන අංශයේ සිදු වූ වෙනස්කම්
  උදා:- අන්තර් ජාලය හා අධ්‍යාපන පහසුකම් ලබා ගැනීම
  ( E - Leraning, M-Learining)
- සෞඛ්‍ය අංශයේ සිදු වූ වෙනස්කම්
  උදා:- වෛද්‍යවරුන්ගේ සේවා ලබා ගැනීම සඳහා අන්තර් ජාල පහසුකම් ලබා ගැනීම.
  (E- Medicine)
- බැංකු කටයුතුවල දී කාඩ්පත් භාවිතය (ATM)
  උදා:- මුදල් අවශ්‍ය ඕනෑ ම වේලාවක දී ටෙලර් යන්ත්‍ර මගින් කාඩ්පත් භාවිත කර මුදල් ලබා ගත හැක.

**බෙදා හැරීම සම්බන්ධයෙන් සිදු වූ වෙනස්කම්**

- භාණ්ඩ මිලට ගැනීම, අලෙවි කිරීම, දෘෂ්‍යමාන හමුවකින් තොර ව අන්තර්ජාලය හරහා සිදු කිරීම
- ගනුදෙනු පියවීම සඳහා කාඩ්පත් භාවිතය
  උදා:- ණය කාඩ්පත් (Credit Card)
- භාණ්ඩ ඇණවුම් කිරීම සඳහා අන්තර්ජාලය, ෆැක්ස්, ටෙලෙක්ස් ක්‍රම භාවිතය
- කාර්යක්ෂම, ආරක්ෂිත ක්‍රම භාවිතය.
  උදා:- කන්ටේනර්/බහාලුම් භාවිතය, ශීතාගාර පහසුකම් සහිත මාධ්‍ය යොදා ගැනීම, විශාල බඩු තොග ගෙන යා හැකි වාහන යොදා ගැනීම
- නාවික, ගුවන් හා දුම්රිය ප්‍රවාහන ක්‍රමවල ඇති වූ ප්‍රවණතා
  උදා:- ගුවන් යානා හා බස්, සියලු පහසුකම් සහිත නැව්, බහාලුම් පර්යන්ත විදුලි දුම්රිය ආදිය
- රැහැන් මගින් බෙදා හැරීම
  උදා:- විදුලිය, දුරකථන
- අභ්‍යන්තර නළ මගින් බෙදා හැරීම
  උදා:- ජලය, තෙල්, ගෑස්
- බෙදා හැරීම සඳහා ශ්‍රව්‍ය, දෘශ්‍ය මාධ්‍ය හරහා ප්‍රචාරණ කටයුතුවල බලපෑම
- බහුජාතික සමාගම්, නියෝජිත ආයතන ආදියේ මැදිහත් වීම

**වෙළෙඳාම සම්බන්ධ වෙනස්කම්**

- සුපිරි වෙළෙඳ සල් මගින් භාණ්ඩ වෙළෙඳාම
- ව්‍යාපාරික ආයතන, වෙළෙඳ සල් වෙත භාණ්ඩ තොග ගෙනවිත් බාර දීම
- භාණ්ඩ ඇණවුම් කිරීමට නවීන ක්‍රම භාවිතය හා පාරිභෝගිකයා වෙත ගෙනවිත් බාර දීම.
  උදා:- අන්තර්ජාලය, දුරකථන, ෆැක්ස්
- ගෙවීම සඳහා කාඩ්පත් භාවිතය
  උදා:- ණයකාඩ් ( Credit Card) හර කාඩ්පත් ( Debit Card)
- තරගකාරී ප්‍රචාරණ ක්‍රම භාවිතය, ඒවාට සම්බන්ධ වෙන ම ආයතන පවා බිහි වී ඇත.
- මිල දී ගැනීමට පහසු ප්‍රමාණවලින් සිත් ගන්නා සුලු ලෙස ඇසිරීම.

### 9.2.3 රැකියා වෙළෙඳපොළ හා බැඳුණු නව ප්‍රවණතා

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය පුළුල් වීම හා ඊට සමගාමී ව බෙදා හැරීම හා වෙළෙඳාම යන අංශවල පුළුල් වීම, සාම්ප්‍රදායික ක්ෂේත්‍ර තුළ ද තාක්ෂණය නිසා රැකියා අවස්ථා උදා වීම වේගවත් වී ඇත. එමෙන් ම විවෘත ආර්ථික රටාව නිසා දේශීය හා විදේශීය වශයෙන් පෞද්ගලික අංශයේ ද රැකියා අවස්ථා බිහි වී ඇත. කෘෂිකාර්මික, කාර්මික, සේවා යන සියලු අංශවල මෙම ප්‍රවණතාව දැකිය හැකි ය.

- කෘෂිකාර්මික අංශය හා බැඳුණු නව ප්‍රවණතා
  - යැපුම් මට්ටමේ පැවැති කෘෂිකාර්මික රටාව ඉන් බැහැර වී කාර්මික අංශයට අමුද්‍රව්‍ය සැපයීමට යොමු වී තිබීම
    උදා:- ආහාර කල්තබා ගැනීම
    පළතුරු ටින් කිරීම
    කිරි ආශ්‍රිත විවිධ නිෂ්පාදන - කිරි පැකට්, යෝගට්, රස කළ කිරි
  - කෘෂි අපනයන විවිධාංගීකරණය
  - ස්වයං රැකියා අවස්ථා
    උදා:- සත්ව පාලන කටයුතු
    පැළ තවාන්
    ආහාර පාන සැකසීම
    මල් වගාව
  - කෘෂි පර්යේෂණ ආශ්‍රිත රැකියා අවස්ථා

කාර්මික අංශය හා බැඳුණු නව ප්‍රවණතා

- කාර්මික අංශයේ පරිගණක කටයුතු පුළුල් වීම නිසා ඒ ආශ්‍රිත රැකියා අවස්ථා පුළුල් වීම
  උදා:- පරිගණක දත්ත සැකසුම් ශිල්පීන්, වැඩ සටහන් සම්පාදක
- විදේශ වෙළෙඳපොළ මුල් කරගත් පෞද්ගලික අංශයේ රැකියා බිහි වීම
  නිදහස් වෙළෙඳ කලාප, අපනයන ගම්මාන, කර්මාන්ත පුර, කාර්මික ජනපද කර්මාන්ත උද්‍යාන ආදිය.

උදා:- පිරිස් කළමනාකරු, තත්ත්ව පාලක නිලධාරීන්, වැඩ අධීක්ෂකවරු, ජුකී මැෂින් ක්‍රියාකරුවන් ආදී අවස්ථා

**සේවා අංශය හා බැඳුණු නව ප්‍රවණතා**

උදා:-
- පෞද්ගලික බැංකු ක්‍රමවල ව්‍යාප්තිය
- රක්ෂණ ආයතන පුළුල් වීම
- වරාය, ගුවන් තොටුපළ පහසුකම් පුළුල් වීම
- වෛද්‍ය සේවයේ ඇති වු පුළුල් වීම
- සන්නිවේදනය හා ප්‍රචාරණය
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වු වෙනස්කම් හා ජාත්‍යන්තර පාසල් බිහි වීම
- සංචාරක අංශයේ පුළුල් වීම
- විදේශ රටවල විවිධ සේවාවන් සඳහා යොමු වීම
- පෞද්ගලික ප්‍රවාහන සේවා අංශය පුළුල් වීම

ආදී සියලු අංශවලට රැකියා වෙළෙඳපොළ පුළුල් වීම හා නව රැකියා අවස්ථා උදා වීම ප්‍රවණතාවකි.

## 9.2.1 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- සමාජ යහපතට දායක වන තාක්ෂණික, ආර්ථික හා සමාජ වෙනස්වීම්වලට අනුගත ව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම** :- කාලීන වෙනස්කම් ඇසුරින් පුද්ගල හා සමාජ සංවර්ධනයට බලපාන වෙනස් වීම් විමර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** :- " එදා හා අද තාක්ෂණය හඳුනා ගනිමු. "

**කාලය** :- මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.2.1.1 ට අදාළ ගල් ආයුධ දක්වන රූප සටහන්
- ඇමුණුම 9.2.1.2 ට අදාළ කාර්ය පත්‍රිකාව
- ඩිමයි කඩදාසි
- මාකර් පෑන්
- පැන්සල්

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.2.1.1**

- ඇමුණුම 9.2.1.1ට අදාළ රූප සටහන් පන්තියට ඉදිරිපත් කරන්න.
- පන්තියේ සිසුන්ට රූප සටහන නිරීක්ෂණයට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- රූප සටහනේ සඳහන් ආයුධ වර්ග හා ඒවායින් ලබා ගන්නා ප්‍රයෝජන, මිනිසාගේ සොයා ගැනීම්, අත්හදා බැලීම් අනුව අලුත් දේවල් සොයා ගත් බව ආදිය පිළිබඳ ව සිසුන් සියලු දෙනා සහභාගී කරගෙන කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ඈත අතීතයේ සිට ම මිනිසා තම අවශ්‍යතා පහසුවෙන් ඉටුකර ගැනීමට තාක්ෂණය භාවිත කළ බව
- වර්තමානයේ විවිධ අවශ්‍යතා පහසුවෙන් ඉටුකර ගැනීමට තාක්ෂණය භාවිත කරන බව
- කාර්මික හා විද්‍යාත්මක දියුණුවත් සමග තාක්ෂණික වෙනස්කම් සිදු වන බව
- විවිධ ගවේෂණ හා පර්යේෂණවල ප්‍රතිඵල මත නව තාක්ෂණික සොයා ගැනීම් බිහි වන බව
- තාක්ෂණික වෙනස් වීම් සමග ජීවන ක්‍රමය, පරිභෝජන රටාවේ වෙනස් වීම්, නව රැකියා බිහි වීම, නාගරීකරණය ආදී අංශවල වෙනස් වීම් හේතු කොටගෙන සමාජ වෙනස් වීම් සිදු වන බව

**(මිනිත්තු 10යි)**

**පියවර 9.2.1.2**

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 9.2.1.2 ට අදාළ කාර්යය පත්‍රිකාව බැගින් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- කාර්ය පත්‍රිකාවේ සඳහන් කාර්යයෙහි සිසුන් නිරත කරවන්න.
- අවශ්‍ය අවස්ථාවල මඟ පෙන්වීම හා උපදෙස් ලබා දෙන්න.
- වාර්තාව සැකසීමට ප්‍රමාණවත් කාලය ලබා දෙන්න.

**(මිනිත්තු 40යි)**

## පියවර 9.2.1.3

- එක් එක් කණ්ඩායම රැස් කළ තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම ඉදිරිපත් කළ තොරතුරු පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට සෙසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු ඉස්මතුවන සේ සමාලෝචනයක යෙදෙන්න.

- අතීතයේ දී එදිනෙදා වැඩ කටයුතු පහසු කරගැනීමට තාක්ෂණික උපකරණ භාවිත කළ බව
- වර්තමානයේ දී විවිධ අවශ්‍යතා ඉටු කරගැනීමට තාක්ෂණික උපකරණ භාවිත කරන බව
- පර්යේෂණ හා ගවේෂණවල ප්‍රතිඵලයක් ලෙස නවීන තාක්ෂණික උපකරණ බිහි වන බව
- තාක්ෂණයේ ඇති වූ වෙනස්කම් පුද්ගල හා සමාජ ජීවිතයේ විවිධ අංශ වෙනස් කිරීමට හේතු වූ බව

  උදා:- ජීවන ක්‍රමය වෙනස් වීම
  පරිභෝජන රටාව වෙනස් වීම
  නාගරීකරණය
  නව රැකියා අවස්ථා බිහි වීම

**(මිනිත්තු 30යි )**

## තක්සේරුව හා ඇගයීම

- තාක්ෂණික වෙනස් වීම් පිළිබඳ ව විස්තර කරයි.
- තාක්ෂණය යෝග්‍ය පරිදි භාවිත කිරීමෙන් එදිනෙදා වැඩ කටයුතු පහසුවන බවට අදහස් දක්වයි.
- එදිනෙදා කටයුතු සඳහා යෝග්‍ය පරිදි තාක්ෂණික උපකරණ භාවිතයට යොමු වෙයි.
- කණ්ඩායම තුළ සහයෝගයෙන් කටයුතු කරයි.
- කණ්ඩායම තුළ නායකත්වයට ගරු කරයි.

## පසු වැඩ

- ගෘහස්ත කටයුතු පහසුකර ගැනීම සඳහා භාවිත කරන උපකරණවල පින්තූර රැස් කරන්න.
  එක් එක් උපකරණ භාවිතයෙන් ලැබෙන ප්‍රයෝජන ලැයිස්තු ගත කරන්න.
  නූතන පර්යේෂණවල ප්‍රතිඵල මත බිහි වූ තාක්ෂණික නිර්මාණ කිහිපයක තොරතුරු රැස් කරන්න.

**ඇමුණුම 9.2.1.1**



**ඇමුණුම 9.2.1.2**
**කාර්ය පත්‍රිකා**

**කණ්ඩායම 01**

*	ගෘහස්ථ කටයුතු ඉටු කරගැනීම සඳහා අතීතයේ භාවිත කළ උපකරණ හා වර්තමානයේ යොදා ගන්නා උපකරණ කිහිපයක් වෙන වෙන ම සටහනකින් පෙන්වන්න.
*	වර්තමානයේ භාවිත කරන උපකරණ නිසා ලැබී ඇති වාසි හෝ යහපත් ප්‍රතිඵල ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම 02**

*	වී වගාව සඳහා අතීතයේ භාවිත කළ ක්‍රම හා උපකරණ වර්තමානයේ භාවිත කරන  ක්‍රම හා උපකරණ පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.
*	නවීන තාක්ෂණික ක්‍රම හා උපකරණ වී වගාවට යොදා ගැනීම නිසා ඇති වූ වාසි / යහපත් ප්‍රතිඵල ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම් 03**

*	ප්‍රවාහනය සඳහා අතීතයේ භාවිත කළ ක්‍රම හා උපකරණත් වර්තමානයේ භාවිත කරන ක්‍රම හා උපකරණ නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.
*	නවීන ක්‍රම/ උපකරණ භාවිතය නිසා ඇති වූ වාසි / යහපත් ප්‍රතිඵල ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම 04**

*	සන්නිවේදනය සඳහා අතීතයේ භාවිත කළ ක්‍රම හා උපකරණ වර්තමානයේ භාවිත කරන ක්‍රම හා උපකරණ නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.
*	නවීන ක්‍රම හා උපකරණ භාවිතය නිසා ඇති වූ වාසි / යහපත් ප්‍රතිඵල සටහන් කරන්න.

## 9.2.2 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- සමාජ යහපතට දායකවන තාක්ෂණික ආර්ථික සහ සමාජ වෙනස් වීම්වලට අනුගත ව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම** :- ආර්ථිකයේ සිදු වන වෙනස් වීම්වලට අනුගත ව ක්‍රියා කරයි.

**ක්‍රියාකාරකම** :- " තාක්ෂණය සමග ආර්ථිකයේ සිදු ව ඇති වෙනස්කම් සොයා බලමු. "

**කාලය** :- මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.2.2.1 තාක්ෂණික උපකරණ හා නිෂ්පාදන ඇතුළත් පින්තූරය
- ඇමුණුම 9.2.2.2 ට අදාළ කාර්ය පත්‍රිකාව
- ඩිමයි කඩදාසි
- මාකර් පෑන්
- ෆෙල්ට් පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.2.2.1**

- ඇමුණුම 9.2.2.1 පින්තූරය පන්තියට ඉදිරිපත් කරන්න.
- එය නිරීක්ෂණයට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- එහි දැක්වෙන්නේ මොනවා ද? එම උපකරණ හෝ නිෂ්පාදන කුමන අංශ / ක්ෂේත්‍රවලට අයත් ද? ඒවායින් ලැබෙන ප්‍රයෝජන මොනවා ද? ආදියට පිළිතුරු ලබා ගන්න.
- පහත කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- මිනිසාගේ අවශ්‍යතා සපුරාලීම සඳහා කෘෂිකාර්මික, කාර්මික, සේවා අංශවලින් නිෂ්පාදන සිදු කරන බව
- නිෂ්පාදනය කරන ලද භාණ්ඩ බෙදා හැරීම සම්බන්ධයෙන් ද වෙනස්කම් සිදු ව ඇති බව
- වෙළෙඳාම සම්බන්ධයෙන් ඇති වී තිබෙන තාක්ෂණික වෙනස්කම් ජන ජීවිතය කෙරෙහි බලපා ඇති බව

**(මිනිත්තු 10 යි)**

**පියවර 9.2.2.2**

- සිසුන් සංඛ්‍යාව අනුව පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් 5කට බෙදන්න.
- ඇමුණුම 9.2.2.2 ට අදාළ කාර්යය පත්‍රිකාව කණ්ඩායම්වලට ලබා දෙන්න.
- කණ්ඩායම්වලට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- අදාළ කාර්යය නිම කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

**(මිනිත්තු 30 යි)**

**පියවර 9.2.2.3**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- කණ්ඩායම් අතර අදහස් හුවමාරුවට අවස්ථාව දෙන්න.
- සිසු ප්‍රබලතා අගයන්න. සංවර්ධනය විය යුතු තැන් පෙන්වා දෙන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- තාක්ෂණය භාවිත කිරීම නිසා කෘෂිකාර්මික අංශයේ විශාල වෙනස්කම් සිදුව ඇති බව
- කෙටි කාලයකින් වැඩි අස්වනු ලබා දෙන බීජ වර්ග සොයා ගෙන ඇති බව
- පාරිභෝජනය සඳහා සැකසූ ආහාර, ක්ෂණික ආහාර හඳුන්වා දී ඇති බව
- ධීවර කටයුතුවල දී ද නවීන යාත්‍රා, මසුන් ඇල්ලීමේ නව ක්‍රම, කල් තබා ගැනීමේ නව ක්‍රම භාවිත කරන බව
- වඩා කාර්යක්ෂම හා පහසු ගුණාත්මක තත්ත්වයෙන් යුතු විවිධ කාර්මික නිෂ්පාදන බිහි වී ඇති බව
- අන්තර්ජාලය, දුරකථන ආදී නවීන ක්‍රම මගින් අධ්‍යාපනය, සෞඛ්‍ය, බැංකු සේවා කටයුතු පහසු වී ඇති බව
- බෙදා හැරීමේ ක්ෂේත්‍රයේ සිදු ව ඇති වෙනස්කම් ද ජන ජීවිතය කෙරෙහි බලපා ඇති බව

  උදා:- - අන්තර්ජාලය හරහා ගනුදෙනු
  - කාඩ්පත් මගින් ගනුදෙනු පියවීම
  - කන්ටේනර් මගින් විශාල බඩු තොග එහා මෙහා ගෙන යාමට නැව් හා ගොඩබිම වාහන යොදා ගැනීම
  - නළ මගින් බෙදා හැරීම් කටයුතු කිරීම ආදිය.
- සුපිරි වෙළෙඳ සල් ක්‍රියාත්මක වීම
- නිවෙස් වෙත භාණ්ඩ රැගෙනවිත් දීම ආදිය මගින් පාරිභෝගික අවශ්‍යතා පහසුවෙන් ඉටු කරගත හැකි බව
- භාණ්ඩ ඇණවුම් කිරීම හා මුදල් ගෙවීම් සඳහා ද නව ක්‍රම යොදා ගත හැකි බව

**(මිනිත්තු 40යි)**

# තක්සේරුව හා ඇගයීම

- ආර්ථිකයේ විවිධ අංශ සඳහා තාක්ෂණය බලපා ඇති බවට අදහස් දක්වයි
- පාරිභෝගික අවශ්‍යතා පහසුවෙන් හා කාර්යක්ෂම ව ඉටු කර ගැනීමට නව ක්‍රම හා උපකරණ හේතු වී ඇති බව පිළිගනිමින් කතා කරයි.
- තාක්ෂණික නිෂ්පාදන අතරින් අවශ්‍ය දේ පමණක් තෝරා ගැනීමට ක්‍රියා කරයි.
- කණ්ඩායම් සහයෝගයෙන් කටයුතු කරයි.
- නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

**ඇමුණුම 9.2.2.1**







භාණ්ඩ ප්‍රවාහනය කරන නැවක්



**ඇමුණුම 9.2.2.2**
**කාර්ය පත්‍රිකා**

**කණ්ඩායම 01**

**කෘෂිකාර්මික අංශය** යටතේ බෝග වගාව සම්බන්ධයෙන් තාක්ෂණය බලපා ඇති ආකාරය හා අවස්ථා පිළිබඳ තොරතුරු ගොනු කර නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම 02**

**කෘෂිකාර්මික අංශය** යටතේ සත්ව පාලනය හා ධීවර කටයුතු සම්බන්ධයෙන් තාක්ෂණය යොදා ගෙන ඇති අවස්ථා ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම් 03**

**කාර්මික භාණ්ඩ** නිෂ්පාදන අංශයේ තාක්ෂණය යොදා ගැනීම නිසා සිදු වී ඇති වෙනස්කම් පිළිබඳ වාර්තාවක් නිර්මාණශීලී ව ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම 04**

**නිෂ්පාදිත භාණ්ඩ හා සේවා බෙදා හැරීම** සම්බන්ධයෙන් ශීඝ්‍ර වෙනස්කම් මෑත කාලයේ සිදු ව ඇත. ඒ පිළිබඳ ව තොරතුරු නිර්මාණශීලී ව ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම 05**

**වෙළෙඳාම** සම්බන්ධයෙන් තාක්ෂණය හා උපකරණ භාවිතය නිසා විශාල වෙනස්කම් සිදු ව ඇත. ඒවා පිළිබඳ තොරතුරු ගොනු කර සිත් ගන්නා ආකාරයට ඉදිරිපත් කරන්න.

## 9.2.3 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- සමාජ යහපතට දායක වන තාක්ෂණික, ආර්ථික හා සමාජ වෙනස්වීම්වලට අනුගත ව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම** :- නව රැකියා වෙළෙඳපොළට ගැළපෙන පරිදි තම දක්ෂතා හා හැකියා හඳුනා ගෙන ඒවා වර්ධනය කර ගැනීමට කටයුතු කරයි.

**ක්‍රියාකාරකම** :- " රැකියා ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා හඳුනා ගනිමු "

**කාලය** :- මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :-
- ඇමුණුම 9.2.3.1 කාර්ය පත්‍රිකාව
- පුවත්පත්වල පළ වූ විවිධ රැකියා අවස්ථාවලට අදාළ දැන්වීම් (පාඩමට කලින් සූදානම් කර ගන්න)
- ඩිමයි කඩදාසි
- මාකර් පෑන්

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.2.3.1**

- පන්තියේ සිසුන් අනාගතයේ දී තමන් කුමන රැකියාවක් කිරීමට බලාපොරොත්තු වන්නේ ද යන්න විමසා එය කළුලෑල්ලේ ප්‍රදර්ශනය කරන්න.
- බුද්ධි කලම්බනය මගින් ලැබෙන පිළිතුරු කළුලෑල්ලේ සටහන් කරන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- නිෂ්පාදනය, බෙදා හැරීම, වෙළෙඳාම යන අංශවල සිදු වූ වෙනස්කම් මත වර්තමානයේ නව රැකියා ක්ෂේත්‍ර රාශියක් බිහි වී ඇති බව
- එම රැකියා කෘෂිකාර්මික, කාර්මික, සේවා යන අංශවලට බෙදා දැක්විය හැකි බව
- කෘෂිකාර්මික, කාර්මික, සේවා අංශවල නව ප්‍රවණතා ඇති වූ බව
- සේවා අංශයේ රැකියා කාර්මික හා කෘෂිකාර්මික අංශයේ රැකියාවල දියුණුවට ද බලපාන බව

**(මිනිත්තු 15යි)**

## පියවර 9.2.3.2

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 9.2.3.1ට අදාළ කාර්ය පත්‍රිකාව බෙදා දෙන්න.
- ඩිමයි කඩදාසි, මාකර් පෑන් එක් එක් කණ්ඩායමට ලබා දෙන්න.
- කණ්ඩායම් විසින් රැගෙන ආ රැකියා ඇබෑර්තු දැන්වීම් නිරීක්ෂණය කර කණ්ඩායමට ලැබුණු ක්ෂේත්‍ර යටතේ ගොනු කිරීමට අවස්ථාව දෙන්න.

**(මිනිත්තු 25යි)**

## පියවර 9.2.3.3

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම්වලට සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසු ප්‍රබලතා අගය කරමින් සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කරමින් පහත කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- තාක්ෂණික වෙනස් වීම් සමග කෘෂිකාර්මික කාර්මික සේවා අංශවල රැකියා ක්ෂේත්‍රයේ නව අවස්ථා ඇති වූ බව
- කෘෂි ක්ෂේත්‍රයේ සමහර අංශ යැපුම් මට්ටමේ සිට කාර්මික අංශයට අමුද්‍රව්‍ය සපයන තත්ත්වය දක්වා වර්ධනය වූ බව
- අපනයන විවිධාංගීකරණය යටතේ ස්වයං රැකියා අවස්ථා ඇති වූ බව
- කාර්මික අංශයේ නව රැකියා බිහි වූ බව
- කෘෂිකාර්මික කාර්මික අංශවලට අදාළ ව සේවා අංශයේ නව රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් බිහි වූ බව
- සෙසු අංශවලට වඩා සේවා අංශයේ රැකියා අවස්ථා පුළුල් වූ බව

**(මිනිත්තු 40 යි)**

## තක්සේරුව හා ඇගයීම

- විවිධ ක්ෂේත්‍ර යටතේ බිහි වූ නව රැකියා නම් කරයි
- විවිධ රැකියා රටේ සමාජ හා ආර්ථික සංවර්ධනයට දායක වන බව පිළිගනියි
- ආර්ථිකයේ පවත්නා විවිධ ක්ෂේත්‍ර යටතේ රැකියා වර්ගගත කරයි.
- කණ්ඩායම් වගකීම් නිසි ලෙස ඉටු කරයි.
- සෑම රැකියාවක් මගින් ම සමාජයටත් ආර්ථිකයටත් විශාල සේවයක් කළ හැකි බවට අදහස් දක්වයි.

පසු වැඩ :-

ඔබ ප්‍රදේශයේ කෘෂිකාර්මික, කාර්මික, සේවා යන අංශ තුනට අදාළ ව බිහි වී ඇති රැකියා ලැයිස්තුවක් සකසන්න.
එම රැකියා අවස්ථා ඔබ ප්‍රදේශයේ ආර්ථික හා සමාජයීය දියුණුව ඇති වීමට දායක වී ඇති ආකාරය පිළිබඳ පාසල් සඟරාවට ලිපියක් සකස් කරන්න.
ඔබ අනාගතයේ දී තෝරා ගැනීමට අපේක්ෂිත රැකියාව නම් කර

- එය තෝරා ගැනීමට හේතු
- ඒ මගින් සමාජ ආර්ථික දියුණුවට කළ හැකි සේවය පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන්න.

## කාර්ය පත්‍රිකා

**ඇමුණුම 9.2.3.1**

| |
|---|
| **කණ්ඩායම 01**<br><br>* ඉරිදා පුවත්පත් කිහිපයක් සපයා ගන්න.<br>* එහි රැකියා දැන්වීම් කියවන්න.<br>* ඒ අතරින් **කෘෂි අංශයට** අයත් රැකියා දැන්වීම් කපා වෙන් කර ගන්න.<br>* ඔබට සපයා ඇති ඩිමයි කඩදාසියේ ඔබ තීරණය කරන පිළිවෙළකට නිර්මාණාත්මක ව අලවන්න.<br>* එක් එක් රැකියාවෙන් සමාජයට වන සේවය කරුණු ලෙස දක්වන්න. (ඩිමයි කඩදාසියේ පහළ) |
| **කණ්ඩායම 02**<br><br>* ඉරිදා පුවත්පත් කිහිපයක් සපයා ගන්න.<br>* එහි රැකියා දැන්වීම් හොඳින් අධ්‍යයනය කරන්න.<br>* ඒ අතරින් **කාර්මික අංශයට** අයත් රැකියා දැන්වීම් කපා වෙන් කරන්න.<br>* ඩිමයි කඩදාසියේ ඒවා ඔබ තීරණය කරන පිළිවෙළකට නිර්මාණාත්මක ව අලවන්න.<br>* ඩිමයි කඩදාසියේ පහළ කොටසේ එක් එක් රැකියාවෙන් සමාජයට වන සේවය කරුණු වශයෙන් දක්වන්න. |
| **කණ්ඩායම් 03**<br>* ඉරිදා පුවත්පත් කිහිපයක් සපයා ගන්න.<br>* එහි රැකියා දැන්වීම් හොඳින් අධ්‍යයනය කරන්න.<br>* **සේවා අංශයට** අයත් රැකියා දැන්වීම් කපා වෙන් කරන්න.<br>* ඩිමයි කඩදාසියේ ඔබ කැමති පිළිවෙළකට ඒවා නිර්මාණාත්මක ව අලවන්න.<br>* ඩිමයි කොළයේ පහළ - ඒ ඒ රැකියා අවස්ථාවලින් සමාජයට වන සේවය කරුණු ලෙස දක්වන්න. |

# 9.3 පාලනය සඳහා ජනතා සහභාගිත්වය

**(කාලච්ඡේද 08යි)**

## හැඳින්වීම

ලෝකයේ ඉපැරණි ශිෂ්ටාචාර අතුරින් ග්‍රීසියේ ඇතැන්ස් නගරයේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පැවති බවට තොරතුරු අනාවරණය වී ඇත. වර්තමාන ලෝකයේ බොහෝ රටවල පාලනය සඳහා යොදා ගන්නා පාලන ක්‍රමයක් ලෙස නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය හැඳින්විය හැකි ය. ජනතාවගේ සහභාගිත්වයෙන් ගොඩනගා ගන්නා ජනතාවගේ පාලනය සඳහා පවත්වා ගෙන යන පාලන ක්‍රමයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය වැදගත් වන බැවින් එහි සාර්ථකත්වයට ජනතාවගේ සක්‍රීය සහභාගිත්වය අවශ්‍ය වේ. මෙම ඒකකය තුළින් ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමයක් සාර්ථක ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිපුණතා සිසුන් තුළ සංවර්ධනය කිරීම මෙම ඒකකය තුළින් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක ව පවත්වා ගෙන යාමට සක්‍රිය ව දායක වෙයි.

**නිපුණතා මට්ටම්** :

- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික අංග ලක්ෂණ විශ්ලේෂණය කරයි.
- ජන සමාජයක එක්සත් බව ඇති කිරීමට දේශපාලන පක්ෂ මගින් ඉටු කළ යුතු කාර්යභාරය අගය කරයි.
- ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක යහපත් පුරවැසියකු ලෙස තම වගකීම් හා යුතුකම් ඉටු කරයි.

**විෂය අන්තර්ගතය** :

**9.3.1 ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ**
**ප්‍රජාතන්ත්‍රවාදය හැඳින්වීම**

- "ප්‍රජා "යනු ජනතාව යි. " තන්ත්‍රය "යනු පාලන ක්‍රමය යි. ඒ අනු ව "ප්‍රජාතන්ත්‍රවාදය" යනු ජනතාවගේ පාලන ක්‍රමයකි. මෙය ජනතාව විසින් ජනතාව උදෙසා පවත්වා ගෙන යනු ලබන ජනතා පාලන ක්‍රමයක් ලෙස හැඳින්විය හැකි ය.

**ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවත්නා රටවලට උදාහරණ**

- ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවකට අනුව පාලනය කිරීම
- මහජන ඡන්දයෙන් බිහි වූ ආණ්ඩු පැවතීම
- සර්වජන ඡන්ද බලය
- නීතියේ ආධිපත්‍යය
- නිදහස් හා ස්වාධීන මැතිවරණ
- බහුතර කැමැත්ත මත තීරණ ගැනීම

- තරගකාරී පක්ෂ ක්‍රමය
- අධිකරණයේ ස්වාධීනත්වය
- නියෝජන ක්‍රම පැවතීම
- රට ඡන්ද කොට්ඨාසවලට බෙදා තිබීම
- ආණ්ඩු පක්ෂයක් හා විරුද්ධ පක්ෂයක් පැවතීම
- බලතල බෙදා තිබීම.
- නිදහස, සමානාත්මතාව හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- නිදහස් ජන මාධ්‍යවල ක්‍රියාකාරිත්වය

**ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවත්නා රටවලට නිදසුන්**

- මහා බ්‍රිතාන්‍යය
- ඇමෙරිකා එක්සත් ජනපදය
- ඉන්දියාව
- ශ්‍රී ලංකාව
- කැනඩාව
- සිංගප්පූරුව
- මැලේසියාව

**ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට අවශ්‍ය අංග**

- දේශපාලන අවබෝධයෙන් යුත් ජනතාවක් සිටීම
- කැපවීමෙන් හා වගකීමෙන් යුක්ත නායකයන් සිටීම
- නිදහස් ජන මාධ්‍ය ක්‍රමයක් පැවතීම
- ආර්ථික තත්ත්වය සතුටුදායක මට්ටමක පැවතීම
- නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක වීම
- ආණ්ඩුවේ කාර්යයන් බෙදා තිබීම.
- ක්‍රියාකාරී විරුද්ධ පක්ෂයක් පැවතීම

### 9.3.2 දේශපාලන පක්ෂ

**දේශපාලන පක්ෂ හැඳින්වීම**

- දේශපාලන බලය ලබා ගැනීමේ අරමුණින් පොදු ප්‍රතිපත්තියක් මත කටයුතු කරමින් ජනතා සුබසිද්ධිය අරමුණු කරගත් එකට එක් වූ පුද්ගල කණ්ඩායම දේශපාලන පක්ෂ වේ. (එඩ්මන්ඩ් බර්ක්)

- ජාතික අවශ්‍යතාවයන් පදනම් කර ගෙන මහජනතාවගේ අදහස් හා දේශපාලන පක්ෂයේ ප්‍රතිපත්ති එකට එක්වීමෙන් දේශපාලන පක්ෂ නිර්මාණය වේ.

- දේශපාලන පක්ෂයක අරමුණ විය යුත්තේ ප්‍රාදේශීය, වාර්ගික, ආගමික වැනි පටු සාධක පදනම් කර ගනිමින් ක්‍රියාත්මක වීම නොව ජාතික අවශ්‍යතා පදනම් කර ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීම යි.

**ජන සමාජයක එක්සත් බව ඇති කිරීම සඳහා දේශපාලන පක්ෂ මගින් ඉටු කළ යුතු කාර්යභාරය**

- විසිරී ඇති මහජන මතය ඒකරාශී කිරීම
- ජනතා අවශ්‍යතා හඳුනා ගනිමින් ඒ අනුව පක්ෂ ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාවට නැංවීම
- ජනතාව දැනුවත් කිරීම
- අනාගත නායකයින් පුහුණු කිරීම
- ජන සමාජය තුළ එක්සත් බව ඇති කිරීම
- තම පක්ෂයට ප්‍රතිවිරුද්ධ අදහස් දරණ දේශපාලන පක්ෂවල සාමාජිකයින්ගේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන අදහස්වලට ගරු කිරීම

**ඡන්ද බලය හා මැතිවරණය**

- මහජන නියෝජිතයින් තෝරා පත් කර ගැනීම හා ජනතා මතය විමසීම සඳහා පැවැත්වෙන මැතිවරණයක දී තම කැමැත්ත ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ඡන්ද බලය යි.

- පාලන ආයතනවලට ජනතා නියෝජිතයින් තෝරා පත් කර ගැනීම සඳහා පැවැත්වෙන ජනතා ඇදහස් විමසීම මැතිවරණය යි.

**ජනතාව පාලනයට සහභාගි වන අවස්ථා**

- පාර්ලිමේන්තු මැතිවරණය
- ජනාධිපතිවරණය
- පළාත් පාලන මැතිවරණ (ප්‍රාදේශීය සභා, නගර සභා, මහනගර සභා)
- පළාත් සභා මැතිවරණ
- ජනමත විචාරණය

**සර්වජන ඡන්ද බලය හා එහි වැදගත්කම**

- කිසි ම භේදයකින් තොර ව නියමිත සුදුසුකම් සපුරා ඇති සියලු පුරවැසියන්ට තම දේශපාලන මතය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය.

**ශ්‍රී ලංකා වාසීන්ට ඡන්ද බලය ලැබීම**

- 1910 මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් වයස අවුරුදු 21 ට වැඩි උගත් හා ධනවත් පුරුෂ පක්ෂයේ සීමිත පිරිසකට පමණක් ඡන්ද බලය හිමි විය.
- 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය මගින් වයස අවුරුදු 21 ඉක්ම වූ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම සර්වජන ඡන්ද බලය ප්‍රදානය කරන ලදී.

- 1958 දී වයස අවුරුදු 18 වැඩි සියලු ම පුරවැසියන්ට ඡන්ද බලය හිමි වීම

**ඡන්ද බලය හිමි වීම සඳහා තිබිය යුතු සුදුසුකම්**

- ශ්‍රී ලාංකික පුරවැසියකු වීම
- වයස අවුරුදු 18 සපුරාලීම
- ලියාපදිංචි ඡන්ද දායකයකු වීම
  ඡන්ද බලය අහිමි වීමට ලක්වූවෙකු නොවීම (ඡන්ද බලය අහිමි වීමට හේතු පැහැදිලි කරන්න.)

**සර්වජන ඡන්ද බලයේ වැදගත්කම**

- මහජනතාවට තම පාලකයන් තෝරාපත් කර ගැනීමට අවස්ථාවක් ලැබීම.
- නුසුදුසු පාලකයන් ඉවත් කිරීම සඳහා අවස්ථාව ලැබීම.
- දේශපාලන සහයෝගිත්වය පුළුල් වීම
- දේශපාලන දැනුම වර්ධනය වීම
- පුද්ගලයා ක්‍රියාකාරී ව දේශපාලනයට සහභාගි වීම
- මහජන නියෝජිතයින් තමන් පත් වූ ඡන්ද කොට්ඨාසයට සේවය කිරීමට පොළඹවන මාර්ගයක් වීම.
- රටේ ජනතාවගේ සුභසිද්ධිය සහ සංවර්ධනය සඳහා කටයුතු කිරීමට පොළඹවන උපාය මාර්ගයක් වීම

**මැතිවරණ, මැතිවරණ සම්බන්ධ ජනතා අයිතිවාසිකම් හා යුතුකම්**

පාලනය සඳහා සුදුසු නියෝජිතයන් තෝරා පත් කර ගැනිමට යොදා ගන්නා වූ ක්‍රියාවලිය මැතිවරණය යි.
මැතිවරණ නියෝජිතයන් තෝරාපත් කර ගැනීම සඳහා නියෝජන ක්‍රම 2ක් ක්‍රියාත්මක වේ.

- සරල බහුතර නියෝජන ක්‍රමය
- සමානුපාතික නියෝජන ක්‍රමය

**සරල බහුතර නියෝජන ක්‍රමය**

- මැතිවරණයක දී යම් ඡන්ද කොට්ඨාසයක් සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින් අතරින් වැඩි ම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා අපේක්ෂකයා ජයග්‍රාහී අපේක්ෂකයා ලෙස තෝරා පත් කර ගන්නා ක්‍රමය යි.

**සමානුපාතික නියෝජන ක්‍රමය**

- මැතිවරණයක දී යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා ඉදිරිපත් වන දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායම් විසින් ලබා ගන්නා ඡන්ද ප්‍රමාණයට අනුපාතික ව ආසන හිමි කර ගන්නා වූ ක්‍රමය යි.

**මැතිවරණ සම්බන්ධ ජනතා අයිතිවාසිකම්**

- ඡන්දය පාවිච්චි කිරීම
  (පාලකයින් තෝරා ගැනීමේ අයිතිය)
- දේශපාලන පක්ෂයකට බැඳීම
- දේශපාලන පක්ෂ පිහිටුවීම
- ඡන්ද නාම ලේඛනයට නම ඇතුළත් කර ගැනීම
- ඡන්ද අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීම
- මැතිවරණ ප්‍රචාරණ අයිතිය
- සංවිධානය වීම
- සාධාරණ හේතුමත විවේචනය කිරීම

**මැතිවරණ සම්බන්ධ ජනතා යුතුකම්**

- මැතිවරණවල දී ඡන්දය දීම
- මැතිවරණ නීතිවලට අවනත ව කටයුතු කිරීම
- ප්‍රචණ්ඩ ක්‍රියාවලින් වැළකී සිටීම හා ප්‍රචණ්ඩ ක්‍රියාවලින් වැළකී සිටීමට අනුබල දීම
- බුද්ධිමත් හා සුදුසු පාලකයන් තෝරා ගැනීම
- ජය පරාජය නිහතමානී ව භුක්ති විඳීම
- මැතිවරණ නීතිය ක්‍රියාත්මක කිරීමට අනුබල දීම

# 9.3.1 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක ව පවත්වා ගෙන යාමට සක්‍රිය ව දායක වෙයි.

**නිපුණතා මට්ටම** :- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික අංග ලක්ෂණ විශ්ලේෂණය කරයි.

**ක්‍රියාකාරකම** :- " ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ලක්ෂණ හඳුනා ගනිමු. "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.3.1.1 රූප සටහන (ඇමුණුමට අදාළ රූප සටහන් කලින් සූදානම් කර ගන්න).
- ඇමුණුම 9.3.1.2 කාර්ය පත්‍රිකාව
- $A_4$ කඩදාසි
- ඩිමයි කඩදාසි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.3.1.1**

- ඇමුණුම 9.3.1.1 ට අදාළ ව සපයාගත් පින්තූර පන්තියට ඉදිරිපත් කරන්න.
- එම පින්තූර අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න. ඉන් කියවෙන සුවිශේෂ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ අනාවරණය කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - ජනතාව රටේ පාලනයට සහභාගි කර ගැනීම සඳහා ඡන්ද බලය අවශ්‍ය බව
> - සර්වජන ඡන්ද බලය වැදගත් ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් බව
> - සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමේ දී විවිධ සුදුසුකම් සැලකිල්ලට ගන්නා බව
> - ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තුළ දේශපාලන පක්ෂ වැදගත්වන බව
> - ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ රාශියක් පවතින බව
> - ශ්‍රී ලංකාවේ විවිධ මැතිවරණ පැවැත්වෙන බව
> - ප්‍රජාතාන්ත්‍රවා දී පාලන ක්‍රමයක මැතිවරණ වැදගත් වන බව
> - නීතිය ඉදිරියේ සියලු දෙනාට ම සමාන ව සලකන බව
> - අධිකරණයේ ස්වාධීනත්වය ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක සාර්ථකත්වයට හේතු වන බව

**(මිනිත්තු 10යි)**

## පියවර 9.3.1.2

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 9.4.3.2 හි දැක්වෙන කාර්ය පත්‍රිකා එක බැගින් කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- කාර්ය පත්‍රිකාවලට අදාළ ව සිසුන් වැඩෙහි යොදවන්න.
- සිසුන් අතර ගැවසෙමින් අවශ්‍ය අවස්ථාවල දී සිසුන්ට මඟ පෙන්වන්න.

**(මිනිත්තු 30යි)**

## පියවර 9.3.1.3

- අවශ්‍ය කරුණු වාර්තා කර ගත් පසු සිසුන්ට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම් සමග සාකච්ඡා කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- වැදගත් කරුණු සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු ඉස්මතුවන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට දේශපාලන පක්ෂ දායක වන බව
- ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ සාර්ථකත්වයට නිදහස් මැතිවරණ හේතුවන බව
- ඡන්ද බලය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ වැදගත් අංගයක් බව
- රටක ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක ව ක්‍රියාත්මක වීමට ස්වාධීන අධිකරණයක් පැවතිය යුතු බව
- නීතිය ඉදිරියේ සියලු දෙනාට ම සර්ව සාධාරණත්වය ඉටු විය යුතු බව

**(මිනිත්තු 40යි)**

## තක්සේරුව හා ඇගයීම

- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ නම් කරයි.
- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සාර්ථක පාලන ක්‍රමයක් බව පිළිගනිමින් අදහස් දක්වයි.
- ප්‍රජාතන්ත්‍රවාදී දිවිපෙවෙතකට හුරු වෙයි.
- වාර්තා නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි.
- ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග තම චරිත ලක්ෂණ තුළින් ප්‍රදර්ශනය කරයි.

**ඇමුණුම 9.3.1.1**

**පහත සඳහන් පින්තූර සුදානම් කර ගන්න.**

ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පෙන්නුම් කරන රූප

අදහස් ප්‍රකාශ කිරීම /ඡන්ද බලය / දේශපාලන පක්ෂ

**ඇමුණුම 9.3.1.2**

**කාර්ය පත්‍රිකා**

**01 කණ්ඩායම**

ඔබට දී ඇති ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**නිදහස් හා සාධාරණ මැතිවරණ**

වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල පාලනය සිදු වන්නේ මහජන නියෝජිතයන් මගිනි. නියෝජිතයන් තෝරා ගැනීම සඳහා භාවිත කරන ක්‍රමය මැතිවරණ යනුවෙන් හැඳින් වේ. පාලනය සඳහා මහජන නියෝජිතයන් පත්කර ගැනීමට විවිධ නියෝජන ක්‍රම පවතී. එනම් සරල බහුතර නියෝජන ක්‍රමය හා සමානුපාතික නියෝජන ක්‍රමය යි.

- ජනතාව පාලනයට සහභාගි කරවා ගැනීමට පවත්වන විවිධ මැතිවරණ

  * පාර්ලිමේන්තු මැතිවරණ
  * ජනාධිපතිවරණය
  * ජනමත විචාරණය
  * පළාත් සභා මැතිවරණය
  * පළාත් පාලන මැතිවරණ
    (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා)

මැතිවරණ සම්බන්ධ ජනතා යුතුකම් හා වගකීම් කිහිපයකි. මැතිවරණවල දී නිවැරදි ව ඡන්දය පාවිච්චි කිරීම, ජය පරාජය නිහතමානී ව භුක්ති විඳීම, බුද්ධිමත් ව සුදුසු පාලකයන් තෝරා ගැනීම, ප්‍රචණ්ඩ ක්‍රියාවලින් වැළකී සිටීම හා ප්‍රචණ්ඩ ක්‍රියාවලට අනුබල නොදී ම යනාදිය යි.

1. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මහජන නියෝජිතයන් තෝරා පත් කර ගන්නේ කෙසේ ද?
2. පාලනය සඳහා මහජන නියෝජිතයන් තෝරා ගැනීමට භාවිත කරන නියෝජන ක්‍රම නම් කරන්න.
3. ශ්‍රී ලංකාවේ ජනතාව ඡන්දය පාවිච්චි කරන විවිධ මැතිවරණ නම් කරන්න.
4. සාධාරණ මැතිවරණ ක්‍රමයකට බාධා පැමිණෙන අවස්ථා නම් කරන්න.

**02 කණ්ඩායම**

ඔබට දී ඇති ඡේදය කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## සර්වජන ඡන්ද බලය

1931 දක්වා දේපල හා උගත්කම මත ශ්‍රී ලංකාවේ සීමිත පිරිසකට ඡන්ද බලය හිමි විය. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ වයස අවුරුදු 21 ඉක්ම වූ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම ඡන්ද බලය ප්‍රදානය කරන ලදී.

කිසි ම භේදයකින් තොර ව නියමිත සුදුසුකම් සපුරා ඇති සියලු පුරවැසියන්ට ඡන්ද බලය හිමි වෙයි.

ශ්‍රී ලාංකික පුරවැසියන්ට ඡන්ද බලය හිමි වීම සඳහා තිබිය යුතු සුදුසුකම්

* ශ්‍රී ලාංකික පුරවැසියකු වීම
* වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම
* ඡන්ද ලැයිස්තුවේ නම සඳහන් වීම
* ඡන්ද බලය අහිමි වීමට ලක් වූවෙකු නොවීම

සර්වජන ඡන්ද බලයේ වැදගත්කම

* මහජනතාවට සුදුසු පාලකයන් තෝරා පත් කර ගැනීමටත් නුසුදුසු පාලකයන් ඉවත් කර ගැනීමටත් හැකි වීම
* දේශපාලන සහභාගිත්වය පුළුල් කිරීම
* දේශපාලන දැනුම වර්ධනය කිරීම

යහපත් පුරවැසියෙකු ලෙස ඡන්දය පාවිච්චි කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු කිහිපයකි.

* වංචනික ලෙස ඡන්දය පාවිච්චි නොකිරීම
* අන් අයගේ ඡන්දය පාවිච්චි කිරීමට උත්සාහ නොගැනීම
* ජනතාව බිය වැද්දී ම, තර්ජනය කිරීම ආදී දේවලින් වැළකී සිටීම
* ඡන්ද දූෂණ පිටු දැකීම හා නිවැරදි ව ඡන්දය පාවිච්චි කිරීම

1. සර්වජන ඡන්ද බලය යනු කුමක් ද ?
2. ශ්‍රී ලාංකික පුරවැසියන්ට සර්වජන ඡන්ද බලය ප්‍රදානය කරනු ලැබුවේ කුමන වර්ෂයේ ද?
3. සර්වජන ඡන්ද බලය වැදගත් වන්නේ ඇයි ?
4. යහපත් පුරවැසියකු ලෙස ඡන්දය පාවිච්චි කිරීමේ දී නොකළ යුතු දෑ මොනවා ද?

## 03 කණ්ඩායම

ඔබට දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

### තරගකාරි පක්ෂ ක්‍රමය

ප්‍රජාතන්ත්‍රවාදී රටක දේශපාලන පක්ෂ ක්‍රමයක් තිබීම ඉතා වැදගත් ය. මහජන නියෝජිතයන් සේ පත්වන ඡන්ද අපේක්ෂකයන් මැතිවරණවලට බොහෝ විට ඉදිරිපත් වන්නේ දේශපාලන පක්ෂ මගිනි. දේශපාලන පක්ෂයක් යනු රට පාලනය කිරීම සඳහා නිශ්චිත ප්‍රතිපත්ති මාලාවක් පෙරදැරි කරගෙන ආණ්ඩු බලය ලබා ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක වන කණ්ඩායමකි. ප්‍රජාතන්ත්‍රවාදී රටක මෙවැනි පක්ෂ දෙකක් හෝ වැඩි ගණනක් තිබිය හැකි ය.

බහුතර කැමැත්තෙන් ආණ්ඩුවක් පිහිටුවීමේ දීත්, ජනතා අප්‍රසාදයට පත් වූ ආණ්ඩුවක් බලයෙන් නෙරපීමේ දීත් මිනිසාට දේශපාලන වශයෙන් සංවිධානය වීමේ හැකියාව, නිදහස හා අයිතිවාසිකම් තිබිය යුතු ය. ඒ අයිතිය තහවුරු කරමින් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය, ඕනෑ ම සමාන අදහස් දරන සමාන අවශ්‍යතා ඇති කණ්ඩායමකට සංවිධානය වීමේ නිදහස ලබා දී ඇත. ඒ අනුව තරගකාරී දේශපාලන පක්ෂ ක්‍රමයක පැවැත්ම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යක මූලික ලක්ෂණයක් වේ. ජනතා සහභාගිත්වය ලබා ගැනීම සඳහා දේශපාලන පක්ෂ මගින් ඉටු කරන කාර්ය භාරයක් ඇත. එනම් සමාජය තුළ විසිරී පවතින මහජන මතය ඒකරාශී කිරීම, තරගකාරි ව මැතිවරණවලට ඉදිරිපත් වීම, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට දායක වීම ආදිය යි.

තව ද විවිධ වාර්ගික හා ආගමික ජන කොටස්වලින් සමන්විත සමාජයක් තුළ සෑම ජන කොට්ඨාසයකට ම පිළිගත හැකි ආකාරයේ ජාතික එකමුතු බවක් ඇති කිරීමට ද ක්‍රියා කළ යුතු ය. මේ සඳහා ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා නායකයින් බිහි කරන්නේ පක්ෂ ක්‍රමය තුළිනි.

1. දේශපාලන පක්ෂයක් යනු කුමක් ද?
2. ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක වීමට පක්ෂවලින් ඉටුවන කාර්යභාරය පැහැදිලි කරන්න.
3. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂ කිහිපයක් නම් කරන්න.

**04 කණ්ඩායම**

ඔබට දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**නීතිය ඉදිරියේ සමානාත්මතාව හා අධිකරණයේ ස්වාධීනත්වය**

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක දැකිය හැකි තවත් මූලික ලක්ෂණයක් වන්නේ නීතිය ඉදිරියේ සමානාත්මතාවය හා අධිකරණයේ ස්වාධීන බවයි. නීතිය ඉතා ශ්‍රේෂ්ඨ හා උත්තරීතර දෙයක් ලෙස සලකන අතර "නීතිය ඉදිරියේ සියලු ම මිනිසුන් සමාන ය" යන සංකල්පය අගය කරයි. පොදුවේ නීතිය කාටත් සාධාරණ වීමෙන් සැම දෙනාගේ ම ජීවිත, නිදහස හා අයිතිවාසිකම් එක ම අයුරින් ආරක්ෂා කිරීමට උත්සාහ ගනියි.

මේ සඳහා ස්වාධීන හා නිදහස් අධිකරණයක් ක්‍රියාත්මක වේ. එමගින් නීතිය හා සාමය ආරක්ෂා කිරීමටත්, යුක්තිය පසිඳලීමත්, සාධාරණ ව ඉටු කරනු ලැබේ. අධිකරණය ස්වාධීන ආයතනයක් වන අතර පක්ෂපාතිත්වයෙන් තොර ව සාධාරණය ඉටු කරවා ගැනීමට මෙ තුළින් බලාපොරොත්තු වේ.

වර්තමාන සංකීර්ණ සමාජය තුළ දැනුවත් ව හෝ නොදැනුවත් ව අයිතිවාසිකම් කඩවෙන අවස්ථා එමට ය. ජීවිත හානි කිරීම්, දේපල හානි කිරීම්, රැකියා අහිමි කිරීම්, අයුතු බලපෑම්, මංකොල්ල කෑම්, දූෂණ, වංචා කිරීම් යනාදී වශයෙන් මෙය ඉතා සංකිර්ණ ය. ඒ සඳහා අධිකරණයක් විසින් සාධාරණය ඉටුකිරීමට බැඳී සිටියි.

උසාවි නියෝගයකින් තොර ව කිසි ම කෙනෙකුගේ නිවසක් පරීක්ෂා කිරීමට අයිතියක් නැත. ලිඛිත චෝදනාවක් නොමැති ව කිසි ම පුද්ගලයකු අත් අඩංගුවේ තබා ගත නොහැකි ය. වරදකරුවන්ට හෝ සැකකරුවන්ට කෲර වද හිංසා පැමිණ විය නොහැකි ය. වරදකරුවකු ලෙස පිළිගැනෙන තෙක් සෑම අයකු ම සැකකරුවකු ලෙස සලකනු ලැබේ.

1. ඡේදයේ සඳහන් පරිදි මිනිස් අයිතිවාසිකම් කඩවන අවස්ථා නම් කරන්න.
2. එවැනි අවස්ථාවල ගත හැකි ක්‍රියාමාර්ග නම් කරන්න.

## 9.3.2 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක ව පවත්වා ගෙන යාමට සක්‍රිය ව දායක වෙයි.

**නිපුණතා මට්ටම** :- ජන සමාජයක එක්සත් බව ඇති කිරීමට දේශපාලන පක්ෂ මගින් ඉටු කළ හැකි කාර්ය භාරය අගය කරයි.

**ක්‍රියාකාරකම** :- " දේශපාලන පක්ෂයක කාර්යභාරය හඳුනා ගනිමු. "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.3.2.1 ට අදාළ කාර්ය පත්‍රිකාව
- බ්‍රිස්ල් බෝඩ්
- ෆෙල්ට් පෑන්
- දේශපාලන පක්ෂ කිහිපයක ලාංඡන සපයා ගන්න.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.3.2.1**

- ඔබ සපයා ගත් පක්ෂ ලාංඡන කිහිපය පන්තිය වෙත ඉදිරිපත් කරන්න. එම ලාංඡනවලට අදාළ දේශපාලන පක්ෂ හඳුනා ගැනීමට සලස්වන්න.
- පහත කරුණු ඉස්මතුවන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

- පොදු ප්‍රතිපත්තියක් අරමුණු කරගෙන පාලන බලය ලබා ගැනීම සඳහා එකට එක් වූ කණ්ඩායමක් දේශපාලන පක්ෂයක් ලෙස හැඳින්විය හැකි බව
- ජනාධිපති, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් සභා මන්ත්‍රීවරු, පළාත් පාලන ආයතන නියෝජිතයන් මැතිවරණ මගින් තෝරා පත්කර ගන්නා බව
- එම මැතිවරණ සඳහා අපේක්ෂකයන් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් වශයෙන් මැතිවරණ සඳහා තරග කරන බව
- දේශපාලන පක්ෂ මගින් රටේ පාලන කටයුතු සඳහා විශාල මෙහෙයක් සිදු කළ හැකි බව

**(මිනිත්තු 05යි)**



**පියවර 9.2.1.2**

**පියවර 9.3.2.2**

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට ඇමුණුම 9.3.2.2 හි ඇතුළත් කාර්ය පත්‍රිකා ලබා දෙන්න.
- අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දෙන්න.

**(මිනිත්තු 20යි)**

**පියවර 9.3.2.3**

- එක් එක් කණ්ඩායම් විසින් රැස් කළ තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම් ඉදිරිපත් කරන තොරතුරු පිළිබඳ අදහස් දැක්වීමට සෙසු කණ්ඩායම්වලට අවස්ථාව සලසන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ උදාහරණ දක්වන්න.

- ජනමතය ඒකරාශී කිරීම සඳහා දේශපාලන පක්ෂයකට විශාල කාර්ය භාරයක් ඉටුකළ හැකි බව.
- නායකයන් බිහි කිරීම සඳහා දේශපාලන පක්ෂයකින් විශාල සේවාවක් ඉටු කළ හැකි බව.
- ජන සමාජයක එක්සත් බව සුරැකීමට දේශපාලන පක්ෂවලට දායක විය හැකි බව.
- රටක සංවර්ධනය සඳහා දේශපාලන පක්ෂයකට විශාල කාර්යභාරයක් ඉටු කළ හැකි බව.

**(මිනිත්තු 15යි)**

## තක්සේරුව හා ඇගයීම

- දේශපාලන පක්ෂයක කාර්යභාරය විස්තර කරයි.
- ජන සමාජයේ ප්‍රගමනය සඳහා දේශපාලන පක්ෂයකින් විශාල මෙහෙයක් සිදු වන බව පිළිගනිමින් අදහස් ප්‍රකාශ කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් යුතු ව අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා දායක වෙයි.
- තොරතුරු සෙවීමට හා වාර්තා කිරීමට දායක වෙයි.
- කණ්ඩායම් වාර්තා නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි.

**ඇමුණුම 9.3.2.1**
**කාර්ය පත්‍රිකා**

**කණ්ඩායම 01**

| |
|---|
| ජනමතය ඒකරාශී කිරීම සඳහා දේශපාලන පක්ෂයකට කළ හැකි මෙහෙය |

**කණ්ඩායම 02**

| |
|---|
| නායකයන් බිහි කිරීම සඳහා දේශපාලන පක්ෂයකට ඉටු කළ හැකි මෙහෙය |

**කණ්ඩායම් 03**

| |
|---|
| ජන සමාජයක එක්සත් බව ඇති කිරීමට දේශපාලන පක්ෂයකින් ඉටු කළ හැකි මෙහෙය |

**කණ්ඩායම 04**

| |
|---|
| රටක සංවර්ධනය සඳහා දේශපාලන පක්ෂයකින් සිදු කළ හැකි මෙහෙය |

ඔබ කණ්ඩායමට ලැබී ඇති මාතෘකාවට අනුව වාර්තාවක් සකස් කර පන්තියට ඉදිරිපත් කරන්න.

## 9.3.3 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක ව පවත්වා ගෙන යාමට සක්‍රිය ව දායක වෙයි.

**නිපුණතා මට්ටම** :- ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක යහපත් පුරවැසියෙකු ලෙස තම වගකීම් හා යුතුකම් ඉටු කරයි.

**ක්‍රියාකාරකම** :- " නායකයෙක් තෝරා ගනිමු. "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.3.3.1 හි ඇතුළත් ඡන්ද පත්‍රිකාවක ආකෘතිය
- ආදර්ශ ඡන්ද පත්‍රිකා
- ආදර්ශ ඡන්ද පෙට්ටි
- ඡන්ද පොළ නිලධාරි නිල ලාංඡන
  1. ඡන්ද ස්ථානාධිපති
  2. සහකාර ඡන්ද ස්ථානාධිපති
  3. ලිපිකරු
  4. කාර්යාල කාර්ය සහායක

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.3.3.1**

- භූමිකා රංගනයක් මගින් පන්ති නායක ධුරයට ඉදිරිපත් වන අපේක්ෂකයන්, මෙම ධුරය සඳහා තම සුදුසුකම් පිළිබඳ හැඳින්වීමක් පන්තියට ඉදිරිපත් කරන්න.
- පහත කරුණු ඉස්මතුවන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න

- බුද්ධිමත් ව සිතා බලා නායකයන් තෝරා පත්කර ගත යුතු බව
- සමාජයේ යහපතට කටයුතු කරන නායකයකු තුළ හොඳ ගුණාංග පැවතිය යුතු බව
- ජනතාව නිවැරදි ව ඡන්දය පාවිච්චි කළ යුතු බව

**(මිනිත්තු 10යි)**

**පියවර 9.3.3.2**

- පන්ති කාමරයේ ආදර්ශ ඡන්ද පොළක් සකස් කරන්න.
- ඡන්ද පොළ නිලධාරීන්ට අදාළ රාජකාරි පවරන්න.
- නිල ලාංඡන පැළඳීමට උපදෙස් දෙන්න.
- මැතිවරණය පවත්වන්න.

**(මිනිත්තු 15යි)**

**පියවර 9.3.3.2**

- ඡන්දය ප්‍රකාශ කිරීමට සලස්වන්න.
- සිසුන් ලවා ඡන්ද ගණන් කරවන්න.
- ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන්න.
- අපේක්ෂකයින්ට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  පහත සඳහන් කරුණු ඉස්මතු වන ආකාරයට සමාලෝචනයක යෙදෙන්න.

- ඡන්දය පාවිච්චි කිරීමේ දී බුද්ධිමත් ව සිතා තීරණ ගත යුතු බව
- මැතිවරණ සාමකාමී ව පැවැත්විය යුතු බව
- තෝරා ගන්නා නායකයන් අවංක ව කැපවීමෙන් යුතු ව කටයුතු කළ යුතු බව

**(මිනිත්තු 15යි )**

## තක්සේරුව හා ඇගයීම

- බහුතර කැමැත්ත මත නායකයන් තෝරා ගැනීම පිළිබඳ පැහැදිලි කරයි.
- නායකයන් සතුවිය යුතු වැදගත් ගුණාංග අගය කරයි.
- සාමකාමී ව ඡන්දය ප්‍රකාශ කරයි.
- නායකත්ව ගුණාංග ප්‍රගුණ කරයි.
- නිවැරදි ව නායකයන් තෝරා ගැනීමට පෙළඹෙයි.

ඇමුණුම 9.3.3.1

ඡන්ද පත්‍රිකාවක ආකෘතිය

| | | |
|---|---|---|
| "අ" පක්ෂය | * | |
| "ආ" පක්ෂය | * | |
| "ඉ" පක්ෂය | * | |
| "ඊ" පක්ෂය | * | |
| "උ" පක්ෂය | * | |
| "ඌ" පක්ෂය | * | |
| ස්වාධීන කණ්ඩායම I | * | |
| ස්වාධීන කණ්ඩායම II | * | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| 12 | 14 | 15 | | | | | | | | | |

## 9.3.4 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක ව පවත්වා ගෙන යාමට සක්‍රිය ව දායක වෙයි.

**නිපුණතා මට්ටම** :- ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක යහපත් පුරවැසියෙකු ලෙස තම වගකීම් හා යුතුකම් ඉටු කරයි.

**ක්‍රියාකාරකම** :- " පාලකයන් පත් කර ගැනීම සඳහා ඡන්ද බලය ප්‍රයෝජනයට ගනිමු. "

**කාලය** :- මිනිත්තු 40 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.3.4.1 අදාළ ඡන්ද පොළක චිත්‍රය
- ඇමුණුම 9.3.4.2 මැතිවරණ ප්‍රතිඵලයක ශීර්ෂ පාඨ ඇතුළත් කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 9.3.4.3 ට අදාළ (ඡන්ද පත්‍රිකාව ) කාර්ය පත්‍රිකාව
- ඩිමයි කඩදාසි - මාකර් පෑන්

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.3.4.1**

- ඇමුණුම 9.3.4.1 ට අදාළ ඡන්ද පොළක චිත්‍රය පන්තියට ඉදිරිපත් කරන්න.
  එහි සිදුවන කාර්ය කුමක් ද ?
  යන ප්‍රශ්න සිසුන් වෙත ඉදිරිපත් කර පහත කරුණු ඉස්මතුවන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

- වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජනතාව මහජන නියෝජිතයන් පත් කිරීම මගින් පාලනයට සහභාගි වන බව
- නියමිත සුදුසුකම් සපුරා ඇති අයට ඡන්ද බලය හිමි වන බව
- මහජන නියෝජිතයන් තෝරා පත් කර ගන්නේ ජනතා බහුතර කැමැත්ත මත බව
- ඡන්ද බලය නිවැරදි ව හා බුද්ධිමත් ව භාවිත කළ යුතු බව

**(මිනිත්තු 10යි)**

**පියවර 9.3.4.2**

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට අදාළ කාර්ය පත්‍රිකා ලබා දෙන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.

**(මිනිත්තු 20යි )**

**පියවර 9.3.4.3**

- කණ්ඩායම් විසින් සකස් කරන ලද තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ තොරතුරු පිළිබඳ තවදුරටත් අදහස් දැක්වීමට එම කණ්ඩායමේ සෙසු සාමාජිකයන්ට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම් ඉදිරිපත් කළ තොරතුරු පිළිබඳ කරුණු දැක්වීමට සෙසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන ආකාරයට සමාලෝචනයක යෙදෙන්න.

- ජනතාව පාලනයට සම්බන්ධ කර ගන්නා වූ ප්‍රධාන ක්‍රමවේදය සර්වජන ඡන්ද බලය බව
- ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතින රටවල පුරවැසියන්ට මෙම අයිතිය හිමි වන බව
- ඡන්දය නිවැරදි ව පාවිච්චි කිරීම ප්‍රජතාන්ත්‍රවාදී සමාජයක පුරවැසියන්ගේ යුතුකමක් හා වගකීමක් බව
- බුද්ධිමත් ව සිතා ඡන්දය භාවිත කළ යුතු බව

**(මිනිත්තු 10යි )**

## තක්සේරුව හා ඇගයීම

- ඡන්දය නිවැරදි ව භාවිත කළ යුතු ආකාරය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
- ඡන්දදායකයකු සතු යුතුකම් හා වගකීම් පිළිබඳ විස්තර කරයි.
- ඡන්දය නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම අගය කරයි.
- කණ්ඩායම් වාර්තා නිවැරදි ව ඉදිරිපත් කරයි.
- කණ්ඩායම් තුළ සහයෝගයෙන් කටයුතු කරයි.

**ඇමුණුම 9.3.4.1**

ඡන්ද පොළක දර්ශනයක්



**ඇමුණුම 9.3.4.2**

කාර්ය පත්‍රිකාව

**කණ්ඩායම 01**

මැතිවරණ ප්‍රතිඵලයක ආදර්ශයක් පහත දැක්වේ. එය හොඳින් අධ්‍යයනය කරන්න.

| | | | |
|---|---|---|---|
| * | මැතිවරණ දිස්ත්‍රික්කය | - | |
| * | ලියා පදිංචි ඡන්දදායකයන් සංඛ්‍යාව | - | 452,250 |
| * | ඡන්දය ප්‍රකාශ කළ සංඛ්‍යාව | - | 2,68,220 |
| * | ප්‍රතික්ෂේප වූ ඡන්ද සංඛ්‍යාව | - | 47,620 |
| * | වලංගු ඡන්ද සංඛ්‍යාව | - | 2,20,600 |

මෙම ප්‍රතිඵලය අනුව ඡන්දදායකයන් විසින් පැහැර හැර ඇතැයි සැලකිය හැකි යුතුකම් හේතු දක්වමින් පැහැදිලි කරන්න.

**කණ්ඩායම 02**

මෙහි දැක්වෙන්නේ පාර්ලිමේන්තු මැතිවරණයකට අදාළ ආදර්ශ ඡන්ද පත්‍රිකාවකි. එම පත්‍රිකාව පන්තියට ප්‍රදර්ශනය කර, නිවැරදි ව ඡන්දය ප්‍රකාශ කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.



| | | |
|---|---|---|
| "අ" පක්ෂය | * | |
| "ආ" පක්ෂය | * | |
| "ඉ" පක්ෂය | * | |
| "ඊ" පක්ෂය | * | |
| "උ" පක්ෂය | * | |
| "ඌ" පක්ෂය | * | |
| ස්වාධීන කණ්ඩායම I | * | |
| ස්වාධීන කණ්ඩායම II | * | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| 12 | 14 | 13 | | | | | | | | | |

**කණ්ඩායම 03**

ඡන්දදායකයකු විසින් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් ලැයිස්තුගත කර ඒ පිළිබඳ විස්තරයක් පන්තියට ඉදිරිපත් කරන්න.

# 9.4 පළාත් පාලන ආයතන හා ජනතා සහභාගිත්වය

**(කාලච්ඡේද 06යි)**

## හැඳින්වීම

ජන සම්මතවාදී පාලන ක්‍රමය ආරම්භ වූ යුගයේ සිට ම ජනතාව රටේ පාලනයට සම්බන්ධ කර ගැනීම සඳහා විවිධ ක්‍රම භාවිත කර ඇත. ජන සංඛ්‍යාව වැඩි වීම, ජනතාවගේ ප්‍රශ්න සංකීර්ණ වීම ආදිය හේතු කොට ගෙන ආණ්ඩුවලට ජනතා අවශ්‍යතා ඉටු කිරීම සඳහා එතෙක් ක්‍රියාත්මක වූ වැඩ පිළිවෙළ ප්‍රමාණවත් නොවී ය. මේ නිසා නිර්මාණය වූ එම ප්‍රශ්න සාධාරණ ව හා කාර්යක්ෂම අයුරින් විසඳීම සඳහාත් රටේ පාලනයට හා සංවර්ධන ක්‍රියාවලියට පුරවැසියන් සක්‍රිය ලෙස දායක කර ගැනීම සඳහාත් මධ්‍යම ආණ්ඩුවේ කටයුතු ප්‍රාදේශීය මට්ටමින් විමධ්‍යගත කිරීමේ කාර්ය ය කෙරෙහි අවධානය යොමු විය. වර්තමානයේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන ක්‍රමය ආරම්භ වුයේ මෙම ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් වශයෙනි. මෙම ආයතන නූතන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම පවතින සෑම රාජ්‍යයක ම දැකිය හැකි ය. මෙම ආයතන විශේෂය ප්‍රථමයෙන් සරල ව ආරම්භ වුවත් පසු ව ජනතා සහභාගිත්වය පදනම් කරගත් ආයතන බවට පත් විය.

**නිපුණතාව** : පොදු යහපතට හේතුවන පළාත් පාලන ආයතනවල කටයුතුවලට සහය දක්වයි.

**නිපුණතා මට්ටම්** :

- තම ප්‍රදේශයට පළාත් පාලන ආයතනවලින් සිදුවන සේවා පිළිබඳ විමර්ශනය කරයි.
- පළාත් පාලන ආයතනවල සේවා හා සම්බන්ධ මහජන වගකීම් හා යුතුකම් ඉටු කරයි.
- පළාත් පාලන ආයතනයක සේවා කාර්යක්ෂම ව ඉටු කිරීමට ජනතා සහභාගිත්වයේ ඇති වැදගත්කම අගය කරයි.

**විෂය අන්තර්ගතය** :

### 9.4.1 පළාත් පාලනය හැඳින්වීම

- මධ්‍යම ආණ්ඩුව විසින් පැන වූ හෝ පනවන ලද නීතියක් පදනම් කරගෙන මධ්‍යම ආණ්ඩුවේ පාලනයට හා අධීක්ෂණයට යටත් ව ප්‍රජා සේවා පහසු කිරීම සඳහා නාගරික හා ප්‍රාදේශීය මට්ටමින් පිහිටුවා ඇති ආයතන විශේෂය පළාත් පාලන ආයතන ලෙස හැඳින් වේ.

**පළාත් පාලන ආයතනවල ආරම්භය**

බ්‍රිතාන්‍ය යුගය දක්වා ආරම්භය විහිද යයි

- ක්‍රි.ව. 1865 දී කොළඹ, මහනුවර, ගාල්ල සඳහා මහ නගර සභා පිහිටු වීම
- ක්‍රි.ව. 1871 දී ගම් කාර්ය සභා පිහිටුවීම
- ක්‍රි.ව. 1892 දී සුළු නගර සභා පිහිටුවීම
- ක්‍රි.ව. 1940 දී නගර සභා පිහිටුවීම

**බ්‍රිතාන්‍ය යුගයේ දී පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් පැන වූ පනත් සහ ආඥා (ගුරුවරයාගේ දැන ගැනීම සඳහා)**

- ක්‍රි.ව. 1865 නගර සභා පනත
- ක්‍රි.ව. 1871 ගම් කාර්ය සභා පනත
- ක්‍රි.ව. 1920 අංක 11 දරන පළාත් පාලන ආඥා පනත
- ක්‍රි.ව. 1924 අංක 9 දරන ගම් සභා ආඥා පනත
- ක්‍රි.ව. 1932 අංක 9 දරන ආඥා පනත
- ක්‍රි.ව. 1933 අංක 37 දරන ආඥා පනත
- ක්‍රි.ව. 1938 අංක 60 දරන ගම් කාර්ය සභා ආඥා පනත
- ක්‍රි.ව. 1945 අංක 43 දරන පළාත් පාලන සේවා පනත
- ක්‍රි.ව. 1946 අංක 03 දරන සුළු නගර සභා පනත
- ක්‍රි.ව. 1946 අංක 57 දරන පනත

### 9.4.2 පළාත් පාලනයේ අවශ්‍යතාව

- මධ්‍යම ආණ්ඩුවේ කටයුතු විමධ්‍යගත වීම
- මධ්‍යම ආණ්ඩුවේ ප්‍රජා සේවා කටයුතු විධිමත් ව පවත්වා ගෙන යාම
- රටක පාලන කටයුතු වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වීම
- ප්‍රජා සේවාවන් ජනතාවට පහසුවෙන් ළඟා කළ හැකි වීම
- පාලන ඒකකය තුළ වාසය කරන ජනතාවගේ අවශ්‍යතාවලට අනුකූල ව පාලනය කළ හැකි වීම
- අනාගත දේශපාලන නායකයන් පුහුණු කරන ආයතන වීම
- තරුණ කොටස්වලට රටේ පාලනයට සහභාගී වීමට අවස්ථාව සැලසීම
- රටේ සංවර්ධන ක්‍රියාදාමයට ජනතා සහභාගිත්වය වැඩි කිරීම
- ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කර ගැනීමට පහසු වීම.
- ජාතික ප්‍රතිපත්ති සම්පාදනයේ දී ජනතා සහභාගිත්වය ලබා ගැනීම
- හදිසි අවස්ථාවල දී ප්‍රාදේශීය වශයෙන් ක්ෂණික ව ක්‍රියාත්මක වීමට පහසු වීම

### 9.4.3 පළාත් පාලනයට සම්බන්ධ ආයතන

- නිදහස ලැබූ අවස්ථාවේ සිට ක්‍රි.ව.1980 දක්වා
  - ගම් සභා (579)
  - සුළු නගර සභා (83)
  - නගර සභා (37)
  - මහ නගර සභා (14)

- ක්‍රි.ව. 1980 දී සම්මත කළ අංක 35 දරණ දිස්ත්‍රික් සංවර්ධන සභා පනත
  - ගම් සභා හා සුළු නගර සභා අහෝසි කර දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම
  - දිස්ත්‍රික් සංවර්ධන සභාවල සහභාගිත්වය වැඩි කිරීමට ග්‍රාමෝදය මණ්ඩල හා ප්‍රාදේශීය මණ්ඩල පිහිටුවීම
  - ක්‍රි.ව. 1987 අංක 15 දරණ පනත අනුව දිස්ත්‍රික් සංවර්ධන සභා අහෝසිකර ප්‍රාදේශීය සභා පිහිටුවීම

- ක්‍රි.ව. 1987 න් පසු ව පවතින ආයතන
  - ප්‍රාදේශීය සභා (270)
  - නගර සභා (42)
  - මහ නගර සභා (18)

මහ නගර සභා

(1) කොළඹ
(2) ශ්‍රී ජයවර්ධනපුර
(3) දෙහිවල ගල්කිස්ස
(4) මොරටුව
(5) මහනුවර
(6) කුරුණෑගල
(7) මාතලේ
(8) අනුරාධපුර
(9) රත්නපුර
(10) නුවරඑළිය
(11) මීගමුව
(12) ගම්පහ
(13) ගාල්ල
(14) මාතර
(15) බදුල්ල
(16) කල්මුනේ
(17) මඩකලපුව
(18) යාපනය

### 9.4.4 පළාත් පාලන ආයතනවලට නියෝජිතයන් පත් කර ගැනීම

- සමානුපාතික නියෝජන ක්‍රමයේ විවෘත ලැයිස්තු ක්‍රමය යොදා ගනියි.
- පළාත් පාලන ආයතනවල සීමා තීරණය කිරීම හා නම් කිරීම මධ්‍යම ආණ්ඩුව (පළාත් පාලන අමාත්‍යාංශය) විසින් සිදු කිරීම
- ඒ ඒ ආයතන සඳහා පත්කරගත යුතු නියෝජිතයන් ගණන මැතිවරණ කොමසාරිස් විසින් තීරණය කිරීම

**නියෝජිතයන් පත් කර ගැනීමේ ක්‍රියාවලිය**

පියවර I නාම යෝජනා භාර දීම

- ආයතනයට පත්කර ගත යුතු නියෝජිතයන් සංඛ්‍යාවට අමතර ව තවත් අපේක්ෂකයන් කිහිප දෙනෙකුගේ නම් ලැයිස්තුවට ඇතුළත් කිරීම (මුළු ගණනින් 1/3 ක් හෝ 6ක් යන දෙකෙන් අඩු සංඛ්‍යාව)
- සෑම නාම යෝජනා පත්‍රයක් ම ලැයිස්තුවක් ලෙස ඉදිරිපත් කිරීම
- ඉදිරිපත් කරන අපේක්ෂකයින්ගෙන් 40% ක් අවු : 18-35 ත් අතර විය යුතු වීම
- සෑම අපෙක්ෂකයකු ම ලියාපදිංචි ඡන්දදායකයෙකු වීම
- නාම යෝජනා පත්‍ර නිසි ලෙස සම්පූර්ණ කළ යුතු වීම
- සිංහල අකාරාදි පිළිවෙළට නම් ඇතුළත් කිරීම

පියවර II ඡන්දය ප්‍රකාශ කිරීම

- එක් එක් අපේක්ෂකයන්ට මනාප අංක ලබා දීම
- ඡන්ද දායකයා විසින් කැමති පක්ෂයකට ඡන්දය ප්‍රකාශ කිරීම
- එක් ඡන්ද දායකයෙකුට හිමි මනාප තුන එක් අපේක්ෂකයකුට හෝ අපේක්ෂකයන් දෙදෙනෙකුට හෝ තිදෙනෙකුට ප්‍රකාශ කළ හැකි වීම

පියවර III ජයගාහකයන් ප්‍රකාශයට පත් කිරීම

- එක් එක් කණ්ඩායම් / පක්ෂ ලබාගත් ඡන්ද වෙන් වෙන් ව ගණන් කිරීම
- වැඩි ම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් පක්ෂයට / කණ්ඩායමට ප්‍රසාද ආසන දෙකක් පිරිනැමීම
- ප්‍රකාශිත මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 1/8 (12.5% ) ක් ලබාගත නොහැකි වූ පක්ෂ / කණ්ඩායම් තරගයෙන් ඉවත් කිරීම හා ඔවුන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් අඩු කිරීම
- ඉහත ක්‍රියාවලියෙන් පසු ලැබෙන ඡන්ද සංඛ්‍යාව අදාළ ඡන්ද සංඛ්‍යාව ලෙස හැඳින්වීම.
- අදාළ ඡන්ද සංඛ්‍යාව, එම සභාවට තෝරා ගත යුතු මන්ත්‍රී සංඛ්‍යාවට 2ක් අඩු සංඛ්‍යාවෙන් බෙදීම. එසේ කිරීමෙන් ලැබෙන පූර්ණ ඡන්ද සංඛ්‍යාව සම්ප්‍රයුක්ත ඡන්ද සංඛ්‍යාව ලෙස හැඳින්වීම
- සම්ප්‍රයුක්ත ඡන්ද සංඛ්‍යාවෙන් ඒ ඒ දේශපාලන පක්ෂ හා කණ්ඩායම් ලැබූ ඡන්ද සංඛ්‍යාව වෙන වෙන ම බෙදීම මගින් ඒ ඒ පක්ෂ කණ්ඩායම්වලට හිමි නියෝජිතයන් ගණන තීරණය කිරීම
- තේරී පත් වූ ගණන මුළු මන්ත්‍රීන් ගණනට අඩු වූ විට වැඩි ම ශේෂයට ඉතිරි මන්ත්‍රී ධූර ලබා දීම. එක් එක් පක්ෂ, කණ්ඩායම්වල අපේක්ෂකයන් ලැබූ මනාප ගණන් කිරීම
- මනාප ලබාගත් පිළිවෙළ අනුව මන්ත්‍රී ධූර සඳහා පත් වූ අපේක්ෂකයින් නම් කිරීම

**පියවර 1V පුරප්පාඩු පිරවීම**

- පුරප්පාඩු ඇති වූ විට පක්ෂයේ හෝ කණ්ඩායම් නායකයාගේ අභිමතය පරිදි එය පිරවීමට සුදුසු අයෙකු නම් කිරීම

### 9.4.5 පළාත් පාලන ආයතනවල ව්‍යුහය බලතල හා කාර්ය

**පළාත් පාලන ආයතනවල ව්‍යුහය**

- පළාත් පාලන ආයතනවල පාලන කටයුතු සිදු වන්නේ මහජන නියෝජිතයන් හා රජයේ නිලධාරින්ගේ සහභාගිත්වයෙනි.
- මහජන නියෝජිතයන් ඡන්දයෙන් පත්වන අතර ඔවුහු ජනතාව වෙනුවෙන් පෙනී සිටිති.
- රජයේ නිලධාරින් මගින් පරිපාලන කටයුතු මෙහෙයවයි. පළාත් පාලන ආයතන සියල්ලේ ම බලතල හා කාර්යයන් බොහෝ දුරට එක සමාන ය. නමුත් ඒ ඒ ආයතනවල ව්‍යුහය අනුව සුළු වෙනස්කම් ද දැකිය හැකි ය.

**ප්‍රාදේශීය සභාවක ව්‍යුහය**



**නගර සභාවක ව්‍යුහය**



**මහ නගර සභාවක ව්‍යුහය**




(වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා මෙම පොතේ අග පිටුවල දැක්වෙන ඇමුණුම් X, Y චාට් සටහන් දෙක අධ්‍යයනය කරන්න.)

## පළාත් පාලන ආයතන සතු බලතල

### මහ නගර සභාව

- මුඩබිම්, වැව්, අමුණු, ජලාශ, ගල්වළවල් හා ඉඩම් පිළිබඳ අයිතිය.
- ප්‍රසිද්ධ මාර්ග, වීථි, ඇළ මාර්ග, පාලම්, පොදු වෙළෙඳපොළ, ස්මාරක, නාගරික බෙහෙත් ශාලා, පුස්තකාල, උද්‍යාන හා ගොඩනැගිලිවල අයිතිය
- වත්කම් මිල දී ගැනීම හා විකිණීම
- අතුරු ව්‍යවස්ථා පැනවීම හා සංශෝධනය කිරීම
- පැල්පත් හා අඩු ආදායම් නිවාස පාලනය

### නගර සභාව / ප්‍රාදේශීය සභාව

- මංමාවත් හා ගමනාගමන කටයුතු
- වැටවල්, බඩවැටි හා අගල් පිළිබඳ අයිතිය
- ස්වාභාවික ජල උල්පත් හා ජලාශ පිළිබඳ අයිතිය
- වීථි, ඇළ මාර්ග, විවෘත භූමි භාග, බෙහෙත් ශාලා, පුස්තකාල, පොදු පොළ යනාදියේ අයිතිය.

## පළාත් පාලන ආයතන සතු කාර්ය

### මහ නගර සභාව සතු කාර්ය

- ප්‍රසිද්ධ පාරවල්, ඇළමාර්ග, පාලම්, වතුපිටි, උද්‍යාන, පිට්ටනි, පුස්තකාල, බෙහෙත් ශාලා නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම
- පොදු වෙළෙඳපොළවල් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම, කැළිකසළ හා අපද්‍රව්‍ය බැහැර කිරීම, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු පවත්වාගෙන යාම
- ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීම, ඉදිකිරීම සඳහා අවසර දීම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම.
- පොදු දේපළ ආරක්ෂා කිරීම හා පානීය ජල පහසුකම් සැලසීම
- පොදු නාන ස්ථාන, පොදු වැසිකිළි ඇති කිරීම හා පවත්වාගෙන යාම
- මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා විසින් පවරනු ලබන වෙනත් කාර්යයන් ඉටු කිරීම
- සෞඛ්‍යයට අහිතකර ද්‍රව්‍ය විකිණීම වළක්වාලීම

**නගර සභා / ප්‍රාදේශීය සභා සතු කාර්ය**

- බල ප්‍රදේශය තුළ පවතින ආයතනයට අයත් මාර්ග, ඇළ මාර්ග, පාලම් නඩත්තු කිරීම.
- පුස්තකාල, පෙර පාසල්, වැසිකිළි පහසුකම් ඇති කිරීම හා පවත්වාගෙන යාම
- අඩු අදායම්ලාභී අය වෙනුවෙන් නිවාස පහසුකම් සැපයීම
- බල ප්‍රදේශයේ සංවර්ධන අවශ්‍යතා පිළිබඳ සොයා බැලීම , අවශ්‍ය සැලසුම් සම්පාදනය කිරීම හා ඒවා ක්‍රියාවට නැංවීම
- වෙළෙඳපොළ, රථගාල්, බස්නැවතුම්පොළ, ආදාහනාගාර ආදිය ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම

**පළාත් පාලන ආයතනයක මුදල්**

- පළාත් පාලන ආයතනය සතු අරමුදල්
- අරමුදල් සඳහා මුදල් විවිධ ක්‍රම මගින් ලබා ගැනීම

උදාඃ- - පළාත් සභාවෙන් / රජයෙන් ලැබෙන මුදල්
- වරිපණම්, දඩමුදල්, මුද්දර ගාස්තු
- සේවා සැපයීමෙන්
- විකිණීම හා බදු දීම්, කුලියට දීම්
- පාර්ලිමේන්තු හා පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන ප්‍රතිපාදන

9.4.6 පළාත් පාලන ආයතනවල සේවා සම්බන්ධ මහජන වගකීම් හා යුතුකම්

- පළාත් පාලන ආයතනවලින් මහජන පහසුව සඳහා ඉටු කරනු ලබන කාර්යයන් සේවා වශයෙන් හැඳින්විය හැකි ය.

- මේ කාර්යයන් ඉටු කිරීමට සම්බන්ධ වන පුද්ගලයන් කොටස් දෙකකි.

1. මහජන නියෝජිතයන්
2. නිලධාරීන්

මෙම මහජන නියෝජිතයන්ගේ හා නිලධාරීන්ගේත් සේවාලාභීන් වන මහ ජනතාවගේත් වගකීම් හා යුතුකම් සමූහයක් ඇත.

## මහජන නියෝජිතයන් / නිලධාරීන්ගේ වගකීම් හා යුතුකම්

| වගකීම් | යුතුකම් |
|---|---|
| * ප්‍රදේශයේ සම්පත් හඳුනා ගැනීම<br>* මහජන ගැටලු හා අවශ්‍යතා හඳුනා ගැනීම<br>* අවශ්‍යතාවලට අනුව තීරණ ගැනීම<br>* තීරණ ක්‍රියාත්මක කිරීමේ දී සොයා බැලීම<br>* සංවර්ධන උපාය මාර්ග හඳුනා ගැනීම<br>* නායකත්වය සැපයීම<br>* සැලසුම් සැකසීමට අවශ්‍ය සහය දීම<br>* මහජන අවශ්‍යතා කලට වේලාවට ඉටු කිරීම<br>* නීතිරීතිවලට අනුකූල ව කටයුතු කිරීම<br>* තමන්ට අයත් රාජකාරි නිසි ලෙස ඉටු කිරීම<br>* සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම | * මහජන දුක්ගැනවිලිවලට සවන් දීම<br>* ජනතාව සමග සමීප සබඳතාවයක් පවත්වාගෙන යාම<br>* රැස්වීම්වලට සහභාගි වීම<br>* වංචාව හා දූෂණය වළක්වාලීම<br>* රාජ්‍ය දේපළ අයථා පරිහරණය වළක්වාලීම<br>* කැපවීමෙන් මහජන සුබසිද්ධියට කටයුතු කිරීම<br>* අවංක වීම<br>* ආයතනය ජනතාවට ප්‍රියමනාප ස්ථානයක් බවට පත්කිරීම<br>* දූෂණය හා වංචාව පිටු දැකීම<br>* මහජන අවශ්‍යතා කාර්යක්ෂම ව හා ක්‍රමානුකූල ව ඉටු කරදීම |

**සේවා ලාභීන්ගේ (මහජනතාව) වගකීම් හා යුතුකම්**

| වගකීම් | යුතුකම් |
|---|---|
| * අනිසිලෙස පහසුකම් භුක්ති විඳින්නන් පිළිබඳ තොරතුරු අදාළ අයට දැනුම් දීම<br>* සම්පත් අපතේ යාම වළක්වා ගැනීම.<br>* නීතිරීති වලට ගරු කිරීම<br>* පොදු දේපළ හා පොදු ස්ථාන ආරක්ෂා කිරීම<br>* අනවසර ඉදිකිරීම් නොකිරීම<br>* ඉදිකිරීම් සඳහා අවසර ගැනීම | * පොදු සේවා කටයුතු සඳහා අදාළ නිලධාරීන්ට සහය වීම<br>* කලට වේලාවට බදු ගෙවීම හා බිල්පත් ගෙවීම<br>* කසල හා අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම<br>* පොදු දේපල අරපිරිමැස්මෙන් පරිහරණය කිරීම<br>* අවශ්‍යතා ඉටුකර ගැනීමට නීත්‍යානුකූල මාර්ග ප්‍රයෝජනයට ගැනීම<br>* නිලධාරීන් හා මහජන නියෝජිතයන් සමඟ සුහද ව කටයුතු කිරීම |

## 9.4.1 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- පොදු යහපතට හේතු වන පළාත් පාලන ආයතනවල කටයුතු වලට සහාය දක්වයි.

**නිපුණතා මට්ටම** :- තම ප්‍රදේශයට පළාත් පාලන ආයතනවලින් සිදු වන සේවා පිළිබඳ විමර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** :- " පළාත් පාලන ආයතනවලින් සැපයෙන සේවා සොයා බලමු ."

**කාලය** :- මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 9.4.1.1 ට අදාළ කාර්ය පත්‍රිකාව
- ප්‍රාදේශීය සභා/ නගර සභා / මහනගර සභා යන ආයතන වලින් ඔබට අදාළ ආයතනයක නිලධාරි මහතෙක් දේශනයක් සඳහා (සාකච්ඡා කළ යුතු / අවධාරණය කළ යුතු කරුණු පිළිබඳ කල් ඇති ව දැනුවත් කරන්න.)
  හාෆ්ෂීට් / ඩිමයි / ෆෙල්ට් පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 9.4.1.1**

- පළාත් පාලන ආයතනයක සේවා පිළිබඳ ව බුද්ධිකලම්බන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පළාත් පාලන ආයතනයකින් සිදු වන සේවා එමගින් හඳුනා ගැනීමට අවස්ථාව දෙන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- මෙම ආයතන ප්‍රජා සේවා ඉටු කරන ආයතන බව
- බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙම ආයතන ආරම්භ වූ බව
- මහනගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා වර්තමානයේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන බව
- මෙවැනි ආයතනවලට නියෝජිතයන් තෝරා පත් කර ගන්නේ මහජන ඡන්දයෙන් බව
- ප්‍රාදේශීය සංවර්ධනය සඳහා මෙම ආයතන ක්‍රියා කරන බව
- හදිසි ආපදාවල දී මෙම ආයතන ද ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාකාරි වන බව

**(මිනිත්තු 10 යි )**

**පියවර 9.4.1.2**

- සිසුන් කණ්ඩායම් 4කට බෙදන්න.
- කාර්ය පත්‍රිකා 9.4.1.2 සිසුන්ට ලබා දෙන්න.
- දේශකයාගේ දේශනයට සවන් දී ඒ ඇසුරින් අදාළ කාර්ය පත්‍රිකා සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.
- ආරාධිත දේශකයාට දේශනය සඳහා අවස්ථාව දෙන්න.

**(මිනිත්තු 40යි)**

**පියවර 9.4.1.3**

- එක් එක් කණ්ඩායම් තම කාර්යය පත්‍රිකාවට අදාළ ව රැස්කරගත් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- සෙසු කණ්ඩායම්වල අදහස් විමසන්න.
- ප්‍රබලතා අගයමින් පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- තමා ජීවත් වන ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය කුමක්දැ යි දැනගත යුතු බව
- ප්‍රජා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා හමුවිය යුතු නිලධාරීන් නිවැරදි ව හඳුනාගත යුතු බව
- පළාත් පාලන ආයතනයකින් ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රජා සේවා රාශියක් ඉටුවන බව
- පළාත් පාලන ආයතන මගින් ප්‍රජා සංවර්ධනය සඳහා වැඩ සටහන ක්‍රියාත්මක වන බව
- මහජන නියෝජිතයන් ජනතාවගේ සුබ සාධන කටයුතු ඉටු කළ යුතු බව
- මහජනතාව හා නියෝජිතයන් අතර පවතින අන්‍යොන්‍ය සබඳතාව පදනම් කරගෙන ප්‍රදේශය සංවර්ධනය වන බව

**(මිනිත්තු 30යි)**

## තක්සේරුව හා ඇගයීම

- තම පාසල් බල ප්‍රදේශය අයත් වන පළාත් පාලන ආයතනයේ කාර්යය විස්තර කරයි.
- පළාත් පාලන ආයතනය මගින් සමාජයට සිදු වන සේවය පිළිබඳ අභිමානයෙන් කථා කරයි.
- පළාත් පාලන ආයතනවල කාර්යභාරය වගු ගත කරයි.
- අවධානයෙන් හා අවබෝධයෙන් සවන් දෙයි.
- පැවරූ කාර්ය නිසි ලෙස ඉටු කිරීමට සහාය වෙයි.

ඇමුණුම 9.4.1.1

# කාර්ය පත්‍රිකා

**කණ්ඩායම 01**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ පහත දැක්වෙන තොරතුරු දේශනය ඇසුරින් එක්රැස් කිරීමයි.

- දේශනයෙන් කියැවෙන පළාත් පාලන ආයතනය කුමක් ද?
- ආයතන ප්‍රධානියාගේ නිල නාමය කුමක් ද?
- ප්‍රධාන පරිපාලන නිලධාරියාගේ නිල නාමය කුමක් ද?
- එම ආයතනයේ පරිපාලනය සඳහා පත්කර ඇති නිලධාරීන්ගේ තනතුරු කීපයක්
- මහජන නියෝජිතයන් ආණ්ඩු පක්ෂය හා විරුද්ධ පක්ෂය ලෙස වෙනස්වන ආකාරය හඳුනා ගන්නා ආකාරය

**කණ්ඩායම 02**

දේශනයට හොඳින් සවන් දී පහත දැක්වෙන කාර්යය ඉටු කරන්න.

* අදාළ පළාත් පාලන ආයතනය මගින් ඉටු කරන ප්‍රජා සේවා ලැයිස්තුවක් සකසන්න.
* එම ආයතනය මගින් ඉටුකර ඇති හා යෝජිත ප්‍රජා සංවර්ධන කටයුතු වෙන වෙන ම ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම් 03**

දේශනයට අවධානයෙන් සවන් දෙන්න. අදාළ පළාත් පාලන ආයතනයේ, මහජන නියෝජිතයන්ගෙන් ඉටුවන කාර්යයන් පෙළ ගස්වන්න.

**කණ්ඩායම 04**

දේශනයට අවධානයෙන් සවන් දෙන්න. පළාත් පාලන ආයතනවල සේවා හා සම්බන්ධ මහජනතාවගේ වගකීම් හා යුතුකම් වෙන වෙන ම සටහන් කරන්න.

# 9.4.2 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- පොදු යහපතට හේතුවන පළාත් පාලන ආයතනවල කටයුතුවලට සහය දක්වයි.

**නිපුණතා මට්ටම** :- පළාත් පාලන ආයතනවල සේවා හා සම්බන්ධ මහජන වගකීම් හා යුතුකම් ඉටු කරයි.

**ක්‍රියාකාරකම** :- " පළාත් පාලන ආයතනවලින් ලබා දෙන පහසුකම් ඵලදායී ව ප්‍රයෝජනයට ගනිමින් තම යුතුකම් හා වගකීම් ඉටු කරමු ."

**කාලය** :- මිනිත්තු 40 යි

**ගුණාත්මක යෙදවුම්** :-
- ඇමුණුම 9.4.2.1 ට අදාළ තොරතුරු පත්‍රිකාව
- ඇමුණුම 9.4.2.2 ට අදාළ කාර්ය පත්‍රිකාව
- ඩිමයි කොළ, ෆෙල්ට් පැන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.4.2.1**

- ඇමුණුම 9.4.2.1 ට අදාළ තොරතුරු පත්‍රිකාව ඉදිරිපත් කර අනාවරණය කරගත් කරුණු ඇසුරින් බුද්ධිකලම්බන සාකච්ඡාවක යෙදෙන්න.
- පහත කරුණු ඉස්මතු වන ආකාරයට සාකච්ඡාව මෙහෙයවන්න.

| |
|---|
| • එදිනෙදා ජන ජීවිතය යහපත් කර ගැනීමට පළාත් පාලන ආයතන මගින් විශාල සේවයක් ඉටු කරන බව<br>• පළාත් පාලන ආයතනය මගින් ඉටු කරන සේවයෙහි වැදගත්කම ජනතාව විසින් වටහා ගතයුතු බව<br>• පළාත් පාලන ආයතන මගින් ඉටු කරන කාර්ය සාර්ථක වීමට නම් පුරවැසියන් විසින් තම වගකීම් හා යුතුකම් නිසි ලෙස ඉටු කළ යුතු බව |

**(මිනිත්තු 10යි )**

**පියවර 9.4.1.2**

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට ඇමුණුම 9.4.2.2 ට අදාළ කාර්ය පත්‍රිකාව ලබා දෙන්න.
- අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දෙන්න.

**(මිනිත්තු 20 යි)**

**පියවර 9.4.2.3**

- කාර්ය පත්‍රිකාවට අදාළ ව කණ්ඩායම් විසින් රැස් කළ තොරතුරු පන්තිය වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන තොරතුරු පිළිබඳ අදහස් දැක්වීමට සෙසු කණ්ඩායම්වලට අවස්ථාව සලසා දෙන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • ජනතාවගේ යහපත වෙනුවෙන් පළාත් පාලන ආයතන ඇප කැප වී කටයුතු කරන බව<br>• පළාත් පාලන ආයතනවලින් ඉටු කරනු ලබන සේවා පිළිබඳ නිරතුරු ව ජනතාව දැනුවත් විය යුතු බව<br>• පළාත් පාලන ආයතනවලින් ඉටුකරන ලද සේවා යම් දිනෙක අඩාල වුවහොත් එනිසා ජන ජීවිතයට විශාල බලපෑමක් සිදුවන බව<br>• එම නිසා පළාත් පාලන ආයතනවලින් ඉටු කරනු ලබන සේවා සම්බන්ධයෙන් ජනතා වගකීම් හා යුතුකම් නොපිරිහෙලා ඉටු කළ යුතු බව |

**(මිනිත්තු 10යි)**

## තක්සේරුව හා ඇගයීම

- පළාත් පාලන ආයතන හා සම්බන්ධ ජනතා වගකීම් හා යුතුකම් නම් කරයි.
- පළාත් පාලන ආයතනවලින් ඉමහත් සේවයක් ඉටු කරන බව පිළිගෙන අදහස් ප්‍රකාශ කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සාමූහික ව ඉටු කරයි.
- පළාත් පාලන ආයතනවල සේවය හා සම්බන්ධ වගකීම් හා යුතුකම් ඉටු කිරීමට පෙළඹෙයි.
- පළාත් පාලන ආයතනවල වගකීම් හා යුතුකම් ඉටු කිරීමට අන් අයට සහයෝගය දක්වයි.

**9.4.2.1 ට අදාළ තොරතුරු පත්‍රිකාව**

ප්‍රජා සේවා පහසු කිරීම සඳහා නාගරික හා ප්‍රාදේශීය මට්ටමින් පළාත් පාලන ආයතන පිහිටුවා ඇත. මධ්‍යම ආණ්ඩුවේ කටයුතු විමධ්‍යගත වීමටත්, ප්‍රජා සේවා කටයුතු විධිමත් ව පවත්වා ගෙන යාමටත් රටක පාලන කටයුතු වඩා ප්‍රජාතන්ත්‍රවාදී වීමටත් පළාත් පාලන ආයතන අවශ්‍ය වේ. එපමණක් නොව ප්‍රජා සේවාවන් ජනතාවට පහසුවෙන් ළඟාකර ගැනීමට ද පළාත් පාලන ආයතන තිබීම අවශ්‍ය ය. එමෙන් ම රටේ සංවර්ධන ක්‍රියාදාමයට ජනතා සහභාගිත්වය වැඩි කිරීමටත් පළාත් පාලන ආයතන අවශ්‍ය ය.

පළාත් පාලන ආයතන මගින් විශාල සේවාවක් ඉටු වේ. පාරවල්, ඇළමාර්ග, පාලම්, වතුපිටි, උද්‍යාන, පිට්ටනි, පුස්තකාල, බෙහෙත් ශාලා නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම, පොදු වෙළෙඳ පොළවල් ආරම්භ කිරීම හා පවත්වා ගෙනයාම ආදී සේවාවන් ඒ අතර වැදගත් වේ.

පළාත් පාලන ආයතනවල කාර්යයන් සාර්ථක වීමට නම් පුරවැසියන් විසින් තම වගකීම් හා යුතුකම් නිසි ලෙස ඉටු කළ යුතු ය.

**ඇමුණුම 9.4.2.2**

**කණ්ඩායම 01**

| |
|---|
| සෞඛ්‍ය, සනීපාරක්ෂක සේවා හා කැළි කසල බැහැර කිරීම පිළිබඳ ජනතාවගෙන් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් |

**කණ්ඩායම 02**

| |
|---|
| ජල සම්පාදනය, බෙදා හැරීම, වීථි ලාම්පු නඩත්තුව පිළිබඳ ජනතාවගෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් |

**කණ්ඩායම් 03**

| |
|---|
| වරිපණම් බදු ගෙවීම සම්බන්ධයෙන් ජනතාවගෙන් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් |

**කණ්ඩායම 04**

| |
|---|
| පොදු වෙළෙඳපොළ, පුස්තකාල, තොටුපලවල්, ආදිය පිළිබඳ ජනතාවගෙන් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් |

**කණ්ඩායම 05**

| |
|---|
| ප්‍රසිද්ධ පාරවල්, ඇළ මාර්ග නඩත්තුව පිළිබඳ ජනතාවගෙන් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් |

## 9.4.3 ක්‍රියාකාරකම

**නිපුණතාව** :- පොදු යහපතට හේතුවන පළාත් පාලන ආයතනවල කටයුතුවලට සහය දක්වයි.

**නිපුණතා මට්ටම** :- පළාත් පාලන ආයතනයක සේවා කාර්යක්ෂම ව ඉටු කිරීමට ජනතා සහභාගිත්වයේ ඇති වැදගත්කම අගය කරයි.

**ක්‍රියාකාරකම** :- " පළාත් පාලන ආයතනවල සේවා කාර්යක්ෂම ව ඉටු කිරීමට සහාය වෙමු ."

**කාලය** :- මිනිත්තු 80 යි.

**ගුණාත්මක යෙදවුම්** :-

- පළාත් පාලන ආයතන මගින් ඉටුවන සේවා දැක්වෙන චිත්‍ර හෝ තොරතුරු පත්‍රිකාවක් සපයා ගන්න.
- ඇමුණුම 9.4.3.1 ට අදාළ කාර්ය පත්‍රිකාව
- ඩිමයි /බ්‍රිස්ල් බෝඩ්

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 9.4.3.1**

- සපයාගත් චිත්‍ර හෝ පිංතුර හෝ තොරතුරු පත්‍රිකා ප්‍රදර්ශනය කරන්න.
- එය නිරීක්ෂණයට ප්‍රමාණවත් වේලාවක් ලබා දෙන්න.
  පහත කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න

- පළාත් පාලන ආයතනවලින් ජනතාවගේ සුබ සිද්ධිය සඳහා විවිධ සේවා සපයන බව
- එම සේවා භුක්ති විඳීමේ දී මහජනතාව ඒවා නිසි ලෙස පරිහරණය කරමින් ඒවා ආරක්ෂා කිරීමට දායක විය යුතු බව
- ඒ ඒ ආයතනවල නිලධාරීන් ද අදාළ පහසුකම් හා සේවා නිසි ලෙස ලබා දී ජනතාවට සේවා සැපයිය යුතු බව

**(මිනිත්තු 10යි )**

**පියවර 9.4.3.2**

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 9.4.3.2 අදාළ කාර්ය පත්‍රිකා කණ්ඩායම්වලට ලබා දෙන්න.
- අදාළ සම්පත් සපයා දෙමින් කාර්යයෙහි නිරත කරවන්න.
- අවශ්‍ය අවස්ථාවල ගුරු මගපෙන්වීම් හා උපදෙස් ලබා දෙමින් වාර්තා සැකසීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- වාර්තා ඉදිරිපත් කිරීමට සුදානම් කරවන්න.

**(මිනිත්තු 30 යි)**

**පියවර 9.4.3.3**

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම් පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට සෙසු අයට අවස්ථාව දෙන්න.
- සිසු ප්‍රබලතා අගය කරමින් පහත කරුණු ඉස්මතුවන සේ සමාලෝචනයක යෙදෙන්න.

- පළාත් පාලන ආයතන මගින් පොදු ජනතාවගේ යහපතට විවිධ සේවා සපයන බව
- ඒවා ලබා ගන්නා සේවාලාභීන් විසින් ඒවා නිසි ලෙස පරිහරණය කිරීම, බදු ගෙවීම හා නියමිත ගාස්තු ගෙවීම සිදු කළ යුතු බව
- සේවය නිසි ලෙස ලබා දීම සඳහා කටයුතු කිරීම සේවාදායකයන්ගේ වගකීමක් බව
- බල ප්‍රදේශයේ පවිත්‍රතාව, ආරක්ෂා කර ගැනීමට සේවාදායකයන් හා සේවාලාභීන් ක්‍රියා කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න පවිත්‍ර පරිසරයක් නිර්මාණය වන බව
- පුස්තකාල, ආරෝග්‍යශාලා, ක්‍රීඩා පිටි, බස්නැවතුම්පොළ, ආදාහනාගාර, මහජන පොළ ආදී සේවා පවත්වාගෙන යාම පළාත් පාලන ආයතනවල වගකීමක් බව
- ඒ වෙනුවෙන් තම යුතුකම් හා වගකීම් ඉටු කිරීම සේවාලාභීන්ගේ කාර්යයක් වන බව

**(මිනිත්තු 40යි)**

## තක්සේරුව හා ඇගයීම

- පළාත් පාලන ආයතනවලට සම්බන්ධ සේවාදායකයන් හා සේවාලාභීන් තම වගකීම් හා යුතුකම් නිසි ලෙස ඉටු කළ යුතු බවට අදහස් දක්වයි.
- ඒ ඒ සේවා සැපයීමේ දී සේවා දායකයන්ගේ හා සේවාලාභීන්ගේ වගකීම් මෙන් ම යුතුකම් වගුගත කරයි.
- සේවා භුක්ති විඳීමේ දී ඒවා නිසි ලෙස පවත්වාගෙන යාමට දායක වෙයි.
- කණ්ඩායම තුළ සහයෝගයෙන් කටයුතු කරයි.
- සමාජයීය යුතුකම් ඉටු කිරීමට පෙළඹෙයි.

ඇමුණුම 9.4.3.1 කාර්ය පත්‍රිකා

**1 කණ්ඩායම**

ඔබ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන පුස්තකාලයේ, සේවා ලබන්නන් ලෙස ඔබගේ වගකීම හා පුස්තකාලයාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයේ වගකීම ඇතුළත් කොට පහත වගුව සම්පූර්ණ කරන්න.

| පුස්තකාල සේවාලාභීන්ගේ වගකීම | ආයතන නිලධාරීන්ගේ වගකීම හා බැඳුණු කාර්යයන් |
|---|---|
| | |

**2 කණ්ඩායම**

ඔබ ජීවත්වන ප්‍රදේශයේ වසංගත රෝග පැතිරීම වැළැක්වීම හා නිවාරණය සඳහා පළාත් පාලන ආයතනයට ඇති වගකීම හා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවකු ලෙස ඔබට ඇති වගකීම වෙන වෙන ම සටහන් කරන්න

වසංගත රෝග පැතිරීම වැළැක්වීම හා නිවාරණය

| පළාත් පාලන ආයතනයට පැවරී ඇති වගකීම | සේවාලාභීන්ට පැවරී ඇති වගකීම හා බැඳුණු කාර්යයන් |
|---|---|
| | |

**3 කණ්ඩායම**

පළාත් පාලන බල ප්‍රදේශයේ කැළිකසළ බැහැර කිරීම සඳහා පළාත් පාලන ආයතනයට ඇති වගකීම හා බල ප්‍රදේශයේ ජීවත් වන්නකු ලෙස ඔබට ඇති වගකීම් වගුවේ සටහන් කරන්න.

| පළාත් පාලන ආයතනයේ වගකීම් | සේවාලාභීන්ගේ වගකීම් |
|---|---|
| ........................................................ | .................................................. |
| ....................................................... | .................................................. |
| ....................................................... | ................................................. |

ඇමුණුම X

පළාත් පාලන ආයතනයක ව්‍යුහය

(උදාඃ- මහ නගර සභාවක සංවිධාන ව්‍යුහ ආදර්ශයකි)



ඇමුණුම Y

ප්‍රාදේශීය සභාවක සංවිධාන ව්‍යුහ ආදර්ශයකි.



# තක්සේරුව හා ඇගයීම

## හැඳින්වීම

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම සඳහාත් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩ සටහන් දෙකක් ලෙස තක්සේරුව හා ඇගයීම හඳුන්වා දිය හැකි ය. තක්සේරුව නිසි පරිදි සිදු වන්නේ නම් පන්තියේ ඉගෙනුම් ලබන සියලු ම සිසුන්ට, අපේක්ෂිත නිපුණතාවන්ට අදාළ ආසන්න ප්‍රවීණතාව ලබා ගැනීම අපහසු නොවේ. ඇගැයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් කවරේදැයි හඳුනා ගැනීමට ය.

තක්සේරුවේ යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (FEED BACK) හා ඉදිරි පෝෂණය (FEED FORWARD) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කර ගත් විට ඔහුන්ගේ ඉගෙනුම් ගැටලු මඟ හරවා ගැනීමට ප්‍රතිපෝෂණය, සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත්විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණය ලබා දීම ගුරු කාර්යය වේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා විෂයයේ නිපුණතා අතුරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වුයේ දැයි සිසුන් විසින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඇගයීම් වැඩ පිළිවෙළ සිසු සාර්ථකත්වය ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු අදාළ පාර්ශ්වයන්ට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු වේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂයමාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය (STUDENT - CENTRED) නිපුණතා පාදක ( COMPENTENCY - BASED) ක්‍රියාකාරකම් දිශාභිමුඛ (ACTIVITY ORIENTED) කර ගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා ක්‍රියාවෙන් ඉගෙනුම, ගුරුවරයාගේ පරිණාමන භූමිකාවේ (TRANSFORMATION ROLE ) හරය වේ.

පූර්වයෙන් සංවර්ධනය කළ ක්‍රියාකාරකම් සමූහයක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂයමාලාවේ ඉගෙනුම් හා ඉගැන්වීම, තක්සේරුව හා ඇගයීම සමග සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම්වල දෙවැනි පියවරේ දී සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන විට ඔවුන් තක්සේරු කිරීමටත් ක්‍රියාකාරකම්වල තුන්වැනි පියවරේ දී සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කිරීමට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත් ගුරුවරයාට හැකි වේ. සිසුන් ගවේෂණයේ යෙදෙන විට සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් සිසුන් මුහුණපා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සපයා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.

තක්සේරුව හා ඇගයීම පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ. මෙම නිර්ණායක අතරෙන් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතාව ගොඩ නැගීමට ඒකරාශී වී තිබෙන දැනුම, කුසලතා හා ආකල්ප මූලික කොටගෙන සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා දෙකක් ප්‍රගුණ කර ගැනීමට සිසුන්ට උපකාරී වේ. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් සහ පන්ති කාමරය තුළ දී සිසුන් ක්‍රියාත්මක වීමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර තක්සේරුව යටතේ එම චර්යා ශක්තිමත් කිරීමත් ඇගයීම යටතේ ඒවා ප්‍රමාණය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු ය.

ඇගයීම් වැඩපිළිවෙළ වැඩි දියුණු කිරීමෙන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පුළුල් කළ හැකි ය. ඒ ක්‍රියාකාරකම් සන්නතිය ( ACTIVITY CONTINUM ) ඔස්සේ ඇගයීම් අවස්ථා කිහිපයක ඇති කිරීමට ගුරුවරයාට අවස්ථාව ඇත. ඇගයීම් ලක්ෂ්‍ය ( EVALUATION POINTS ) හඳුනා ගැනීමට පහසු වන පරිදි ක්‍රියාකාරකම් සන්නතිය, පොකුරු ක්‍රියාකාරකම් (ACTIVITY CLUSTER) කිහිපයකට වෙන් කිරීමෙන් ඇගයීම් වැඩ පිළිවෙළ අර්ථවත් කළ හැකි ය. සෑම ක්‍රියාකාරකම් පොකුරක් ආරම්භයේ දී ඒ ඒ ක්‍රියාකාරකම් සඳහා ගන්නා ඇගයීම් උපකරණ කවරේ දැයි සිසුන්ට හඳුන්වා දීම අවශ්‍ය වේ. ඇගයීම් ප්‍රභේද තෝරා ගැනීමේ දී සිසු ඉගෙනුම් පෙළඹවීම විකසිත කරවන ප්‍රබෝධමත් ක්‍රියාකාරකම් යොදා ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙයට අදාළ ක්‍රියාකාරකම් ලැයිස්තුවක් මතු දැක්වේ.

සංකල්ප සිතියම් (CONCEPT MAPS )

බිත්ති පුවත්පත් (WALL NEWS PAPERS)

ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් (QUIZZIES)

ප්‍රශ්න සහ පිළිතුරු පොත් (QUESTION AND ANSWER BOOKS)

ශිෂ්‍ය කාර්ය සාධක ගොනු (PORTFOLI OS )

සිසු නිර්මාණ ප්‍රදර්ශනය (EXHIBITIONS )

විවාද (DEBATES )

සාකච්ඡා මණ්ඩල (PANEL DISCUSSIONS )

සම්මන්ත්‍රණ (SEMINARS )

ක්ෂණික කතා (IMPROMPTU SPEECHES )

භූමිකා රංගන (ROLE PLAYS )

සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම (PRESENTATION OF LITERATURE REVIEWS )

ක්ෂේත්‍ර පොත්, ස්වභාව අධ්‍යයනය දින පොත්, හොඳ වැඩ පොත් (FIELD BOOK, NATURE DIARIES )

ප්‍රායෝගික පරීක්ෂණ (PRACTICAL TESTS )

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ තුන්වන කොටස යෝජිත ඇගයීම් ලක්ෂ්‍යයක් හා ඒ සඳහා තෝරා ගෙන ඇති ඇගයීම් උපකරණය හඳුන්වා දීමට සැලසුම්කර තිබේ. මේ ආකාරයට ක්‍රියාකාරකම් තුළත් ඒවා අතරත් ඇගයීම් දෙයාකාරයකින් සිදු කිරීමෙන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් පුළුල් වන අතර කැමැත්තෙන් හා ප්‍රබෝධයෙන් ඉගෙනුමෙහි නියැලීමට සිසුන්ට හැකි වේ.

මෙයට අමතර ව පන්ති කාමරය තුළ ලිඛිත පරික්ෂණ ව්‍යාපෘති වැඩ ආදිය හා වසර අවසානයේ පවත්වන පාසල් මට්ටමේ හෝ කලාපීය මට්ටමේ ලිඛිත පරීක්ෂණයකට සිසුන් ඉදිරිපත් කළ හැකි ය.

එමෙන් ම වාර අවසානයේ ඇගයීම සඳහා සපයා ඇති ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණ භාවිත කරන්න.

1.0 ස්වයං තක්සේරුව

පාඩමට අදාළ ව නිපුණතා පදනම් කර ගෙන ස්වයං තක්සේරුකරණයක් සැලසුම් කිරීම, අදාළ පාඩම ඉගැන්වීමට ප්‍රථම සිසුන් ඒ පිළිබඳ ව දක්වන මත, අදහස්, ආකල්ප, පාඩම හෝ වාරය අවසානයේ සිසුන් අදාළ තේමාවන් පිළිබඳ ව දක්වන අදහස් ආකල්ප සංසන්දනාත්මක ව තක්සේරු කළ හැකි ය. තම ප්‍රබලතා හා දුබලතා මෙකී ස්වයං තක්සේරුවෙන් අවබෝධ කර ගැනීම අපේක්ෂා කෙරේ. අදාළ නිර්ණායක පාසලේ ඇති මානව හා භෞතික සම්පත් ද අවධානයට යොමු කරමින් ගුරුවරයාගේ අභිමතය පරිදි තක්සේරුකරණය හා ඇගයීම සඳහා අදාළ නිර්ණායක හඳුනා ගත හැකි ය.

2.0 සමවයස් ඇගයීම

යම් කාර්යයක් එක් එක් කණ්ඩායමකට පවරා අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට සිසුන් දක්වන දායකත්වය, සංවිධානය, අන්තර් පුද්ගල සම්බන්ධතා, සැලසුම් කිරීම ආදී විවිධ නිර්ණායක පදනම් කර ගෙන ඇගයීම් කටයුතු කළ හැකි ය. කාර්ය අවසානයේ අදාළ කණ්ඩායම්වලට උපස්ථම්භනය, ඇගයීම, ත්‍යාග ආදිය පිරිනැමීම වැදගත් වේ.

3.0 කාර්ය සාධක ගොනු පවත්වා ගෙන යාම

- වාරය ආරම්භයේ දී කාර්ය සාධන ගොනු සැකසීම පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබා දීම
- වාරය මැද දී අදාළ කාර්යය පරීක්ෂා කර ප්‍රතිපෝෂණය ලබා දීම
- අවසාන ඇගයීම සඳහා පහත සඳහන් නිර්ණායක භාවිත කිරීම යෝග්‍ය වේ.
    - උපදෙස් පිළිපැදීම
    - සංවිධානාත්මකබව
    - නිර්මාණශීලීත්වය
    - අදාළ සංකල්ප නිපුණතා අවබෝධ කරගෙන ඇත් ද යන්න අවසාන වශයෙන් ප්‍රදර්ශනය වේ ද යන්න නිගමනය කිරීම.

4.0 ව්‍යාපෘති ඇගයීම

- වාරයක් අවසානයේ කුඩා ව්‍යාපෘතියක්, කේවල හෝ කණ්ඩායම් වශයෙන් ක්‍රියාත්මක කිරීම මේ සඳහා නිර්ණායක අභිමත පරිදි සැකසිය හැකි වේ.

5.0 විධිමත් ඇගයීම

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂයට අදාළ මූලික සංකල්ප, වාර අවසාන පරීක්ෂණයකින් තක්සේරුව හා ඇගයීම කළ යුතු ය. ජීවන අවස්ථා / සිද්ධි ආදිය ඇසුරින් නිපුණතා ප්‍රගුණ කරගෙන ඇති ආකාරය ඇගයීමකට ලක් කළ යුතු ය.

විෂය භාර ගුරු මහත්ම මහත්මීන් විසින් පාසල පදනම් කර ගත් ඇගයීම් කාර්යය සංවිධානය කිරීම මැනවි. ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකසන ලද පාසල පදනම් කර ගත් ඇගයීම් පටිපාටියට අනුව ඇගයීම් කටයුතු සංවිධානය කිරීම අපේක්ෂා කෙරේ.

පාසල් මට්ටමින් කලාප මට්ටමින්, පළාත් මට්ටමින් පැවැත්වෙන මධ්‍ය වාර්ෂික හා වර්ෂ අවසාන පරීක්ෂණයට සිසුන් ඉදිරිපත් කොට ඔවුන්ගේ දැනුම, අවබෝධය, භාවිතය හා ඉහළ මට්ටම්වල ඉගෙනුම් හැකියා මැන බැලීමට පුළුවන.

එක් එක් ඒකකයට නියමිත කාල පරිච්ඡේද සංඛ්‍යාවෙන් 50% පමණ පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ ආශ්‍රිත ව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීම සුදුසු ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම් උපකරණය - 1

1. **ඇගයීම් අවස්ථාව** :- 1 වන වාරය

2. **ආවරණය කෙරෙන නිපුණතා** :- සාමුහික ක්‍රියාකාරිත්වය තුළින් සමාජ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට ක්‍රියාකාරී ව දායක වෙයි.

3. **අවධාරණය කෙරෙන නිපුණතා මට්ටම් :-**

   - සමාජ සුරක්ෂිතතාව කෙරෙහි පුද්ගල යුතුකම් හා වගකීම් ඉටු කරයි.
   - සමාජ සුරක්ෂිතතාවට දායකවන විවිධ ආයතන හඳුනාගෙන අභිමානවත් පුරවැසියෙකු ලෙස සහයෝගයෙන් කටයුතු කරයි.
   - සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ වී සහජීවනයෙන් යුතු පුරවැසියෙකු ලෙස කටයුතු කරයි.

4. **ඇගයීම් උපකරණයේ ස්වභාවය (ඇගයීම් ප්‍රභේදය):-** පැවරුම (පොත් පිංචක් සකස් කිරීම)

5. **ගුණාත්මක යෙදවුම්** :- කාර්ය පත්‍රිකා

6. **ඇගයීම් උපකරණයේ අරමුණු** :-

   - සමාජ සුරක්ෂිතතාව හඳුනා ගනියි.
   - සමාජ සුරක්ෂිතතාව සඳහා දායක වන ආයතන නම් කරයි.
   - සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා යොදා ඇති යාන්ත්‍රණ, නීතිරීති හා බැඳුණු පුද්ගල වගකීම් හඳුනාගෙන කටයුතු කරයි.
   - සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ වී සහජීවනයෙන් යුතු පුරවැසියෙකු ලෙස කටයුතු කරයි.

7. **ඇගයීම් ක්‍රියාත්මක කිරීමට උපදෙස්** :-

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් හයකට බෙදන්න.
- එක් එක් කණ්ඩායමට නියමිත කාර්ය පත්‍රිකා ලබා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකම්වල යෙදෙන අතර අවශ්‍ය මඟ පෙන්වීම කරන්න.
- නියමිත කාලයේ දී ඇගයීම නිම කරන්න.
- සිසුන් ඇගයීමට ලක් කරමින් නිර්ණායක මත ලකුණු ලබා දෙන්න.

8. **නිර්ණායක** :-

- ගුරු උපදෙස්වලට අනුව පැවරුමට අදාළ තොරතුරු ප්‍රමාණවත් පරිදි රැස් කිරීම
- තොරතුරුවල උචිත බව
- ලබාගත් තොරතුරු නිසි පරිදි වගු ගත කිරීම
- අදාළ කාර්යයන් හි ක්‍රියාකාරී ව සම්බන්ධ වීම
- සහයෝගයෙන් හා එකමුතු බවින් යුතු ව කටයුතු කිරීම

**ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය**

- සිසුන් රැස් කරගත් තොරතුරුවල ප්‍රබලතා හා දුබලතා පෙන්වා දීම
- තවදුරටත් සංවර්ධනය විය යුතු තැන් හඳුනා ගැනීමට ඉඩ සැලසීම

**කාර්ය පත්‍රිකාව 01**

**පළමු වන කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ පොත් පිංච සකස් කිරීමට අවශ්‍ය මුල් පිටුව සකස් කිරීම යි.

- සෙසු කණ්ඩායම් සමග සාකච්ඡා කර විෂය අන්තර්ගතය පිළිබඳ අවබෝධයක් ලබා ගන්න.
- ගුරු මහත්ම /මහත්මීන් ගේ මඟ පෙන්වීම මත පොත් පිංචට සුදුසු මාතෘකාවක් සහ මුල් පිටුවට ගැළපෙන චිත්‍රයක් නිර්මාණය කරන්න.

**කාර්ය පත්‍රිකාව 02**

**දෙවන කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ

- සමාජ සුරක්ෂිතතාව යන්න පැහැදිලි කිරීම
- සමාජය හා පුද්ගලයා අතර සම්බන්ධතාව විස්තර කිරීම

එම විස්තරවලට අදාළ වන තොරතුරු චිත්‍ර මගින් ද නිරූපණය කරන්න.

**කාර්ය පත්‍රිකාව 03**

**තුන්වන කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමාජ සුරක්ෂිතතාවට දායක වන ආයතන නම් කිරීම යි.

- එම ආයතන මගින් සමාජ සුරක්ෂිතතාව සඳහා සැපයෙන දායකත්වය
- එක් එක් ආයතනයන් මගින් සමාජ සුරක්ෂිතතාවට ඉටුවන මෙහෙය සාර්ථක කර ගැනීම සඳහා ඔබට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න.
  එම විස්තරවලට අදාළ වන තොරතුරු චිත්‍ර මගින් ද නිරූපණය කරන්න.

**කාර්ය පත්‍රිකාව 04**
**හතරවන කණ්ඩායම**

- ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා දායක වන යාන්ත්‍රණ, නීතිරීති හා බැඳුණු පුද්ගල වගකීම් නම් කිරීම
- එම යාන්ත්‍රණ, නීතිරීති සමාජ සුරක්ෂිතතාවයට දායක වන ආකාරය ඇතුළත් වගුවක් සකස් කිරීම

**කාර්ය පත්‍රිකාව 05**
**පස්වන කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ සමුපකාර ව්‍යාපාරයේ

- අරමුණු
- සමුපකාර සමිති වර්ග
  හා
- ඒවා මගින් සලසා ගත හැකි සේවා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම යි.
  ඒ සඳහා චිත්‍ර, රූප සටහන්, සංකල්ප සිතියම් ආදිය යොදා ගෙන නිර්මාණශීලී ව කරුණු ඉදිරිපත් කරන්න.

**කාර්ය පත්‍රිකාව 06**
**හයවන කණ්ඩායම**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ පාසල් සමුපකාර සමිතිය සම්බන්ධයෙන් පහත සඳහන් අනුමාතෘකාවලට අදාළ ව කරුණු රැස් කිරීමට යි.

- පාසල් සමුපකාරයක අරමුණු
- එමගින් පාසල් සිසුන්ට සැපයෙන සේවා
- එහි සාර්ථකත්වයට ඔබට දායක විය හැකි ආකාරය

# ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම් උපකරණය -II

1. **ඇගයීම් අවස්ථාව** :- 2 වන වාරය

2. **ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්** :-
   - 9.1.1 විවිධ පුද්ගල දක්ෂතා එළිදක්වයි.
   - 9.1.4 අවශ්‍ය තැන ස්ථිරසාරතාවයෙන් කටයුතු කරයි.
   - 9.2.1 තරගකාරී ලොව තුළ යහජීවනය ප්‍රගුණ කරයි
   - 9.3.1 ජීවිත අවස්ථා අභියෝග හමුවේ ඵලදායී තීරණ ගනියි.

3. **ආවරණය කරන විෂය සන්ධාරය** :-
   - ආත්මාවබෝධයෙන් කටයුතු කිරීම
   - නිවැරදි තීරණ ගැනීම
   - ආපදා කළමනාකරණය කිරීම

4. **ඇගයීම් උපකරණයේ ස්වභාවය** :-
   - ක්ෂේත්‍ර චාරිකාවක්

5. **උපකරණයේ අරමුණු** :-
   - ඵලදායී තීරණ ගැනීමට යොමු කිරීම
   - යහජීවන ගුණාංග පුරුදු පුහුණු කිරීම
   - තම හැකියා දක්ෂතා, තමන් හැසිරිය යුතු පරාස සීමා හඳුනා ගැනීමට යොමු කිරීම

6. **උපකරණය ක්‍රියාත්මක කිරීමට උපදෙස්**

   **ගුරු උපදෙස්**
   - මෙම උපකරණය ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වගකීම ආරම්භයේ සිට ශිෂ්‍යයන්ට ලබා දෙන්න.
   - ක්ෂේත්‍ර චාරිකාවෙන් ආවරණය වන නිපුණතා පිළිබඳ සැලකිලිමත් වෙමින් චාරිකාව යන දිනය, ස්ථානය, වේලාව, ක්‍රියාපිළිවෙළ, ගෙනයන ද්‍රව්‍ය ආදිය ඇතුළත් සැලැස්මක් සිසුන් ලවා සකස් කරවන්න.
   - මෙවැනි වැඩසටහනක අරමුණු හා සිසුන් එවැනි කාර්යයන් හි යෙදීමේ වැදගත්කම පිළිබඳ කරුණු පහදා දෙන්න.
   - අවශ්‍ය සියලු කටයුතු සූදානම් කරන්න.

**ක්‍රියාත්මක කිරීම**

- යෝජිත සැලැස්මට අනුව චාරිකාවේ යෙදෙන්න.
- කාර්යයන් කොටස් කර ඒවා ඉටු කිරීමට කණ්ඩායම්වලට පවරන්න.

## 7. ඇගයීම් නිර්ණායක

- උපදෙස් පිළිපැදීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
- ක්ෂේත්‍ර චාරිකාව නිවැරදි ව සැලසුම් කිරීම
- අනපේක්ෂිත සිදුවීම් පිළිබඳ අවධියෙන් සිටීම
- සමස්ත ක්‍රියාවලියේ නිමාව ඉදිරිපත් කරන පොත් පිංච (වාර්තා සටහන)

සිසුන් විසින් සකස් කළ යුතු කාර්ය පත්‍රිකාවකට සුදුසු දළ සටහනක්

**චාරිකාවට පෙර**

චාරිකාව යන ස්ථානය :-
චාරිකාව යන දිනය :-
ඔබට හැඟෙන පරිදි මෙම චාරිකාවේ අරමුණු :-
චාරිකාවෙන් ඔබ ලබා ගැනීමට අපේක්ෂා කරන දේ :-

**චාරිකාවෙන් පසු**

ඔබ චාරිකාවෙන් ලබාගත් අත්දැකීම් :-
චාරිකාවෙන් පසු ඔබේ සිතට නැඟුන සිතිවිලි කෙටියෙන් විස්තර කරන්න.

# ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම් උපකරණය - III

1. **ඇගයීම් අවස්ථාව** :- 3 වන වාරය

2. **ආවරණය කෙරෙන නිපුණතාව** :- පොදු යහපතට හේතුවන පළාත් පාලන ආයතනවල කටයුතුවලට සහය දක්වයි.

3. **අවධාරණය කෙරෙන නිපුණතා මට්ටම් :-**

- තම ප්‍රදේශයට පළාත් පාලන ආයතනවලින් සිදු වන සේවා පිළිබඳ විමර්ශනය කරයි.
- පළාත් පාලන ආයතනවල සේවා හා සම්බන්ධ මහජන වගකීම් හා යුතුකම් ඉටු කරයි.
- පළාත් පාලන ආයතනයක සේවා කාර්යක්ෂම ව ඉටු කිරීමට ජනතා සහභාගිත්වයේ ඇති වැදගත්කම අගය කරයි.

4. **ඇගයීම් උපකරණයේ ස්වභාවය** :-
   - නිපුණතා මට්ටම් ආවරණය වන ලෙස ප්‍රශ්නෝත්තර සංග්‍රහයක් සැකසීම.

5. **උපකරණයේ අරමුණු** :-

- පළාත් පාලන ආයතනවල ආරම්භය හා විකාශය පිළිබඳ සොයා බලයි.
- පළාත් පාලන ආයතනවල අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් වෙයි.
- පළාත් පාලන ආයතනවලට නියෝජිතයන් පත්කර ගන්නා ආකාරය සොයා බලයි.
- පළාත් පාලන ආයතනවල ව්‍යුහය, බලතල හා කාර්යයන් විමර්ශනය කරයි.
- මහජන නියෝජිතයන්ගේ හා මහජනතාවගේ වගකීම් හා යුතුකම් විමර්ශනය කරයි.

**06. උපකරණය ක්‍රියාත්මක කිරීමට**

**උපදෙස්**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ප්‍රශ්න සැකසීම සඳහා නිපුණතා මට්ටම් අනුව යමින් අදාළ කොටස් සිසු කණ්ඩායම්වලට පවරන්න.
- ප්‍රශ්න සැකසීම හා ඒවාට අදාළ පිළිතුරු සැකසීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- ප්‍රශ්න සැකසීමට අවස්ථාව ලබා දෙන්න.
- සැකසූ ප්‍රශ්න සාකච්ඡා කොට සුදුසු ලෙස සංස්කරණය කර ගන්න.
- සියලු ප්‍රශ්න එකතු කර ප්‍රශ්නෝත්තර සංග්‍රහයක් සකස් කර ගන්න.
- ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්, දැනුම මිනුම තරග, ලිඛිත පරීක්ෂණ සඳහා ප්‍රශ්නෝත්තර සංග්‍රහය අවශ්‍ය අවස්ථාවල භාවිතයට ගන්න.

07. **ඇගයීම් නිර්ණායක**

- අදාළ නිපුණතා මට්ටම්වලට අනුව ප්‍රශ්න හා පිළිතුරු සැකසීම.
- සකසන ලද ප්‍රශ්නවල ප්‍රමාණාත්මක බව
- සකසන ලද ප්‍රශ්නවල ගුණාත්මක බව
- අදාළ කාර්යයන් හි ක්‍රියාකාරී ව සහභාගි වීම
- කාලය නිසි ලෙස යොදා ගැනීම හා සමස්ත නිමාව

ඇමුණුම - 1.1

- දරුවන් තුළ හඳුනාගත හැකි සුවිශේෂ බුද්ධිමය දක්ෂතා පිළිබඳ ව මනෝවිද්‍යාඥ හොවාර්ඩ් ගාඩ්නර් (Howard Gardner 1983) විසින් බහුවිධ බුද්ධිමය මාන අටක් හඳුනා ගෙන ඇත.
- භාෂාමය බුද්ධිය - ( උදාඃ- ප්‍රසිද්ධ දේශකයන්, දේශපාලනඥයන්, , කථිකයන්, නිවේදකයන්, මාධ්‍ය ශිල්පීන්, කථාරචකයන්, ගුරුවරුන් කවීන්, සංස්කාරකවරුන්, භාෂා විශාරදයන්)

කථනය හා ලේඛනය පිළිබඳ දක්ෂතා

උදාඃ- මැක්සිම් ගෝර්කි ශ්‍රේෂ්ඨ ලේඛකයා, කුමාරතුංග මුනිදාස ශ්‍රේෂ්ඨ පඬිවරයා

- තාර්කික / ගණිතමය බුද්ධිය — හේතුඵල ක්‍රියාදාමය යටින් දිවෙන මූලධර්ම තේරුම් ගැනීමේ හැකියාව

කුඩාකල සිට දරුවන් ප්‍රදර්ශනය කරන හැකියා

* ඕනෑම දෙයක් ඇල්ලීම, තද කිරීම, විසිකිරීම, කැඩීම මගින් කුතුහලය සංසිඳුවා ගනියි.
* ස්වභාවධර්මයේ සංසිද්ධි හේතු ඵල ස්වභාවයන් නිරීක්ෂණය කරයි.
* සංඛ්‍යා සමග කටයුතු කිරීමට කැමැත්තක් දක්වයි.

උදාඃ- ගණිතඥයන්, ගණකාධිකාරීවරුන්, සැලසුම් කරුවන්, පරිගණකඥයන්, ඉංජිනේරුවන්

උදාඃ- ඇල්බට් අයින්ස්ටයින් සුප්‍රකට ගණිතඥයා
විමල සුරේන්ද්‍ර විද්‍යාඥයා

- සංගීතය හා රිද්මයානුකූල බුද්ධිය (සංගීතයෙන් සිතීමේ හැකියාව)

|   |   |
|---|---|
| * | සංගීතය හා රිද්මය පිළිබඳ දක්ෂතා |
| * | සංගීතය ප්‍රිය කිරීම, සංගීතයට අනුව චලනය |
| * | තාල තැබීම, ගායනය, වාදනය, ස්වර රචනය, සංගීත නිර්මාණය |

උදා:- ගායක ගායිකාවන්, සංගීත අධ්‍යක්ෂකවරුන්, නාට්‍ය රචකයන්

රවිශංකර් - සංගීත ගාන්ධර්වයා
ආචාර්ය පණ්ඩිත් අමරදේව සූරීන්

- දෘශ්‍යමය අවකාශමය බුද්ධිය

|   |   |
|---|---|
| * | අවකාශමය ලෝකය යමෙකුගේ අභ්‍යන්තරයට ගෙන මනසින් දැකීමේ හැකියාව |
| * | වර්ණ, රේඛා, හැඩතල, අවකාශ සම්බන්ධතා හඳුනා ගැනීමට පුළුවන් වීම |
| * | වගු ප්‍රස්තාර, සිතියම් නිර්මාණයට දක්ෂ වේ. |

උදා:- ගෘහ නිර්මාණ ශිල්පීන්, නාට්‍ය ශිල්පීන්, කලාකරුවන්, චිත්‍ර ශිල්පීන්, මූර්ති හා කැටයම් ශිල්පීන්, පරිගණක රූප ඇඳීමට දක්ෂයන්, දාම්, චෙස් ක්‍රීඩකයන්

මයිකල් ඇංජලෝ චිත්‍ර ශිල්පියා
ජෙෆ්‍රිබාවා ගෘහ නිර්මාණ ශිල්පියා

- කායික හා සංචලන බුද්ධිය

* තමාගේ පූර්ණ ශරීරය හෝ ශරීරාංගයක් යම් ගැටලුවක් විසඳීමට, යමක් සෑදීමට හෝ කිසියම් අන්දමක නිපදවීමක් කිරීමට හෝ තම අදහස් හෝ හැඟීම් බැහැර ව ඵලදායි ලෙස ප්‍රදර්ශනය කිරීමට ඇති හැකියාව.
* ශරීර චලන අභිමත පරිදි හසුරුවා ගැනීමට හැකි ය.

උදා:- - නර්තන ශිල්පීන්, අභිරූපණ ශිල්පීන්, මලල ක්‍රීඩකයින්, පිහිනුම් කරුවන්, වාදකයන්, කැටයම් ශිල්පීන්, ශෛල්‍ය වෛද්‍යවරුන්
- සුප්‍රකට විකට අභිරූපණ ශිල්පීන්

උදා :-

නර්තන ශිල්පී පනිභාරත ශූරීන්
සුසන්තිකා ජයසිංහ මලල ක්‍රීඩිකාව

- පුද්ගල ඇතුළාන්ත බුද්ධිය

    * තමන් පිළිබඳ ව දැන ගැනීම, තම හැඟීම්, චිත්තවේග, ආශාවන්, රුචි අරුචිකම් පිළිබඳ ව යථා අවබෝධය
    * තමන් පිළිබඳ ව නිවැරදි තක්සේරුවක් ගොඩනගා ගැනීම
    * තමන්ට අවංක වීම
    * තම දර්ශනයක් ගොඩනගා ගැනීම

| |
|---|
| උදාඃ- චිත්තකයින්, දාර්ශනිකයන්, මනෝ විද්‍යාඥයන්, ආගමික ශාස්තෘවරුන් |

- අන්තර් පුද්ගල බුද්ධිය

    * අන්‍යයන්ගේ හැඟීම් හා චර්යාවන් තේරුම් ගනිමින් ඔවුන්ගේ ප්‍රතික්‍රියාවලට සාර්ථක ව මුහුණ දී යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීම අන්තර් පුද්ගල බුද්ධිය යි.
    * කුඩා කල සිට ප්‍රගුණ කළ යුතු ය.
    * අන්‍යයන්ගේ සතුට, දියුණුව හා සමගිය ගැන සතුටු වීම.

| |
|---|
| උදාඃ- පූජ්‍ය පක්ෂය, සමාජ සේවකයින්, උපදේශකයන්, ප්‍රජාසේවකයන්, ස්වේච්ඡා සේවකයන්, දේශපාලනඥයන්, ජන නායකයන්, ගුරුවරුන් |

- ස්වභාව ධර්ම බුද්ධිය

    * භෞතික හා සජීවී පරිසරය අවබෝධ කරගෙන පරිසරයට සංවේදී වීම, පරිසරය සංරක්ෂණය කිරීම මෙම බුද්ධියේ ලක්ෂණය යි.
    * කුඩා කල සිට ම සතුන්ට හා ස්වභාව ධර්මයේ සංසිද්ධීන්ට ඇලුම් කිරීම සත්ව ලෝකය, මුහුදු පත්ල, අභ්‍යවකාශය, ඡායාරූප ආදිය කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වයි.
    * පරිසරයේ සිදුවන වෙනස්කම් හා විශේෂ ලක්ෂණ අන්‍යයන්ට පෙර දකියි.
    * සිප්පිකටු, පරිසරයේ විවිධ දෑ රැස් කිරීම විශේෂ ලක්ෂණයකි.

| |
|---|
| උදාඃ- පරිසර විද්‍යාඥයන්, ජීව, සත්ව, උද්භිද විද්‍යාඥයන්, ගොවියන්, සංචාරකයන්. |